# කොටි විනිවිදීම



පාඨලී චම්පික රණවක
ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය

# කොටි විනිවිදීම

පාඨලී චම්පික රණවක

ප්‍රථම මුද්‍රණය 1999

කොටි විනිවිදීම
පාඨලී චම්පික රණවක

ISBN - 955-8239-00-3

ප්‍රකාශනය
ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය

මුද්‍රණය
ගුණසිරි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ්
203, ඕල්කට් මාවත
කොළඹ - 11

# පටුන


| | පිටු අංක | |
|---|---|---|
| පාරමිතාව | 1 | 05 |
| 01 අදියර- බුදුරැස් මිලින කළ ගිණිරැස් | 06 | 08 |
| 02 අදියර- ලේ සාගරයේ සත්‍යය ගිලියෑම | 09 | 25 |
| 03 අදියර- ත්‍රස්තවාදයේ මනෝකාය දෙමළ ජාතිවාදයයි | 26 | 38 |
| 04 අදියර- ලේ විලමත සාම දියකෙලිය | 39 | 50 |
| 05 අදියර- කොටි ගොදුරු බිම් | 51 | 69 |
| 06 අදියර- සෙංකඩගලින් මලයනාඩුවේ පුල්ලි මතුවේ | 70 | 77 |
| 07 අදියර- කොටි මදිවට ඔටු ත්‍රස්තවාදයක් | 78 | 83 |
| 08 අදියර- මඩපාට කොටි | 84 | 104 |
| 09 අදියර- කොටි වැනසීම හැර අන්මගක් නැත | 105 | 111 |

# පාරමිතාව

අහස පොළොව ගුගුරවමින් ඒ බෝම්බය පිපිරී ගියේය. කළු පැහැති දුම්රොටු අහසට නගිත්දී තාර පොලොවෙන් ගිනිදැල් නගින්නට විය. සිප් බිමටගිය දරුවෝත්, දරුවන්ගේ කුසගිනි නිවීම පිණිස වැඩබිමට ගිය මව්පියෝත් කුරිරු ලෙස ඉරා දමා තිබිණි. වැලපෙන මිනිසුන් හසර නැතිව ඒ මේ අත දුව ගියේ තවත් බෝම්බයක් පිළිබඳ බිය ජනක පුවත සමගිනි.

ඒ දිනය 1998 මාර්තු පස්වෙනිදා විය.

එය අඳුරු බ්‍රහස්පතින්දාවකි.

මේ කොළඹ නගරයේ පිපිරිගිය විසිඑක්වෙනි බෝම්බයයි. 1983 න් පසු එකසිය විසිහත්වෙනි සමූහ ඝාතනයයි.

සෑම කළු වලාවකම රිදී රේඛාවක් ඇත්තා සේ ඒ අඳුර තුළ සිටම අධිෂ්ඨාන සහගත ගැහැණුන් හා මිනිසුන් අතලොස්සක් මෙසේ සිතන්නට වූහ.

දැන් ඉතින් ඇති

ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය බිහි වූයේ එලෙසය.

ඊළඟ වසර තුළ ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය මනුෂ්‍යත්වයේ ආලෝකය ශ්‍රී ලංකාව පුරාම ගෙනගියේය. මරදාන බෝම්බය පිපිරවීම සඳහා අණදෙන විට දෙමළ කොටි නායකයින්වත්, සෑම සිංහල සමූග ඝාතනයක් වෙත්දීම ප්‍රහාර කෙස් පැලෙන තර්කවල පටලවා කැපීපෙනීමට දඟලන අධිමානී උගතුන් රැළවත් මරාදාන බෝම්බයෙන් මෙවන් දෙයක් සිදුවේයැයි නොසිතුවෝය. දෙමළ ජාතිවාදීන් පමණක් නොව රතු කොල නිල් තොප්පි දාගත් නරුම දේශපාලකයින්ද දශක දෙකක් සිංහල කම පුවත් පත් වලින් විකුණා කමින් සිටි ද්‍රෝහී චින්තකයින්ද සිය පරස්පරයන් අතීතයට එක්කර එකම කල්ලියක් වී ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරයට පහර දෙන්නට එක්වූහ.

එහෙත් සාමයට ලැදි සෑම මනුෂ්‍යත්වය අගයන ජනතාව දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදයට එරෙහිව අවසන් පවුර ලෙස ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරයට වඩාත් ආදරණීය ලෙස රැකවරණය දෙන්නට වූහ.

ඉතිහාසයේ ප්‍රථම වතාවට ත්‍රස්තවාදය මැඩලීම පිණිස දළ සැලැස්මක්

ත්‍රස්තවිරෝධී ජාතික සැලැස්ම හෙවත් කොටි පරදන මග ලෙස එළිදක්වන්නට ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරයට හැකිවිය. ජනතාවගේ ආදරණීය දිරියෙන්ද, දෙමළ ජාතිවාදී ද්‍රෝහීන්ගේ බිය වැද්දීම්, මැර ප්‍රහාර, මඩ ප්‍රහාර මැදින් ද දැන් එය රට පුරාත් විදේශයන්හීදී සංවාදයට ලක්වේ. මෙයට වසර කිහිපයකට කලින් මෙන් නොව දැන් ඕනෑම අයෙක් කොටි සමඟ සාකච්ඡා කිරීමට දෙවරක් නොව තුන්වරක් සිතීමට පෙළඹී තිබේ. සාමය හා මලමිනී විකුණාකෑම සිය ජීවන වෘත්තිය කරගත් කපුටු රංචු බඳුවූ එන්.ජී.ඕ. කල්ලි දැන් නන්නත්තාර වී සිටී. ජනතාව මරා කමින් සිටි කොටි සහ ගිපුලිහිණීන් දැන් වඩාත් කල්පනාකාරී වී තිබේ.

මේ සියලු වෙනස් වීම් වලට හේතුව ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාර මහපොළවමත ක්‍රියාකරමින් ඓන්ද්‍රිය මිනිස් බලවේගයක් මගින් මහපොළවට පමණක් නොව ගිරිකුළුද වෙනස් කර අස්වද්දා ඇති නිසාය.

මේ කෘතිය ලියවෙන්නේ නවීන ලෙස සිතන නවීන ලෙස ක්‍රියාකරන නවීන මිනිසුන්ගේ ඇස් හිස් මස් ලේ සමඟ මුසුව ඇති ප්‍රඥාව අවධි කරලීම සඳහාය. මෙය කෙස් පැලෙන තර්ක වලට සිරවූ බුද්ධිවාදී කල්ලි පිණිස නොවේ. ත්‍රස්තවාදයට එරෙහිව සිය ශරීරයෙන්ම ක්‍රියා කිරීමට කැමති ප්‍රඥාබල පිරිස වෙනුවෙනි.

මේ කෘතිය සඳහා වූ කරුණු බොහෝමයක් සාමූහික උත්සාහයන් විසින් ජනිත වනු ලැබීය. ලේඛකයන් කිහිප දෙනෙකු විසින්ම දෙමළ ජාතිවාදය හා කොටි ත්‍රස්තවාදය අරභයා ලියන ලද කෘතීන් හා ලියවිලිද එහිදී උපයෝගී කරගන්නා ලදි. ඒ සියලු අර්ථයෙන් මෙය සමූහයා විසින් සමූහයා උදෙසා කරන ලද සාමූහික ප්‍රයත්නයකි.

මේ කෘතිය තුළ දිවෙන දර්ශනයක්ද ඇත. බටහිර බුද්ධිවාදී චින්තනයන්ගෙන් හෙම්බත්ව සිටින ජනයාට මනස්පුතුන්ගේ පාරාජිකාවූ දරශනයන්ගෙන් පලක් නැත. කෙසේ වෙතත් අනාගත සමාජය නිර්මාණය කිරීම සඳහා සිය ඇස් හිස් මස් ලේ දන් දී සිටින ප්‍රඥාවෙන් පිරිපුන් මිනිසුන් සඳහා සැකෙවින් එකී දර්ශනයද විස්තර කළ යුතුය.

දෙමළ ජාතිවාදී කථිකාව තුළ ඇති වැරදි අදහසක් නම් හේතුඵල සබඳතා පිළිබඳ විග්‍රහයයි. දෙමළ ජනතාවට සිදුවූ අයුක්තිය හා අසාධාරණය නම් වූ හේතුවෙන් කොටි සංවිධානය උපන් බවත්, ඒ නිසා කොටි ඵලය පමණක් බවත් එයින් කියවේ. එබැවින් කොටි විනාශ කළද දෙමළ ප්‍රශ්නයක් ගැඹුරු යථාර්තයක් ලෙස ඇති නිසා නැවත නැවතත් කොටි සංවිධානය වැනි ආයතන බිහිවන බවද එයින් කියවේ. මෙය බටහිර රටවල ජනප්‍රිය සැඟවුනු ගැඹුරු යථාර්ථයක් ඇත. මතුපිට ඇත්තේ ඒ යථාර්තයේ සෙවණැලි පමණක් බව ට වූ දේව විශ්වාසයේම

අංගයකි. මේ කෘතියේ තර්ක කරන්නේ සැඟවුනු දෙමළ දුක්ගැනවිල්ලක් නොමැති බවය. දෙමළ ජාතිවාදය හා ඒ පිළිබඳ ඓතිහාසිකව බිහිකළ කොටි ත්‍රස්තවාදය මෙන්ම ඵලයද බවය. සමාජ ක්‍රියාකාරීත්වය වනු මිනිසුන්ගේ නිර්මාණයක් මිසි ඊනියා සැඟවුනු යථාර්තයක සෙවනැල්ලක් නොවේ. කොටි සංවිධානයේ සංවිධාන ජාලයේ ශක්තියෙන් මිස ඔවුන් සිය ගමන යන්නේ දෙමළ ජන සහයකින් නොවේ. ඒ නිසාම කොටි සංවිධානයෙහි ජාලය විනාශ කර දශක කිහිපයක් එය යටපත් කරගෙන සිටිවිට නැවත එවැනි ත්‍රස්තවාදී ක්‍රියාවලියක් බිහිවන්නේ නැත.

දෙමළ ජාතිවාදී කතිකාව තුළ ඇති තවත් වැරදි අදහසක් නම් දෙමළ දුක්ගැනවිල්ලට දේශපාලන අදහසක් ද ඇති බවය. එනම් ශ්‍රී ලංකා රාජ්‍යයෙන් දෙමළ ජනයා පිටමං කිරීම පිළිබඳවය. මේ නිසා ව්‍යවස්ථා සංශෝධනයකින් දෙමළ ජනතාවගේ සමාජීය මෙන්ම දේශපාලනික දුක්ගැනවිලිද නිමා කළ හැකි බව කියවේ. මේ සමහර සිංහල බලවේගයන් වෙතත් අර්ථයකින් ප්‍රකාශ කරන අදහසකි. එනම් දෙමළ ජාතිවාදයෙන් රැකවරණය ලබාගැනීමට කළ හැකි එකම දෙය ව්‍යවස්ථාව සැකසීම බවය.

මේ සියලු අදහස් ගලා එන්නේ 1960 දශකයේ දේශපාලන විද්‍යාව හැදෑරූ බලවේග තුළිනි. එදා රාජ්‍ය හා ආණ්ඩුවට සමාජය තුළ ආර්ථික, මතවාදී දේශපාලනික හා යුදමය ලෙස තිබූ ආධිපත්‍ය අද නැත. රාජ්‍යයේ සීමා වෙනස් වී ඇත. අද නූතන රාජ්‍යක ආර්ථිකය, මතවාදය පමණක් නොව, ආරක්ෂක අංශ පවා ජාත්‍යන්තර සංවිධාන වලින්, පුද්ගලික ව්‍යවසායක කරුවන් අතින්, සමාගම් වලින්, නිලධාරී යන්ත්‍රයෙන්, සංවිධාන ගතවූ සංවිධාන කල්ලි වලින් ආදී මෙකී නොකී බලවේග විසින් බෙදා ගෙන ඇත. බලය බෙදා හැරීම, බලය බෙදාහදා ගැනීම, ව්‍යවස්ථා සංශෝධනය ආදියෙන් සියලු ප්‍රශ්න විසඳේ යැයි සිතීම මුග්ධ සිතුවිල්ලකි. කෙසේ වෙතත් රාජ්‍ය හැකිලීයාම වෙනුවට ඒ ශක්තිමත් වන ව්‍යුහයන් ගොඩනැගේ නම් ව්‍යවස්ථාවට අලුත් අදහසක් ඇතිවනු ඇත. ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව මතුපිටින් උද්ඝෝෂණය කළද ජාතිවාදී සංවිධාන පසුගිය දශක පහ තුළ රාජ්‍යයේ මැදිහත් වීමකින් තොරව ඉඩම් හා දේපල අල්ලා ගැනීම, ජනාවාස බිහිකිරීම, ස්වාධීන ආර්ථිකයන් තැනීම, පමණක් නොව යුද කල්ලියක් නිර්මාණය කිරීමට පවා සමත්ව තිබේ. මුස්ලිම් වරුන් ඒ දෙමළ ජාතිවාදීන්ට වඩා හොඳින් ඉටුකරගනිමින් සිටිති. එමගින් ඔවුන්ම ව්‍යවස්ථාවෙන් ප්‍රශ්න විසඳා ගැනීම ඵල විරහිත බව ඔප්පු කර ඇත. සිංහල ජාතික ව්‍යාපාරය පමණක් මේ නවීන තත්වය තේරුම් නොගෙන තවමත් 1956 ජනප්‍රිය සටන්පාඨ වල සිර වී සිටී.

දෙමළ අභිලාශයන් පිළිබඳ වැරදි අදහසක් ඇත. පුද්ගලයෙකුට තමන්ගේ ඕනෑම පුද්ගලික අදහසක් දැරීමට හා ඒ අනුව

ක්‍රියාත්මක වීමට අයිතියක් ඇති බව ස්වෛරී පාරිශුද්ධ පුද්ගල නිදහස පිළිබඳ සංකල්පයයි. මෙය හින්දු සමාජයේදී නම් තමන්ගේ ආත්මන් හඳුනාගැනීමකි. ආත්මන් සමාජයට ඔසවා තබන විට සමාජ ආත්මන් කෙනෙකු ස්වෛරී ජාතිය නමින් බිහිවේ. එවිට ඒ ජාතිය මෙසේ තර්ක කරයි අපි ස්වෛරී පාරිශුද්ධ ජාතියක් නිසා අපට උවමනා ආකාර වලට අපට සිතිය හැක, අපට ක්‍රියා කළ හැක. දෙමළ ජාතික අභිලාශයන්හි පදනම ඉහත කී දර්ශනයයි. අවාසනාවකට 'මගේ ලෝකය' හා පරිශුද්ධ ජාතිය නමින් වූ බෞද්ධ විසංගත සංකල්පයක් සිංහල ජාතික ව්‍යාපාරයටත් පසුගිය දශක දෙක තුළ එක්විය. සබඳතා සහිත ලෝකයක කිසිම පුද්ගලයෙක්, සමාජයක් හෝ ජාතියක් පාරිශුද්ධ, නිරපේක්ෂ ස්වෛරීත්වයක් අත්කර නොගනී. එලෙස ක්‍රියා කිරීමට ගියහොත් ගැටුම අනිවාර්ය වේ. මේ අනුව දෙමළ ජනතාවගේ පදනම යුද ගැටුමය. වසන්ත රාජා වැනි දෙමළ ජාතිවාදීන් දැන් කොපි කරන්නේ ඉවක් බවක් නැතිව දෙසූ ඒ ව්‍යාජ සිංහල චින්තනයන්ගෙන් දෙමළ ජාතිවාදය බිඳීම සඳහා ගෙන ආ කියන ඒ චින්තනයන් ගෙන් වැඩියෙන්ම පෝෂණය වී ඇත්තේද දෙමළ ජාතිවාදී මතවාදයයි. පුද්ගලයන්ට ජාතියට මෙන්ම මනුෂ්‍යත්වයටද ඇත්තේ සාපේක්ෂ අනන්‍යතා පමණි.

අනෙක් අතට ව්‍යාජ සාමවාදීන් හා මානවාදීන් සිය මතවාද පතුරවද්දී බොහෝ පහසු ලෙස කොටින්ගේ යුද හමුදාව හා ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා සමාන ලෙස සළකති. දෙමළ සමාජය හා සිංහල සමාජය සමාන ලෙස ජාතිවාදීයයි සලකති.

කොටින්ගේ ත්‍රස්තවාදී යුද කල්ලිය අන්කිසිවකුට වගනොකියයි. එය තම මතවාද සහිත සමාජයක් නිර්මාණයක කරගෙන ඇති උමතු ඒකාධිපති ක්‍රියාවලියකි. පෙරලා ශ්‍රී ලංකා යුදහමුදාව නීතියට වගකිව යුතුය. එහි දේශපාලන මෙහෙයවන ආණ්ඩු ජනතා ඡන්දයට වෙනස් කළ හැකිය. සිංහල සමාජ බහුවිද අදහස් ඇති සමාජයකි. දෙමළ සමාජය තුළ මෙන් එහි ඇත්තේ එකම ඒකාධිපති අදහසක් නොවේ. දෙමළ ජාතිවාදීන්ට පවා බිය සැකෙන් තොරව සිංහල සමාජයේ අදහස් පළකිරීමට, පෙළපාලි යෑමට පමණක් නොව බෝම්බ පිපිරවීමට හැකියාව ලැබී තිබේ. අනිත් අතින් සිංහල සමාජය තුළ දෙමළ ජනතාව මරා දමමින් සිය ඉඩකඩන් වලින් පළවා හරින ජාතිවාදී ව්‍යාපාරයක් නැත. **ජාතිවාද යනු අහඹු සිදුවීමක් දෙකක් නොව භූගෝලීය ලෙස හා කාලාන්තරයක් මුළුල්ලේ අඛණ්ඩව සිදුවන අන් ජාතියක් ඔවුන් ඒ ජාතියට අයත්වූ නිසාම පීඩාවට පත්කරන ක්‍රියාවලියකි.** වෙම්මනියේ මිනිවලවල් වල කැනීම් සිදුවුවද තිරුක්කෝවිල් වල කැනීම් සිදුවන්නේ නැත. කැකුළාවෙන් මංගල ගමින් සිංහලයින් මරාදමා පළවාහැරියාට ගාල්ලෙන්,

කොළඹින් හෝ දෙමළ ජනයා මරාදමා පළවා හරින්නේ නැත. මේ නිසා සිංහල සමාජය හා දෙමළ සමාජය සමඟ සමව ජාතිවාදය යැයි සංසන්දනය කළ නොහක. එකක් මහජන වගකීමකට යටත්ව ඇති අතර අනිත් එක් පුද්ගලයෙකුට පමණක් යටත්ව ඇති නිසා ය. මේ නිසා දෙමළ කොටිනුත් එකයි සිංහල හමුදාවත් එකයි යන සංසන්දනයන් කළ හැක්කේ අවසාන විග්‍රහයේදී කොටි සංවිධානයේම පෙරමුණ බාලකායකට පමණි.

මේ කෘතිය කියවන අය මෙහි දෙමළ මිනිසුන්ගේ දුක් වේදනා අනාථ භාවය හා තවත් සමාජ ගැටළු ප්‍රමාණවත් ලෙස සාකච්ඡා නොකිරීම තුළ විටක චෝදනා කළ හැක. එය එසේ සිදුවී ඇත්තේ වැදගත් හේතූන් නිසාය. ශ්‍රී ලංකා රාජ්‍යයේ මාධ්‍යයත් ජාතිවාදී මාධ්‍යයත් විදේශ රටවල මාධ්‍යයත් පුද්ගලික මාධ්‍යයත් දෙමළ දුක්වේදනා බොහෝ අතිශෝක්තියෙන් වර්ණනා කර ඇති නිසා. අපත් ඒ සඳහා අකුරු වැය කිරීමෙන් පලක් නැත. අනෙක් අතට එය වැලකීම් වලින් අවධිකළ හැකි දෙමළ සමාජයක්ද නැත. දෙමළ දුක්ගැනවිලි පිළිබඳ කිඹුල් කඳුලු වලින් ප්‍රයෝජන අත්වන්නේ කොටි සංවිධානයේ මිනීමරු ක්‍රියාවලියට පමණි. දෙමළ නමින් පවතින්නේ කොටින්ගේ සංවිධානයට අයත් දෙමළුන් හා නිෂ්ක්‍රීය, මළ දෙමළ සමාජයක් පමණි. මේ නිසා ප්‍රශ්නය විසඳීමේ වගකීම ඇත්තේ තවමත් නොමළ සිංහල සමාජයටය. මේ කෘතියේ ඉලක්කය ඒ නිසා සිංහල සමාජයය.

මේ කෘතිය කියවා ම්ලේච්ඡත්වයට යටත්වීම වෙනුවට මනුෂ්‍යත්වය වෙනුවෙන් සටන් වැදීම එක් මිනිසෙකු හෝ තෝරාගනීනම් මෙහි සාර්ථකත්වය එයමය.

# බුදුරුස් මිලින කළ ගිනිරුස්

දහසක් බුදුන් බුදුවන උදෑසන හිරුගේ පළමු රැස් දහර තුරු ලතා අතරන් පෙරීවිත් රන්වියනේ කොත්කැරැල්ල මත දිදුලනු සෝමවතී මාතාව දුටුවාය. ඇයත් ඇයගේ දියණිවරුන් වූ සීලවතී, සුමනාවතී හා මුණුබුරු මිනිබිරියයන් වූ හර්ෂ ගයාන් හා ඉෂාරා දුරකතර ගෙවා රෑ නිදිවරා මෙහි පැමිණියේ ජීවමානු බුදුන්ගේ සංකේතය වූ ශ්‍රී දන්තධාතූන් වහන්සේ සිත්සේ වැඳපුදා ගැනීමටය. පසුගිය පනස් වසරකට සෙවනැල්ල බඳුව ඇය අසල සිටි ආදාරණීය සැමියා වූ හිරිපිටිය මහතා ද එහි විය.

සෝමවතියගේ ජීවිතයේ වසර හැටපහකම දවස ඇරඹුනේ උදෑසන බුදුන් නැමැදීමෙනි. මන්දස්මිතිය රැදුනු බුදුමුව හා පියවුණු මහා කාරුණික බුදු දෙනෙත දකිමින්.. "ඉතිපිසෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ".. යැයි පවසා පහන් දල්වා ඇය දවස ඇරඹුවාය. අරුණට පළමු ඇයගේ මුළුතැන් ගෙයි ලිපෙහි ආලෝකයෙන් නිවස ආලෝකමත් විය. ඉතින් ඇය ළැදැරියක්ව සිටි දියණියක් වූවාය. එතැනින් අද දෙවැනි බුදුන් කෙනෙකු බඳු වූ අම්මා කෙනෙකු වූවාය. දැන් ඇය අම්මාවරුන්ගේත් අම්මා කෙනෙකි. සසර පුරා සෙනෙහසින් වැළඳගත් බැඳුම් වලින් යුතුවූ දූදරුවනුත් මුණුබුරු මිනිබිරියනුත් පිරිවරාගත් පදානුගත අර්ථයෙන්ම මිත්තනියකි. මේ සිල් මෑණියෝ මෙහි පැමිණියේ බුදුහිමියන්ගේ මහා කරුණාව සමඟ එක්වන්නටය. එහි පහස අත්විඳින්නටය. එය තම දුවාදරු කැදැල්ල සමඟ එක්ව නිරාමිසව විඳගන්නටය.

ඉතින් ඈ උදෑසන හිරු රැස් දෙස බලා සිටියාය. දළදාවට සෙවන දෙන රන්වියනට ඉහලින් සැබෑ බුදුරැස් විහිදේ යැයි බලාපොරොත්තුවේ දෑස් දල්වා සිටියාය. අයට කුඩාකල අත්පොත් කළ "දළදාසිරිත" මතක් විය.

**"නාරජ, දළදා වහන්සේ පන්දහසක් හවුරුදු බුදු සසුන් පවත්නා ලක්දිවට අරක් පිණිසැ වඩනා සේකැ. තොප විසින් රඳවාගැන්ම කාරණ නොවේ, යි වදාළහ. එ කෙනෙහි නාරජ තෙරුන් වහන්සේට දළදා වහන්සේ හා රුවන් කරඬුව පාවා දුන්නේ යැ. ඉක්බිති තෙරුන් වහන්සේ ගුරුළු වෙස හැරැ සයුරෙන් නැගී දළදා වහන්සේ ඔවුන් දෙදෙනා හට පාවාදී නික්මුණුසේකැ"**

දළදා සිරිතේ වදන් ඇයට තවමත් මතකය.

එය ඇගේ මෑනියන් ඇයට කියවූවාය. ඇය සිය දුවා දරුවන්ට එය කියෙව්වාය. ඇයගේ මුණුබුරු මිනිබිරියන්ද එය කියනු ඇය අසා ඇත. ඔවුනගේ දරුවන් ද දිනෙක එය වනපොත් කරනු ඇත්තේය. එය ඒ තරම්ම නොකැඩුණු නොබිඳුනු රන් හුයක් බඳු ඉතිහාසයකි.

සත් සමුදුරු දෙබෑකරගෙන සියලු සතුරු ආපදාවන් මැඩගෙන දළදාව හේමමාලිය හා දන්ත කුමරු මෙරට ගෙන එන අයුරු ඇයට දැන් මැවී පෙනේ. ඔවුන් ගොඩබසින්නේ වත්මනේ මුලතිව් නමින් ප්‍රචලිත වුවද අතීතයේ සිංහල බෞද්ධ ශිෂ්ටාචාරයේ තෝතැන්නක් වූ වෙරළකඩටමකටය. එතැන් පසිඳු මං ඔස්සේ ද, පෙත්මං ඔස්සේද, වන ලැහැබ හා ගිරිදුර්ග ඔස්සේද, දිය කඳුරු ඔස්සේ ද උන්වහන්සේ වැඩම කළ සේක. එවක් පටන් සිංහල බෞද්ධ රාජ්‍යයේ ස්වෛරීත්වයේ, ඒකීයත්වයේ හා සහජීවනයේ රන් සලකුන බවට උන්වහන්සේ පත්වීම අනිවාර්යයක් විය. චෝල්, චේර, පාණ්ඩ්‍ය මිලේච්ඡ ආක්‍රමණිකයන්ගේ ලේ තැවරුණු අසිපත් අස්සක් මුල්ලක් නෑර උන්වහන්සේ සොයත් දී කසාවන් සිවුරු තුළත්, ගිරි ශිඛර යටත්, දියකඳුරු මතත්, උන්වහන්සේ සුරක්ෂා වූ සේක. පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි මිසදිටු පව්ටු මිලේච්ඡ පාලනයේ කාලතුවක්කු වලටත් උන්වහන්සේ දෙදරවනු නොහැකි විය. විල්ලුද පලස් ද ෂණ කුරහන් ගලක්ද එකම මුදු පියවිල්ලක් ලෙස සලකා සුවයෙන් උන්වහන්සේ සැතැපී සිටි සේක. සතුරාගේ වෛරයෙන් දැවී ගිය දෙනෙත් ගිණි පුළිඟු වලට කිසිකලෙක උන්වහන්සේ දවාලිය නොහැකි විය. සදා ප්‍රභාමත්ව දැල්වෙමින් සිටි සේක.

ඉතින් සෝමවතී උපාසිකා මාතව මල් පහන් සූදානම් කරන්නට වූවාය. සුදු පිරුවටයක් ඇඳගත් ඇය සුදුමලින් පිරීගිය වට්ටිය දියෙන් දොවා සිය දෑස් ද දියෙන් තෙමා ගත්තාය. ඉන්පසු බුදුන් සිහිකර දකුණු පය පෙරට තබා අරුණින් නැහැවීමට අරඅඳින දළදා මාලිගයේ වාහල්කඩ බලා ගමන් ගත්තාය. ඇගේ දුවාදරුවෝද මුණුබුරු මුණුබිරියෝද ඇය පසුපසින් පියමැන්නේ පහන් වූ සිත් තවතවත් ප්‍රභාවත් බවට පත්කර ගනිමිනි.

එහෙත් පහන්වූ සිතින් යුතු පිරිසිදු මිනිසුන්ට ජීවමාන බුදුන් වැනිවූ දළදා සම්දුන් දැකීමට, පිදීමට, වසර දෙදහස් තුන්සීයක බෞද්ධ ඉතිහාසයක් ඇති මේ රටේ තවත් අයිතියක් හෝ ඉඩකඩක් නොමැති බව ඒ උවැසියෝ කිසිවෙක් නොදැන සිටියහ.

ඒ වන විටත් මිලේච්ඡ යක්ෂයෝ අඳුර මැදින්ම ඒ පුණ්‍ය භූමියට පිවිස සිටියහ. අමු ලේ සුවඳට ඉව අල්ලමින් ජීවමාන බුදුන් වැනි වූ දළදා හිමියන් විසුනු කිරීමේ අරමුණින් දුරුවෙන අඳුර තුළම සිට පෙරට ඇදෙමින් සිටියහ.

අතින් ගෙන සිටි මල්වට්ටිය හිසට ගත් සෝමවතිය බුදුන් නැමදීමේ ගාථාව

සිතින් මුමුනන්නට වූවාය.

.....ඉතිපිසෝ භගවා අරහං සම්මා සමුබුද්ධෝ..

.....ධෝ්ංංං..

.............................

යක්ෂයෝ බෝම්බ පුපුරවා ලූහ .....................

වාහල්කඩ දෙදරා ඇද වැටිනි. සඳකඩ පහණ සත් කඩකට පැලී ගියේය. බුදුන් දැකීමට තෙල් මල් පහන් ගෙන සුදෝ සුදු වතින් ද සිතින් ද තැන්පත්වූ උවැසි උවැසියෝ යක්ෂයන් විසින් ඉරාදමා තිබුණෝය. කැට කැබලිති වූ බුදුරුව කියාපෑවේ තවදුරටත් මේ බිමේ නිදහසේ බුදුන් දැකීමට කිසිවෙකුටත් අයිතියක් නැති බවය.

පිපිරීමෙන් වාතලය දෙදරාගොස් අවසන් වනවත් සමගම හිරිපිටිය මහතා විසිවී ගිය තැනින් නැගිට ගත්තේය. ලෙයින් පෙඟීගිය දෑස විවර කළ ඔහුට කැට කැබිලිති වී පුපුරා ඇද වැටෙන දළදා මාලිගයේ වහල දර්ශනය විය.

..අනේ දළදා හාමුදුරුවනේ මොකද මේ උනේ..

..........................................

පිස්සෙකු මෙන් ඔහු සුන් බුනු අතරින් පෙරට දිව ගියේය. තම බිරිඳ වූ සෝමවතියත් තම දියණිවරුන් වන සීලවතී හා සුමනාවතීත් තම මුනුබුරු මිනිබිරියන් වූ ගයන් සහ ඉෂාරාත් ඉරී ගිය මාංශ සහිතව ඇද වැටී සිටිනු ඔහුට දැක ගත හැකි විය. සුදු පිරුවට ලෙයින් පෙඟී තිබුණු ආකාරය ඔහුට තවත් දරාගත නොහැකි දර්ශනයක් විය. පිය සෙනෙහස ඔහුගේ ලේ මස් විනිවිද ගොස් ඇට තුළට වැද එහි සිට වේදනාවෙන් කීරි ගැසෙන හඬ හඬාවැටෙන හඬ ඔහුට ඇන්නේය. තම දුවාදරුවන් හා සැමියා අහිමි වූ පටාචාරව වැළපෙමින් බුදුන් සොයා ගිය ලෙස ඒ වියපත් මිනිසා ද වියරු වැටෙනු අයෙකු සේ දිව යන්නට විය.

..අනේ බුදුහාමුදුරුවනේ මේ අපරාධය ඔබවහන්සේටවත් පෙනෙන්නේ නැත්දෝ...

පටාචාරාවට පිහිටවීමට බුදුරදුන් හිටියත් ඔහුට පිහිට වීමට බුදුවරු ඉතුරුව සිටියේ නැත.

ඒ දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදය මේ පින් බිමේ බුදුවරු හා දෙවිවරු වනසා දමා බොහෝ කලක් ගතව ඇති නිසාය.

# ලේ සාගරයේ සත්‍ය ගිලීයෑම

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ත්‍රස්තවාදය නිසා දිනපතාම මිනිස්සු මියයති. දෙමාපියන් නැති දරුවෝත්, දූ දරුවන් අහිමි දෙමාපියෝත් සමාජයට එක්වෙති. පොදු හා පෞද්ගලික දේපොල වැනසේ, තමන් සන්තක සියළු දේ අහිමිව මිනිසුන් අනාථයන් බවට පත්වේ. ආගමික ස්ථාන වලට ප්‍රහාරයන් එල්ලවේ. නිශ්චිත එක් බසක් පමණක් එනම් සිංහල කථා කිරීමේ වරදට මිනිසුන්ට මරණය උරුම වේ. ම්ලේච්ඡ සංස්කෘතිය විසින් අන්‍ය සංස්කෘතීන් හා මානව සදාචාරයන් ඉරාදැමේ. අවි ආයුධ සහිත ආර්ථිකය නිසා ජාවාරම් කරුවන් සුළු පිරිසක් පොහෝසතුන් වුවද පොදු මිනිසුන්ගේ හා රටේ ආර්ථිකයට බරපතල හානි සිදුවේ.

මේ සියල්ල අද ශ්‍රී ලංකාවේ පවත්නා යථාර්ථයයි. එහෙත් රාජ්‍ය මාධ්‍ය ඇතුළු දේශීය, විදේශීය මාධ්‍ය හා ප්‍රකාශකයින් මේ පිළිබඳව කියන්නේ අපූරු කතන්දරයකි. එනම් ශ්‍රී ලංකාවේ ඇත්තේ ජනවාර්ගික යුද්ධයක් බවත් එයින් මිය යන්නේ, අනාථවන්නේ, දේපොළ අහිමිවන්නේ, හිංසාවට පත්වන්නේ, ආර්ථිකය ඇදවැටෙන්නේ, සංස්කෘතික හා ආගමික නිදහස අහිමිවන්නේ දෙමළ ජනතාවගේ බවය. නැතහොත් ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාව ජනවාර්ගික වැනසීමකට හා ජනවාර්ගික පවිත්‍රකරණයකට ලක්වී ඇති බවය. මේ නිසාම ඇතැමුන් පවතින යුද වාතාවරණය දෙමළ ජනඝාතක යුද්ධය යැයි හැඳින්වීමට තරම් සැහැසි වී ඇත.

මේ පිළිබඳ සත්‍යය කුමක් ද? දෙමළ ජාතිවාදී ප්‍රචාරක යන්ත්‍රණය මගින් කුලියට ගනු ලැබූ මාධ්‍යවේදීන් හා මාධ්‍ය විසින් නගන අසත්‍යයේ ඝෝෂාවෙන් ද, දෙමළ ජාතිවාදී මිනීමරු යන්ත්‍රයට හසුවී වාන් දමන ලේ සාගරයෙන් ද, යටපත් කිරීමට තැත් කරන කරුණු සහිත ජීවමාන සත්‍යය කුමක්ද?

පළමුවෙන් කිවයුතුව ඇත්තේ ශ්‍රී ලංකාවේ රටවල් දෙකක් අතර පවත්නා යුද්ධයක් නැති බවය. රට තුළ මරණය, බිය, සැක සහිත යුද වාතාවරණයක් පවතින අතර එයට හේතුවී ඇත්තේ ත්‍රස්තවාදී කැරලිකරුවන්ය. (ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා එය යටපත් කිරීම සඳහා ක්‍රියාකරති) ඉන් මිනිස්සු මියයති, අනාථවෙති, අංගවිකල වෙති, ආර්ථික අතින් විනාශයට පත්වෙති.

මේ පිළිබඳව ඇති මනෝ ලෝකයේ ප්‍රබන්ධ කතා කෙසේ වෙතත්, ජීවමාන

අත්දැකීම් පෙන්වා දෙන්නේ වැඩිම හානි සිදුවී ඇත්තේ දෙමළ නොවන ජනයාට බවය. විශේෂයෙන් සිංහල බෞද්ධ ජනයාට බවය.

අපි මුලින්ම සංඛ්‍යා ලේඛන ගෙන බලමු.

දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදය 70 දශකයේ සිට සිය ප්‍රහාර එල්ල කිරීම නිසා 1998 දෙසැම්බර් මාසය දක්වා මිය ගිය ශ්‍රී ලංකා ආරක්‍ෂක හමුදා සාමාජිකයන්ගේ ගණන 11,855 කි. අතුරුදහන් වී ඇති පිරිස 2408 කි. මොවුන්ගෙන් 350-400 ක් අතර පිරිසක් කොටි අත්අඩංගුවේ සිටින අතර සෙසු පිරිස මියගිය බැව් විශ්වාස කෙරේ. මේ අනුව ආසන්නයෙන් 14,000 ක් සෙබළු මියගොස් ඇත්තේය. මෙයින් 8208 ක්ම එනම් අඩකටත් වැඩි ප්‍රමාණයක් මියගොස් ඇත්තේ චන්ද්‍රිකා-ප්‍රභාකරන් ඊනියා සාමකථා 1995 අප්‍රේල් 17 දා අභාවවාචක ලෙස කෙළවරවීමෙන් පසුවය. 1983 ජූලි සිට 1998 මාර්තු දක්වා තුවාල ලැබූ, අංගවිකල වූ හෝ අතුරුදන් වූවන් ලෙස සැලකූ ආරක්‍ෂක හමුදා සාමාජික පිරිස 26,127 කි. මෙයින් තුනෙන් දෙකක් එනම් 17,492 ක් එම ඉරණමට ලක්වූයේ 1995 අප්‍රේල් 17 න් පසුවය. මෙමගින් කෙලින්ම පෙන්වා දෙන්නේ ඊනියා සාම සාකච්ඡා වල ප්‍රතිඵලයක් ලෙස රටේ දරුවන්හට ලේ හා මාංශ වලින් වන්දි ගෙවන්නට සිදුවූ බවය. 1998 දෙසැම්බර් මස වනවිට මියගිය මුළු ආරක්‍ෂක හමුදා සාමාජික පිරිස 1400 ඉක්මවන අතර තුවාල ලැබූ, අංගවිකල වූ හෝ අතුරුදන් වූ පිරිස 26,000 ක් පමණ වන බව වාර්තා වේ.

ආරක්‍ෂක හමුදා ප්‍රකාශ කරන අන්දමට හා හමුදා ප්‍රකාශකයින් පසුගිය දශක දෙක තුළ ජනමාධ්‍ය වලට නිකුත් කළ නිවේදන වලට අනුව 1998 මාර්තු දක්වා කොටි සංවිධානයේ සාමාජිකයින් 25,337 ක් මරා දමා ඇත. කොටි සංවිධානයේ ලන්ඩන් කාර්යාලය කියන්නේ මියගිය තම සාමාජිකයින් ගණන 13,335 ක් බවය (1998 නොවැම්බර් මස දක්වා) එහෙත් කොටි සංවිධානය බොහෝවිට මියයන තම සාමාජිකයින් සිවිල් වැසියන් ලෙස හුවා දක්වති. (උදාහරණයක් ලෙස 1995 දී වැලිඔය ජනපදයට එල්ල කළ මිලේච්ඡ ප්‍රහාරයේදී කොටි සාමාජිකයින් 450 ක් මියගිය විට ඔවුන් ප්‍රකාශකළේ ආරක්‍ෂක හමුදා කෝකිලායි හා මුලතිව්වල අහිංසක දෙමළ ජනයා ඝාතනය කර ඇති බවය) මේ අනුව මධ්‍යස්ථ විචාරකයින් ප්‍රකාශ කරන්නේ 1998 දෙසැම්බර් මස වන විට මියගිය කොටි සාමාජිකයන් පිරිස 16,000 ක් පමණ වන බවය.

1987 ඔක්තෝබර් 10 දා සිට මේ ගැටුමට එක්වූ ඉන්දීය හමුදාව 319 දෙනෙක් මිය ගිය බවත් 1053 ක් තුවාල ලැබූ බවත් ඉන්දීය හමුදා නායකයෙකු වන ඩිපෙන්ඩර් සින්ග් මහතා කියයි. එහෙත් මධ්‍යස්ථ විචාරකයින් පවසන්නේ ඉන්දීය සෙබළු 1187 ක් 1987 ඔක්තෝම්බර් හා 1989 නොවැම්බර් අතර මියගිය බවය.

මේ ගැටුමට මැදිව මියගිය නිරායුද සිවිල් ජනතාවද සිටී. 1984 නොවැම්බර් මස 30 වැනි දින ඩොලර් හා කෙන්ට්ෆාම් නම් වැලිඔයට සිංහල ජනපද දෙකට පහදී සිය සමූහ ඝාතන ඇරඹූ කොටි සංවිධානය 1998 අප්‍රේල් වනවිට පුද්ගලයින් හය දෙනෙකුට වැඩියෙන් එකවර මරාදැමූ එවැනි සමූහ ඝාතන වලින් සිංහලයින් 2541 ක් මරාදමා ඇත. 1978, 83, 87 ආදී වසර වල උතුරු හා නැගෙනහිර පළාත්වල සිදුකළ සිංහල විරෝධී ජනඝාතනය හා පුද්ගලයින් හය දෙනාට අඩුවෙන් සිදුකළ ඝාතන නිසා මරාදැමුනු සිංහල ජනතාවද සැලකූ විට මේ ගණන 3500 ක් පමණ වේ. 1990 අගෝස්තු 3 වැනි දින කාතන්කුඩි හි ජුම්මා හුසෙන් මුස්ලිම් පල්ලියට පහරදීමෙන් ආරම්භ වූ උතුරු හා නැගෙනහිර මුස්ලිම් පල්ලියට පහරදීමෙන් ආරම්භ වූ උතුරු හා නැගෙනහිර මුස්ලිම් සමූහ ඝාතන නිසා මේ වනවිට මුස්ලිම්වරුන් 540 ක් පමණ ඝාතනය වී ඇති බව වාර්තා වේ.

1972 ජූනි 04 දා තින්නවේලිහිදී එස්. උල්ගනාදන් ඝාතනය කිරීමෙන් ඇරඹුණු කොටි නොවන දෙමළ ජන සංහාරය මගින් මේවන විට කොටි සංවිධානය 4000 කට අධික පිරිසක් ඝාතනය කර ඇති බව වාර්තා වේ. 1987 ඔක්තෝබර් 10 දා ඇරඹුන ඉන්දීය හමුදා මෙහෙයුම් නිසා නිරායුද දෙමළ ජනයා 900 කට අධික පිරිසක්ද පසුගිය දශක දෙක තුළ ශ්‍රී ලංකා ආරක්ෂක අංශ හා කොටි සංවිධානය අතර ගැටම්වලට මැදිවී 2000 ආසන්න පිරිසක් ද මියගිය බව වාර්තාවී තිබේ. මේ අනුව කවරාකාරයෙන් හෝ මියගිය දෙමළ ජන සංඛ්‍යාව හත්දහසකට ආසන්නය.

මෙසේ පසුගිය දශක දෙක තුළ මේ ගැටුම නිසා ඍජුව මියගිය ගණන 41,000 ක් පමණ වේ. එයින් ආසන්නයෙන් 17,500 ක් සිංහලයන් වන අතර 23,000 ක් දෙමළ ජාතිකයන් වේ. මුස්ලිම්වරු 550 ක් පමණ වෙති. මේ මරණ වලින් 25,000 කට ඍජුව වගකිවයුත්තේ දෙමළ කොටි සංවිධානයයි.

එමෙන්ම උතුරේ ත්‍රස්තවාදයෙන් දකුණේ ත්‍රස්තවාදී කැරලිකාරීත්වයකට මග පෑදිණි. දෙමළ ජාතිවාදය, ඉන්දීය ආක්‍රමණය හා පලාත් සභා නොවන්නට 1987-89 වකවානුවේ ජනතා විමුක්ති පෙරමුණට දෙවැනි කැරැල්ලක් සඳහා අවශ්‍ය වූ පුළුල් දේශපාලන වාතාවරණයක් ගොඩනැගෙන්නේ නැත. එසේ නොවුයේ නම් 1987-90 වකවානුවේදී ශ්‍රී ලංකා ආරක්ෂක අංශ, ජ.වි.පෙ., එජාප, ශ්‍රීලනිප හා වාමාංශික පක්ෂවල සාමාජිකයන් ද අහිංසක සිංහල ජනතාව ද 72,000 ක් ගිලගත් භීෂණ වාතාවරණය පැන නගින්නේ නැත. උතුරේ ඊනියා සාමය පිහිටුවීමට දකුණේ දෙමළ නොවන ජීවිත 72,000 ක් බිලිගත් බව ද අමතක නොකළ යුතුය.

මේ අනුව දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදය පසුගිය වකවානුවේදී ශ්‍රී ලංකාව තුළ ලක්ෂයකට අධික ජන ජීවිත වැනසීම පිළිබඳව ඍජුව හා වක්‍රව වගකිවයුතුව තිබේ. තත්වය එසේ තිබියදී ලෙයින් ලියැවුනු ජීවමාන අත්දැකීම, අපේ ජීවතවල

අත්දැකීමක්ව තිබියදී, දෙමළ ජනයා 55,000 ක් මියගියායැයි කියන ව්‍යාජ දෙමළ ජනඝාතක යුද්ධය අහසේ තැනූ මායාවත් බව පැහැදිලිය.

මෙ අතර ශ්‍රී ලංකාවේ ඝාතන සිදුවන්නේ අවි වලින් පමණක් නොවේ. වසරකට 9000 -14000 අතර පිරිසක් ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගනිති. (මෙය 1997 දී ලක්ෂයකට 47 ක් වූ අතර එය ලෝකයේ ඉහළම ප්‍රතිශතයයි) ඒ අනුව 1983 සිට මියගිය පිරිස 150000 ක් පමණ වන අතර ඔවුන් 91% ක්ම සිංහලයන්ය. මෙයට අමතරව මත්ද්‍රව්‍ය හා මත්පැන් භාවිතය නිසා වාර්ෂිකව 10,000 කට අධික පිරිසක් වැනසෙන බවද වාර්තා වේ. නිති විරෝධී ගබ්සාවෙන් පමණක් වර්ෂයකට නූපන් දරුවන් 1,50000 ක් ඝාතනය කෙරෙති. එහෙත් ඒ කිසිදු ඝාතනයක් ගැන කෙඳිරිල්ලක්වත් ශ්‍රී ලංකාවේ ඇසෙන්නේ නැත. ඒ ඔවුන් සිංහල වීම නිසාය.

මේ අනුව ශ්‍රී ලංකාවේ දී මිනිස් ජීවිත අගයන්නේ ඔවුන්ගේ ජනවාර්ගිකත්වය අනුවය. මියගිය මිනිසා දෙමළ නොවේ නම් ඔහුගේ හෝ ඇයගේ මරණයට අගයක් නැත. එසේ හෙයින් දෙමළ ත්‍රස්තවාදයෙන් හා සියදිවි නසාගැනීමෙන් මියයන සිංහල ජනජීවිත බේරා ගැනීමට දේශපාලන විසඳුම් ගැන කථා කරන්නට කිසිවෙක් නැත. එමෙන්ම කොටි සංවිධානය විසින් නිරායුධ සිංහල, දෙමළ, මුස්ලිම්, මිනිසෙකු හෝ ගැහැණියක මරාදැමූ විට සියළු මානව හිමිකම් සංවිධාන එක්වරම නිද්‍රාවට පත්වේ. එක්සත් ජනපදයේ පශ්චාත් උපාධි අපේක්ෂකයෙකුගේ නිබන්ධනයකට අනුව ශ්‍රී ලංකාවේ සිංහලයෙකුගේ ජීවිතය මෙන් අසූ ගුණයක් දෙමළ ජීවිතය වටින්නේය. එයට හේතුව ලෙස ඔහු පෙන්වා දෙන්නේ දෙමළ ජීවිතයක් අහිමිවීම පිළිබඳව පරිහරණය කරන මාධ්‍ය ඉඩකඩ (වචන හා කාලය අනුව) එක්සත් ජනපදයේදී සිංහලයෙකුට වඩා අසූ ගුණයක් පමණ වීමය. මෙයින් පෙනීයන්නේ මාධ්‍ය ආධිපත්‍ය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රශ්නය දෙමළ ජන ඝාතක එකක් බවට විදේශ වලදී මවා පා ඇති අන්දමය. මෙසේ අවසාන වශයෙන් ශ්‍රී ලංකා රාජ්‍යයත්, සියළු දේශීය විදේශීය මානව හිමිකම් සංවිධානත්, ඊනියා මානවවාදීනුත් දෙමළ ජනජීවිත ගැන පමණක් උනන්දුවන එයිනුත් දෙමළ කොටි පිලිබඳ උනන්දුවෙන් කටයුතු කරන කොටින්ගේ සහායක බල ඇණියක් බවට පත්ව තිබේ.

පවතින දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදය නිසා තුවාල ලැබූවන් හෝ අංගවිකල වූවන් හෝ පිලිබඳ චිත්‍රය ද මෙවැනිම එකකි. මේ සඳහා කොළඹ නගරය පමණක් උදාහරණයකට ගත හැක. 1984 ජනවාරි 21 දා කොළඹ ඔබරෝයි හෝටලයේ සිදුවූ බෝම්බ පිපිරීමකින් සාමාන්‍ය වැසියන් ඉලක්ක කරගත් බෝම්බ ප්‍රහාරයන් ඇරඹිණි. ඉන් පසුව 1998 මාර්තු මස 25 වැනි දින මරදානේ දී පුපුරවා හරින ලද දෙමළ කොටින්ගේ ජාතිවාදී ප්‍රහාරයත් සමග පුපුරවා හරින ලද මුළු බෝම්බ ප්‍රමාණය විසි එකකි. එමගින් කොළඹ නගරයේ පමණක් මරා දමන ලද සංඛ්‍යාව

541 කි. තුවාල ලැබූවන්ගේ ගණන 4480 කි. මේ තුවාල ලැබූවන් අතුරෙන් 12-15 අතර ප්‍රමාණයක් සදාකාලික අන්ධභාවයට හෝ අංගවිකලත්වයට හෝ පත්ව ඇත. එහෙත් ඒ කිසිවෙකු පිලිබඳ ඔවුනගේ ජීවිත සමඟ දෙමාපිය දූදරුවන්ගේ ජීවිත කාලකන්ණි භාවයට ඇදවැටීම පිළිබඳව හෝ කඳුළු සලන, ප්‍රචාරය කරන, සහය ලබාදෙන දේශීය විදේශීය මානවවාදීන් කිසිවෙකු නැත. මේ අනුව දෙමළ ජාතිවාදී ප්‍රහාර නිසා අසරණ භාවයට පත් ලක්ෂ ගණන් ජනතාව හඬක් නැති අසරණුන් බවට පත් වී ඇත.

අනාථභාවය පිළිබඳව චිත්‍රය ද මෙයට නොදෙවෙනිය. මුලින්ම දෙමළ අනාථභාවය පිළිබඳ ප්‍රශ්නය ගෙන බලමු.

යාපන දිස්ත්‍රික්කය පිළිබඳ තත්වය පළමුව සලකා බලමු. 1981 දී යාපනයේ දෙමළ ජනගහණය 8,12,447 ක් විය. ස්වභාවික වර්ධනය අනුව 1998 දී මේ ජනගහණය දශලක්‍ෂයකට ඉතා ආසන්න වියයුතු බව කියවේ. එහෙත් රිවිරැස මෙහෙයුමෙන් වසර තුනකට පසු 1998 අගෝස්තුවේ දී යාපනය දිස්ත්‍රික්කයේ සිටි දෙමළ ජනගහනය ලක්ෂ 5 කට ආසන්නය. දෙමළ ජාතිවාදීන්ගේ සංඛ්‍යා ලේඛන වලට අනුව ඉතිරි ලක්ෂ 5 අනාථයෝ ලෙස වාසය කරති. ඔවුන්ගෙන් ලක්‍ෂ 1.5 ක් විදේශගත වී ඇති බවද තවත් ලක්‍ෂ 2 ක් ඉන්දියාවේ ද, තවත් ලක්ෂ 1.5 ක් වන්නියේ ද අනාථ කඳවුරු වල දුක්විඳින බව කියවේ.

ඉන්දියාවේ වාසය කරනවාය කියන දෙමළ අන්ධයින් ලක්‍ෂ 2.5 ක් පිලිබඳව 1984 වසරේ සිටම ඉන්දියානු මධ්‍යම රජයද, තමිල්නාඩු ප්‍රාන්තය ද බොහෝ වේදනාවෙන් ප්‍රකාශ නිකුක් කර ඇත. 1984 සිට සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම යටතේ ඉන්දීය පුරවැසිභාවය ලැබූ ඉන්දීය දෙමළ ජනයා ඉන්දියාවට ගෙන්වා ගැනීම ඉන්දියාව පමා කළේ ද මේ ලක්‍ෂ 2.5 ක දෙමළ අනාථයන් පෙන්වමිනි. එසේ කර 1989 දී සම්පූර්ණ විය යුතුව තිබූ සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාත්මක වීම වැලැක්වීමෙන් ලක්ෂ 6 කට ආසන්න ඉන්දීය දෙමළ සරණාගතයන්ට ශ්‍රී ලංකාවේ සුව පහසු කඳුකරයේ ජීවත්වීමට ඉන්දියාව ඉඩ සලස්වා ඇත. අනෙක් අතින් මේ ඉන්දියාවේ සිටිනවාය කියන ලක්‍ෂ 2 - 2.5 ක අනාථයන් පිලිබඳව ඉන්දීය සාමසාධක හමුදාවේ (IPKF) අණදෙන නිළධාරියාව සිටි ඩිපෙන්ඩර් සින්ග් මෙසේ කියා ඇත **"ශ්‍රී ලාංකික දෙමළ අනාථයින්ගේ සංඝණනයක් පැවැත් වූ විට අපට ඇත්තටම දැනගන්නට ලැබුණේ එකී සංඛ්‍යාව 60,000 ක් පමණ වන බවය. ඒ තාක් මධ්‍යම රජයෙන් සෑම වසරකම ලක්‍ෂයකට අධික පිරිසකට අනාථාධාර ලබාදෙයි. මේ මුදල් යන්නේ කොයිබට ද?"** (THE IPKF IN SRI LANKA - DEPENDER SINGH - Pg 121) 1991 දී රජිව් ගාන්ධි ඝාතනය කිරීමෙන් පසු හිටි අඩියේ ඉන්දීය බලධාරීන් තවත් සොයාගැනීමක් කළහ. එනම් ඉන්දියාවේ වෙසෙන ශ්‍රී ලංකික දෙමළ අනාථයන්

35,000 හැකි ඉක්මණින් පිටමන් කළ යුතු බවය! මෙලෙස දැන් සත්‍ය වශයෙන්ම ඉන්දියාවේ ඊනියා අනාථ කඳවුරුවල වාසය කරන දෙමළ ජන කණ්ඩායම 30,000 ක් පමණ වේ. එහෙත් ඒ 30,000 පෙන්නා වතුදෙමළ නීතිවිරොධී ඉන්දීය පුරවැසියන් ලක්‍ෂ 6 ක් ශ්‍රී ලංකාවේ සුවපහසු කඳුකරයේ ජනාවාසකරණය කර ඇත්තේ ඉන්දීය විදේශ ප්‍රතිපත්තියේ එන පංචසීලයෙන් කුමන එකකට අනුව දැයි විමසා බැලිය යුතුය.

මේ අනුව ඉන්දියාවේ වෙසෙන අනාථයන් ගණන 30,000 කි. එසේ නම් වන්නියේ කෙතරම් පිරිසක් සිටීද?

1995 අවසන් කාර්තුවේ යාපනය ත්‍රස්තවාදයෙන් මුදාගැනීමේ රිවිරැස මෙහෙයුම අරඹූ විට කොටි ත්‍රස්තවාදය එලියට පිළිතුරු දුන්නේ අතිශය ම්ලේච්ඡ ආකාරයෙනි. එනම් ලක්‍ෂ 6 පමණ වූ යාපනය නගරයේ ජනගහනය බලහත් කාරයෙන් වන්නි කැළයට දැක්කීමෙනි. මෙවැනි ම්ලේච්ඡ ක්‍රියාවක් දෙවැනි ලෝක යුද්ධයේදීවත් සිදු නොවීය. එවැන්නකට සමාන සිදුවීමකු සිදුවූයේ 1975 අප්‍රේල් මාසයේදී කාම්බෝජයේ නොම්පෙන් අග නගරයේය. කෙමරූජ් නායක පොල්පොට් නොම්පේන් නගරවාසීන් ලක්ෂ 10 කට ආසන්න පිරිසක් ගම්මානවලට දක්නාගෙන ගොස් නගරය හිස්කළේය. අදත් මුලු ලෝකයම පොල්පොට්ගේ ඒ උම්මත්තක ක්‍රියාව හෙළා දකින අතර ඒ ම්ලේච්ඡත්වය කිසිම කාම්බෝජ වැසියකු අමතක කර නැත. එහෙත් ප්‍රභාකරන් නම් ම්ලේච්ඡ උම්මත්තකයා යාපනය වැසියන් වන්නි කැළයට දැක්කූවිට ඒ පිළිබඳ කිසිවෙක් කිසිවක් නොකීහ. ද්‍රෝහී දෙමළ ජාතිවාදියෙකු වන තොණ්ඩමන් කීවේ "රාම කුමරු සමග වනගතවීමට අයොධ්‍යාවේ මිනිසුන් නාවත් ප්‍රභාකරන් සමග වනගතවීමට යාපනය දෙමළ ජනයා ආත්ම පරිත්‍යාගයෙන් ඉදිරිපත් වී ඇති බවය". එහෙත් ඒ ඊනියා ආත්ම පරිත්‍යාගශීලී ජනයා ලක්ෂ ගණනින් යාපනයට ආපසු පැමිණෙන විට ඔවුන් කීවේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නිසා වන්නියේ දෙමළ ජනයා අපා දුක් විඳින බවය. 1998 අගෝස්තු මස වව්නියාවේ ප්ලොට් සංවිධානයේ මන්ත්‍රීවරයා ඝාතනය කළ විට ප්ලෝට් සංවිධානය 1990 න් පසු වව්නියාවට පැමිණි යාපනයේ දෙමළ අනාථයන් 3000 කට නගර හැරයන ලෙස නියෝග කළේය. එයට පෙර ප්ලොට් සංවිධානයම කීවේ වවුනියාවේ පමණක් 50,000 න් දෙමළ අනාථයන් සිටින බවය. 1999 අප්‍රේල් මස මඩු දේවස්ථානය මුදාගැනීමට ශ්‍රී ලංකා ආරක්‍ෂක අංශ ක්‍රියාකරනවිට පූජකයින්ද, දෙමළ ජාතිවාදීන්ද කීවේ එහි දෙමළ අනාථයින් 40,000 ක් ඇති නිසා හමුදා මැදිහත්වීමට ඔවුන් එරෙහි වන බවය. එහෙත් 1999 ජූනි වලදී හෙළිවූයේ එහි සිටියේ අනාථයින් 7800 ක් පමණක් බවය. මේ සියල්ලෙන් පෙනෙන්නේ දෙමළ අනාථ සංඛ්‍යාව උලුප්පාලමින් දෙමළ ජාතිවාදීන් ලොවට කරන බෝරුවය. මුළු වන්නි ප්‍රදේශයටම යාපනයේ පැමිණ ආපසු නොගොස්

සිටින ගණන 1999 අගෝස්තු වෙද්දී 30,000 කට නොඅඩු බව මධ්‍යස්ථ නිරීක්ෂකයන්ගේ මතයයි. මොවුන්ගේන් සාතිශය බහුතරය සැබෑ අනාථයින් නොව යාපනයට යළිත් නොයාහැකි කොටි සංවිධානයේ සාමාජිකයන්ගේ පවුල් හා හිතවතුන්ය. ඔවුන් යාපනයට නොයන්නේ කොටින්ගේ යුද්ධයේ සහායක බල ඇණියක් වීමත් නිසාත්, යාපනයට ගියහොත් කොටි විරෝධී දෙමළ ජනයාගේ පළිගැනීමට ලක්වේය යැයි බිය නිසාත් ය.

එසේ නම් ඉන්දියාවේ හා වන්නියේ ඇත්තේ 60,000 ක් නම් යාපනයේ දෙමළ ජනතාවට සිදු වූයේ කුමක් ද?

1981 ජන සංගණණයට අනුව කොළඹ නගර සීමාවේ සමස්ත ජනගහණය 5,85,776 ක් වන අතර එයින් ශ්‍රී ලාංකික දෙමල ජනගහණය 1,30,210 වේ. 1998 ජූලි වලදී කොළඹ නගර සීමාවේ වාසය කරන දෙමළ ජනගහණය 4,85,000 පමණ වන බව වාර්තාවේ. මේ අනුව කොළඹ නගරයට පමණක් 3,00,000 කට ආසන්න යාපනයේ දෙමළ සංක්‍රමණිකයන් පැමිණ ඇති බව පෙනේ. මීගමුව, වත්තල, දෙහිවල, ගල්කිස්ස. කෝට්ටේ යන නගර සභා සීමා වලට ද 1,00,000 කට ආසන්න පිරිසක් පැමිණ ඇත. මේ අනුව 1998 අගදී කොළඹ අවට අලුතින් ජනාවාස වී ඇති දෙමළ ජනගහණය හාරලක්ෂය ඉක්මවන බවත් ඔවුන්ගෙන් බහුතරය ඊනියා දෙමළ අනාථයන් බවත් පැහැදිලිය. කොළඹ නගරය තුළ නිවාස සංවර්ධන අධිකාරිය තැනූ තට්ටු නිවාස එකක් 47,000 කින් බහුතරය මේ දෙමළ "සරණාගතයින්" විසින් මිලියන ගණන් ගෙවා මිළදී ගෙන ඇති අතර නවීන හින්දු කෝවිල් 50 ක් ද ගොඩනංවා ඇත. එසේ නම් සිංහල හමුදාවට බියේ වන්නියේ දුක්විඳිනවාය කියන දෙමළ අනාථයින් ඇත්තටම සිටින්නේ කොළඹ තට්ටු නිවාස වලය!!

මෙයට අමතරව මහනුවර නගරයට ද විසිදහසක පමණ දෙමළ සංක්‍රමණික පිරිසක් පැමිණ ඇත. මේ මගින් කොළඹ සහ මහනුවර ජනවාර්ගික සංයුතිය දෙමළ කරණයට ලක්වී ඇත. දැන් මේ සංවිධානාත්මක ලෙස සිදුකෙරෙන ජනාවාසකරනයක් බවට පත්ව ඇත. මෙය නිසැකවම දෙමළ ව්‍යාප්තවාදයයි.

තවත් ලක්ෂ 1.5 - 2 අතර යාපන දෙමළ වාසීන් පිරිසක් විදේශවල වාසය කරති. මොවුන් කිසිවෙක් ආනථයන් නොවන අතර මොවුන් දෙමළ ජාතිවාදී ප්‍රචාරක ව්‍යාපාරයට මුවාවී බටහිර හා නැගෙනහිර ආසියාතික රටවල හොඳ රැකියා සොයාගෙන පලාගිය අය වෙති.

යාපනය හැර සෙසු දිස්ත්‍රික්ක වල දෙමළ අනාථයින් ගණන 5000 - 10000 අතර වේ. මේ සියල්ලෙන් පෙනී යන්නේ දෙමළ සංක්‍රමණිකයන් හා කොළඹ ටොරොන්ටෝ, මෙල්බර්න්, සිංගප්පූරු, මදුරාසි ආදී නගරවල **"දෙමළ**

**ව්‍යාප්තවාදීන්"** ලක්ෂ කීපයක් සිටියත් සැබෑ දෙමළ අනාථයන් ගණන 40,000 කට නොවැඩි බවය. එමෙන්ම වඩා වැදගත් දෙය නම්, **ශ්‍රී ලංකාවේ කිසිම ප්‍රදේශයකින් දෙමළ ජනයා දෙමළ වීම නිසි පළවා හැර නොමැති බවය. මෙය ශ්‍රී ලංකාවේ දී සිංහල මුස්ලිම් ජනවර්ග දෙකටම සිදුවූවත් දෙමළ ජනතාව අරඹයා සිදුනොවූ ජනවාර්ගික පවිත්‍රකරණයේ ප්‍රතිඵලයය.** එහෙත් ලෝකය පුරා දෙමළ ජාතිවාදීහු දෙමළ අනාථ ප්‍රශ්නය තවමත් උස්හඬින් වයති.

දැන් අපි සිංහල අනාථ තත්ත්වය විමසා බලමු.

අපි යාපනයෙන්ම පටන් ගනිමු. සාපේක්ෂ වශයෙන් සාමකාමී වූ 1971 දී යාපනයේ සිංහල ජනගහණය 20,402 ක් හෙවත් 2.9% ක් විය. ස්වභාවික වර්ධනය අනුව අද ඒ සංඛ්‍යාව 30,000 ක් පමණ විය යුතුය. එහෙත් 1977, 78, 81, 83 ජාතිවාදී ප්‍රහාරවලින් ක්‍රමයෙන් සිංහලයන් පළවාහරිනු ලැබූ අතර යාපනයේ අන්තිම සිංහල පුරවැසියා ජීවත්වූයේ 1987 ඔක්තෝබර් 6 දාය. මෙලෙස යාපනයෙන් පමණක් සදහටම පළවා හරින ලද සිංහලයන්ගේ ගණන 30,000 කි. 1981 දී මුලතිව් දිස්ත්‍රික්කයේ 3948 ක් හෙවත් 5.9% ක් සිංහලයෝ වාසය කලහ. අද මුලතිව් වලට අයත් වැලිඔය සිංහල ජනපදයේ ගම්මාන කිහිපයක් හැර වෙනත් එකදු සිංහලයෙකු හෝ නැත. ස්වභාව වර්ධනය සමග ගත් කළ මුලතිව් වල අනාථවූ සිංහලයන් සංඛ්‍යාව 5,000ක් පමණ වේ. 1981 දී සංඛ්‍යා ලේඛන අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සිංහල ජනගහනය 86,341 වන අතර ස්වභාවික වර්ධනය අනුව එය අද ලක්ෂය ඉක්මවා යා යුතුය. විශේෂයෙන් ත්‍රිකුණාමල නගරසීමාව තුළ පලවා හරිනු ලැබු සිංහලයන් 12,000 ක් සමග ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් පමණක් 16,000 ක් පමණ සිංයලයන් පළවාහැර තිබේ. 1981 සංඛ්‍යා ලේඛණ අනුව මන්නාරම් සිංහල ජනගහනය 8,700කි. (8.14%) ස්වභා වර්ධනය අනුව මෙම ගණන අද 12,000 ක් පමණ විය යුතුය. මේ නිසා අඩුතරමින් මන්නාරමේ අනාථවී ඇති සිංයලයින් ගණන 10,000 ඉක්මවිය යුතුය. 1981 සංඛ්‍යා ලේඛන අනුව වවුනියාවේ සිංහල ජනගහණය 15,876 කි. (16.55%) ස්වභා වර්ධනය අනුව අද එය 22,000 ක් පමණ විය යුතුය. මේ අනුව අඩුම තරමින් 6,000 ක පමණ සිංහල අනාථයින් පිරිසක් වවුනියාවේ බිහිවී ඇත. 1946 දී මඩකලපුවේදී සිංහල ජනගහණය 11,850 ක් විය. 1957 ප්‍රහාර නිසා 1963 දී එය 6,580 දක්වා පහළ ගියේය. 1971 දි එය 11,281 (4.37%) ක් විය. මේ අනුව අද එය 16,000 ක් පමණ විය යුතුය. මෙ අනුව මඩකලපු දිස්ත්‍රික්කයේ සිංහල අනාථයින් ගණන 15.000 ක් විය යුතුය. මෙයට අමතරව පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව හා අම්පාර දිස්ත්‍රික්ක වලද සිංහල අනාථයෝ 6,000 - 8,000 අතර ගණනක් වාසය කරති. මේ අනුව අඩුම තරමින් **1977, 78, 81, 83, හා 84 න් පසු දෙමළ ජාතිවාදී ප්‍රහාර 128 ක් මගින් 90,000 ක් 90,000කට ආසන්න සිංහලයන් පිරිසක් අනාථ**

**භාවයට පත්කර ඇත.** මේ අනාථභාවයේ වන්නේ මොවුනට කවරදාකවත් යළිත් තම ගම්බිම් වලට යා නොහැකි ලෙස එම ගම් ජනවාර්ගික පවිත්‍රකරණයකට පත්කර තිබීමය. මොවුන්ගෙන් සාතිශය බහුතරය මහමඟ හිඟමනද දකුණේ වෙරලාසන්නයේ කුඩා පැල්පත් වලටද ගම්මානවල කුලීකරුවන් බවට ද පත්කර ඇත. මොවුන්ගේ ප්‍රශ්නය ගැන කතා කිරීමට කිසිවෙක් නැත. මන්ද සිංහල අනාථභාවය මානව හිමිකම් අභිමිවීමක් නොවන ලෙස රජයත් සෙසු සංවිධානත් සලකන නිසාය.

1983 කළු ජූලිය ගැන කතාකරන්නෝ කොළඹ බෝම්බ 21 මගින් 541 දෙනෙක් ඝාතනය කළ බව අපට නොකියති. එකසිය විසිඅට සැරයක් නිරායුධ සිංහල ගම්මානවලට පහරදී අහිංසිකයින් ඝාතනය කර තුන්දහස්පන්සියක් මරා 90,000 ක් අනාථ කළ බව නොකියති. **ඒ කිසිදු ප්‍රහාරයක දී අහිංසක දෙමළ ජනයාට ප්‍රතිප්‍රහාරදීමක් සිදුනොවූ බව ලෝකයාට නොකයති.** කළු ජූලිය ගැනම කියති. ඇසළ කළුවර ගැන නාට්‍ය තනති. 1983 ජුලියේදී මියගිය මුළු සංඛ්‍යාව 471 ක් වන අතර එයින් 311 දෙනෙක් දෙමළ ජාතිකයෝද 160 ක් සිංහල ජාතිකයෝ ද වූහ. 1983 න් පසු දෙමළ ජාතිවාදී සාමුහික ලෙස කරණ ලද සිංහල ඝාතන වලින් බක් මාසයකදී මියගිය ගණන 348 කි. වෙසක් මාසයේ දී එය 235 කි. ඇසළ මස 330 කි. නිකිණි මසදී 464 කි. එහෙත් කිසිවෙක් බක් කළුවර, වෙසක් කළුවර,හෝ නිකිණී කළුවර ගැන නොලියති. කොටි සංවිධානය අද මේ රටේ කලාව හා සාහිත්‍යයද හසුරුවන බව අපි තේරුම් ගතයුතු වෙමු.

මෙයට අමතරව 1991 ඔක්තෝබර් 11 දා සිට යාපනයෙන් හා උතුරු පළාතෙන් මුස්ලිම්වරු පළවාහරිනු ලැබූහ. මෙලෙස අනාථ වූ ප්‍රමාණය 50,000 ඉක්මවන බව කියැවේ. නැගෙනහිර මුස්ලිම් ගම්මාන වල ද 1990 න් පසු දෙමළ ජාතිවාදී ප්‍රහාර 11 ක් සිදු වී තිබේ. අවසානයේ සිදු වූයේ මුස්ලිම් අනාථයන් සිංහලයින් බහුතරයක් සහිත ප්‍රදේශවල පදිංචි කරවීමය. මුස්ලිම් අනාථ ප්‍රශ්නය කිසියම් ජාත්‍යන්තර සංවිධානයක් ප්‍රශ්න නොකලත් මුස්ලිම් අනාථයනට ඡන්ද අයිතිය ලබා දී ඇති අතර (ඔවුන්ට යාපනය සඳහා මන්ත්‍රී වරයෙක්ද සිටි) පුනරුත්ථාපන ඇමති අෂ්රෆ් විසින් සිංහල හා දෙමළ අනාථයන්ට වෙන්කර ඇති මුදල් මොවුනට වැය කරන බව චෝදනාද නැගී ඇත. පුත්තලම, අම්පාර, ආදී ප්‍රදේශවල සිදුකර ඇති මුස්ලිම් අනාථයන්ගේ ජනාවාසකරණය නිසා ද පහර වැදී අත්තේ ඒ ප්‍රදේශවල සිංහල ජනතාවය.

මෙයින් පෙනීයන්නේ ජනවාර්ගික කෝලාහල, ජාතිවාදී ප්‍රහාර, සමුහ ඝාතන, ජනවාර්ගික පවිත්‍රකරණය හා අනාථ ගැටළුව පිළිබඳව දෙමළ ජාතිවාදීන් මවා ඇත්තේ පොඩි බොරුවක් නොවන බවය. මේ අසත්‍යය දෙපළු කිරීම හා ජීවමාන අනාථ ප්‍රශ්නය කරළියට ගෙන ඒම දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදයට එරෙහි

සෑම අයකුගේම යුතුකමය. අද දෙමළ ජාතිවාදී රාජ්‍යක් බවට පත් ඇති ශ්‍රීලංකාවේ ගෞරවණීයව ජීවත් විමට අයිතිය ලබාගැනීමට දෙමළ ජාතිවාදි ත්‍රස්තවාදීන් නොවන සෙසු සියළු ජනතාවට විශේෂයෙන් හඬක් නැති සිංහල ජනතාවට සිදුව තිබේ.

දෙමළ ජාතිවාදීන්ගේ ඊළග මහා බොරුව නම්, ආරක්ෂක මෙහෙයුම නිසා දෙමළ ජනයාට විශේෂයෙන් දෙමළ කුල කතුනට හිරිහැර පිඩා සිදුවන බවය. කොටින්ම අධිකරණය ඇමතිවරයාගේ ප්‍රධානත්වයෙන් දෙමළ ජනයා පරික්ෂාවට ලක්කිරිමට සොයා බැලීම විශේෂිත මානව හිමිකම් කොමිසමක් පත්කර තිබේ. මේ පුදුම මානව හිමිකම් කොමිසම සොයා බලන්නේ දෙමළ මානව හිමිකම් පමණි. ඒ අරුම පුදුම දෙමළ මානව හිමිකම් පමණක් සොයා බලන මානව හිමිකම් කොමිසමේ නිළ නොවෙන නිර්මාතෘ වු ආචාර්ය නීලන් තිරුචෙල්වම් ද 1999 ජූලි 29 දා මහමඟ ඝාතනය කෙරෙණි. එයට එරෙහිව කොටින්ට චෝදනා කිරීමට එකදු දෙමළ මානව වාදියෙකුත් ඉදිරිපත් වුයේ නැත. අද ශ්‍රී ලංකා රාජ්‍යය දෙමළ ජාතිවාදී රාජ්‍යයක් බවට තවත් අටුවා ටීකා කුමටද?

කෙසේ වෙතත් ආරක්ෂක අංශ කිසිදු ප්‍රශ්නයකින් තොරව අත්අඩංගුවට ගැනීම හා පරික්ෂා කිරීම සිදුකරන්නේ නම්, එය සාමාකාමී ජනයාට ඇත්ත වශයෙන් හිරිහැරයකි. එහෙත් ආරක්ෂක අංශ එසේ ක්‍රියා කරන්නේ දෙමළ සමාජයක් ආවරණයක් කරගෙන බෝම්බ පුපුරවන, සිංහල, මුස්ලිම් ගම්මාන වලට කඩා වැදී අහිංසකයින් කැතිගාන, විදුලි ට්‍රාන්ස්පෝටර්, දුරකථන පද්ධති, තෙල් ටැංකී, ප්‍රවාහන සේවා වනසන දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදය නිසාය. ඉතින් මාර්ග වසාදැමීමෙන්, මාර්ග පරික්ෂාවන් හෙම්බත් වන්නේ සිංහල දෙමළ - මුස්ලිම් සියලු දෙනාය. එහෙත් ත්‍රස්තවාදය ඇත්තේ දෙමළ සමාජයේය. එසේනම් ඇත්තේන්ම සිදුව ඇත්තේ දෙමළ සමාජය තම සමාජය ජාතිවාදී රකුසාට බිලිදීමෙන් සමස්ත රටේ ජනතාව හිරිහැරයට පත් කිරීමය. දෙමළ සමාජය තමන්ව කාලකණ්ණි මිලේච්ජත්වයකට යටත් විමට ඉඩහැරීමෙන් එය අවසානයේ මුළු රටම වෙලාගැනීමට ඉඩදීමෙන් කර ඇති විනාශයට මුළුමහත් ලාංකීක සමාජයෙන්ම එය සමාව අයැදිය යුතුය. එකී විනාශයට ඔවුන්ද වගකිව යුතුය. අනෙක් අතට යාපනයේ සිංහල, මුස්ලිම් ජනයා කැතිගා පළවා හරිද්දී, එක වචනයකින් වත් එයට එරෙහිව නොවු සමාජයක් දැන් තමන්ට වන හිරිහැර ගැන කථා කරන්නේ කෙසේද? එයට ඔවුනට සදාචාරාත්මක අයිතියක් ඇත්ද? 1983 න් පසු 128 වරක් සිංහල විරෝධි ප්‍රහාර එල්ලකර ඇතැත් ඒ එකදු ප්‍රහාරයකදිවත් සිංහලයන්ගේ ප්‍රතිප්‍රහාර එල්ල නොවී තිබියදීත් දෙමළ ත්‍රස්තවායක් සහිත දෙමළ සමාජයකට තමන් ජනවාර්ගික ලෙස හිරිහැරයට පත්වී ඇතැයි කිවහැකිද? ඇත්තෙන්ම දෙමළ සමාජයේ හෘද සාක්ෂිය අද විමසිය යුත්තේ යාපනයේ සිංහල

මුස්ලිම් ජනයාට ජීවත් වීමට නොහැකිව තිබියදීත් තමන් කොළඹ, මීගමුව, මහනුවර හා ගාල්ලේ ජීවත්වන්නේ කෙසේද යන්නය. එමෙන්ම යාපනයේවත් කළ නොහැකි ලෙස සිංහල විරෝධී උද්ඝෝෂණ හා හර්තාල් පැවැත්වීමට ද කොළඹ දෙමළ සංවිධාන වලට හැකි බව 1999 ජූනි 18 දා ඔවුන් විසින් කොළඹට කැඳවූ හර්තාලයෙන් පෙනී ගියේය.

අත්අඩංගුවට පත්වන දෙමළ කුල කතුන් ගැන කථාකිරීමට ප්‍රථම දෙමළ සමාජය තමන්ගේ අසා ගත යුතු ප්‍රශ්න කීපයක් ඇත. එනම් වසර 9 - 16 දක්වා දරුවන් බාලක බාලිකාවන් තිරිසන් ලේ පිපාසිතයින් ලෙස කොටි හමුදාවේ ක්‍රියා කරණ බව දෙමළ සමාජය නොදන්නේද? දෙමළ තරුණියන් බඩේ බෝම්බ බැඳගෙන බෞද්ධ සිද්ධස්ථාන වැනසීම හා සිංහල පාසැල් දැරියන් ඝාතනය කිරීම ගැන දෙමළ සමාජය නොදන්නේද? කොටි සංවිධානයත් සෙසු දෙමළ සන්නද්ධ කල්ලිත් තම ප්‍රතිවිරුද්ධ කල්ලිවල දෙමළ කුල කතුන් දූෂණය කර කෑලි කපා මරාදැමූ බව දෙමළ සමාජය නොදන්නේද? දෙමළ කුලවත් සංස්කෘතිය ගැන කතා කිරීමට පෙර නිරායුද මහලු ගැහැණියක වන සරෝජිණි යෝගේශ්වරන් අමු අමුවේ මාරාදැමීම ගැනත් ඇයට නිදහසේ වැලලීමට පවා සිංහලයින්ගේ අගනුවරට ඒමට සිදුවූ බවත් තේරුම් නොගත්තේ ඇයි. (මිනී මරු දෙමළ ජාතිවාදය පෝශනය කිරීමට මියයන තෙක්ම සරෝජනී යෝගේශ්වරන් හා කොටීන් විසින් ඝාතනය කල ඇගේ සැමියා වන වෙට්ටුවේලු යෝගේශ්වරන් ක්‍රියා කළ බවද සඳහන් කළ යුතුය)

හිට්ලර් බිහිකිරීම වෙනුවෙන් ජර්මන් සමාජය වන්දි ගෙව්වා සේ ප්‍රභාකරන් බිහිකිරීම ගැන දෙමළ සමාජයද වන්දි ගෙවිය යුතු වේ. ආරක්‍ෂක අංශවල නීත්‍යානුකූල පරීක්ෂා කිරීම පිළිබඳව දොඩවන දෙමළ සමාජයේ විවිධ සංවිධාන කල්පනා කළ යුතුව ඇත්තේ සිංහල හා මුස්ලිම් සමාජයද අවිගත් ජාතිවාදී කල්ලි බිහිකරගත හොත් තත්වය කුමක් වේද යන්න ය. දෙමළ ජන සමාජයේ වගකීම් විරහිත ක්‍රියාවන් යොමුවන්නේ සමස්ථ සමාජයම එකිනෙකාට එරෙහිව අවිගත් අරාජික තත්වයකට යොමු කිරීමටය. ඒ බිහිසුනු තත්වය මගහරවා ගැනීමට නම් කවර වන්දියක් හෝ දී දෙමළ ජාතිවාදිය වනසා ලිය යුතුය.

ඉන්දියාවේ මධ්‍ය ආණ්ඩුවට භාරතීය ජනතා පක්‍ෂය පැමිණීමත් සමඟ ශ්‍රී ලංකාවේ ඊනියා දෙමළ සංවිධාන 39 ක් ඉන්දීය අගමැති වරයා අමතමින් ශ්‍රී ලංකාවේ දෙමළ හින්දූන්ට ආගම ඇදහීමට නොහැකිවී ඇතැයි ප්‍රකාශ කලහ. ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධයන් විසින් හින්දු කෝවිල් 3000 විනාශ කර ඇති බවට චොදන එල්ල කෙරිනි. ඒ ලිපිය නිකුත්වී සති තුනකට පසු තමිල්නාඩුවේ සෙල්වි ජයලලිතා ජයරාම් ප්‍රකාශ කලේ හින්දු කෝවිල් 1800 ක් විනාශ කර ඇති බවය. (සතිතුනක් ඇතුළත හින්දු කෝවිල් 1200 ක් අතුරු දහන් වී ඇත)

ශ්‍රී ලංකාවේ මෙම පෙත්සමට අත්සන් තබා ඇති එක් සංවිධානයක් වන්නේ හින්දු මහ සභාවය. මෙය පිහිටා ඇත්තේ කොටුවේ සම්බුද්ධා ලෝක විහාරයට මීටර් 100 ක් තරම් නුදුරිනි. තවත් මීටර් 100 ක් නුදුරින් කොටුවේ හින්දු කෝවිල ඉහල අහසේ දැකගත හැක. දෙමළ කොටි සංවිධානය ගලදාරී ප්‍රහාරය එල්ලකරන විට බෞද්ධයන්ට වැදගත් පොහොය දිනක කොටුවේ සම්බුද්ධාලෝක විහාරයට පහර දුන් අතර සිල්සමාදන් වී සිටින උපාසික උපාසිකාවන්ගේ ජීවත වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ සංඝනායක විතාරන්දෙණියේ චන්ද්‍රජෝති හිමිපාණන් වහන්සේ මෙහිදී කොටින් අභිමුව අභීතව දිවිදුන් සේක. බෞද්ධ සිද්ධස්ථානයක මෙතරම් නින්දිත ලෙස බෞද්ධ විරෝධී ප්‍රහාරයක් එල්වී තිබියදී හින්දු මහා සභා ගොඩනැගිල්ලට හෝ අසල යෝධ හින්දු කෝවිලට ප්‍රතිප්‍රහාරයක් එල්ල නොවීය. ලෝක බෞද්ධයන්ගේ මුදුන්මල්කඩ බඳු දළදා මාලිගයට දෙමළ ජාතිවාදීන් 1998 ජනවාරි 25 දා බෝම්බ ප්‍රහාරයක් දී වනසා දමන විට අවට පිහිටි එකදු හින්දු කෝවිලකට හෝ තර්ජනයක් එල්ල නොවීය. පසුගිය විසි වසර තුළ උතුරින් හා නැගෙනහිරින් බෞද්ධයින් 85000 ක් පලවා හරිද්දී, බෞද්ධ සිද්ධස්ථාන 261 ක් වනසාදමද් දී, මේ එකදු හින්දු කෝවිලකට හෝ හානි නොවීය. ඉන්දියාවේ හින්දු කෝවිලකට මෙවැනි ප්‍රහාරයක් එල්ලවිනි නම්, මිනිසුන් මියයනු ඇත්තේ දශලක්ෂ ගණනින් බව කිවයුතුය. ශ්‍රී ලාංකික වෙසෙසින්ම බෞද්ධ එකක් වන අතර ඒ නිසාම ඉවසීමකින්ම යුතුය. විශේෂයෙන්ම පසුගිය විසි වසර තුළ එය හින්දුන් සම්බන්ධයෙන් ඉතා ඉවසිලිවන්තව කටයුතු කර තිබේ. එහෙත් ඉන්දියාවේ අන්තවාදී හින්දු මූලධර්ම වාදී පිරිසකට මුවාවී. හින්දු මහ සභාව, යාපනයේ හින්දු කෝවිල් භාරකරුවන්ගේ සංගමය, හා හින්දු පූජක සංසදය (එන්. විජයසිංහම්, සචිත්තනාදන් හා කුමාර් පොන්නම්බලම් වැනි කොටි සංවිධානයේ බළල් අත් මෙය මෙහෙයවයි) වැනි සංවිධාන හින්දු මූලධර්ම වාදය පතුරවයි. මොවුහු ඉතා සූක්ෂම ලෙස ඉන්දියානු අරමුදල් හා කොටි සංවිධානයේ අරමුදල් වලින් කොළඹ හා තදාසන්න ප්‍රදේශවල මහනුවර, නුවරඑලිය, බදුල්ල වැනි ප්‍රදේශ වලින් දේපොළ මිලදී ගෙන නවීන හින්දු කෝවිල් ගොඩනගමින් සිටිති. වැල්ලවත්ත කදිරේශන් කෝවිල ලහිලහියේ හින්දු සංස්කෘතික සංකීර්ණයක් බවට පත්කරමින් පවතින අතර නුවරඑලියේ සිද්දෙයි අම්මාන් (සීතා දෙවොල) හා හනුමාන් දෙවොල ලෙස අක්කර 100 ක පමණ පැතිරී යන හින්දු කෝවිල් ඉදිකරගෙන යනු ලැබේ. හින්දු මහ සභාව කොළඹ කොටුවෙන් තට්ටු හතක යෝධ ගොඩනැගිල්ලක් මිලදී ගෙන ඇති අතර මට්ටක්කුලිය, පෑලියගොඩ, වත්තල, මීගමුව, වැල්ලවත්ත, කිරුළපන හා දෙහිවල ප්‍රදේශවල වේගයෙන් සිදුවන දෙමළ ජනපදකරනය අතර අනවසර ඉඩම් අල්ලාගැනීම හා කෝවිල් ගොඩනැගීම ලහි ලහියේ සිදුකරගෙන යනු ලැබේ. මුතුරාජ වෙල ප්‍රදේශයේ රාජ්‍ය අනුග්‍රහයෙන් රු කෝටි 600 ක් වැයකරන යෝධ කෝවිල්

සංකීර්ණයක් ඉදිකිරීමට කටයුතු කරගෙන යයි. කොළඹ අවට පමණක් මෙවැනි කෝවිල් 50 ක් ගොඩනගා ඇත ඒවායේ සේවයට ඉන්දීය පූජකයින් 50 දෙනෙකු ගෙනවිත් ඇත. කොළඹ දෙමළ ව්‍යාප්තවාදයට ඉන්දීය අන්තවාදී හින්දු මූලධර්මවාදීන් ද එක්වී ඇති බව පැහැදිලිය 1998 - 99 වසරවල කොළඹ නගරය පුරා ගමන්කළ වේල් පෙරහැරවල් ගණන හා තේරු උත්සව ගණන සලකා බැලූ විට දෙමළ ව්‍යාප්තවාදයේ තරම වටහා ගත හැක. අද අනුරාධපුර අටමස්ථාන පවා කොටි ප්‍රහාරයෙන් පසු දැඩි ආරක්ෂක තත්වයන්ට යටත්ව ඇති අතර නිදහසේ බෞද්ධ පෙරහැර කිරීමට හෝ බෞද්ධයන්ට වන්දනා මාන කිරීමට නොහැක. යාපනය නල්ලූර් කන්දසාමි කෝවිලේ සිට කොළඹ කදිරේශන් කෝවිල දක්වා, නුවරඑලියේ සීතා දෙවොල් සිට ගාල්ලේ කිත්තන්ගෙයි කෝවිල දක්වා හින්දු ජනයා භුක්ති විඳින ආගමික නිදහස බෞද්ධයන්ට නැත. කොවිල් 1800 ක් බිඳ දැමූවායැයි කියන කථාව ශ්‍රී ලංකාවේ සිදුවන බෞද්ධ සංහාරය වසා ගැනීම පිණිස හින්දු කුමන්ත්‍රණකාරීන් විසින් ගොඩනැගූ ප්‍රබන්ධයක් වන අතර ශ්‍රී ලංකාවේ බෞද්ධයින් වසර 2300 ක් තිස්සේ හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි මූලධර්මවාදීන් අතලොස්සකගේ අසිපත් හා තුවක්කුවලින් තම ආගම රැකගත් අතර තවත් පන්දහසක් කල් එසේ කරනු ඇති බව හින්දු මූලධර්මවාදය දැනගත යුතුය.

අනෙක් අතට කොටින්ගේ සයනයිඩ් සංස්කෘතියටද දැන් හින්දු කියවීමක් ලබාදීමේ උත්සාහයක් ඇත. මහාභාරතයේදී ක්‍රිෂ්ණා අර්ජුන්ට පැහැදිලි කළ ලෙස ජීවිතයක් මෙන්ම මරණයක්ද, පව් හෝ පින් කියා දෙයක් නැත. ඇත්තේ නොවෙනස් ආත්මයන් පමණි. මේ නිසා ස්වයං ඝාතන මෙන්ම මිනිස් ඝාතන වලින්ද ආත්මයන්ට හානියක් සිදුනොවේ. පාපයක් සිදුනොවේ. ආදී ලෙස කොටින්ගේ ඇමතු ඝාතන වලට ආගමික රැකවරණයක් දීමට මූලධර්මවාදීන් දැන් ක්‍රියාකරගෙන යයි.

අනෙක් අතින් 1987 සිට ස්වයංඝාතන සිදුකරගත් 148 ක් වූ (1999 අගෝස්තු) කොටින්ගේ උමතු කළුකොටි ක්‍රියා වීරත්වයට නැංවීමද සයනයිඩ් කරල කොටි නිර්භයත්වය බව පෙන්වීමටද උත්සාහ දැරේ. වාර්තා වී ඇති අන්දමට 1993 සිට 1999 අගෝස්තු දක්වා 1065 ක් සයනයිඩ් බැඳගත් කොටි සාමාජිකයන් ආරක්ෂක අංශවලට භාර වී ඇත. මෙය කොටි බලකායෙන් 20% කි. මෙයින් පෙනීයන්නේ ඊනියා සයනයිඩ් වීරත්වය ගැනද පතුරුවා ඇත්තේ පොඩි බොරුවක් නොවන බවය.

ලෝකය පුරා දෙමළ මිථ්‍යාව වැපිරීමට කතෝලික හා ක්‍රිස්තියානි නිකායන් වල පූජකයින් කිහිපදෙනෙක් ද ඉදිරිපත්වී සිටිති. 1984 නොවැම්බර් 30 දා නායාරූ

කොකිලායි (කැකුලාව) දීවර ගම්මාන වල සිංහල කතෝලිකයින් පෙතිගසා දමා ඔවුන්ගේ කුඩා කතෝලික පල්ලි ගිනිබත් කළ දෙමළ ජාතිවාදී මිනීමරුවන් කියන්නේ දෙමළ කතෝලිකයන් හා ක්‍රිස්තියානීන් මර්ධනයට ලක්ව ඇති බවය. 1983 දී උතුරේ කතෝලික දියෝකීසයන් රටේ සෙසු දියෝකීසයන් සමඟ සබඳතා අහෝසි කර ඊළාම් සභාවක් පිහිටුවා ගැනීමට කටයුතු කළ සුප්‍රකට ජාතිවාදියෙකු වන තෝමස් සෞන්දනායගම් හා ජෝසප් රායප්පු පියනමවල් අද ද යාපනයට හා මන්නාරමට වී සිදුකරන්නේ තම ජාතිවාදී උම්මත්තකභාවය ප්‍රකට කිරීමය. එම්මානුවෙල්, සිංගරායර්, සිංහරාසා වැනි පූජකවරු. කෙලින්ම කොටි සංවිධානයේ ප්‍රචණ්ඩත්වයට හවුල් වූවෝය. පසුගිය දශකය තුළ චන්ද්‍රා ප්‍රනාන්දු පියනම (සභාපති පුරවැසි කමිටුව මඩකළපුව 1988. 06. 06 දින ඝාතනය කෙරුණි) ඇතුළු කතෝලික සාහෝදර පියනමවල් තිදෙනෙකු කොටි සංවිධානය ඝාතනය කර ඇති නමුත් කිසිදු කතෝලික නිළ ආයතනයක් මේ ඝාතන හෙළා දැක නැත. මඩු පල්ලිය වන්දනා කිරීමට සිංහල කතෝලිකයන්ට ඇති අයිතිය උදුරාගෙන ඇති අතර මඩු ප්‍රදේශය ආරක්‍ෂක හමුදා අතට අත්පත්වීම ගැන මන්නාරම රදගුරු ඇතුළු පිරිස මහා ඝෝෂාවක් 1999 අප්‍රේල් මස සිට ගෙන ගියෝය. ජූනි 02 වැනිදා කැකුලාව සිංහල කතෝලික ධීවරයන්ට ප්‍රහාර එල්ලකර පළවාහරිනු ලැබූ අතර මඩු දෙමළ අනාථයින් ගැන වැලපෙන කිසිවෙක් ඒ ගැන කිසිවක් කීවේ නැත. එමෙන්ම ක්‍රිස්තියානි කල්ලි ගණනාවක්ම අසරණ දෙමළ හින්දූන් ඉලක්ක කරගෙන "ක්‍රිස්තියානීකරණය" සිදුකරගෙන යනු ලබන අතර නොර්වේ, ස්වීඩන්, කැනඩාව, එංගලන්තය, එක්සත් ජනපදය වැනි ක්‍රිස්තියානි මූලධර්මවාදී රටවල රාජ්‍ය නොවන සංවිධාන මේ පිටුපස වෙයි. සිංහල කතෝලිකයන් හා සිංහල ක්‍රිස්තියානීන් මර්ධනය කිරීමට කටයුතු කරන මේ මූලධර්මවාදී බලවේග අද කරන ව්‍යසනය නිසා විටෙක මේ රට තවත් සෝමාලියාවක් බවට පත්වීමට ඉඩ ඇත.

දෙමළ ජාතිවාදීන් විසින් දියත්කර ඇති යුද්ධයට මුහුණදීම සඳහා ශ්‍රී ලංකා ආර්ථකය ශක්තිමත් නොවන බවද. රටේ ජාතික ආදායමෙන් වැඩි කොටසක් යුද්ධයට වැයවෙන නිසා වෙනත් සහනාධාර හෝ සංවර්ධන කටයුතු කළ නොහැකි බවද රජය ප්‍රකාශ කරයි. මේ අතර කොටි සංවිධානයේ බළල් අණ්ඩක් වන ජාත්‍යන්තර ඇලර්ට් සංවිධානය හිටපු ජනාධිපති ලේකම් බ්‍රැඩ්මන් වීරකෝන්, එක්සත් ජාතක පක්ෂයේ උපදේශක චරිත රත්වත්ත, හිටපු ගුවන් හමුදාපති හැරී ගුණතිලක ආදීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් ශ්‍රී ලංකාවේ යුද වියදම් පිළිබඳව අධ්‍යයනයක නියැලෙන බවද වාර්තාවී තිබේ.

1997 වර්ෂයේ දී රජයට යුද කටයුතු සඳහා රුපියල් කෝටි 41,527 ක් වැය කළේය. 1994 ට පෙර කිසිදු වසරක යුද වියදම කෝටි 2000 ඉක්මවා ගියේ නැත. වන්නියේ මෙහෙයුම් අවසන් වූ විට මේ යුද වියදම යළිත් රුපියල් කෝටි

2000 ඉක්මවා නොයන බව ආරක්‍ෂක අංශ කියයි. අද ශ්‍රී ලංකාවේ ආරක්‍ෂක අංශවල ඍජු රැකියාවල 260000 ක් පමණ සේවය කරන අතර ඔවුන් ආශ්‍රිතව තවත් ලක්‍ෂ 7 ක් පමණ වක්‍ර රැකියාවල නිරතව සිටිති. අනිත් අතට ශ්‍රී ලංකාවේ දළ ජාතික නිශ්පාදනය වාර්ෂිකව රුපියල් කෝටි ලක්ෂයක් පමණ වේ. (1998 දී එය රුපියල් කෝටි 105000 ක් පමණ විය) මේ සියල්ලෙන් එළඹිය හැකි නිගමන කිහිපයකි.

රජය අයවැය ලේඛනයට අනුව රාජ්‍ය ආරක්ෂක පිරිවැය 15% ක් පමණ වුවත් දළ ජාතික නිෂ්පාදිතය අනුව එය 5 කට අඩු මට්ටමක පවතී. මේ අනුව මේ වියදම රටේ ආර්ථික අර්බුදයක් ඇතිකිරීමට තරම් බලවත් තත්වයක නොපවතී. කොටි සංවිධානයද මත්ද්‍රව්‍ය ජාවාරම් වලින්, විදේශ ආධාරවලින්, දෙමළ ජනයා ගේ කප්පම්වලින් වාර්ෂිකව රුපියල් කෝටි 600 ක් පමණ උපයන බවද වාර්තා වී ඇති නිසා ශ්‍රී ලංකාවටද සිය ආරක්‍ෂක වියදම් සැලකියයුතු ප්‍රමාණයක දිගටම රඳවා ගැනීමට සිදුවේ. අනෙක් අතට ආරක්‍ෂක වියදම් වලින් තුනෙන් දෙකකටත් වැඩි ප්‍රමාණයක් රජය උපයාගන්නේ ජාතික ආරක්‍ෂක බද්දෙනි. මේ නිසා රජයට මේ යුද වියදම් පියවා ගැනීම පිළිබඳව විශාල අර්බුදකාරී වගකීමක් නොපවතී. අනෙක් අතට වහාම මෙහෙයුම් නතර කළත් ආරක්‍ෂක අංශවල 260000 ක් නඩත්තු කිරීම සඳහා අනිවාර්යයෙන්ම රුපියල් කෝටි 2000 කට ආසන්න ප්‍රමාණයක් වැයකළ යුතුවේ. අනෙක් අතින් සාමයෝජනා ලෙස ඉදිරිපත්වී ඇති පළාත් සභා සඳහා ද රජය රුපියල් කෝටි 2200 ක් වැයකරයි. ඒ අර්ථයෙන් ඊනියා සාමය යුද්ධයට වඩා වියදම් සහිත එකකි. තවද උද්ධමනය නිසා මුදල් වල අගය පිරිහීම හේතුකොටගෙන මේ වියදම්වල සැබෑ වටිනාකම වඩා අඩු අගයකි. උදාහරණයක් ලෙස 1977 මිළ ගණන් වලට අනුව 1997 රුපියල් කෝටි 4153 නේ හුවමාරු වටිනාකම සැබෑ ලෙසම රුපියල් කෝටි 456 කි. (නිශ්චිත සංඛ්‍යා ලේඛන සඳහා ඇමුණුම බලන්න)

අනෙක් අතින් ශ්‍රී ලංකා රජය වෙනත් ක්‍ෂෙත්‍රවලින් ජාතියට අහිමිකර ඇති ධනය රුපියල් කෝටි ලක්‍ෂ ගණනකි. උදාහරණයක් ලෙස රේගුව තුළ පමණක් රජයට හිතවත් ව්‍යාපාරිකයන් සිදුකරන වංචා නිසා වාර්ෂිකව රුපිල් කෝටි 5000 ක් පමණ ශ්‍රී ලංකා රජයට අහිමිවන බව වාර්තා වේ. මෙය සැකයකින් තොරව මේ තත්වයෙන්ම යුද වියදම් පවත්වා ගැනීමට තරම් ප්‍රමාණවත් මුදලකි. අනෙක් අතින් ජාතියේ ධනයෙන් ගොඩනගාගත් ශ්‍රී ලංකා ටෙලිකොම්, ලංකා වානේ සංස්ථාව, එයාර් ලංකා ගුවන් සේවය, රාජ්‍ය වතු පද්ධතිය ආදිය පුද්ගලීකරනයෙන් පමණක් රිපියල් කෝටි 20,000 ක පමණ පාඩුවක් සිදුව ඇති බව ගණන් බනා ඇත. අනාගතයේදී පැවරීමට යන එප්පාවවල පොස්පේට් නිධිය, කොළඹ වරාය ආදියෙන් ජාතියට සිදුවන පාඩුව තරමින් රුපියල් කෝටි ලක්‍ෂයකි. මේ

සියල්ලෙන්ම පෙනීයන්නේ දේශපාලකයන් සිය නොහැකියාවට පිළිතුරක් ලෙස යුද වියදම් පෙන්නුව ද ඔවින් විසින් කාබාසිනියා කරන ජාතික ධනය එමෙන් සියගුණයකටත් වැඩි බවය.

කෙසේවෙතත් ශ්‍රී ලංකා ආරක්ෂක අංශවලට වැය කරන මුදල් කාර්යක්ෂමව වැයවෙන්නේද යන්න පිළිබඳව ද ප්‍රශ්න ඇත. 1997 වසරේ දී යුද්ධයට වැයකළ රුපියල් කෝටි 4153 හි නියම වටිනාකම 1977 ට අනුව රුපියල් කෝටි 456 ක් වුවත් එමගින් තවමත් එක් මහවැලි ජලාශයක් තැනීමට ඉඩ තිබිණි. මෙයින් පෙනෙන්නේ ත්‍රස්තවාදය මැඩලීමට ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක හා ඒ දෙකේ නායකත්වය හෙබවූ ප්‍රභූ පවුල් දෙකක සාමාජිකයින් අපොහොසත්වීම නිසා වන්දි ගෙවීමට සිදුව ඇත්තේ සමස්ත ජනතාවට බවය. 1997 වසර තුළ කොටි සංවිධානයේ 1300 ක් මරාදැමූ බව අරක්ෂක අංශ කියන විට තම සාමාජිකයින් 1065 ක් මියගිය බව කොටි සංවිධානය කියයි. මේ අනුව රුපියල් කෝටි 4153 වැයකර සිදුකර ඇත්තේ කොටි සංවිධානයේ දහසකට ආසන්න පිරිසක් මරාදැමීමය. එනම් එක් කොටි සාමාජිකයෙක් මරාදැමීම සඳහා රුපියල් ලක්ෂ 400 ක් පමණ වැයවෙන බවය.

මෙය කිසිසේත්ම පිළිගත හැකි තත්වයක් නොවේ. සිම්බාබ්වේ රට සමඟ කළ මෝටාර් ගනුදෙනුවේ දී ද, යුක්‍රේනය සමඟ කළ ප්‍රහාරක යානා ගනුදෙනුවේදී ද, පමණක් සිදුව ඇති වංචා සලකන විට ත්‍රස්තවාදය මේසා බලවත් ව්‍යසනයක් බවට පත්කළ දේශපාලන ප්‍රභූන් අවි ජාවාරම ජයටම සිදුකරගෙන යන බව පෙනීයයි. ජයසිකුරු මෙහෙයුමේ නිරතවූ දහසකට ආසන්න සෙබලුන්ගේ ඝාතන වලට වගකිව යුතු සිම්බාබ්වේ මෝටාර් ගනුදෙනුවේ සැකකරු වූ මයිල්වාගනම් රුපියල් 25000 ක අප මත නිදහස් වීම අවි ජාවරම් කරුවන්ගේ දේශපාලන බලය පෙන්නුම් කළ එක් සිදුවීමක් පමණි. සෙබළුන්ගේ ජීවිතවලින්, ජාතියේ සම්පත්වලින් මේ මහා මංකොල්ලය කරගෙන යාමට ජාතිය තවත් ඉඩදිය යුතු නැත.

අනෙක් අතින් කොටි තේ ආර්ථිකයට, අයෝජන වලට, සංචාරක ව්‍යාපාරයට, බලශක්ති නිෂ්පාදනයට, බැංකු පද්ධතියට, පරිගණක ජාලයට, දුරකථන පද්ධතිවලට දිගින් දිගටම ප්‍රහාර එල්ල කරති. කොටි 2000 කට අධික පුදලක් ප්‍රධාන බැංකු දෙකට දේශපාලකයින්ගේ හිතවත් ව්‍යාපාරිකයන් වංචා කිරීම නිසා ප්‍රධාන බැංකු දෙකම පවතින්නේ අස්ථාවර තත්වයකය. නැගෙනහිර ආසියාවේ ආර්ථික අර්බුදය ශ්‍රී ලංකාවට වාසිදායක ලෙස බැලපෑවත් ජපානයේ, රුසියාවේ, හා ඉන්දියාවේ ආර්ථික බිඳවැඩීම් ශ්‍රී ලංකාවට තදින්ම බලපානු ඇත වසර විස්සක් පුරා බටහිර මූල්‍ය ආයතන විසින් නටවනු ලබන ශ්‍රී ලංකා ආර්ථිකය ඒ නිසාම අර්බුදයක් කරා ඇදීයාමට නියමිතවව ඇත.

මේ සියල්ලෙන් පෙනී යන්නේ ත්‍රස්තවාදී ගැටුම තීරක ලෙස ආර්ථිකයට බල නොපෑවත් ශ්‍රී ලංකා ආර්ථිකය වෙතත් හේතු මත බිඳවැටීමේ ඉඩක් ඇති බවය. මේ නිසා දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදය තීරක ලෙස මැඩලීමක් වහාම සිදු නොවුහොත් මුළු රටම මහත අන්ධකාරයකට ඇදවැටීමට නියමිතය. උතුරු හා නැගෙනහිරට වඩා දකුණේ අස්ථාවරත්වය ආර්ථිකයට තීරණාත්මක ලෙස බලපායි. උදාහරණයක් ලෙස 1978 දී 8% ක් වූ ආර්ථික වර්ධන වේගය උතුරේ කැරලිකාරීත්වය තුළත් 1985 දී 5.8% ක් විය. එහෙත් දකුණ අස්ථාවර වීම නිසා එය 1987 දී 1.8% ක් විය. මෙය ආර්ථිකයේ ස්ථාවරත්වය ගැන සැලකිලිමත්වන ඕනෑම අයෙකු විසින් අවධාරණය කරගත යුතු කරුණකි.

දූෂිත දේශපාලකයන්ගේ අදූරදර්ශී ආර්ථික ප්‍රතිපත්ති නිසා කොටි ත්‍රස්තවාදීන්ගේ මූලික ඉලක්කයක් වූ ශ්‍රී ලංකාව ආර්ථික බිඳවැටීටවිම ඉබේම සාර්ථක වීමට ඉඩ තිබේ. එවිට කොටින්ට එරෙහිව යුද පෙරමුණ ද ඉබේම දුර්වල වී 1987 - 89 වැනි අරාජික යුගයක් ඇතිවීමට ඉඩ ඇත. වහා කොටි පැරදවීම සඳහා ක්‍රියා කළ යුත්තේ ඒ නිසාය.

# ත්‍රස්තවාදයේ මනෝකාය දෙමළ ජාතිවාදයයි.

1998 මැයි මස දිනක එංගලන්තයේ සිටිනා ශ්‍රී ලංකිකයෝ බ්‍රිතාන්‍ය අගමැතිවරයාගේ කොටි සංවිධානය තහනම් කරන ලෙස ඉල්ලා සිටිමින් පෙළපාලියක් ගමන් ගත්හ. ඒ පෙළපාළියේ ප්‍රදර්ශනය වූ එක් බැනරයක ලියා තිබුණේ 'දෙමළ ත්‍රස්තවාදය පරදමු' යන්නය. මෙය රජයේ පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය වලින් ප්‍රචාරයවූ අතර දෙමළ ජාතිවාදී පක්ෂ, සංවිධානය හා රාජ්‍ය නොවන සංවිධාන එහි සඳහන් "දෙමළ ත්‍රස්තවාදය" යන වචනයට එරෙහිව මහා ඝෝෂාවක් ගෙන ගියහ. ශ්‍රී ලංකාවේ පවතින්නේ ත්‍රස්තවාදයක්ද යන්න පිළිබඳ බෝහෝ වාද විවාද දකුණේ ඇතිවිය.

ත්‍රස්තවාදී ක්‍රියා කරන්නේ කොටි සංවිධානය බව අද පැහැදිලිය. මේ නිසා ත්‍රස්තවාදයට පිවිසුණු හිටපු සටන්කාමී ලෙස පෙනී සිටින ප්ලොට්, ඊ.පී.ඩී.පී. ටෙලෝ, ඊ.පී.ආර්.එෆ්., ඊරෝස් වැනි කල්ලිද, ඊනියා මධ්‍යස්ථවාදින් ලෙස පෙනී සිටිනා දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ ද සමහර විටෙක දෙමළ ජාතිවාදී කරුමය ප්‍රභාකරන්ට දමා දෙමළ ජාතික උරුමය තමන් සතුකර ගැනීමට තැත් කරති. රාජ්‍ය මාධ්‍ය ද අතොරක් නැතිව කියන්නේ දෙමළ ජාතික අභිලාෂයන් හා කොටි ත්‍රස්තවාදය දෙකක් බවය.

පළමුව කිවයුත්තේ ඉහත සඳහන් කළ ඊනියා හිටපු සටන්කාමීන් හෝ ඊනියා මධ්‍යසථාවාදීන් අද කොළඹට වී යාපනය ගැන කථා කරන්නේ ඔවුන්ගේ හොඳහිත හෝ ප්‍රජාත්‍රන්තවාදයට ඇති කැපවීම නිසා නොව කොටි සංවිධානය ඔවුන්ව යුදමය ලෙස මර්ධනය කර ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට එළවා ඇති නිසාය. 1999 ජුලි මස සිට කොටි ඒ සියළු ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ හා සංවිධාන තහනම් කළහ. එහෙත් තවමත් ඔවුහු සියලු දෙනාම දැඩි සිංහල විරෝධී, මිලේච්ඡ අදහස් ඇති ලේ පිපාසිත ත්‍රස්තවාදී මනසිකන් යුතු අයම වෙති. කොටින්ම මොවුන්ගේ රූපකාය ප්‍රජාතන්ත්‍රවාදී සළුපිළි දැරුවන් මනෝකාය දෙමළ ජාතිවාදී ප්‍රභාකරන් ත්‍රස්තයාගේ කිසිසේත් වෙනස් නොවේ.

අනෙක් අතින් කලකට පෙර දෙමළ දුක් ගැනවිලි ලෙස ප්‍රකාශ කළ එහෙත් කිසියම් සාධකයක් පෙන්නාලීමට අපොහොසත් වීම නිසා දැන් 'දෙමළ අභිලාෂයන්' ලෙස වෙනස් කර ඇති ඊනියා දෙමළ ජාතික අයිතීන් දෙමළ සමාජය තුළ ඇත්තටම පවතීද යන්න සොයා බැලිය යුතුවේ. රිවිරැස මෙහෙයුමෙන් පසු

යාපනයේ දෙමළ සාමාන්‍ය ජනයා ඉතා කැමැත්තෙන් හා කීකරුව ශ්‍රී ලංකා යුද හමුදාව සමග වාසය කරති. දෙමළ ජනයා ශ්‍රී ලංකා හමුදා සමග සිටින්නේ සැඟවිගිය කෝපයකින් පිපිරෙමිනි. ඔවුන්ගේ වෛරය කොයියම්ම මොහොතක හෝ පුපුරවාගොස් දහස් ගණන් විදිවලට බැස නැගී සිටින තත්වයක් උදාවන බව බොහෝ කලක සිට දෙමළ ජාතිවාදීහු පවසති. එහෙත් වසර තුනක් පුරා එවැන්නක් සිදුවී නැත. එපමණක් නොව අතීතයේදී පවා මේ ඊනියා නැගීටිම් පිටුපස තිබී ඇත්තේ දෙමළ ජාතිවාදී තුවක්කු බව දැන් සක් සුදක් සේ පැහැදිලිය. ඊනියා දෙමළ අභිලාෂයන්, ඊනියා දෙමළ ජාතික අයිතීන් වනාහී දෙමළ ජාතිවාදී ව්‍යාපාර හා සංවිධානවල අතලොස්සක් විසින් කුලවාදී පීඩනයෙන්, බලහත් කාරයෙන් දෙමළ සමාජය මත “පටවන” ලද බොරුවක් බව පැහැදිලිය.

ඒ නිසා මේ රටේ ක්‍රියාත්මක වන ප්‍රචණ්ඩ දේශපාලන දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදය මිස අන් කිසිවක් නොවේ. කොටි ත්‍රස්තවාදයේ මතවාදය හා අරමුණු දෙමළ ජාතිවාදය ය.

දෙමළ ජනසමාජය කීතුකීතුකර උම්මත්තක දෙමළ ජාතිවාදය එකී සමාජය මත “බලෙන් පැටවූ” ආකාරයත්, මිනීමරු ත්‍රස්තවාදයක් කරා දෙමළ සමාජය දක්කාගෙන ගිය ආකාරයත් දැන ගැනිමට අතීතය පිරික්සා බැලිය යුතුවේ.

ක්‍රි.ව. 14 - 15 වැනි සියවස් වල ඉන්දියාවේ බලවත් වූ මුස්ලිම් - මෝගල් අධිරාජ්‍යයන් නිසා ද බටහිර බලපෑම් නිසා ද දකුණු ඉන්දියාවේ විජය නගර් රාජධානිය විසිරී ගියේය. දකුණු ඉන්දියාවේ දෙමළ ප්‍රදේශවල ජීවත් වූ සමහර ගම් ප්‍රධානීන් ද වෙළෙන්දන් ද ආරක්ෂාව පතාත්, වෙළදාම සඳහාත් ගොඩබැස්සේ ශ්‍රී ලංකාවේ යාපන අර්ධද්වීපයටය. ඔවුහු නිරතුරුවම කෝට්ටේ හා පසුව මහනුවර සිංහල රාජධානියට යටත්ව සිය ජීවිකාව ගෙන ගියහ. යාපනය හෙවත් නාගදීපය දුරාතීතයේ සිටම හොඳ සිංහල බෞද්ධ ජනාවාසයක් හා වෙළඳ තොටක් වූ බව රනින් ගලින් කළ අද දක්වා පවතින පුරාවස්තු ජනපද හා ග්‍රාම නාම සාක්ෂි දරයි.

කෙසේ වෙතත් පෘතුගීසි ආක්‍රමණය (16 සියවස) සිදුවූ විට යාපනය දෙමළ වෙළෙඳ ප්‍රධානීන් කළේ සිංහල රජුට වූ පක්ෂපාතීත්වය පාවාදී කිසිදු සටනකින් තොරව යාපනය පෘතුගීසීන්ට පාවාදීමයි. එය නල්ලූර් ගිවිසුම ලෙස ප්‍රකටය. එහෙත් පෘතුගීසින් මෙන්ම ලන්දේසින් ද යාපනය සැලකුවේ දෙමළ වෙළෙන්දන්ට අයත් ප්‍රදේශයක් හැටියට නොව සිංහල රාජධානියේ කොටසක් ලෙසින් බව ඔවුන් හා සිංහල රාජධානිය අතර වූ ගිවිසුම් වලින් පෙනීයයි. 1815 සිංහල ඉංග්‍රිසි ගිවිසුමෙන් ද මෙය ස්ථාපිත විය.

ඉංග්‍රීසීන් මුළු ලොව පුරාම සිය අධිරාජ්‍යය පතුරුවා ගත්තේ ඒ ඒ රටවලම තමන්ට හිතවත් විශේෂ කණ්ඩායමක් හෙවත් ප්‍රභූ වංශයක් බිහිකර ගැනීමෙනි. මෙය එංගලන්තය, ස්කොට්ලන්තය හා වේල්සය ඈඳාගෙන පාලනය කිරීමේදීත් සිදුකළ දෙයකි. ඒ අනුව ඉංග්‍රීසීන්ගේ ප්‍රථම උත්සාහය වූයේ උඩරට සිංහල ප්‍රභූවරුන් ද එවැනි පිරිසක් බිහිකර ගැනීමය. එහෙත් කැප්පෙටිපොළ නිළමේ තුමා ඉංග්‍රීසීන් විසින් සිංහල ප්‍රභූවරුන් කෙරෙහි තිබූ ආකල්පය වෙනස් විය. ඒ වෙනුවට ඔවුනගේ අවධානය යොමු වූයේ දකුණු ඉන්දියාවේදී ද, යාපනයේදී ද බටහිර ජාතීන්ට නිශ්චිත ලෙස කීකරු වීම සිය ප්‍රතිපත්තිය කර ගත් දෙමළ වංශක්කාරයන් වෙතටය. මේ අනුව ශ්‍රී ලංකාවේ විවිධ කොටස් ක්‍රිස්තියානි මිෂනාරීන්ට බෙදාදෙන විට යාපනය ඇමරිකානු මිෂනාරී සමාගමට පවරදෙනු ලැබීය (1819) මෙහි මුඛ්‍ය අරමුණ වූයේ ඉංග්‍රීසීන්ට සුවච කීකරු දෙමළ ප්‍රභූ කල්ලියක් යාපනයෙන් බිහිකර ගැනීමය. එමගින් නිතර කැරලිගසමින් නිදහස ඉල්ලන සිංහල බලවේගයට එරෙහිව පලිහක් ලෙස මේ විශේෂ දෙමළ ප්‍රභූවරුන් යොදාගැනීමය.

මේ වැඩපිළිවෙල කෙතරම් සාර්ථක වීද යත් 1833 වනවිට යාපනය ඉංග්‍රීසි අධ්‍යාපනය මෙන්ම ක්‍රිස්තියානි ව්‍යාප්තියේ ද තොතැන්නක් බවට පත්විය. ශ්‍රී ලංකාවේ පමණක් නොව අවට රටවලටද අවශ්‍ය රාජ්‍ය සේවකයින් බිහිකරන ඉංග්‍රීසි ගැති උගත් ශ්‍රමය බිහිකරන පැක්ටරිය විය. මේ අනුව 1833 දී දියත් වූ කෝල්බෲක් - කැමරන් ආර්ථික ප්‍රතිසංස්කරණවල දී ද මේ දෙමළ ප්‍රභූත්වය ප්‍රමුඛ වූ අතර ඉන්දියාව, මැලේසියාව, අප්‍රිකාව ආදී රටවලද ලාභ බුද්ධිමය හා ලිපිකාර ශ්‍රමය සපයන්නා බවට දෙමළ ප්‍රභූ පන්තිය පත්විය.

**මේ අනුව ශ්‍රී ලංකාවේ දෙමළ ප්‍රභූ පන්තියක් බිහිවූයේ බලවත් වූයේ එළාර යුගයේ සිට එන වසර දහස් ගණනක ඊනියා දෙමළ ශිෂ්ටාචාරයක ප්‍රතිඵලයක් ලෙස නොව මුස්ලිම්වරුන්ට බියෙන් ලංකාවට පළා ආ පිරිසක් ඉංග්‍රීසීන් විසින් හදාවඩා බලවත් කිරීමේ උපාය නිසාය.**

දෙමළ ප්‍රභූවරු ලෙස විශේෂ පිරිසක් මේ අනුව 1833 වන විට ගොඩනැංවිණි. 1833 ප්‍රතිසංස්කරණ වලදී ඉංග්‍රීසීන් මෙරටට ව්‍යවස්ථාදායක සභාවක් හඳුන්වා දුන්හ. පසුව එයට හෝර්ටන් ආණ්ඩුකාරයා විසින් නිළනොලත් සාමාජිකයින් ලෙස සිංහල. දෙමළ, බර්ගර් ලෙස නියෝජිතයන් පත්කරන ලදි. (1835)

මෙහි වැදගත් කරුණ නම් ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය ගොඩනැගූ සිංහල ජාතියට එක් නියෝජිතයෙකු පත්කරන විට දෙමළ හා බර්ගර් වරුන්ටද

නියෝජිතයන් ලබාදීමය. මෙමගින් දෙමළ ප්‍රභූ පන්තිය තුළ තමන් ද ශ්‍රී ලංකාවේ සම අයිතිකරුවන් බවට මාන්නයක් ඇතිවූ අතර ජාතිභේදවාදය ද නීත්‍යනුකූල කරනු ලැබීය. දෙවැනි කාරණය නම් මේ සඳහා පත්කළ දෙමළ නියෝජිතයාගේ ස්වරූපයයි. ඔහු නමින් අරුමුගම් පිල්ලේ කුමාරස්වාමි වූ අතර ඔහුව 1805 දී ඉංග්‍රීසීන් විසින් වාසල මුදලිකමට පත්කළ අයෙක් විය. එමෙන්ම අවසන් සිංහල රජු නායක්කාර් වංශිකයෙක් වූ නිසා 1815 සිංහල රාජධානිය ආක්‍රමණයේ දී විශේෂ මෙයෙහක් ඉටුකළ අයෙක් ද විය. කුමාරස්වාමි හදිසියේ 1836 දී මිය ගිය විට උග්‍ර දෙමළ ජාතිවාදියෙකු වන සයිමන් කාසිචෙට්ටි ඒ සඳහා පත්කරන ලදී. යාපනයේ වසර දහස් ගණනක සිට දෙමළ ශිෂ්ටාචාරයක් විය යන ඓතිහාසික මහා බොරුව මුලින්ම ප්‍රකාශ කළ අය අතරට සයිමන් කාසිචෙට්ටි ද එක් වෙයි. පසුව 1845 දී මේ සඳහා කුමාරස්වාමිගේ පුත් මුතුකුමාරස්වාමි ඒ ධූරය දැරුවේය. (1861-1879) ඔහුගෙන් පසු ඒ සඳහා පත්කළේ ඔහුගේ බෑනා වූ පොන්නම්බලම් රාමනාදන්ය. රාමනාදන් මහතා ඒ වනවිට ජිවත් වූයේ මදුරාසියේ බවද සිහිකළ යුතුය.

මෙලෙස 19 වන සියවස අවසන් වන විට දෙමළ ප්‍රභූ පන්තියක් බිහිවීම ස්ථාවර වී තිබිණි. ඔවුන් ශ්‍රී ලංකා සිවිල් සේවයේත්, පරිපාලනයේත්, තවදුරටත් වැවිලි කර්මාන්තයේ පවා බලවත් කල්ලියක් බවට පත්වී සිටියහ. ආරුමුග නාවලර් විසින් දියත් කරන ලද ක්‍රිස්තියානි විරෝධී හින්දු පුනර්ජීවනය නිසා සිදුවූයේ සාමාන්‍ය දෙමළ ජනයා යාපනයේ වෙල්ලාලයන්ගේ වහලුන් තත්වයට පහත හෙළනු ලැබීමත් තමිල්නාඩුව සමඟ සබඳකම් ශක්තිමත් වීමත්ය. එමෙන්ම හින්දු දහමේ එන පුද්ගලික ආත්මන් වෙනුවට සමාජ ආත්මන් කෙනෙකු ලෙස දෙමළ ජාතිය නිශ්පාදනයද ඇරඹිනි. මේ අතර 1858 න් පසු මහා මාර්ගවල වැඩට ගෙන එනු ලැබූ ඉන්දියානු මලබාර් කම්කරුවන් ද ඉංග්‍රීසීන් විසින් උඩරට රාජධානියට අයත්ව තිබූ මඩකළපුවේ පදිංචි කිරීමෙන් එහි දෙමළ ජනාවාසයක් ඇති වෙමින් තිබුනි. එමෙන්ම ඉස්ලාම් දහම ඇදහූ මැලේ හා මුවර්වරු එක්ව වෙනම මුස්ලිම් නියෝජනයක් ඉල්ලූ අතර (1888) ඒ අවස්ථාවේ දී දෙමළ ප්‍රභූවරු කීවේ මුස්ලිම්වරු "දෙමළ කථාකරන" නිසා වෙනම නියෝජනයක් අනවශ්‍ය බවය. මෙලෙස "දෙමළ කතාකරන ජනයා" නමින් ජනකොටසක් **නිෂ්පාදනය** කිරීමට දෙමළ ප්‍රභූවරු උත්සාහ කළහ. 1910 දී තොරාගත් පිරිසකට ඡන්ද අයිතිය දී දේශීය නියෝජිතයෙකු ව්‍යවස්ථාදායකයට පත්කරගැනීමට ඉඩදීමට ඉංග්‍රිසි ආණ්ඩුව මැකලම් ප්‍රතිසංස්කරනයෙන් තීරණය කළේය. මෙයට විරෝධය පෑ දෙමළ ප්‍රභූවරු 1910 අප්‍රේල් 6 වෙනිදා යාපනයේ දී රැස්වී කෘෂිවේ යටත් විජිත ලේකම්වරයාට ලිපියක් යැවූහ. ඒ ලිපියෙන් කියවුනේ **දෙමළ ජනයා සමස්ත ශ්‍රී ලංකාවේම ශිෂ්ටාචාරය ගොඩනැගූ ඓතිහාසික ජනකොටස වූ බැවින්**

**ඡන්ද අයිතිය මගින් සිංහලයන්ට ව්‍යවස්ථාදායකයේ බලය හිමිවනවාට තමන් එරෙහි බවය.** මෙයින් පෙනී යන්නේ දෙමළ ජාතිවාදී අභිලාෂය බිහිවූයේ 1956 සිංහල භාෂා පණත හෝ 1983 ජූලි කෝලාහල නිසා නොව ඊට බොහෝ කලකට පෙර බවය. කෙසේ වෙතත් දෙමළ ප්‍රභූවරුන්ගේ බලය මුලු රටටම ප්‍රදර්ශනය වූයේ 1911 දී මක්ලම් - කෘෘවේ ප්‍රතිසංස්කරණ වලින් ධනහිමි ඉංග්‍රීසි උගත් ප්‍රභූවරුන්ට තමන්ගේ "ඡන්දයෙන්" නියෝජිතයෙකු පත්කිරීමට නිල ලෙස අවස්ථාව ලැබුණු විටය. එහිදි දෙමළ ප්‍රභූවරයෙකු වූ පොන්නම්බලන් රාමනාදන් සිංහලයෙකු වූ මාක්ස් ප්‍රනාන්දුව පරාජයට පත්කලේය. එහිදී ඡන්දය දීමට සුදුසු වූවන් 2924 ක් වූ අතර ඉන් දෙමළ අය වූයේ 1160 ක් පමණය. කෙසේ වෙතත් රාමනාදන්ට ඡන්දය 1645 ක් ලැබුණු අතර ප්‍රනාන්දුට ලැබුණේ ඡන්ද 981 ක් පමණය.

මේ ඡන්ද ප්‍රතිඵලය දෙමළ ප්‍රභූවරු විස්තර කර ගත්තේ මෙසේය **".. අපි සංඛ්‍යාවෙන් කුඩා වූවත් නිල, ධන, කුල බලයෙන් ශ්‍රී ලංකාවේ බලවත් ජාතියයි. සිංහලයන් හා මුස්ලිම්වරු පවා අපේ නායකත්වය පිළිගෙන ඇත. මේ නිසා ඉංග්‍රීසීන් මෙරට හැරයන විට මේ රටේ පාලනය හිමිවිය යුත්තේ අපටය.."** කියාය. මේ උතුම් ජාතිවාදී මතය සනාථ වන වර්ගයේ සිදුවීම් කීපයක් ඊලඟට සිදුවිය. එනම් උඩරට, පහතරට ආදී ලෙසද කුල-මල ලෙසද බෙදී සිටි සිංහල ප්‍රභූවරු රාමනාදන්ගේ නායකත්වයේ සෙවණට පත්වීමටය. මෙය 1915 සිංහල මුස්ලිම් ගැටුම්වලදී "දෙමළ ගොකු අයියා" ලෙස පෙනී සිටීමට රාමනාදන්ට පිටිවහලක් විය. මේ නිසා ඊලඟ මැතිවරණයේ දී රමානාදන්ට එරෙහිව තරංග කල ඩි.ඇන්. ජයවර්ධනය ලැබුනේ ඡන්ද 47 කි. 1917 දී පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කමිටුවේ ද, 1919 දී පිහිටුවන ලද ලංකා ජාතික සංගමයේ ද සභාපති ධුරය ලැබුණේ රමනාදන්ගේ සොයුරු පොන්නම්බලම් අරුනාචලම්ටය. මේ සියල්ල විසින් සනාථ කෙරෙන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රමුක ජාතිය දෙමළ යන්න බව දෙමළ ප්‍රභූවරු තවදුරටත් සිතන්නට වූහ. ශ්‍රී ලංකාවේ ජාතිභේදවාදය වැපිරීමට ප්‍රමුඛයෙකු වූ මැනිං ආණ්ඩුකාරයා 1921 දී නව ආණ්ඩුක්‍රම සංශෝධනයක් කරා පළාත්බද ඡන්දයක් පැවැත්වීමට තැත්කරන විට දෙමළ ප්‍රභූවරු එයට විරෝධය පෑවේ "දෙමළ මහජන සභාව" නම් තනි දෙමළ ජාතිවාදී සංවිධානය පිහිටුවීමෙනි. එය මේ සියවසේ ශ්‍රී ලංකාවේ පිහිටවූ ප්‍රථම ජාතිවාදී සංවිධානය විය. **1921 අගෝස්තු 15 වැනි දින පිහිටවූ මෙම ජාතිවාදී ප්‍රභූ සංවිධානය ප්‍රථමවරට විවෘතවම ප්‍රකාශකළේ සියවස් 25 ක සිට දෙමළ ජනයා ශ්‍රී ලංකාවේ වාසය කළ බවත්, යාපනය ශ්‍රී ලංකාවේ අගනගරය වූ බවත්, දෙමළ ජනයා ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය ගොඩනැංවූ ප්‍රමුඛ, දියුණු ජාතිය බවත්ය.** මෙහි සභාපතිත්වය දැරුවේ පොන්නම්බලම් අරුනාචලම්ය. මේ පිළිබඳ මානව විද්වතෙකු වූ බී.එස් කෝන් මෙලෙස ප්‍රකාශ

කළේය. **"නවසිය විසි ගණන් වල මැද වනතෙක්ම ශ්‍රී ලංකාවේ දෙමළ ප්‍රභූවරුන්ගේ මානසිකත්වය වූයේ ඔවුන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ජනවර්ගය වූ බවය. මේ පිළිබඳ හොඳම සාක්ෂිය වන්නේ අරුනාචලම්ගේ කථාවයන්ය. ඔහු බොහෝවිට සිංහල හා අන් අය සුළු ජාතීන් ලෙස නම් කළේය"** [B.S.COHN, NOTES ON THE HISTORY OF THE STUDY OF INDIAN SOCIETY AND CULTURE pg 70 - 71]

මේ අනුව 1911 - 30 වකවානුව තුළ වෙල්ලාල දෙමළ ප්‍රභූවරු ඔවුන් සෙසු දෙමළ සමාජය වහලුන් කරගත්තා සේ ශ්‍රී ලංකාවේම ජනතාව තමන්ගේ දෙපා යට මැඩ වහලුන් කරගැනීමේ උම්මත්තක සිතිවිල්ලට පත්වූහ. මේ අනුව 19121 - 30 යනු දෙමළ ජාතිවාදයේ පළමු යුගය යි. එහිදී ඔවනුගේ උත්සාහය සමාන වන්නේ ඉංග්‍රීසින්ගෙන් පසු තමන් අතට බලය ගන්නට ක්‍රියා කළ දකුණු අප්‍රිකාවේ සුදු "අප්‍රිකානා" ජාතිවාදයට ය. 1911 -21 වකවානුවේ ශ්‍රී ලංකාවේ එකම දේශීය නියෝජිතයා වීමට වලිකෑ දෙමළ ප්‍රභූන් 1921 - 31 අතර උත්සාහ කළේ ව්‍යවස්ථාදායකයේ බහුතරය වීමට ය. දකුණු අප්‍රිකාවේ සුදු ජාතිවාදය ක්‍රියා කළේද එසේය.

1927 නොවැම්බර් 13 වන දි "අර්ල් හි ඩොනමෝර්" සාමිවරයා පැමිණීමත් සමගම දෙමළ ප්‍රභූවරුන්ගේ හිස් ගිනි ගත්තේය. ඒ "ඩොනමෝර් කොමිසම" පැමිණියේ ශ්‍රී ලංකාවට "සර්වජන ඡන්දය" දීමට බව වාර්තා වීම නිසා ය. දෙමළ මහජන සභාව නම් දෙමළ ජාතිවාදී සංවිධානයේ ලේකම්වරයා වූ ඒ. රාමනාදන් ඩොනමෝර් කොමිසම ඉදිරියේ සාක්ෂ්‍ය දෙමින් කියාසිටියේ **"දෙමළ ජනයා වනාහි මේ දිවයිනේ ප්‍රාරම්භක ආදිවාසියා ය. ඔවුන් වසර දහස් ගණනක සිට මේ රටේ ශිෂ්ටාචාරය ගොඩනැංවූහ. විද්වතුන්ගේ පර්යේෂණ අනුව මේ දෙමළ නිජභූමිය මුලු ලෝක ශිෂ්ටාචාරයේ ම තොටිල්ලය"** [NATHAN MSS 606, EVIDENCE OF A.RAMANATHAN. 7 DEC 1927] රාමනාදන්ගේ මේ අදහස ද්‍රවිඩස්ථානයේද පදනමය. මුළු ලෝක ශිෂ්ටාචාරයම ආරම්භ වූයේ ද්‍රවිඩස්ථානයකින් බව ලෝක ද්‍රවිඩස්ථානයේ මූලාරම්භකයන්ගේද මතයයි. 1926 දී ප්‍රකාශයට පත්කරන ලද මුදලි සී. රාසනායගම් නම් දෙමළ ජාතිවාදී ප්‍රබන්ධකරුගේ "පැරණි යාපනය" නම් කෘතියට අනුව විජය රජුගේ සිට ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වය පිහිටුවා ඇත්තේ දෙමළ රජවරු විසිනි. මෙලෙස ශාස්ත්‍රීය ලෙසද දේශපාලනික ලෙසද ශ්‍රී ලංකාව දෙමළ නිජභූමිය බවත් එය අවට රටවල් සියල්ල එයින් ශිෂ්ටාචාරගත වූ බවත් අනාගතයේ ලෝක ද්‍රවිඩ රාජ්‍යය ශ්‍රී ලංකාව පදනම් කරගෙන පිහිටුවිය යුතු බවත් කියවිණි.

පොන්නම්බලම් රාමනාදන් මහතා තවදුරටත් ප්‍රකාශ කළේ "සර්වජන ඡන්දබලය නිසා අසික්කිත මැරයන්ටත්, ගැහැනුන්ටත්, පාදඩයන්ටත් පාලන

බලය හිමිව" බවය.

(කියවන්න EVIDENCE OF CEYLON TAMIL LEAGUE, 30 NOV 1927 YD P.RAMANATHAN, MEMORANDUM ON THE DONOUGHMORE CONSTITUTION-LONDON 1934, PG 4-14)

මේ අනුව දෙමළ ප්‍රභූවරු, වෙල්ලාල පිරිමි හැර දෙමළ, සිංහල, මුස්ලිම් අන් කිසිවෙක් පාලන බලය ලැබිය යුතු නොවන බවටද උමතු ජාතිවාදී, කාන්තා විරෝධී මතයේ එල්බ සිටියහ. එයින් හින්දු සංස්කෘතිය විනාශ වන බව පුනපුනා කීවෝය.

කෙසේ වෙතත් ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ දෙමළ ජාතිවාදීන්ට විශාල අනාගත ආයෝජනයක් ලැබුණි. එනම් සිංහල ඡන්ද බලය දියාරු කිරීම සඳහා වතු දෙමළ සංක්‍රමණිකයන්ට ද ඡන්ද අයිතිය පිරිනැමීමය. 1931 වනවිට තමන්ගේ රට වූ ඉන්දියාවේ නැති ඡන්ද අයිතියක් මේ අනුව සංක්‍රමණික දෙමළ කම්කරුවන්ට ලැබුණි. ඩොනමෝර් ඔවුනට ඡන්ද අයිතිය ලබාදුන්නේ හිතාමතාය. එමගින් දෙමළ ප්‍රභූවරු සතුටු කිරීම ඔහු අපේක්ෂා කළේය.

අවසානයේ ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක විය. මුලින් ඡන්ද වර්ජනය කළ යාපනයේ ප්‍රභූවරුන් තමන්ගේ ප්‍රතිවාදී බලවේග ප්‍රචණ්ඩත්වය හා මරබලය යොදා මර්ධනය කළහ.

මේ අනුව දෙමළ සමාජය ප්‍රචණ්ඩත්වයේ අධිපතිත්වයට හසු වූයේ 1934 දී තරම් ඈත අතීතයේ දීය. ඉංග්‍රීසි ගැති, සිංහල විරෝධී, කුලවාදී උම්මත්තක මානසිකත්වයක් සහිත කෝචක එතැන් සිට දෙමළ සමාජය වැඩෙන්නට විය. සිංහල සමාජය තුළ මෙන් විවිධ අදහස් දැක්වීමේ ගුණය, නිදහස, සහන ශීලීත්වය හා සමානාත්මතාවය දෙමළ සමාජයෙන් පළා ගියේය. ප්‍රචණ්ඩත්වය දෙමළ සමාජයේ අත්මය විය.

ඩොනමෝර් ප්‍රතිසංස්කරණ වලින් පසු දෙමළ ජාතිවාදී දේශපාලනයේ දෙවන යුගය ඇරඹිණ. සර්වජන ඡන්දබලය යටතේ එවකට 70% ක් වූ සිංහල ජනයා පාගාගෙන සිටීමට නොහැකි බව පැහැදිලි විය. එවිට පියවරක් ආපස්සට ගත් දෙමළ ප්‍රභූවරු දෙමළ ජාතිවාදයේ දෙවන යුගය (1931-49) ආරම්භ කළහ. එනම් ශ්‍රී ලංකා රාජ්‍යය මුළුමනින්ම අත්පත්කර ගත නොහැකි නිසා එය හරි හරියට සමව බෙදාගැනීමේ සටනය. අපේ රටේ දරුවන්ට ජාතික වීරයින් ලෙස ඉගැන්නුවත් මේ රටේ දෙමළ ජාතිවාදී උම්මත්තක දේශපාලනය බිහිකළ පියවරු වූ පොන්නම්බලම් රාමනාදන් (1931) හා පොන්නම්බලම් අරුනාචලම් (1924) යන දේශ ද්‍රෝහීන් දෙදෙනාම මේ වන විට මිය ගොස් සිටිය නිසාත් ඔවුන්ගේ පුතුන් හා

බෑනනුවන් වූ ඒ. රාමනාදන්, අරුනවලම් මහාදේව, එස්. නටේසන් වැන්නවුන් දුර්වල චරිත වූ නිසාත් අලුත් දෙමළ ජාතිවාදියෙකු බිහිවිය. ඒ කනපතිපිල්ලේ ඥානප්‍රභාසර් පොන්නම්බලම් හෙවත් කොළඹ නීතිවේදියෙකු වූ ජී.ජී. පොන්නම්බලම්ය. අපි දැන් ඔහුට ඇහුම්කම් දෙමු.

1939 ජූනි 19 වැනිදා "හින්දු ඕර්ගන්" පුවත්පතට අනුව නාවලපිටියේ පැවති රැස්වීමේදී ජී.ජී. පොන්නම්බලම් මහතා ප්‍රකාශ කර ඇත්තේ "ශ්‍රී ලංකාවට උරුමකම් කිවහැකි එකම පිරිසිදු ජාතිය දෙමළ වන අතර සිංහලයන් කවලම් ජාතියක් බව" ය. 1944 ඔක්තෝම්බර් 29 දා සමස්ත ලංකා දෙමළ කොංග්‍රසය බිහිකළ විට එහි සභාපති දේශනය කරමින් ඔහු ප්‍රකාශ කළේ **"අපට ඇත්තටම අවශ්‍යවන්නේ 70% ක් වූ සිංහලයන් ව්‍යවස්ථාදායකයේ 50% කට වඩා ආසන ගැනීම වැල්ක්වීම"** ලෙසය. මේ අනුව දෙමළ ජාතිවාදයේ දෙවන යුගය එළැඹිණ. එනම් සුප්‍රකට 50:50 යුගයයි. එහි අරමුණ වූයේ බහුතර සිංහලයන්ට අඩකඩ වඩා අඩුවෙන් ජනතා නියෝජනය ලබාදීමේ අවමානව, ප්‍රජාතන්ත්‍ර විරෝධී, වර්ගවාදී මතයයි. මේ මතයට ඉජග්‍රීසීන්ද උපකාර කළෝය. ඒ අනුව,

ශ්‍රී ලංකාවට ඊනියා ඩොමිනීයන් නිදහස ලැබුණේ සිංහල නියෝජනය 55% නොඉක්මවන ලෙස ව්‍යවස්ථාදායකයේ ඡන්ද කොට්ඨාශ නිර්ණය කිරීමට අයිවර් ජෙනිංස් යෝජනා කළ පසුවය. 50:50 නැත්නම් නිදහස අවශ්‍ය නැතැයි දෙමළ ප්‍රභූවරු සිය ස්වාමිවරු වූ ඉංග්‍රීසීන්ට කීවෝය. ඒ අනුව 55:45 ලෙස ව්‍යවස්ථාදායකයේ සිංහල සිංහල නියෝජනය ලැබෙනෙ ලෙස "නිදහස" ලැබින. සෝල්බරි ව්‍යාවස්ථාව අවසන් වශයෙන් නිර්මානය කළ මුරුගේසු තිරුවෙල්වම් හා ඇලන් රෝස් එක්ව ශ්‍රී ලංකාවේ නිදහස සඳා වළලන 29 වගන්තියද එයට එක් කළහ.

නව ශ්‍රී ලංකා රජයේ පොන්නම්බලම්ට හා සුන්දරලින්ගම්ට ඇමති පදවි ලැබුණ ද තමනට එකක් නොලැබීම නිසා කම්පාවට පත්ව සිටි කෲරතම දෙමළ ජාතිවාදියා උපත ලබන්නේ මේ සමගය. එනම් උපතින් මැලේ ජාතිකයෙකු වූ සැමුවෙල් ජේම්ස් චේලුපිල්ලේ චෙල්වනායගම්ය.

චේලවනායගම්ව 1949 සැප්තැම්බර්වලදී දෙමළ කොන්ග්‍රසයෙන් නෙරපා හරින ලද අතර ඔහු 1949 දෙසැම්බර් 18 දා කොළඹ මරදානේදී දෙමළ මේ සඳහා සේවය ලැබුණි.

1947 මැතිවරණ ප්‍රතිඵලවලින් පෙනුණේ කිසිම ව්‍යාවස්ථාදකයක කුමන්ත්‍රණයකින් ශ්‍රී ලංකාවේ ස්වදේශීය ජනයාගේ බහුතර බලය නතර කළ

නොහැකි බවය. මේ නිසා පොන්නම්බලම්ගේ ශ්‍රී ලංකා රාජ්‍යය හරි හරියට බෙදාගැනීමේ උත්සාහය සාර්ථක වූයේ බාගෙටය. එහෙයින් චෙල්වනායගම් තවත් පියවරක් පිටුපසට තැබුවේය. එනම් දෙමළ ජාතිවාදී දේශපාලනයේ තුන්වන යුගයය. එයින් අදහස් වූයේ ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් ශ්‍රී ලංකාවෙන් වෙන්කර වෙනම දෙමළ රාජ්‍යයක් ගොඩ නැංවීමය.

චෙල්වනායගම් අලුත් සංකල්ප කීපයක් "නිෂ්පාදනය" කළේය. ඒවාට වෙනම ආකාරයකට වත් ඓතිහාසික වූත්, පුරාවිද්‍යාත්මක වූත්, සංස්කෘතික වූත් මානවවාදි වූත් කවර වටපිටාවක් වත් නොවීය. ඒ මෙසේය.

1. ශ්‍රී ලංකාවේ දෙමළ ජනයා උතුරු හා නැගෙනහිර පළාත්වල අඩුම තරමින් වසර 3000 ක සිට ජීවත්වී ඇත. මේ නිසා උතුරු නැගෙනහිර යනු දෙමළුන්ට පමණක් උරුම ශුද්ධ දෙමළ නිජභූමියයි. සෙසු අයට එහි ජීවත්විය නොහැක.
2. ශ්‍රී ලංකාවේ දෙමළ ජනයා රටපුරා වැව් පද්ධතිය හා නගර නිර්මාණය කරමින් මේ රට ශිෂ්ටාචාර ගතකර ඇත. තනි දෙමළ රාජ්‍යයේ හා රාජ පරම්පරාවක් වසර 3000 ක සිට නිර්මාණය කරගෙන ඇත. මේ නිසා වෙනම දෙමළ රාජධානියක් ඉතිහාසයේ සිට පැවතුන අතර එය පෘතුගීසීන් විසින් විනාශකර ඉංග්‍රීසීන් විසින් සිංහලයන්ට පවරා දී ඇත. එය නැවත ලබා ගැනීම දෙමළාගේ ජාතික වගකීමය.
3. දෙමළ ජනයා අනන්‍ය භාෂාවක්, සංස්කෘතියක්, අඛණ්ඩ ශිෂ්ටාචාරයක්, නිජභූමියක්, ඇති නිසා වෙනම ජාතියකි. ඒ නිසා ඔවුන්ට ඔවුන්ව පාලනය කර ගැනීමේ ස්වාධින රාජ්‍යයක් බිහිකර ගැනීමේ අයිතිය ඇත. එනම් ස්වයං තීර්ණය අයිතියයි.
4. නැගෙනහිර දෙමළ හා වතු දෙමළ ලෙස දෙමළ ප්‍රභේද නැත. ඇත්තේ දෙමළ කථාකරන එකම ජාතියකි.

වෙනම රාජයයක් ලෙස චෙල්වනායගම් තම අදහස දෙමළ සමාජයට ඉදිරිපත් කළත් ඔහු එය ලෝකයට ප්‍රකාශ කළේ ෆෙඩරල් රාජ්‍යයක් ලෙසය. එමෙන්ම ඔහු කිසිවිටෙක ශ්‍රී ලංකාවේ රාජ්‍යය සහමුලින් පැහැර ගෙන ඉන්දියාවද බෙදා වෙන් කර ලෝක ද්‍රවිඩ රාජ්‍යයක් බිහි කිරීමේ උමතු ජාතිවාදී මතය අත්නොහළේය. ලෝක ද්‍රවිඩ රාජ්‍යයක් බිහිකිරීමේ උමතු ජාතිවාදී මතය අත්නොහළේය. ලෝක ද්‍රවිඩ රජ්‍යයේ පළමු පියවර ලෙස ශ්‍රී ලංකාව දෙකඩ කළ යුතු බව ඔහුගේ අදහස විය. ඉන්පසු වතුකරයත්, කොළඹත් ගිලගෙන ශ්‍රී ලංකාව පියවරෙන් පියවර අල්ලා ගත හැකි බව ඔහුගේ විශ්වාසය විය.

බොහෝ දෙනෙක් හඳුන්වන්නේ චෙල්වනායගම් අවිහිංසාවාදියෙකු ලෙසය. එහෙත් නූතන දෙමළ ත්‍රස්තවාදයේ පියා වූයෙත් ඔහුය. 1948 මාර්තු 20 වැනිදා "සමස්ත ලංකා දේශප්‍රේමී දෙමළ සංවිධානයට" අයත් හැන්ඩි පෙරියනායගම්, කේ. නේසයියා, ඒ.ඊ. තම්බර්, එස්. සිවසුබ්‍රමනියම්, සී. තනබාලසිංහම්, ඒ.සී කනගසිංහම් ආදීන් යාපනය නගර ශාලාවට එක්වී චෙල්වනායගම් හා වින්නියසිංහම්ගේ බෙදුම්වාදී ජාතිවාදී මතවලට එරෙහිව රැස්වීමක් පැවැත්වූහ. එවකට දෙමළ කොන්ග්‍රසයේ සිටි මේ අවිහංදසාවාදියා කළේ මැර පිරිසක් සමග ගොස් ඒ රැස්වීමට පහරදී බෙදුම්වාදී නොවන දෙමළ මිනිසුන්ට බරපතල තුවාල සිදු කිරීමය.

1952 මැතිවරණයෙන් චෙල්වනායගම්ට සිය කන්කසන්තුරේ අසුන අහිමි වූ විට ඔහු කළේ වැඩිවැඩියෙන් ජාතිවාදී වෙමින් තමන්ට එරෙහි බලවේග වලට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියා සංවිධානය කිරීමය. 1954 - 56 වකවානුවේ චෙල්වනායගම් සංවිධානය කළ ඊනියා අවිහිංසාවාදී පාගමන් වලදී බෙදුම්වාදී නොවන මත දැරුවනට දරුණු ලෙස හිරිහැර කරනු ලැබූ අතර අමුම අමු අසත්‍යය වමාරමින් දෙමළ සමාජය බියටත් ත්‍රාසයටත් පත්කළේය. 1956 මැතිවරණයෙන් ඔහුට ලැබුණු "විශිෂ්ඨ" ජයග්‍රහණය තේරුම් ගත යුත්තේ දෙමළ සමාජය පුරා ඔහු මුදාහළ සාමූහික ප්‍රචණ්ඩත්වය හා මැතිවරණ මැර ක්‍රියා සමගය.

1956 ජූනි මස 5 වැනිදා, ඓතිහාසික වරදක් නිවැරදි කරමින් ඉංග්‍රිසි බස වෙනුවට සිංහල රාජ්‍ය භාෂාව කෙරිණි. (1958 සැප්තැම්බර් මසදී දෙමළ බසද රාජ්‍ය කටයුතු සඳහා යෙදවිය හැකි බවටද වූ පනතක් සම්මතවිය) එවිට චෙල්වනායගම් කළේ යාපනයේ, මඩකලපුවේ හා කොළඹ සිංහල විරෝධී උද්ඝෝෂණ ඇරඹීමය. මෙයින් රට පුරාම ප්‍රචණ්ඩක්‍රියා ඇතිවිය. 1958 මාර්තු හා අප්‍රේල් අතරදී චෙල්වනායගම් රටපුරා යමින් වාහනවල ශ්‍රී අකුරුවල තාරගෑම ආරම්භ කරන ලදී. මේ හා සමගම 1958 මැයි මසදී රටම වෙළාගත් ජාතිවාදී ගිනිදැල් ඇවිළ වූයේ ද චෙල්වනායගම්ය. සංවිධානාත්මක ආයුධ සන්නද්ධ දෙමළ ජාතිවාදී ක්‍රියා එහිදී දැකගත හැකිය. අම්පාරේදී පොලිස් නිළධාරීන් සතුව තිබූ රයිෆල් 6 ක් චෙල්වනායගම්ගේ ආධාර කරුවෝ පැහැරගත් අතර මුලු උතුරු හා නැගෙනහිර පළාත් පුරා සිංහල ගම්මානවලට සංවිධානාත්මක ප්‍රහාර එල්ලවිය. **චෙල්වනායගම් නම් ඊනියා අවිහිංසාවාදියා බිහිවීමට පෙර සිංහල - දෙමළ එකම ජාතිවාදී කොලාහලයක් හෝ ඔවුනොවුන් අතර එකම සංවිධානාත්මක ත්‍රස්ත ක්‍රීයාවක්හෝ වාර්තා වී නැත. එහෙත් 1947 දී ඔහු දේශපාලනයට පැමිණීමත් සමග දෙමළ සමාජය ප්‍රචණ්ඩත්වයට තල්ලු කළේය. එමගින් ජාතිවාදී ප්‍රචණ්ඩ ක්‍රියා අවුලවනු ලැබීය.**

1960 මාර්තු හා ජූලි මැතිවරණ වලදී චෙල්වනායගම් උත්සාහ කළේ එ.ජා.ප. යට හෝ ශ්‍රී ල.නි.ප. යට හෝ සිය අසන 13 විකුණා ආණ්ඩුවේ හෙණ්ඩුව වීමට ය. එය අසාර්ථක වූ විට 1961 ජනවාරි මසදී අතුරු පළාත ශ්‍රී ලංකාවෙන් වෙන්කරලීමේ රාජ්‍ය විරෝධී ක්‍රියාවනට ඔහු ගමන් කළේය. ඊළාම් උසාවි, ඊළාම් තැපැල් කාර්යාල, ඊළාම් බැංකු ලහිලහියේ පිහිටුවිණි. සිය ගන් අවි මුගුරු වලින් සන්නද්ධ තරුණ කල්ලියක් සංවිධානය කෙරිණි. එහි නිළ නාමය වුයේ "පුලියපාදෙයි" හෙවත් **කොටි මගය.**

එය පළමු ත්‍රස්තවාදී දෙමළ ජාතිවාදී සංවිධානය යි. යාපනය විශ්ව විද්‍යාලයේ හා පාසල් වල දෙමළ ජාතිවාදී දේශපාලනයට එරෙහි වූවන් මර්ධනය කරන ලදි. බොහෝ පමාවී 1961 අප්‍රේල් වල රජය මේ රාජ්‍ය විරෝධී ත්‍රස්තවාදය මර්ධනය කිරීමට ඉදිරිපත් වූ විට මේ රහසිගත කල්ලිය "යට" ගියේය. එය නැවත මතුවූයේ 1969 දී දෙමළ ඊළාම් විමුක්ති සංවිධානය ලෙස කුට්ටමනී හා ජේගන්ගේ නායකත්වයෙනි.

1961 දී රාජ්‍ය ද්‍රෝහී චෝදනාව මත අත්අඩංගුවට පත් චෙල්වනායගම් වහාම නිදහස් කෙරිණි. ඔහු නිදිහස් කරලීමට බලපෑම් කළ ආරක්‍ෂක අංශ ප්‍රධානීන් අතර 1962 බෞද්ධ විරෝධී රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණය කළ නිළධාරීන් ද සිටි බව කියවේ. විදේශගත වූ චෙල්වනායගම් ලන්ඩනයට ගියේය. එතැන් සිට ශ්‍රී ලංකාවේ දෙමළ අරගලයට සහාය ඉල්ලා ලොව පුරා "දෙමළ ප්‍රජාවට" ආයාචනා නිකුත් කළේය. ලෝක දෙමළ සම්මේලනය ඉන් එකකි. යුදෙව්වන් විසින් රටවල් 86 ක් විසිරී සිටි යුදෙව්වන් වෙනුවෙන් අහිංසකයන්ගේ පලස්තීනය දෙකට කඩා ලෝක යුදෙව් රාජ්‍යයක් (ඊශ්‍රායලයක්) බිහිකළ ආකාරයට රටවල් 34 කට විසිරී සිටින ලෝක දෙමළ ප්‍රජාව දුර්වල ශ්‍රී ලංකාවේ දෙමළ රාජ්‍යයක් බිහිකරගත යුතු බව කියවිණි. (මේ සඳහා ඉන්දියාවේ දී 1936 සිට දරණ ලද උත්සාහයන් ඉන්දීය ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් ද, 1962 දී හමුදා මැදිහත් වීමකින් ද යටපත් කරන ලද නිසා මේ සඳහා දුර්වල ශ්‍රී ලංකාව තෝරා ගැනිණි) දෙමළ ඊළමක් සඳහා මෙලෙස විදේශික දෙමළ ජනයාටද ජාතිවාදී විෂ කැවීම ආරම්භ කරන ලදී.

1965 - 69 අතර තුරු චෙල්වනායගම් හත්හවුල් ආණ්ඩුවට එක්වූ අතර ඒ යුගය තමන්ගේ ස්වර්ණමය යුගය බව චෙල්වනායගම් පසුව ප්‍රකාශ කළේය. බල ලෝභයෙන් බෙදෙන බහුතර සිංහල ඡන්ද දායකයන්ගේ පක්ෂ නටවන්නේ කෙසේ දැයි චෙල්වනායගම් 1965 - 70 හවුල් ආණ්ඩුවෙන් පූර්වා දර්ශයක් දුන්නේය.

1970 මැතිවරණ ප්‍රතිඵල වලින් දෙමළ ජාතිවාදීහු සහමුලින්ම පසුපසට ගියහ. චෙල්වනායගම්ගේ ඊනියා දෙමළ රාජ්‍ය පක්ෂයට ලැබුණෝ මුළු ඡන්ද දායකයින්ගෙන් 4.9% ක ඡන්දයක් පමණි. (ලංකා දෙමළ ජනගහණය 12% කි.)

අමිර්තලිංගම්, නාගනාදන්, සිවසිත්තම්පලම්, ආදී සියලු ජාතිවාදීයෝ සිය අසුන් වලින් පරාජයට පත්වූහ. සමස්ත දෙමළ ඡන්ද දායකයන්ගෙන් 60% කට වැඩි පිරිසක් බෙදුම්වාදය ප්‍රතික්ෂේප කළහ. 45% ක් පමණ දෙමළ ඡන්ද දායකයෝ ශ්‍රී.ල.නි.ප. ප්‍රමුඛ සමගි පෙරමුණට හා එ.ජා.ප. යට ඡන්දය දුන්හ.

දෙමළ ජනයාගේ මේ ප්‍රජාතන්ත්‍රවාදී තීරණය ආපසු ගැන්වීමට චෙල්වනායගම් පියවර තුනක් ගත්තේය. පළමු පියවර ලෙස දෙමළ රාජ්‍ය පක්ෂය, දෙමළ කොන්ග්‍රසය හා ලංකා වතු කම්කරු කොන්ග්‍රසය (තොණ්ඩමන්) එක්කර 1972 මැයි 14 දා දෙමළ එක්සත් පෙරමුණ බිහි කළේය. එහි අරමුණ වූයේ සියවස් පහක විදේශ පාලනයකින් පසු නිදහස් ස්වෛරී ඒකීය ජන රජයක් බවට පත්වෙන ශ්‍රී ලංකාවේ ජනරජ ව්‍යවස්ථාව ඉරා දැමීමය. දෙවැනි පියවර වූයේ බලහත් කාරය මුසු වූ හර්තාල, පෙළපාලි සහිත උද්ඝෝෂණ ව්‍යාපාරයක් ඇරඹීමය. එවිට යළිත් සිංහල දෙමළ කෝලාහල ඇතිවී තත්ත්වය තමන්ට වාසිදායක ලෙස ලේ වලින් තීන්දුවනු ඇතැයි චෙල්වනායගම් කල්පනා කළේය. හැකි තරම් උමතු සිංහල විරෝධී මත අමිර්තලිංගම්, සිවසිත්තම්පලම්, යෝගේෂ්වරන්, සම්පන්දන්, කාසි ආනන්දන් ආදීන් ලවා කියවූයේය. සිංහලයන්ගේ හම්වලින් සෙරෙප්පු හැදීම පිළිබඳවත් පන්දහසක දෙමළ බලකායක් ගැනත් පුරසාරම් ඇසිණි. තමන් බෙලා පොරොත්තු වූ ලෙස ජාතිවාදී ලේ වැගිරීම් සිදුනොවන විට මිනීමැරීමට චෙල්වනායගම් තීන්දු කළේය. එනම් කෙලින්ම ත්‍රස්තවාදය දියත් කිරීමය. මේ සඳහා තැබූ මුල්ම පියවර වන්නේ 1972 ජුනි 04 දා එස්. උලගනාදන්ව තීන්තවේලිහිදී ඝාතනය කිරීමය. ඝාතනයට හේතුව වූයේ 1972 මැයි 22 දා චෙල්වනායගම් දියත් කළ ව්‍යවස්ථාව පිළිස්සීමේ හර්තාලයට සහාය නොදීමයි. ඉන් පසු දිගින් දිගටම ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවූ අතර මේ ප්‍රචණ්ඩ ක්‍රියා සංවිධානාත්මකව සිදුකිරීම සඳහා 1974 දී පිහිටුවනු ලැබූ දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ යටතේ තරුණ බලකායක් පිහිටුවන ලදී. එවකට දෙ.එ.වි.පෙ. සභාපති චෙල්වනායගම් වූ අතර පසුව දෙමළ විමුක්ති කොටි නමින් ප්‍රචලිත වූ ඒ සංවිධානය මෙහෙයවීම සඳහා කටේ කිරි සුවඳවත් නොගිය ගැටවරයෙකු ඉදිරිපත් විය. ඔහු වේලුපිල්ලේ ප්‍රභාකරන් විය.

මේ අනුව අද ප්‍රභාකරන් විසින් කුඩා දරුවන් යුදබිමට යවන්නේ සිය පියවරුන් වූ චෙල්වනායගම්ලා ඔහුව යුදබිමට යැවූ ආකාරයටමය.

ප්‍රභාකරන්ගේ පළමු බිල්ල වූයේ යාපනයේ ජනතාව අතර ඉමහත් ජනාදරයට පත්ව සිටි දෙමළ ජාතිවාදයට එරෙහි යාපන නගරාධිපති වූ ඇල්ෆ්‍රඩ් දොරේ අප්පාවය. දොරේඅප්පා 1960 ජුලි මැතිවරණයේදී ජී.ජී. පොන්නම්බලම් යාපන අසුනෙන් පරාජය කළ අතර 1970 මැතිවරණයේ දී දෙමළ රාජ්‍ය පක්ෂ අපේක්ෂකයාට පරාජය වූයේ ඡන්ද සියගණනකිනි. ඔහු නගරාධිපති වූයේ සියලු

දෙමළ ජාතිවාදීන් පරාජය කරමිනි. එහෙත් ඒ ප්‍රජාතන්ත්‍රවාදි දෙමළ ජන තීන්දුව උණ්ඩය විසින් ආපසු එවනු ලැබිය.

ත්‍රස්තවාදි ක්‍රියා සඳහා සැකපිට අත්අඩංගුවට පත් මාවෙයි සේනාධිරාජයා නිදහස ලබා පැමිණි විට ඔහු පිළිගැනිමට චෙල්වනාගම් ගිය අතර පොලිස් නිලධාරියකු මරා දමා බැංකුව කොල්ලයක් සම්බන්දව පොලීසිය සොයමින් සිටි. උග්‍ර උම්මත්තක දෙමළ ජාතිවාදී තරුණයෙකු වු 'සිවකුමාරන්' පොලීසියට බියෙන් දිවිනසාගත් විට චෙල්වනායගම් ඒ ත්‍රස්තවාදියාගේ පිළිරුවට මල්දමක් පලන්දා ජාතික වීරයෙකු කළේය.

1977 මැතිවරණයට කලින් චෙල්වනායගම්, පොන්නම්බලම් හා තිරුචෙල්වම් යන ජාතිවාදීන් තිදෙනාම මියගිය අතර ඔවුන්ගේ මළමිණීවලට මුවාවි අප්පාපිල්ලේ අමිර්තලිංගම්. සිවසිත්තම්පලම්, හා වෙට්ටිවේලු යෝගේස්වරන් විසින් මෙහෙයවන ලද දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ පෙර නොවුවිරූ ප්‍රචණ්ඩක්‍රියා සහිත මැතිවරණයක් මෙහෙයවිය. මැතිවරණයට පෙර කරුණානිධි, ෂන්මුගනාදන් හා වී.සන්මුගනාදන් යන පොලිස් නිල්ධාරින් තිදෙනාව කන්කසන්තුරේ දී ඝාතනය කරන ලදි. ද්‍ර.එ.පෙ. බලයට පත්වි හයමාසයක් ඇතුළත උතුරු හා නැගෙනහිර පළාත්වල ඊලාම් රාජ්‍යයක් බිහිකරණ බවට දිවුරා පොරොන්දු ලබාදෙන ලදී.

එම්.එච්.එම්. අෂ්රෆ් ඇතුළු සැලකිය යුතු මුස්ලිම් පිරිසක් ද මේ ඊලාම් උද්ඝෝෂණය වට පෙළගැසී සිටියහ.

මේ සියල්ල මාධ්‍යයේ දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ 1977 ජූලි මැතිවරණයෙදී ලබා ගත හැකිවුයේ සමස්ත ඡන්දයෙන් 6.75% ක් පමණි. මුස්ලිම් ඡන්ද අත්හැරී විට 1977 දි වත් දෙ.එ.වි.පෙ. 50% දෙමළ ජන කැමැත්තක් නොවු බව පෙනීයයි. (මෙය 1982 ජනාධිපතිවරණයේදී ද යාපන දිස්ත්‍රික් දෙමළ ජනතාව ඔප්පුකර පෙන්වුහ) මාස 6 කින් ඊළාම දෙන බවට වු දෙ.එ.වි.පෙ. ව්‍යාජය ඉක්මණීන් පිපිරී ගිය අතර 1977 සැප්තැම්බර් හා 1978 දිත් උතුරේ සිංහල විරෝධි ප්‍රචණ්ඩ ක්‍රියා ඇති විය. 1971 දි 20, 402 ක් වු යාපනය සිංහල ජනගහණය 1981 දි 4625 ක් බව පත්වුයේ මේ ප්‍රචණ්ඩ ක්‍රියා නිසාය.

1981 ජූනි සංවර්ධන සභා මැතිවර්ණයේ පසු සමස්ත දෙමළ සමාජයම ප්‍රචණ්ඩ ත්‍රස්තවාදයට ගොදුරු වු අතර එය ඊලගට මුළු ශ්‍රී ලංකාවම ගිල ගත්තේය.

# ලේ විල මත සාම දිය කෙලිය

1985 ජුනි මාසයේ භූතානයේ තිම්පු නුවරට එක්ව ශ්‍රී ලංකා ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනගේ මලනුවන් වූ එච්.ඩබ්. ජයවර්ධන මහතා, අධිනීතිඥ එස්. එල්. ගුණසේකර මහතා හා තවත් ශ්‍රී ලංකික නියෝජිතයන් පිරිසක් සැපවත් වූහ. ඔවුන් එසේ ඉන්දියාවේ උතුරු පෙදෙසේ තිබූ කඳුකර බෞද්ධ රාජ්‍යයකට ගමන් කළේ ශ්‍රී ලංකාවේ ඊනියා ජන වාර්ගික ප්‍රශ්නයට විසඳුමක් සොයා ගැනීම පිණිස ඉන්දියාවේ මැදිහත් වීමෙන් පැවැත් වූ සාකච්ඡාවලට සහභාගි වීමය.

ජයවර්ධන රජය 1985 ජුනි 18 දා මේ "තිම්පු සාකච්ඡා"සඳහා සටන් විරාමයක් දියත් කරන ලද අතර හමුදාවෝ සිය බැරැක්කවල සිදුකරනු ලැබූහ. එල්.ටී.ටී.ඊ. ටෙලෝ, ඊ.පි.ආ.ර්.එල්.එෆ්. සහ ඊරෝස් සංවිධාන එක්වී ඊලාම් ජාතික විමුක්ති සංවිධානයක් (ඊ.ඇන්.ඇල්.ඇෆ්.) ගොඩනගා තිබූ අතර හමුදා භටයින්ගේ හිස්වූ අර්ධද්වීපයේ සෑම මංසංධියකම දැකගත හැකිවූයේ තරඟයට මෙන් අනාගත යුද්ධය සඳහා බංකර තැනීම, ගැටවර - ගැටවරියන් පුහුණු කිරීම, මොරිස් මයිනර් රථවල බඳන ලද ලවුඩ්ස්පීකර් වලින් වැයෙන ඊලාම් රණගොස ආධියයි.

මේ අතර කොළඹ ආණ්ඩුව උදාවන සාමය ගැන ප්‍රශස්ති වයමින් සිටි අතර සිය මාධ්‍ය උපරිම ලෙස යොදා ගනිමින් සාමයේ අගය ජනතාවට ප්‍රකාශ කරමින් සිටියේය. එම මොහොතේදී යාපනයේ කිලිනොච්චියේ, මුලතිව්, හා වව්නියාවේ ඇසුණේ ශ්‍රී ලංකා ආණ්ඩුව දණගසා ඇති බවත් යළිත් හමුදාවට කඳවුරුවලින් එළියට බැසීමට නොහැකි ලෙස ප්‍රහාරයන් දියත් කිරීම පිළිබඳව යුද්ධයේ අගය ප්‍රකාශ කරන මාධ්‍ය ප්‍රචාරණයන්ය.

කෙසේ වෙතත් සාම සාකච්ඡා කොන්දේසි විරහිතව ආරම්භ කරනවා යැයි ඉන්දීය නිලධාරීන් වූ පර්තසාරතී හා ඩික්සිත් (මානී) විසින් දුන් පොරෙන්දු අකුරටම ඉටුකරමින් දෙමළ ජාතිවාදී සංවිධාන හතර හා ඔවුන්ගේ දේශපාලන පෙරමුණ වූ දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ කොන්දේසි හතරක් ඉදිරිපත් කළෝය. ඒවා ඕනෑම සකච්ඡාවක පදනම බවද ප්‍රකාශ කළහ. ඒවානම්,

1. දෙමළ ජාතිය වෙනම ජාතියකි

2. එම දෙමළ ජාතියට වහා පුරවැසිකම් ලබා දිය යුතු ඉන්දීය වතු කමකරුවන් ද ඇතුළත්ය.

3. එම අනන්‍ය දෙමළ ජාතියේ සාම්ප්‍රදායික නිජබිම ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ඒකාබද්ධ පළාතය.

4. එම බිම තුළ දෙමළ ජාතියට අවශ්‍ය නම් ස්වාධීන රාජ්‍යයක් ලෙස පාලනය වීමේ ස්වයංණීර්නය නම් අයිතිය ඇත.

සකච්ඡා සඳහා ඉදිරිපත් කළ පූර්ව කොන්දේසි හතර කියාපෑවේ දෙමළ ඊළාම් රාජ්‍යය පිළිගැනීම සාකච්ඡා සඳහා අත්‍යාවශ්‍ය බවය.

සාකච්ඡාවලින් දෙමළ ජාතිවාදීන්, ඉන්දියාව හෝ බලය සඳහා ඕනෑම පාවාදීමකට සුදානම්ව සිටි කොළඹ ලංකා ආණ්ඩුව හෝ පාඩමක් උගත්තායැයි සැක සහිතය. කෙසේ වෙතත් එයින් භූතානයේ බෞද්ධ රජ වූ 'වංචුක්' රජතුමා නම් පාඩමකට උගත්තේය. එනම් භූතාන වැසියන්ගෙන් 40% ක් ඉන්දීය සම්භවයක් සහිත හින්දු ජනයා නිසා ඕනෑම අවස්ථාවක ලංකාවේ 12% ක්වූ දෙමළ හින්දූන් 67% වූ බෞද්ධයන්ට පෙන්වන වර්ගයේ "සර්කස් දර්ශන" අනාගතයේ භූතානයට ද දර්ශනය විය හැකි බවය. අධිෂ්ඨානශීලී ලෙස ක්‍රියාත්මක වූ වංචුවක් රජු බෞද්ධයන් හැර සෙසු ජනයාගේ පුරවැසි අයිතිය අහෝසි කරන ලද අතර ලක්ෂ ගණනක් හින්දු ජනයා භූතානයෙන් පිටමන් කළේය. මෙලෙස වංචුක් රජු 40% ජනහනයකට ඉඩම් හිමිකර ගැනීමේ අයිතිය ඡන්ද බලය හෝ පුවැසි අයිතිය සහමුලින් අහෝසි කළේය. එහෙත් පුදුමයකට මෙන් අද භූතානයේ ත්‍රස්තවාදය නැත. බෙදුම්වාදයක් නැත. ශ්‍රී ලංකාවේ ඒ සියල්ලට හරියන්නට බෝම්බ පිපිරේ. ගම්මාන පිටින් අහංසකයන් ඝාතනය කෙරේ. ආගමික සිද්ධස්ථාන පුපුරවා හැරේ.

එහෙත් ලොව පුරාම කියන්නේ ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාව සංහාරයකට ලක්වී ඇති බවය.

සාකචඡා වලට මුවාවී පියවරින් පියවර සිය ඉලක්කය ලබාගැනීම 1949 න් පසු දෙමළ ජාතිවාදයේ උපාය මාර්ගයය. 1956 දී උතුරු පළාතේ බහුතර ආසන සංඛ්‍යාවක් දිනා ගැනීමෙන් පසු දෙමළ රාජ්‍ය පක්ෂයේ නායක චෙල්වනායගම්, බණ්ඩාරනායක අගමැතිවරයාට තර්ජනයක් කරකමින් ප්‍රකාශ කළේ වෙනම රාජ්‍යයක් සඳහා උද්ඝෝෂණයක් 1957 ජූනි මස අරඹන බවය. එවිට බණ්ඩාරනායක මහතා කළේ රටටත් ජනතාවටත් හොරෙන් සිය ශාන්ත තෝමස් විද්‍යාලයේ පාසල් මිතුරාවූ චෙල්වනායගම් සමග එක්වී රට සභා නමින් ප්‍රාන්ත රාජ්‍යය ක්‍රමයක් බිහිකර ගැනීමට කුමන්ත්‍රණය කිරීමය. මෙය ඊනියා බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම ලෙස ප්‍රකට විය. ගිවිසුමට විරෝධය පෑමට මුලිකත්වය ගත්තේ විපක්ෂයට වැටී සිටි එක්සත් ජාතික පක්ෂයේ වැඩ බලන නායකයාවූ ජේ.ආර්. ජයවර්ධනය. ජේ. ආර්. ගේ රට බේරාගැනීම සඳහා වූ නුවර පාගමනට

අවශ්‍ය ආධාර සැපයුවේ එම්.වී.පී. පීරිස් මහතායි. 1957 ජූලි 26 දා අත්සන් කරන ලද බණ්ඩාරනායක චෙල්වනායගම් රටසභා පනත රට දෙකඩවීමේ පළමු පියවර යැයි ජයවර්ධන මහතා උද්ඝෝෂණය කළේය.

ඉතිහාසයේ සරදමට මෙන් 1965 මාර්තු මස දිනකදී වෛද්‍ය එම්.වී.පී. පිරිසකගේ නිවසේදී චෙල්වනායගම් දිස්ත්‍රික් සභා ගිවිසුම ජනතාවට හොරෙන් අත්සන් කළේ එළෙසය.

ජාතික යැයි කියාගන්නා දේශපාලනයේ නින්දිත කුහක කම එළෙස හෙළිදරවූ විය. මේ පිළිබඳව චෙල්වනායගම්ගේන් "ස්න්" [SUN] පුවත්පත ප්‍රශ්න කළවිට ඔහු කීවේ තම ප්‍රතිපත්තිය **"දැන් ටිකක් හා පසුව ගොඩක්"** බවය.

1977 සිට රඟ දැක්වෙන්නට වූයේ මේ නිසා ඊනියා සාම සාකච්ඡාවල හා දේශපාලන විසදුමක අවශ්‍යතාව පිළිබඳය. මුළින්ම එය වට මේසයේ සාකච්ඡා විය. අවසානයේ දී දෙමළ එක්සත් විමුක්ති පෙරමුණත්, ආණ්ඩුවත්, විපක්ෂයත් බොහෝ පක්ෂත්, මහා සංඝයාත් එක්වී සාමය වෙනුවෙන් එකඟ තාවයකට පැමිණියහ. 1981 දී පිහිටුවනු ලැබූ දිස්ත්‍රික් සංවර්ධන සභා එහි ප්‍රතිඵලය විය.

දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ දිස්ත්‍රික් සංවර්ධන සභා තරඟ කළ අතර ඔවුන් විසින් ඇති දැඩි කළ දෙමළ ජාතිවාදී සංවිධාන එය කඩාකප්පල් කිරීමට ප්‍රචණ්ඩ ක්‍රියා කරන්නට වූහ. එවකට ආණ්ඩුවට සම්බන්ධ වූ මැරයන්ද ප්‍රචණ්ඩ ක්‍රියා කළහ. හය මසක් යාමට පෙර චෙල්වනායගම්ගේ උපදේශනය අනුව යමින් (දැන් ටිකක් හා පසුව ගෙඩක් ලෙසට) අමිර්තලිංගම් තමන්ට පළාත් සභා අවශ්‍ය බව කීවේය.

1981 ජූනි මස සංවර්ධන සභා පිහිටුවන විට දෙමළ ත්‍රස්තවාදය විසින් ප්‍රතිවිරුද්ධ දේශපාලකයින් තිදෙනකුද සාමාන්‍ය වැසියන් 15 දෙනෙක්ද පොලිස් නිලධාරින් 18 දෙනෙක් ලෙසට 36 දෙනෙක් ඝාතනය කර තිබේ. එයින් සිංහලයන් ඝාතනය කර තිබුණේ 4 දෙනෙක් පමණි. මේ අනුව මුළු කැරලිකාරීත්වය නිසාම මිය ගිය ගණන 50 කට නොඅඩුය.

එහෙත් ජූනි වල සිට ඊනියා සාම ගිවිසුමට පින් සිදුවන්නට ප්‍රචණ්ඩ ක්‍රියා සීග්‍රයෙන් ඉහළ නැග්ගේය. දේශපාලන විසඳුම් වලින් ත්‍රස්තවාදය මර්ධනය වන බවට වූ ජනප්‍රිය මතය අසත්‍යක් බව ඔප්පු වූයේ 1981 තරම් මෑතකදීය.

1981 යනු තීරණාත්මක වර්ෂයකි. මේ සියවස මුලදී සිට දෙමළ ජාතිවාදය උත්සහ කළේ ශ්‍රී ලංකාවේ පාලනය අල්ලා ගැනීමටය. (1911-31) ඉන්පසු උපක්‍රමිකව රටේම බලය සමසමව බෙදා හදා ගැනීමට තැත්කරන ලදී. (1931-47)

ඉන්පසු උතුරු හා නැගෙනහිර පළාත් දෙකම වෙන් කර ගැනීමට තැත්කරන ලදී. ඒ සඳහා දේශපාලනික, මතවාදී, උද්ඝෝෂණික හා යදමය ලෙස පෙරමුණු කිහිපයක් ඇති කරන ලදී. අන්තිමේදී ඔවුන්ට 1981 දී දිස්ත්‍රික් සභා ලැබුණි. ඒ සඳහා මරා දැමීමට සිදුවූයේ 36 දෙනකු පමණි. දැන් ඉතින් ඉදිරියේදී පළාත් සභා ඒකාබද්ධ පළාත් සභා පෙඩරල් රාජ්‍ය, මධ්‍යම ආණ්ඩුව බෙදා හදාගැනීම හා ශ්‍රී ලංකා රාජ්‍යය අල්ලා ගැනීම ආදී පියවර වෙයි.

1983 ජූලි 23 වැනිදා යාපනය පලාලි මාවතේ "වයි" හන්දියේදී ශ්‍රී ලංකා යුද හමුදා ඛණ්ඩයට ත්‍රස්තවාදීන් ප්‍රහාරයක් එල්ල කළ අතර මාදගල් කඳවුරට අයත් දෙවන ලුතිනල්වරයකු හා සෙබළු දොලොස් දෙනකු ජීවිතක්ෂයට පත්වූහ. 1983 ජූලි 23 දක්වා ප්‍රහාර වලින් ආරක්ෂක අංශවල 50 දෙනකු මියගොස් සිටි අතර දේශපාලකයින් 11 දෙනකු සාමාන්‍ය වැසියන් 19 දෙනක්ද සහිතව 90 දෙනෙක් ඝාතනය කර තිබිණ.

"වයි" හන්දියේ ඝාතනය සිංහල ජනයාගේ හිත් සසල කළේය. පියවරින් පියවර දෙමළ ජාතිවාදීන් විසින් යාපනයේ සිංහල ජනයා පළවාහරිමින් උම්මත්තක ජාතිවාදී සංහාරයකට මුල පුරාඇති බව සියළු දෙනාට පැහැදිලි විය. ආණ්ඩුව ක්‍රියා කළේද ඉතාම වගකීම් විරහිතවය. මේ නිසා එකවරම යාපනයේ හා කොළඹ ජාතිවාදී ගැටුම් ඇතිවූ අතර කොළඹ ඇතිවූ මැර ක්‍රියා වලට ආණ්ඩුවේ දේශපාලකයින්ගේ සහාගීත්වය මිස සාමාන්‍ය සිංහල ජනතාවගේ සහභාගීත්වයක් තිබුණේ නැත.

ලොව පුරා දෙමළ ජාතිවාදය ශ්‍රී ලංකාවේ දෙමළ සංහාරයක් සිදුවන බව ප්‍රචලිත කළේය. අමුවෙන් පුළුස්සා මිනිසුන් මරා දැමූ හැටිද. දෙමළ මස්, සිංහල මස් කඩවල විකුණු අයුරුද අද දක්වා ප්‍රකාශ කරනු ලැබේ. අතිශෝක්තියකින් තොරව ප්‍රකාශ කරයි නම් ඒ ජාතිවාදී කෝලාහලය නිසා දෙමළ ජීවිත 311 කිද සිංහල ජීවිත 160 ක්ද වැනසී තිබිණ. මේ ලේ වැගිරීම දිව බොජුනක් වූයේ දෙ.එ.වි.පෙ. හා දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදී කල්ලි වලටය.

83 ජූලි කෝලාහලයෙන් පසු යුගය පිළිබඳවද සටහන් කිරීම වටී. ජූලි කෝලාහලයෙන් මාස 6 ක් ඉක්මවන්නට පෙර සිංහල ප්‍රදේශවල යළිත් දෙමළ ජනයා සිය සුපුරුදු දිවිපෙවත ඇරඹූ අතර වසර 17 ක් ගතවී ඇතිද ඔවුන්ට අබ මල් රේණුවක හානියක් වී නැත. පෙරළා දෙමළ ප්‍රදේශවලින් පළවා හරින ලද සිංහලයින් සාතිශය බහුතරය යළි ඒ ප්‍රදේශවලට නොගිය අතර ඉන්පසු 129 වතාවක් සිංහලයින්ට හා මුස්ලිම්වරුන්ට එරෙහිව දෙමළ ජාතිවාදය සමූහ සංහාර සිදුකර තිබේ. බොහෝ දෙනා කියන්නේ 1983 ජූලි වලින් පසු දෙමළ ජනයා සක්‍රියව ලොව පුරා දෙමළ බෙදුම්වාදී කැරලිකාරීත්වය උපකාර කළ නිසා එය පිම්මේ

වැඩීගිය බවය. එහෙත් සත්‍ය නම් දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදය පිම්මේ වැඩි ගියේ දෙමළ ජනයාගේ දෑත්වල ශක්තියෙන් නොව ඉන්දියාවේ මැදිහත් වීම නිසා බවය. ඉන්දීය මධ්‍යම ආණ්ඩුව 1983 සැප්තැම්බර් මස සිට සෘජුවම ශ්‍රී ලංකාවේ දෙමළ ත්‍රස්තවාදයට උපකාර නොකරන්නට කිසිලෙසක දෙමල ජාතිවාදයට මෙවන් වර්ධනයක් ලැබෙන්නේ නැත.

ඉන්දියාව මැදිහත් වූයේ ඇයි? මෙයට හේතු ගණනාවක් දක්වන්නෝ වෙති.

1. ඉන්දියාව නිදහස ලැබීමට පෙර බ්‍රිතාන්‍යයට යටත් ප්‍රදේශ හා මහාරාජවරු පාලනය කළ රාජ්‍යයන් 562 කින් සමන්විත ප්‍රදේශයකි. පැරණි ආර්යයන්ට ග්‍රීකයන්ට, මෞර්යන්ට හෝ මෝගල් වරුන්ට තබා ඉංග්‍රීසීන්ට වත් ඒ අනුව අද පවත්නා ඉන්දියාව එක් පාලන ඒකකයක් ලෙස පාලනය කළ නොහැකි විය. කෙසේ වෙතත් ඉන්දියාව බිහිවීමේදී මහා භාරතය ඉන්දියාව හා පකිස්ථානය ලෙස දෙකඩ වීම හින්දු ආගම්වාදයේ හිත් වේදනාවට තුඩු දුන්නේය. ගෝඩ්සේ ගාන්ධීට වෙඩි තැබුයේ වැරදීමකින් නොව හින්දු මූලධර්ම වාදයේ සටන්පාඨය වූයේ හින්දි (භාෂාව) හින්දු (ආගම) හා හින්දුස්ථාන් (රාජ්‍යය) ලෙසත් නිදහසින් පසු ඉන්දියාව කලාපයේ බලවත්වීම සඳහා සෘජුවත්, වක්‍රවත් ක්‍රියා කළේය. එය තම පරිවාරයේ වූ කුඩා ස්වාධීන රාජ්‍යක් වන සිකිමයට හමුදා යවා එය තම 25 වැනි ප්‍රාන්තය කර ගත්තේය. පකිස්ථානයට අයත්වීමට ගිය මුස්ලිම් බහුතරයක් සහිත කාෂ්මීරයේන් 75% ක් යුද්ධය කොට ඇදා ගත්තේය. නේපාලයේ රජු ඉන්දියාවට කෙනහිළි කළ විට ඔහුව එළවා දමා තමන්ට හිතවත් කොන්ග්‍රස් පක්ෂ එහි බලයට ගෙනාවේ බෞද්ධයින් පාගා දැමීමෙනි. නේපාලයේ මෙන්ම භූතානයද ඉන්දියාව සලකන්නේ තම පරිවාර රාජ්‍යයන් ලෙසය. කලක් (1947-71) නැගෙනහිර පකිස්ථානය නමින් වූ බංගලාදේශයේ බෙදුම්වාදයට යුදමය හා දේශපාලන උපකාර කර නිදහස් බංගලාදේශයක් බිහි කළේය. (70 දශකය තුළ දෙමළ ජාතිවාදීන් ද විශ්වාස කළේ ඉන්දියාව මැදිහත්වී ශ්‍රී ලංකාවද තමන්ට දෙකඩ කර දෙන බවය) මෙලෙස නේරුගේ පංචසීල විදේශ ප්‍රතිපත්තිය කෙසේවත් එය තමා අවට රටවල් සමග ගැටෙමින් සමහර රටවල් ඈඳාගනිමින් තවත් ඒවා දෙකඩ කර දුර්වල කරමින් තවත් ඒවා බියට පත් කර දෙපයට තබා ගනිමින් ව්‍යාප්තවාදී ලෙස ක්‍රියා කර තිබේ. මේ අනුව ඉන්දියානු ව්‍යප්තවාදී හස්තය ශ්‍රී ලංකාවට යොමු වීම ස්වාභාවිකය. ඉන්දියාව සිටියේ එවැනි අවස්ථාවක් එන තුරුය.

2. එවකට තිබූ ජාත්‍යන්තර තත්වය අනුව ඉන්දියාව, සෝවියට් සංගමය සමගත් 1977 න් පසු ශ්‍රී ලංකාව, එක්සත් ජනපදය සමගත් අත්වැල් අල්ලාගන්නා ලදී. චීනයට අභියෝග කරන්නටය එක්සත් ජනපදය තායිවානය යොදා ගන්නා මෙන් තමන්ට ආර්ථික හා දේශපාලනික ලෙස අභියෝග කිරීමට එක්සත් ජනපදය, ශ්‍රී ලංකාව යොදා ගන්නා බව 1977 න් පසු ඉන්දියාවේ වැටහීම විය. විශේෂයෙන් 1984 දී සිදුවූ එක්සත් ජනපද නියෝජිත වර්නන් වෝල්ටස්ගේ චාරිකාව නිසා ශ්‍රී ලංකාවට වක්‍ර යුද්ධයක් දියත් කළේ ඒ නිසාය. මෙය 1969-71 වකවානුවේදී පකිස්ථානයට සිදුකළ මෙහෙයුමට සමාන ක්‍රියාවකි.

3. ඉන්දියාවට සිංහල ජනයා ගැන ඓතිහාසික සැකයක් ඇත. එය තම ජනකොටස ලෙස සලකන්නේ දෙමළ ජනතාවයි. තමිල්නාඩුවේ ප්‍රාන්ත දේශපාලනයට මේ සමග එකට බැඳී ඇත. ඉන්දියානු ජාතික කොංග්‍රසයේ ලෞකික ප්‍රතිපත්තියට එරෙහිව හින්දි හින්දු හින්දුස්ථාන් සටන් පාඨය 1928 සිට ඇසෙන්නට වූ විට එයට පළමු ප්‍රතික්‍රියාව ලැබුණේ මදුරාසි ප්‍රාන්තයෙනි. එය හින්දුස්ථානයට එරෙහි ද්‍රවිඩස්ථානයට විය. මේ නිසා වරක් තමිල්නාඩුවව විසින් ඇවිස්සීමට පෙර ඉන්දීය මධ්‍යම ආණ්ඩුවට ප්‍රශ්නයට මැදිහත් විය. මෙයට තමිල්නාඩුවට ගලා ආ දෙමළ අනාථයින්ගේ ප්‍රශ්නයද බලපෑවේය.

4. ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනයට හවුල්ව සිටි ඇතැමුන් ඉන්දීය විරෝධීන් වූ අතර ශ්‍රී ලංකාවේ එවකට සිටි මහ කොමසාරිස් ජේ.එන්. ඩික්සිත් දැඩි සිංහල විරෝධියෙකු විය. මොවුන්ගේ පෞද්ගලික මතවාදයද ඉන්දු ලංකා ගැටුමක් බවට පත් විය. එයට ගාන්ධිවරු හා එජාපය අතර තිබුණු සාම්ප්‍රදායික නෝක්කඩුවක් ද හේතු විය.

මේ හේතූන් ගෙන් එකක් හෝ හේතු සියල්ලම නිසා හෝ වේවා 1984-90 කාලය තුළ ඉන්දීය මධ්‍යම ආණ්ඩුව සක්‍රිය ලෙසම ශ්‍රී ලංකාවේ දෙමළ ත්‍රස්තවාදයට අවශ්‍ය අවි ආයුධ පුහුණුව, රැකවරණය. දේශපාලන බලය ලබාදුන්නේය. ශ්‍රී ලංකාවේ දෙමළ රාජ්‍යයක් බිහිවීම තමන්ගේ දේශයේ ආරක්ෂාවට අනාගත තර්ජනයක් බව දැන දැනම එය සිය හමුදා හා දේශපාලනික ලෙස මැදිහත් වීම සිදු කළේය.

1984 දී ඇත්වූ සර්වපාක්ෂික සමුළුව 1985 දී ඇතිවූ තිම්පු සාකච්ඡා 1986 දී ඇතිවූ පළාත් සභා යෝජනා හා 1987 දී ඇතිවූ ඉන්දු-ලංකා ගිවිසුමෙන් ඉන්දීය මැදිහත් වීම කූටප්‍රාප්ත විය. මේ වකවානුව තුළ පැවති සෑම සාම සාකච්ඡාවකින්ම

සිදුවූයේ වර්ධනය වීම පමණි. අන්තිමේදී ද ඉන්දීය හමුදා උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල මෙහෙයුම් සිදුකළ අතර කොටි සාමාජිකයින් දහසක් පමණ ද, සාමාන්‍ය දෙමළ වැසියන් 900 ක් පමණ ඉන්දීය භටයින් දහසකට වැඩි ප්‍රමාණයක් ද එහිදී ඝාතනය විය. ඉන්දීය හමුදා මැදිහත් වීම හා ඉන්දු - ලංකා ගිවිසුම දඩමීමා කරගෙන සිය මාක්ස්වාදී විප්ලවකාරී හිස් දේශප්‍රේමයක සඟවා ගත් ජනතා විමුක්ති පෙරමුණ දකුණේ කැරැල්ලක් දියත් කළ අතර ඔවුන් විසින් ද හමුදා සෙබලුන්, පොලිස් නිලධාරීන් හා දේශපාලන ක්‍රියාධරයන් ඇතුළු 5680 ක් ඝාතනය කරන ලදී. මර්ධනය සහමුලින්ම වාගේ සම්මත නීතියට පිටතින් සිදුවූ අතර ජ.වි.පෙ. සාමාජිකයින් 20,000ක් සමග 66,000 ක් සිංහලයින් සංහාරය වූ බවට විශ්වාස කටයුතු සංඛ්‍යා ලේඛන ඇත. මේ අනුව 1987- 98 දකුණේ ඇතිවූ භීෂණ සැලකිය යුත්තේ ද උතුරේ ජාතිවාදයේ අතුරු ඵලයක් ලෙසය. උතුරට සාමය ගෙන ඒම සඳහා දකුණේ මිනී කන්දක් කරනු ලැබීය. මෙය අනාගතයේ දී ද උතුරට පමණක් කෙසේ හෝ සාමය උදාකිරීමට වලකින බලවේග වලට ලෙයින් පෙන්වා දෙන සත්‍යය. එමෙන්ම ඊනියා තුන්වැනි පාර්ශවයක මැදිහත් වීමෙන් සිදුවන තත්වය කිසිවෙකුට පාලනය කළ නොහැකි අපරාජික තත්වයකට රට ඇදවීමට බවද තවත් උගතුයුතු සත්‍යකි.

1984 දී ඉන්දීය ඔත්තු සේවාවේ කේ.එන්. කාවෝ හා පසුව සැක්සේනා විසින් දියත් කරන ලද "ශ්‍රී ලංකා ක්‍රියාකාරීත්වය"දැන් මදක් විස්තරාත්මකව සලකි බැලිය යුතුය.

1984 - 87 කාලය තුළදී ඉන්දීය ඔත්තු සේවය විසින් ඉන්දියාවේ ප්‍රදේශ ගණනාවකදී ඇති කරන ලද කඳවුරු 29 කදී අඩුම තරමින් විවිධ කණ්ඩායම් වලට අයත් දෙමළ ජාතිකයින් 25,000 යුද භටයින් ලෙස ත්‍රස්ත ක්‍රියා වලට පුහුණු කර ඇත. මේ කණ්ඩායම් වල ශ්‍රී ලංකාවේද පවත්වාගෙන ගිය කඳවරුවල ද පුහුණුව ලත් පිරිස සලකා බැලුව විට මේ ගණන 42,000 ක් තරම් ඉහළ සංඛ්‍යාවක් වෙයි. මේ වකවානුවේ ශ්‍රී ලංකා යුද හමුදාවේ සිටියේ 27,000ක් පමණ වන අතර මෙහෙයුම් සඳහා යොදාගත්තේ ඔවුන්ගේ අඩක් පමණ (15,000) පිරිසකි. තත්වය එසේ තිබියදී පුදුමය නම් 42,000ක පිරිස 15,000 ක පමණ පිරිසක් යටත් කර ගැනීමට නොහැකි වූයේ ඇයිද යන්නය. මේ පුහුණුව ලැබූවන්ගෙන් වැඩි පිරිසක් විසිරී ගියහ. 1986 මැයි මාසයේදී ප්‍රභාකරන් විසින් සභාරත්තම් හා ටෙලෝ හා ප්ලෝටෝ සංවිධාන දෙකට කොටි සංවිධානය එල්ල කළ මාරාන්තික ප්‍රහාරය නිසා සටන් පුහුණුව ලැබූ විශාල පිරිසක් විසිරී ගියහ. 1986 දෙසැම්බර් 14 දා සිට කොටි, ප්ලොටි සහ ඊ.පී.ආර්.එල්.එෆ්. සංවිධාවය තහනම් කර සමූහ ඝාතනය අරඹන ලදී. කෙසේ වෙතත් 1987 මැයි මස

8000 ක ගෙන් යුතු බලඇණියක් විසින් කොබ්බෑකඩුව මහතා විමුක්ති මෙහෙයුම සිදුකළ විට කොටි සංවිධානයේ ඊනියා මාරක බලය දෙදරුම් කෑවේය. ඔවුන් සහමුලින්ම විනාශ නොවී ඉතුරු වූයේ ඉන්දියාවේ සෘජු මැදිහත් වීම හා අරාධිත ආක්‍රමණ නිසාය. 1986 මැයි මස සිට 1987 ඔක්තෝබර් දක්වා යාපනය අර්ධද්වීපයේ සිවිල් පාලනය කොටි සංවිධානය සතුව පැවතුණු අතර මේ වකවානුව තුළ ඕනෑම යුද ගැටුමකට හසුව අතුගෑවී නොයන්නට අවශ්‍ය කරන ශක්තිය ලබා ගත්තේය. යාපනයේ අවසන් සිංහලයාත් අමුඅමුවේ පුළුස්සා පලවා හරින ලද්දේ මේ වකවානුවේදීය. ඉන්දීය හමුදාවල ආධාරයෙන් 1987 සැප්තැම්බර් මසදී ත්‍රිකුණාමලය හා නැගෙනහිර පළාතේ සිංහලයින් සංහාරය පළවා හැරියේ 1987 ඔක්තෝබර් 06 දාය. ඔක්තොබර් 09 වෙනිදා කොටින්ට එරෙහිව පවාන් මෙහෙයුම ඇරඹුණි.

1987 දෙසැම්බර් වන විට කොටි සංවිධානයේ බලමහිමය පාලනය කරන්නට ඉන්දීය හමුදාවට හැකි වුවත් සිය සුපුරුදු මුග්ධත්වය ප්‍රදර්ශනය කරමින් ඔවුන් එය අතුගා දැමීමට කටයුතු නොකළේය. ප්‍රතිඵලය වූයේ ඒවන විටත් බටහිර ලෝකයේ ජාලයක් ගොඩනගා සිටි ප්‍රභාකරන්ට බටහිර ආණ්ඩු උපකාර කිරීමය. 1988 මාර්තු සිට කොටි නැවතත් ඉන්දීය ඔත්තු සේවය (R.A.W.) සමඟද සබඳතා ඇතිකර ගත්හ.

1983 න් පසු ප්‍රභාකරන් ඉන්දියාවෙන් පමණක් නොව බටහිර ආණ්ඩුවලින් ද උපකාර ලබා ගත්තේය. රාජ්‍ය නොවන සංවිධාන හරහා දෙමළ ජනාවාස බිහිකරනු ලැබූ අතර කොටි සංවිධානයට පිරිස් මෙන්ම විදේශ ධනයද, විදේශ ප්‍රචාරයද ලැබුණි. විදේශ රටවල අවි වෙළඳපොළ හා ජාවාරම් කරුවන් හඳුනා ගැනීමට ද ඒවා පරිහරණයටද ප්‍රභාකරන්ට මේ රටවල් ඉඩ ලබා දුන්නේය. ඔවුන්ගේ බලාපොරොත්තුව වූයේ ප්‍රභාකරන් ලවා ඉන්දියාව බෙදා වෙන්කරලීමය. සමහර රටවල් තම ආගමික මූලධර්ම වාදය ව්‍යාප්ත කරලීම සඳහා කොටින්ගේ දෙමළ ජාලය භාවිතා කළේය. අවි ජාවාරම් කරුවෝ තමන්ගේ අවි අලෙවි කර ගැනමටද අවි අත්හදා බැලීමටද තොතැන්නක් ලෙස ශ්‍රී ලංකාව තේරුම් ගෙන කොටි සංවිධානය ශක්තිමත් කරන්නට වූහ. 1987 ඔක්තෝබර් සිට ප්‍රභාකරන්ට ඉන්දියාවට එරෙහිව සටන් කිරීමට ධෛර්යයක් ලබාදුන්නේ බටහිර රටවල් විසිනි. අන්තිමේදී ප්‍රභාකරන්ගේ ගැලවුම් කාරයා වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රේමදාස ආණ්ඩුවය.

1977 සිටම ශ්‍රී ලංකා ආණ්ඩුව දෙමළ ත්‍රස්තවාදය සඳහා අනුගමනය කළේ දෙබඩි පිළිවෙතකි. එය නම් ක්‍රමයෙන් ත්‍රස්තවාදය බලවත් වී රටම ගිලගන්නා තුරු සාමය-යුද්ධය-සාමය වරින්වර මැතිරීම පමණකි. රටේ ආර්ථිකය කඩා

වැටුණු අතර ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනයක් ඇතිවිය. 1987 අප්‍රේල් 12 වැනිදා සටන් විරාමයක් ප්‍රකාශ කෙරුණේ සිංහල දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් යැයි කියවිණි. එහෙත් තිරයෙන් පිටුපස ආණ්ඩුව ඉන්දියාව හා කොටි සාකච්ඡා කරමින් සිටියහ. කොටි සංවිධනය සටන් විරාමය කඩිමට පිළිතුරු දුන්නෝය. අප්‍රේල් 17 දා හබරන කිතුල්උතුවේදී බස්රථ දෙකක සිට සිංහලයන් 127 ක් කපා කොටා මරා දැමුණු අතර අප්‍රේල් 21 දා පිටකොටුවේ බස් නැවතුමේ බෝම්බයක් පුපුරවා හැර 114 දෙනකු ඝාතනය කර 1052 දෙනකුට තුවාල සිදුකළහ. කොටුවේ ලංකා බැංකු ගොඩනැගිල්ල විවෘත කිරීමට ගිය ජනාධිපතිවරයා උද්වේගයෙන් ප්‍රකාශකලේ කොටි ත්‍රස්තවාදය සහමුලින්ම අවසන් කරන බවය. එහෙත් 1987 ජුලි 29 වැනි බදාදා රූපවාහිනියෙන් ජනතාව ඇමතූ ජනාධිපතිවරයා කීවේ තමන් "දෙමළ සටන් කාමීන්" හා ගිවිසුමකට ගිය බවත් ඊළඟ සඳුදා වනවිට ඔවුන් සතු ආයුද භාරදී සාමය උදාකරන බවත්ය. **ඒ සඳුදා යළි නොආ අතර රටම ලේවිලක් විය.**

මේ ලේවිල මැදින් පිහිනා බලයට පත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයා කොටි සංවිධානය සමග රහසින් සාකච්ඡාවන් සම්මුතියෙන් සම්මන්ත්‍රණයෙන් තමන් සාමය උදාකරන බවට හෙතෙම වහසි බස් දෙඩවූයේය. ප්‍රේමදාස මහතා කොටි සංවිධානය සමඟ සාකච්ඡා ආරම්භ කරන විට ආරක්ෂක අංශවල 1237 ක් කොටි සංවිධානය මරා තිබිණි. 843 ක් අතුරුදහන් වී හෝ අංගවිකල වී සිටියහ.

ඔහුගේ සාකච්ඡා වර්ෂයකට අධික කාලයක් ඇදෙමින් ගියේය. කොටින්ට අවි ආයුධ, මුදල් පමණක් නොව කොළඹ නවාතැන්ද සැපයිනි. ඉන්දීය හමුදා ඉවත්වීමෙන් පසු කොටි යාපන අර්ධද්වීපය සති කිහිපයක් තුළ සියතට ගත්හ. වවුනියාවේ සිට උතුරට තිබූ පුලියම්කුලම, මාන්කුලම, කොකාවිල්, හා කිලිනොච්චි හමුදා කඳවුරු පවාදෙනු ලැබූ අතර අලිමංකඩ සිට වවුනියාව දක්වා සැතපුම් 56 ක දුර මුළු වන්නි තිරයේම කොටි සංවිධානයට පවාදෙනු ලැබීය. (1990 නොවැම්බර් 22 වනදා කොටි සංවිධානය මාන්කුලම හමුදා කඳවුර අල්ලා ගැනීම සඳහා වසරකට අධික කාලයක් සටන් වදින්නට ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවට සිදුවූ අතර ඒකාලය තුළ දිවි පිදූ සෙබලුන්ගේ ගණන 3150 වන බව වාර්තාවේ මෙයින් පෙනී යන්නේ ප්‍රේමදාස - ප්‍රභාකරන් සාම සාකච්ඡාවල හා කඳවරු අතහැර දැමීමේ දේශපාලකයෙකුගේ තීන්දුවල වන්දිය ගෙවීමට එකී සාකච්ඡා මගින් වසර 10 කට පසුත් ජාතියට සිදුවී ඇත.) මේ කාලය තුළ අඩුම තරමින් නැව් 6

විදේශ වලින් ගෙන්වා ගැනීමටද කොළඹ මහනුවර ආදී ප්‍රදේශවල ආරක්ෂක නිවාස මිලදී ගැනීමට ද පතාල ලෝකය විනිවිද යෑමට ද කොටි සංවිධානය සමත් විය.

ප්‍රතිඵලය ක්ෂණික විය. 1990 ජුනි 11 දා කොටි සංවිධනය නැගෙනහිර පොලිස් ස්ථානවලට පහර දුන්නේය. කොටින්ට යටත් වන ලෙස කොළඹින් නියෝග ලැබුණු අතර සිරකරුවන් බවට පත්වූ පොලිස් නිලධාරීන් 600 කගේ පමණ රුධිරය ඇදගැනීමෙන් පසුව වාලච්චනේ තිරුක්කෝවිල් කැලයේ දී අමු අමුවේ ඝාතනය කරන ලදී. 1983 දි වැලිකඩ හිරගෙදරදී කොටි සැකකරුවන් 53 දෙනක් සිරකරුවන් විසින් මරාදැමීම ගැන අඳත් කථාකරන ඊනියා මානව හිමිකම් සංවිධාන නිරායුධව යටත් වූ ඒ පොළිස් නිලධාරින් 600 කගේ ජීවිත ගැන වචනයක් වත් කථාකළේ නැත. ඔවුන්ගේ මිනී ඇටකටු හාරා ගොඩගන්නට කිසිඳු ජාත්‍යන්තර සංවිධානයක් ඉදිරිපත් වූයේ නැත.

ප්‍රේමදාස ප්‍රභාකරන් සමග මධුසමය බරපතල ප්‍රතිඵල ගෙන දුන්නේය. කොටි සංවිධානය මුල්වරට ශ්‍රී ලංකා යුද හමුදාවේ ආරක්ෂක සංකීර්ණය විනාශ කිරීමට තරම් බලවත් වූයේ ඒ ඊනියා සාම සාකච්ඡා නිසාය. ප්‍රේමදාසගේ සාකච්ඡාවලට පෙර මරාදමන ලද ආරක්ෂක හමුදා සාමාජිකයින්ගේ ගණන 1237 ක් වු බවත් අතුරු දහන් වූ තුවාල හා අංග විකල වූ පිරිස 843 ක් බව කළින් කීවෙමු. 1972 - 89 ජුනි දක්වා කාලයක් ඒ සඳහා වැය විය. එහෙත් සාම කථා වලට පිං සිදුවන්නට 1989 ජුනි හා 94 නොවැම්බර් අතර ආරක්ෂක හමුදාවල 2679 ක් (සාමකථාවලට පෙර මියගිය පිරිසමෙන් දෙගුණයක්) මරා දැමුණු අතර 5565 ක් අතුරුදන් හෝ අංගවිකල කරනු ලැබීය. මුළු උතුරු පළාත් නැගෙනහිර පළාතේ සැලකිය යුතු කොටසකුත් කොටි පාලනයට නතු විය. නීති විරෝධී කොටි පොළිස් උසාවි බැංකු හා පරිපාලනයක් උතුරේ බිහිවිය.

1987 ඉන්දු - ලංකා ගිවිසුමටත් 1989 - 90 ප්‍රේමදාස ප්‍රභාකරන් කථාවලටත් මුල සිටම එරෙහි වූයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට පත්වූ අතර 1994 දී එම පක්ෂය බලයට පත්වූ අතර නොවැම්බර් මස සිට එහි නායිකාව සිය පක්ෂය අතීතයේ කළ දේ සියල්ලටම පයින් ගසා කොටි සංවිධානය සමග සාකච්ඡා ආරම්භ කළාය. සාමය හා සමෘද්ධිය ඇගේ සටන් පාඨය විය. උතුරේ ගොඩබිමත්, මුහුදත්, අහසත් කොටි සංවිධානය පාලනය කළ නිසා දැනටමත් රට දෙකඩ වී ඇති බවද පුරාජේරු ඇසිණි. දෙමළ ජාතිවාදීන් රාජ්‍යයේ සියළු අංශ පාලනය කිරීමට ඉදිරිපත් වූ අතර වෙස්වලාගත් කොටි නායකයකු වන වසන්ත රාජා රූපවාහිනිය මගින් සාමය උදාකිරීමට පොරොන්දු පිට පොරොන්දු දුන්නේය.

මේ අතර කොටි සංවිධානය සිය සංවිධානය සඳහා විවෘතවම දරුවන් ඇතුළු ගැටවරයන් 3000 පමණ බඳවා ගත්තේය. අඩුම තරමින් අවි නැවු 3 ක්

මේ අතර කාලය තුළ ලබාගෙන ඇත. බැංකොක්හි වෙසෙන පුවත් පත් කලාවේදියකු වන රොබට් කාර්නොයිල් ( ඔහු වර්තමානයේ පෙනේ නම් ආරක්ෂක සඟරාවේ ආසියානු සංස්කාරකවරයායි.) ප්‍රකාශ කරන පරිදි "සෑම්" (SAM) වර්ගයේ මිසයිල තොගයක් කාම්පූචියානු රජයේ දූෂිත නිලධාරීන් පිරිසක් විසින් කොටි සංවිධානයට අලෙවි කර ඇත. චන්ද්‍රිකා - ප්‍රභාකරන් ඊනියා සාම සාකච්ඡා හා සටන් විරාම පවතින විට මේ මිසයිල තායිලන්තයේ චුම්පෝන් වල සිට මුලතිව් දක්වා රැගෙන විත් ඇත. (Interítional & Regionl Security Implicayions of The Sri Lankan Tamil Insurathna Pg 24-25) 1995 අප්‍රේල් 17 ත්‍රිකුණාමලයේ නාවික යාත්‍රාවලට පහරදීමෙන් ඊනියා සටන් විරාමය කෙළවර වූ අතර SMA මිසයිල වලින් අප්‍රේල් 26, 28 දිනවල ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඇන්ටොනී යානා විනාශ කරනු ලැබීය. මේසාම සාකච්ඡා අතර කාලයේදී යුක්‍රේනයේදී නිකොලෙයිව් වරායෙන් කොටි සංවිධානය අයත් එම්තවී. ස්වීනි නැවෙන් ටී.එන්.ටී. වර්ගයේ පුපුරණ ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 60,000 ක් මුලතිව් වනයට ගෙනඑනු ලැබීය. ඊනියා සාම කථා බිඳවැටීමෙන් පසු මේ පුපුරණ ද්‍රව්‍ය වලින් කිලෝ ග්‍රෑම් 1000 ක් පමණ භාවිත කර මහබැංකු ගොඩනැගිල්ල, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, දෙහිවල දුම්රිය ස්ථානය මරදාන දුම්රිය ස්ථානය හා ශ්‍රී දළදා මාලිගාව පුපුරවා හරිනු ලැබූ බව තේරුම් ගත යුතුය. තව දශක ගනණාවක් යන තෙක් ඒ පුපුරණ ද්‍රව්‍ය විනාශකාරී ක්‍රියා සඳහා භාවිතා වනවා ඇත. සාම සාකච්ඡා ගැන නන්දොඩවන කිසිවෙක් මේ විනාශවල වගකීම භාරගන්නේ ද නැත. එහි වන්දි ගෙවීමට සිදුවී ඇත්තේ ද ජාතියටය.

චන්ද්‍රිකාගේ සාම කථාවල ප්‍රතිඵලය මැනුනේද මිනිස් ජිවිත වලිනි. හයමසක් තිස්සේ කොටි සංවිධානයට අවි තොග ගෙනඒමටත්, සාමාජිකයින් බඳවා ගැනීමටත් රාජ්‍ය අනුග්‍රහය ලැබීමේ ප්‍රතිඵලය හද පාරවන සුළුය.

චන්ද්‍රිකා - ප්‍රභාකරන් සාම කතා වලට පෙර මිය ගිය සම්පූර්ණ ආරක්ෂක හමුදා සාමාජික පිරිස 3979 ක් වේ. අතුරුදන් වූ හෝ අංගවිකල පිරිස 6408 කි. 1994 නොවැම්බර් සිට 1998 දෙසාම්බර් දක්වා මියගිය පිරිස 8208 කි. අතුරුදන් වූ හෝ අංගවිකල පිරිස 18813 කි. මෙයින් පෙනීයන්නේ චන්ද්‍රිකාගේ සාමය හා සමෘද්ධිය සොයා කළ ඊනියා සාකච්ඡා වලින් සිදුව ඇත්තේ ආරක්ෂක හමුදාවල 1972 - 94 දක්වා මියගිය පිරිස මෙන් දෙගුණයකටත් වැඩි පිරිසක් මියයෑම පමණක් බවය.

කෙසේ වෙතත් ප්‍රේමදාස ප්‍රභාකරන් සාම සාකච්ඡා වලදී මෙන් නිවට මරණයක් මෙවර ආරක්ෂක හමුදාවලට අත්නොවීය. රිවිරැස, එඩිබල, හා ජයසිකුරු මෙහෙයුම් නිසා අඩු තරමින් කොටි සංවිධානයේ 9000 ක් පමණ මරාදැමුණු අතර යාපනය අර්ධද්වීපය තුළ රජයේ අණාසක පිහිටුවන්නටද

සමත් වීය. එයින් පෙනීගියේ කෙතරම් ජාත්‍යන්තර ජාලයක් තිබුණද විදේශ සහායත් තිබුණද කොටි සංවිධානයට ශ්‍රී ලංකා යුද හමුදාව පෙන්වා ඇති විනයද ගරු කටයුතුය. ලෝකයේම මානව හිමිකම් ගැන කථාකරන එක්සත් ජනපදය තම සෙබලුන් 58,000 ක් වියට්නාමයේදී මියයන විට අඩුම තරමින් නිරායුද වියට්නාම් වැසියන් විසි ලක්‍ෂයක් ඝාතනය කළේය. එහෙත් ශ්‍රී ලංකා යුද හමුදාව තමන්ගේ භටයින් 14,000 ක් මිය ගිය තත්වය තුළදී දෙමළ සිවිල් වැසියන්ගේ ජීවිත බිලිගෙන ඇත්තේ 2000 කට අඩු ගණනකි. එයට කොටින්ගේ උපාය ශීලී දෙමළ ජනතාව බිලිදීමද අයත්ය.

කෙසේ වෙතත් නැවත වැටෙන කොටි රැකීමට විවිධ බලවේග ඉදිරිපත් වෙමින් ඇත. ඉන් ඉදිරියෙන්ම සිටින්නේ බටහිර ආණ්ඩුය. කොටි සංවිධානය අතුගෑවී ගියහොත් ශ්‍රී ලංකාවේ තම අවි වෙළඳපොළ වැනසී යනු දැකීමට බටහිර අවි ජාවාරම් කරුවෝ සූදානම් නැත. ඉන්දියාවේ හින්දු උම්මත්තකයෝ හනුමා මෙන් යළි වලිගය අවුලවා ගැනීමට මාන බලමින් සිටිති. බටහිර මූලධර්ම වාදී ආයතන විසින් මෙහෙයවන රාජ්‍ය නොවන සංවිධාන ද, කොටි සංවිධානයේ පෙරමුණු සංවිධානද යළිත් සාම සාකච්ඡා යන සටන් පාඨය පෙරට ගෙන එමින් ඇත. ආණ්ඩුව, විපක්‍ෂයද එජාපයද හා වාමාංශික පක්‍ෂවල නායකයින් මේ සංවිධාන ලෙසින් මිලට ගෙන ඇති සැටියක් පෙනේ. යාපනය යුදබිමේ දී අත්වූ පරාජය මාලිගා කුමන්ත්‍රණය කරනු පෙනේ. එහෙත් දිනාගත් ප්‍රජාතන්ත්‍රවාදයත්, නිදහස් පාවාදීමකට ජාතිය ඉඩ නොදෙනු ඇත. **කිසිම දේශපාලකයෙකුට කොටි සමග සාකච්ඡා කිරීමට අයිතියක් නැති අතර ඉතින් ඔවුන් එසේ කරන්නේ නම් තම ජීවිත වල අයිතිය වෙනුවෙන් නැගී සිටීමට සිංහල දෙමළ මුස්ලිම් සෑම ශ්‍රී ලංකා පුරවැසියකුටම නීතිමය වුත් ප්‍රජාතන්ත්‍රවාදී වූත් අයිතියක් ඇත්තේය. මන්ද අපරාධකාරී නීති විරෝධී ජාතිවාදී ඒකාධිපති ම්ලේච්ඡ සාහසිකයන් පිරිසක් රැකීමට නිත්‍යානු කූල ආණ්ඩුවක් කටයුතු කරන්නේ නම් එය වැලැක්වීම සෑම පුරවැසියකුගේම ජාතික වගකීම වන හෙයිනි.**

# කොටි ගොදුරු බිම්

පන්සල් කන්දේ සිට බැලූ කළ ඈත කැකුලාව කළපුවත්, මෑත මුලතිව් මහ වනයත් මනාව ප්‍රදර්ශනය වේ. හේමමාලා හා දන්ත කුමරු ශ්‍රී දළදාව වඩමවාගෙන ආවේ මේ ඓතිහාසික වනතීරය හරාහාය. පන්සල් කන්දේ සිට උතුරට ඇති මුළු මුලතිව් වනයේම තැනින් තැන ඒ ඉපැරණි බෞද්ධ ශිෂ්ටාචාරයේ නටබුන් විසිරී ඇත. කුරුලු කොබෙයියන්ගෙන් හා ජලචර උරගයන්ගෙන් ද කැකුලාවාවට අඩුවක් නැත. ශ්‍රී ලංකාවේ උතුරු කදුරුගොඩත් (කන්දරරෝඩේ) නැගෙනහිර මඩකලපුවේත් බටහිර කැළණියේත් ඈත රුහුණේත් සිය මායිම් සනිටුහන් කළ "වසභ" රාජධානියේ සරු කෙතක් වුයේ ඔය නිම්නය බැව් නම් ඉතා පැහැදිලිය.

1995 ජූලි 28 වැනි දින හිමිදිරියේ ඝණ අඳුර මැදින් මුලතිව් වනය දෙසින් ද, කැකුලාව කලපුව දෙසින්ද සිය ගණන් අඳුරු සෙවනැලි යාන්ඔය ජනපදය වෙතට ගමන් කරමින් සිටියහ. වෙල්වනායගම් විසින් 1995 ජූලි 15 දා මෙසේ කියන ලද බව ඒ අඳුර සෙවනැලිවලට මුලතිව් වනයේ දී සියවරක් ජපකරනු ලදුව තිබුණි.

**"දෙමළ ජනයා මේ නිම්නයේ වසර 3000 ක් ජීවත් වි ඇත. කිසියම් සිංහල රජෙකු මේ දෙමළ භූමියට අත තැබීමට බිය වුහ. එහෙත් නූතන සිංහල රාජ්‍යය අපේ ඉඩම් පැහැර ගනිමින් ඇති අතර ඒවා ආපසු ගැනීම අප විසින් කළ යුතුය."**

මේ ම්ලේච්ඡ ජාතිවාදී මන්ත්‍රයෙන් උමතු කරන ලද ඒ "අවතාර" දළදාව වැඩිය මාර්ගයේ සිංහල බෞද්ධයන්ගේ ලේ සුවඳ ඉව අල්ලමින් පෙරට ඇදෙන්නට වුහ. මේ ඔවුන් මෙහි පැමිණි පළමු වතාවට නොවේ. 1984 නොවැම්බර් 30 දා දෙසැම්බර් 1 දා ද ඔවුහු මෙහි ආහ. වැව්දිය ලෙයින් තෙත් වනතෙක් සිංහල කතෝලික ලෙය වගුරුවන ලද්දේය. ඉන්පසු විටින් විට ඒ ලේ සුවඳ ඔස්සේ දෙමළ ජාතිවාදී ම්ලේච්ඡයෝ පැමිණියහ. සිංහල ලේ බී, එහි පිහිනා තම රකුසු කය සතපවාගෙන අඳුරේම මුලතිව් වනයට ඇදී ගියහ.

එහෙත් මෙවර ඒ ඉතිහාසය ආපසු හැරවිණි. වැලිඔය හමුදා කඳවුරේ සෙබළු හා ග්‍රාමාරක්ෂක බල ඇණි සිය නිජබිමේ අයිතිය වෙනුවෙන් පෙරට ආහ. නිහඬව විලාප නගමින් මියයෑම වෙනුවට "සටන" තෝරාගත්හ. ගිනිඅවි

කතා කරන්නට පටන් ගත්තේ හිමිදිරියේම සිටමය. හිරු කැකුලාව කලපුවෙත් නැගඑද්දී සරුසාර කුඹුරුවල දණවටක් එරිදැගලන දෙමළ මිලේච්ඡයින්ගේ රුදුරු අවි හොඳින් පෙනෙන්නට විය. ගිනි මද්දහන වන විට සටන නිමා විය. 1984, 86, 88, 91 ආදී ලෙස අවස්ථා ගණනකදී ගලාගිය ලේවල වන්දිය ඒ එක සටනින් ආපසු ලැබිණි. දෙමළ ජාතිවාදයෙන් උම්මත්තක කරනු ලැබූ මිලේච්ඡයන් 453 කගේ සිරුරු වැලිඔය නිම්නය පුර විසිරී තිබිණි.

වැලිඔය සටන කොටින්ගේ "වෝටර් ලූ" සටන විය. 1984 සිට ජයපිට ජය ලබමින් සිටි කොටි හදවත් මෙයින් දෙදුරු විය. ඉන්පසු රිවිරැස, එඩිබල, ජයසිකුරු මෙහෙයුම් වලින් ඔවුන් දිගටම ආපසු ගියා මිස පෙර ගමනක් නොවීය.

වැලිඔය ප්‍රහාරයෙන් පෙනීගිය එක් වැදගත් දෙයක් විය. ප්‍රහාරය සඳහා පැමිණ සිටි බහුතරය "කොටි පැටව්" හා "කොටි දෙනුන්" බවය. අවුරුදු 12 සිට දරුවෝ එහි සිටියහ. සියයකට වැඩි කාන්තා මළසිරුරුද විය.

පසුව හෙළිදරව් වූයේ සෙබළ හිඟය නිසාත්, මරා දැමීම පුහුණු කිරීමට හා ලේ පිපාසය ඇති කරලීම සඳහාත් කුඩා කොටි පැටවු 1984 සිටම සිංහල හා මුස්ලිම් ගම්මාන වලට පහර දීමට යොදවා ඇති බවය. හමුදා කඳවුරු වලට හෝ පොලිස් ස්ථානයන්ට පහර දීමට ප්‍රථම "මිනීමැරීමේ පුහුණුව" සඳහා කොටි ගැටව් හා ගැටිස්සියෝ සිදුකර ඇත්තේ සිංහල මුස්ලිම් ගම්වල කිරිකැටියන් හා ළමා ලපටින් ඇතුළු අහිංසකයන්ගේ හිස් දෙබෑ කිරීමට පුහුණු වීමය. අහිංසක නිරායුධ ජනයා කපාකොටා දමමින් මෙවන් "ජීවමාන යුද පුහුණුවක්" ලොවේ වෙනත් කිසිම රාජ්‍ය විරෝධී කල්ලියක් සිදුකර ඇත්දැයි සැක සහිතය.

වැලිඔය හා ඉන්පසු ඇතිවූ සටන් වලින්ද ගැඹුරු ප්‍රශ්න ගණනාවක් පැන නැගිණි. එනම් සන්නද්ධ සටනක් සඳහා බලපාන සාධක මොනවාද? කොටි සංවිධානය එම සාධක සපුරාගෙන ඇත්තේ කෙසේද යන්නය. සාමාන්‍ය සන්නද්ධ සටනකදී කරුණු කීපයක් තීරක ලෙස බලපායි. එනම්,

1. සෘජුවම යුද්ධයට මැදිහත්වන භට සංඛ්‍යාව

2. භටයන්ට නවීනතම, කාර්යක්ෂම, වඩා විනාශකාරී අවි සැපයුම් අඛණ්ඩව ලබාදීමේ හැකියාව.

3. භටයන් හමුදාව තුළ සංවිධානය කර ඇති ආකාරය, හා එයට ලබාදෙන යුද හා දේශපාලන හැකියාව

4. යුද ගැටුමට මැදිහත්වන සමාජය ඒ සඳහා දක්වන ආකල්පය හා දායකත්වය ආදියයි.

දැන් මෙයින් පළමු සාධකය හෙවත් භට සංඛ්‍යාව ගැන සලකා බලමු සාමාන්‍යයෙන් යුද ගැටුමකදී එකිනෙකාගේ හමුදාභට සංඛ්‍යා විනාශ කිරීමේ සීඝ්‍රතාවය මත යුද ජයග්‍රහණයේ එක්පැත්තක් රඳාපවතී. මෙහිදී එක්තරා නිශ්චිත සංඛ්‍යාවක් ප්‍රතිවිරුද්ධ පිළට සිටී නම් ඔවුන් කිසි කලෙක පරාජය කළ නොහැකි තත්ත්වයක් විටෙක ඇතිවේ. නොඑසේ නම් සැලකිය යුතු දීර්ඝ කාලයක් සටන අල්ලා ගැනීමට ප්‍රතිවිරුද්ධ කණ්ඩායමට හැකිවේ.

1972 සිට කොටි සංවිධානය හා සෙසු දෙමළ ත්‍රස්තවාදී සංවිධාන වලට සටන සඳහා භටයන් බඳවා ගැනීමේ දී විශාල රුකුලක් වූයේ දෙමළ සමාජයේ අධිපති දේශපාලනය ගෙනගිය දෙමළ රාජ්‍ය පක්ෂය හා පසුව දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ එයට ලබාදුන් රැකවරණයයි. ත්‍රස්තවාදී ක්‍රියා ආරක්ෂා කිරීමට මෙන්ම ඒවා විමුක්තිවාදී ක්‍රියා ලෙස ප්‍රචාරය කිරීමට හොඳ උද්ඝෝෂණ පෙරමුණක් ලෙසද දෙ.එ.වි.පෙ. ක්‍රියා කළේය. මේ බලගතු දේශපාලන හස්තය නොවන්නට 1972 - 84 වකවානුව තුළ ඕනෑම මොහොතක දෙමළ ත්‍රස්තවාදය යුදමය ලෙස සහමුලින් අතුගෑවී යන්නට ඉඩ තිබිණි.

1983 න් පසු සන්නද්ධ දෙමළ ත්‍රස්තවාදයේ ප්‍රචාරකයා හා දේශපාලන පෙරමුණ ලෙස ක්‍රියා කිරීමට තමිල්නාඩු ප්‍රාන්ත ආණ්ඩුව ඉදිරිපත් විය. 1984 න් පසු එයට ඉන්දීය මධ්‍යම ආණ්ඩුවත්, 1987 න් පසු බටහිර ජාතීනුත් ඉදිරිපත් විය. විශේෂයෙන් ඉන්දියාව 1984 - 87 වකවානුව තුළ බිහිකළ සන්නද්ධ භටයින් 25,000 නිසා ශ්‍රී ලංකා ගැටුමේ යුද තුලනය දෙමළ ත්‍රස්තවාදයට වාසි ලෙස නැඹුරු විය. මෙය කෙතරම් බලවත් වූයේ ද යත් දකුණේ සිංහල ත්‍රස්තවාදී කල්ලි තුනක් ද රටේ රාජ්‍ය බලය පැහැර ගැනීම සඳහා ඉන්දීය ඔත්තුසේවා වල සහාය පැතූ බවද වාර්තා වේ. මේ අනුව කොටි ත්‍රස්තවාදය මේසා පිරිස් බලයක් ඇතිකරගත්තේ දෙ.එ.වි.පෙ. ඉන්දියාව, බටහිර ජාතීන් හා කොළඹ තුච්ඡ දේශපාලන අධිකාරීන්ගේ ක්‍රියා නිසා මිස ඔවුන්ගේ විශේෂ දක්ෂතාවයක් නිසා නොවේ.

කොටි ත්‍රස්තවාය සඳහා දෙමළ ජනගහනයේ විවිධ වෙස්කම් ද තීරණ ලෙස බලපා තිබේ. උදාහරණයක් ලෙස වයස් පරතරය හෙවත් තරුණ හා මහළු බෙදීම සැලකිය හැකිය. සන්නද්ධ සටනක් සඳහා තරුණ සහභාගිත්වය අනිවාර්යය. විශේෂයෙන් වයස 16 - 25 අතර තරුණ ජනගහනය වැදගත්ය. ලොව පුරා තරුණ කැරලි විශ්ලේෂණය කළ විද්වතුනට අනුව වයස 16 - 25 අතර තරුණ ජනගහනය මුලු ජනගහනයෙන් 20% ඉක්මවයි නම් එතැන "තරුණ පිපිරීමක්" ඇති වීමට පසුබිමක් පවතින බව කියවේ. මෙයින් අදහස් වන්නේ අනිවාර්ය කැරැල්ලක් ඇතිවන බව නොවේ. දේශපාලන නායකත්වයක් නැතිනම් එවැන්නක් සිදුනොවේ.

මේ අනුව ශ්‍රී ලාංකික දෙමළ තරුණ ජනගහනය දෙස බැලීමේදී 1950 - 60 කාලය අතරතුර එය පැවතී ඇත්තේ 17 ක ප්‍රමාණයකය. එහෙත් දෙමළ රාජ්‍ය පක්ෂයේ ජාතිවාදයත් සමඟ දෙමළ ජනගහන වර්ධනය ඉන්පසු වේගවත් වූ බව පෙනේ. මේ අනුව 1970 දී 18.5 ක් වූ එම ප්‍රතිශතය 1975 දී 20% සීමාවට එළැඹී ඇත. වැඩිම දෙමළ තරුණ පිරිසක් (42000 ක්) සන්නද්ධ සටනේ යෙදී සිටී. 1985 දී එය 23% කි. ඉන්පසු ඇත්තෙන්ම දෙමළ ජාතිවාදී දේශපාලනයෙන් සාමාන්‍ය දෙමළ ජනයා විසිරී යන්නට පටන්ගත් අතර 1987 න් පසු කොටි සංවිධානය මිස අන්කිසි සංවිධානයක් සන්නද්ධ බිමේ ඉතුරුව නොසිටියහ. මේ නිසා දෙමළ ජනගහන වර්ධනයද කඩාවැටී ඇති අතර 1995 රිවිරැස යුද ජය ලබන විට දෙමළ තරුණ ජනගහනය 20% ක් දක්වා ඇදවැටී තිබූ අතර ක්‍රි.ව. 2000 දී එය තවදුරටත් 16% දක්වා ඇදවැටෙනු ඇතැයි සංඛ්‍යාලේඛන පෙන්වාදෙයි. (ක්‍රි. ව 2000 දී සිංහල තරුණ ජනගහනය 16% ක් වන අතර 20% ඉක්මවා තරුණ ජනගහණය පවතින්නේ මුස්ලිම් හා වතු දෙමළ ජනහා අතර පමණි) මෙලෙස සන්නද්ධ සටනේ යෙදී සිටින දෙමළ තරුණ ත්‍රස්තවාදීන් සංඛයාව 1985 සිට වේගයෙන් ඇදවැටී ඇති අතර 1987 සිට එයට තරුණ සහභාගීත්වය ලැබීමද සීමා වී ඇත කොටි සංවිධානය මෙම තත්වයට මුහුණු දී ඇත්තේ අපූරු ආකාරයටය එනම් 1984 සිට තම සංවිධානයේ වයස් සීමාව 16 සිට 9 දක්වා පහත හෙලීමය. එමෙන්ම පීඩිත ගැමි තරුණියන් වැඩියෙන් බඳවා ගැනීමය. මේ අනුව කොටි විසින් දරුවන් හා කාන්තාවන් යුධ භටයන් කිරීම තුලින් පෙන්වා දෙන්නේ අන් කිසිවක් නොව තරුණ දෙමළා තවදුරටත් ත්‍රස්තවාදයට යටත්කල නොහැකි බවය. මෙය හොඳ සලකුණකි. මේ අනුව කොටින්ගේ යුධභට සංඛ්‍යාවට අඩුකිරීමට හා බඳවාගැනීම් අවම කිරීමට නම් දරුවන් හා දැරියන් මිනිස් බෝම්බ කිරීමේ කොටින්ගේ ම්ලේච්ඡ සංස්කෘතියට පහරදිය යුතුය. ඇත්තෙන්ම එය කළ යුත්තේ දෙමළ කුල කතුන් හා දෙමළ සංස්කෘතියේ උත්කෘෂ්ඨ බව පිලිබඳ දොඩන සිවිල් සංවිධානයන්ය. එහෙත් ඔවුන් ඒ සඳහා කිසිවක් නොකරන නිසා දෙමළ ළමා හා කාන්තා ජීවිත සූරාකෑම පිළිබඳ විශාල උද්ඝෝෂණයක් ගෙන යා යුතුය. කොටි සංවිධානයට පිරිස් බඳවා ගැනීමේදී වයස හා ලිංගභේද මෙන් ම දෙමළ සමාජයේ කුලවාදය හා ප්‍රදේශවාදයද පසුබිම් වී ඇත.

1972 - 87 වකවානුව තුළ කොටි සංවිධානට පිරිස් බලය සැපයූ ප්‍රධාන ප්‍රදේශය වූයේ යාපනය අර්ධද්වීපයයි. ලොව පුරා ස්වභාව වර්ධනයක් සහිත වූ ගරිල්ලා කණ්ඩායම් මුලින් වනයද, ඊලඟ ගම්මානද අවසානයේ නගරයද ලෙස පැතිර ගියහ. එහෙත් සියල්ල විකෘති ලෙස නිර්මාණය වී ඇති ශ්‍රී ලංකාවේ දෙමළ කොටි මුලින්ම අල්ලා ගත්තේ ප්‍රධාන නගරයය. එනම් යාපනයයි. 1986 මුල සිට 1995 රිවිරැස මෙහෙයුම දක්වා සුළුබිඳ වැටීම් සහතව වුවත් නගරයේ සිවිල්

පරිපාලනය පවත්වා ගැනීමට කොටින්ට හැකිවිය. මෙයින් පෙනීයන්නේ කොටි සංවිධානය ස්වභාවික ගරිල්ලා ව්‍යාපාරයකට වඩා බලහත්කාරයෙන් බාහිර බලයක් විසින් ගොඩගස්සන ලද ආක්‍රමණික හමුදාවක් ලෙසය කෙසේ වෙතත් 1987 ඔක්තෝබර් මස ඇරඹෙන "පවාන්" ඉන්දීය යුද මෙහෙයුම නිසා කොටි වන්නියට පලාගිය අතර සිය ඉතිහාසයේ මුල්වරට තම මූලික පදනම් භූමිය ලෙස වන්නිය ගොඩ නගන්නට වූහ. 1989 ජූනි වල සිට කොළඹ සිට ජාතිද්‍රෝහී ආණ්ඩුව කොටින්ට අතනොදුන්නේ නම් හා බටහිර රටවල් අවිතොග නොසැපයූවානම් ඔවුන් සහමුලින් විනාශ වීමට ඉඩ තිබිණි. ඒ ජාතිද්‍රෝහී ක්‍රියාවෙන් සිදුවූයේ අදවන තෙක් වන්නිය කොටි පදනම් ප්‍රදේශයක් වීමය. දශක කිහිපයකට ඉහත ජන ශූන්‍ය ප්‍රදේශයක් වූ වන්නිය කොටීන්ට පිරිස් බලය සපයන තොතැන්න වූයේ කෙසේද යන්නද සොයා බැලිය යුතුය.

1981 දී මන්නාරමේ ජනගහනය 68,178 කි. මෙය 1971 දී 53,353 කි. 1971 -81 අතර මන්නාරමේ සංක්‍රමණික පදිංචිකරුවන් වැඩිවීම 11,317 කි. මෙයින් 8000 ක් පමණ ඉන්දියාවට යෑමට සිටි ඉන්දීය දෙමළ පුරවැසියෝය. 1971 දී වව්නියාව හා මුලතිව් ඒකාබද්ධ දිස්ත්‍රක්ක වල දෙමළ ජනගහනය 73,010 කි. 1981 දී මේ දිස්ත්‍රික් දෙකේ ඒකාබද්ධ ජනගහනය 14,3803 කි. මෙයින් අඩුම තරමින් 62,000 ක් ජනයා ඉන්දියාවට යෑමට සිටි ඉන්දීය ජනයා වෙති. මේසේ මේ කාලය තුළ යාපනයට අයත්ව තිබූ කිලිනොච්චි දිස්ත්‍රික්කයට ගෙන එන ලද ඉන්දියානු දෙමළ ජන සංඛ්‍යාව 30,000 කට ආසන්නය. මේ සියල්ලෙන් පෙනෙන්නේ 1971 - 81 කාලය තුළ ඉන්දියාවට යෑමට සිටි ඉන්දීය ජාතිකයන් ලක්ෂයක් වන්නියේ පදිංචි කර ඇති බවය. තවදුරටත් සොයා බැලීමේ දී පෙනීයන්නේ මෙය 1981 න් පසුව අද දක්වා සිදුකරගෙන යන දෙමළ ජාතිවාදී ජනපදකරණයක් බවය. අඩුම තරමින් මේ වනවිට 18,0000 ක් පමණ නීති විරෝධී ඉන්දීය දෙමළ ජනපදකරණයක් මේ ප්‍රදේශවල සිදුකර ඇත. (ඓතිහාසික කන්ද උඩරට සිංහල රාජධානියේ කොටසක් වූ වන්නියේ මේසා විදේශික දෙමළ ජනපදකරණයක් සිදුකරමින්, වැලිඔය සිංහල ජනපදකරණය මුළු ලොව පුරා ප්‍රචාරය කිරීමට දෙමළ ජාතිවාදී ප්‍රචාරක යන්ත්‍රය සමත්ව සිටී)

පසුගිය වකවානුව තුළ මේ ජනපද දෙස බැලීමේ දී පෙනීයන්නේ කොටි සංවිධානයේ යුද භට පිරිස් වලින් 70% ක් පමණ සැදුම්ලා ඇත්තේ මේ නීති විරෝධී දෙමළ ජනපද වලින් බවය. දැන් මේ ඉන්දියානු දෙමළ ජනපදවල සිට කන්ද උඩරට වතුකරයට ත්‍රස්තවාදී පුහුණු මාවතක් තැනී තිබේ. දළදා බෝම්බයද පැමිණියේ ඒ මාවතේ බව හෙළිදරව් වී ඇත.

එසේ නම් අද වන්නියේ කොටි බලය පවත්වා ගෙන යන්නේ මේ ජනපද විසින් බව පැහැදිලිය. එසේ නම් මේ ජනපද කල්තියා සැලසුම් කළ **"ඊළාම් යුද**

**ජනපද"** වේ. එහි අරමුණ අනුරාධපුරය දක්වා කොටි වැට පුළුල් කිරීම බවත් පැහැදිලිය. තවදුරටත් සොයා බැලීමේ දී පෙනී යන්නේ මේ ජනපද වල විවිධ ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාර අතිශයින් ප්‍රචලිත බවය. ක්‍රිස්තියානි මූලධර්මවාදී සංවිධාන සහ ක්‍රිස්තියානි මූලධර්මවාදී රටවල ආධාර ලබන රාජ්‍ය නොවන සංවිධාන මේවායේ අතිශයින් ක්‍රියාත්මක බවය. නොර්වේ, ස්වීඩන් රටවල් එහිදී ප්‍රමුඛය.

මේ ජනපද පිහිටවූයේ කව්ද? දෙමළ ජාතිවාදීන්ගේ ප්‍රවාද වලට අනුව 1977 සැප්තැම්බර්වල දෙමළ ජනයාට එරෙහි ප්‍රහාර ගැන කම්පාවට පත්වූ ලන්ඩනයේ සිටි ගෘහ නිර්මාණ ශිල්පියෙකු වූ ඒ. ඩේවිඩ් සහ රාජ් සුන්දරම් දොස්තර යුවල ශ්‍රී ලංකාවට පැමිණියහ. ශාන්තිනි රාජසුන්දරම් වවුනියාවේ චිකිත්සාගාරයක් පවත්වාගෙන ගිය අතර ඩේවිඩ් හා රාජසුන්දරම්, ගාන්ධියම් ව්‍යාපාරය ආරම්භ කළහ. මොවුන් සමග හරි හරියට දෙමළ පුනරුත්ථාපන සංවිධානය හෙවත් ටී.අර්.අර්.ඕ. ව්‍යාපාරයද කටයුතු කළේය. එහි ප්‍රාරම්භක සාමාජිකයන් වූයේ නිතයනාදන් හා කන්ද සාමිය. මොවුන් විසින් සිංහල ප්‍රහාර වලින් අනාථවූ දෙමළ ජනයා වන්නියේ පදිංචි කළහ.(බිඳුනු තල්රුක - රාජන් හුල්.එස්.ශ්‍රී ධරන්)

බැලූ බැල්මට මෙය අපූරු කතාවකි. එහෙත් 1977 - 81 වකවානුව තුළ පමණක් ඒ ව්‍යාපාරය මගින් ලක්ෂයක් අනාථයන් පදිංචි කර ඇත. එය මහවැලි ව්‍යාපාරය යටතේ ශ්‍රී ලංකා රජයට පවා කළ නොහැකි වූ කටයුත්තකි. මොවුනට මේ සඳහා මුදල් ලැබුණේ කොහින් ද? ලන්ඩනයේ, සිංගප්පූරුවේ හෝ ඉබදන් වල දෙමළ පුණ්‍යාධාර වලින් මේවා ඉදිවිනිද?

කිසිසේත් නැත. පසුව හෙළදරවු වූ පරිදි මේ සඳහා ප්‍රකෝටි ගණනක විදේශාධාර ප්‍රමාණයක් ක්‍රිස්තියානි මූධර්මවාදී රටවලින් ලැබී ඇත. ඒවා සෙඩෙක්, රෙඩ්බානා, සර්වෝදය වැනි වෙනත් ආයතන හරහාද ගාන්දියම් හා ටි.අර්.ආර්.ඕ හරහාද බෙදාහැර ඇත. මෙලෙස කෙලින්ම නොර්වේ හා ස්වීඩන් රටවල් දෙමළ කොටි ත්‍රස්තවාදයට පිටිබලයක් වන මිනිස් පවුරක් නීති විරෝධි පුරවැසියන්ගෙන් වන්නියේ ගොඩනංවා ඇත. ඉන්දියානු යුද හමුදා මෙන්ම ශ්‍රී ලංකා යුද හමුදාවලටද වන්නිය විනිවිද යෑම මෙතරම් අසීරු වී ඇත්තේ 1977 සිට ඉතාම සූක්ෂම සැලසුමකට අනුව පිහිටවූ මේ යුද ගම්මානය නිසාය. නොර්වේ, ස්වීඩන්, කැනඩා හා බ්‍රිතාන්‍ය ආධාර ලබන සැක කටයුතු රාජ්‍ය නොවන සංවිධාන හා ආගමික ප්‍රචාරක කණ්ඩායම් මේ ප්‍රදේශවල ශ්‍රී ලංකා නීතිය අභියෝග කරමින් තවමත් ක්‍රියාත්මක වෙති. වන්නි කොටි යුද බලය බිඳීමෙ රන් යතුරු ඇත්තේ ආගමික මූලධර්මවාදී රාජ්‍ය නොවන සංවිධාන වල ගෙල සිඳීම හරහාය.

කොටින්ගේ ඊළඟ ජන පදනම ඇත්තේ නැගෙනහිරය. ත්‍රිකුණාමලයටත් වඩා එය ඇත්තේ මඩකලපුවේය. කෙසේ වෙතත් කරුණු ගණනක් නිසා නැගෙනහිර කොටි බලය 1995 වනතෙක්ම අවම තත්ත්වයක පැවතිණි. ඉන් ප්‍රමුඛ හේතුව වූ කලී මඩකලපු දෙමළ ජනයා හා යාපනය වෙල්ලාලයන් අතර 1833 සිටම පැවති කුලවාදී අරගලයයි. 1858 න් පසු මඩකලපුවේ ඉංග්‍රීසීන් විසින් වතු දෙමළ හා මාර්ග කම්කරුවන් ලෙස ගෙන ආ දෙමළ ජනයා ජනාවාස කිරීමෙන් පසු මේ ගැටුම ත්‍රිවු විය. මේ නිසා දෙමළ රාජ්‍ය පක්ෂය වැනි දෙමළ ජාතිවාදී පක්ෂ පවා මඩකළපුවේ සාර්ථක වූයේ නැත. කොටින්ට ප්‍රතිවිරුද්ධ ඊ.පී.අර්.එල්.එෆ්, ටෙලෝ වැනි ත්‍රස්තවාදීන් වැඩියෙන් පැතිරගියේ නැගෙනහිරය. එමෙන්ම අම්පාර හො පොළොන්නරුව සිංහල ජනපදනම හා සිංහල දෙමළ මුසුවීමද මෙයට බලපෑවේය. මුස්ලිම්වරුන්ගේ බලයද මෙයට හේතුවී තිබේ.

කෙසේ වෙතත් මහවැලි ව්‍යාපාරය යටතේ ඉදිවූ මාදුරුඔය දකුණු ඉවුරේ 1977 - 85 අතර සිදුවූ නීතිවිරෝධී දෙමළ ජනපදකරණය නිසා නුමුහුන් හුදකළා දෙමළ ජනගහනයක් ඇතිවිය. මේ සංඛ්‍යාව 40,000 ක් පමණ වන අතර ඔවුන්ගෙන් ද බහුතරය ඉන්දීය වතු කම්කරුවෝ වෙති. මේ ජනපදකරණය නම් තනිකරම වාගේ 1977 - 88 එ.ජා.ප. ආණ්ඩුවේ ඇමතිවරයෙකු වූ කේ.ඩබ්. දේවනායගම් හා රාජදොරේ විසින් සිදුකළ විප්ලවයකි. 1995 රිවිරැස මෙහෙයුම නිසාලත් යුද පරාජයත් සමඟ කොටි සංවිධානය වැඩි බරක් මේ දෙමළ ජනපදවලට දැමූ අතර වන්නිය හා නැගෙනහිර අතර මුහුදු, කැළෑ හා ගොඩබිම් මාර්ගය අද කොටි සංවිධානයේ ප්‍රාණ නාලය වී තිබේ. 1985 දී මාදුරුඔය වම් ඉවුරේ දිඹුලාගල නාහිමියන් විසින් පදිංචි කළ සිංහලයන් 20,000 ක් එවකට එ.ජා.ප. රජයෙන් පළවා හැරියේ නැත්නම් කොටින්ගේ ගොඩබිම් මාර්ගය ඇහිරී යෑමටත් එමගින් ඊනියා උතුරු හා නැගෙනහිර දෙමළ නිජබිම දෙකඩ වීමටත් ඉඩ තිබිණි. බලලෝභී දේශපලනය විසින් ඒ සියල්ල පාවාදී ඇත්තේය.

කොටි සංවිධානයේ අලුත්ම මිනිස් කේන්ද්‍රයන් දෙක වී ඇත්තේ මහනුවර හා කොළඹය. වෙළෙඳ ව්‍යාපාර හිමිකර ගැනීම, බලපෑම් කළ හැකි දෙමළ ඡන්ද කුට්ටියක් බිහිකර ගැනීම, කෝවිල් ඉදිකර ආගමික ප්‍රබෝධයක් ජනිතකර ගැනීම, තමන්ගෙම වූ රූපවාහිනී හා පුවත්පත් ජාලයක් පවත්වා ගැනීම, (කොළඹ හා මහනුවර දෙමළ ජනයා ඉලක්ක කරගත් පුද්ගලික රූපවාහිනී සේවා දෙකක් ද ගුවන් විදුලි සේවා දෙකක් ද අතිශයින් පැතිරී ගිය පුවත්පත් තුනක් ද ඇතුළු පුවත්පත් කීපයක් ද ඇති අතර ඒවා කෙලින්ම කොටි සංවිධානයේ මතවාදය ප්‍රචාරය කරයි) අවසාන වශයෙන් මානව හිමිකම් වලට මුවාවී කොටින්ගේ පෙරමුණු සංවිධාන බිහිකිරීම සිදුවේ. කොළඹ දෙමළ ව්‍යාප්තවාදය පැතිරවීම යටතේ 1991 සිට 1998 දක්වා අඩුම තරමින් ලක්ෂ හතරක් වත් සංක්‍රමණික

දෙමළ මිනිසුන් ජනාවාස වී ඇති අතර මට්ටක්කුලිය කොටහේන වැල්ලවත්ත හා දෙහිවල කළුබෝවිල ප්‍රදේශවල සාතිශය බහුතරය දෙමළ වී තිබේ. කොළඹ ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පති වරයෙකුට අනුව කොළඹ මහනගර සභා සීමාවේ දෙමළ ජනගහනය 1998 දී 57% දක්වා ඉහළ නැග අත. 1998 ජනවාරි සිට අගෝස්තු දක්වා මහනුවර නගරයට පමණක් දෙමළ පවුල් 1092 ක් පැමිණි බව මධ්‍යම පළාතේ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය කියයි. මේ කාලය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව හා වත්තල ප්‍රදේශ දෙකට පැමිණි ඇති දෙමළ ජන සංඛ්‍යාව 10,000 ඉක්මවන බව පෑලියගොඩ පොලිස් අධිකාරීවරයා කියා ඇත. පසුගියදා කොළඹ නගරයේ සිදුවූ යෝධ ප්‍රහාරවලට මෙන්ම ට්‍රාන්ස්පෝමර් සහ දුරකථන පද්ධති විනාශ කිරීමටද මේ නව දෙමළ ජනපදිකයින් මැදිහත් වී ඇති බව පෙනීයයි. මේ අනුව දැනටමත් කොළඹ හා මහනුවර ජන සංයුතිය බරපතල ලෙස විකෘති වී ඇති අතර වැඩෙන දේශපාලන බලය ඉදිරියේ "දෙමළ ව්‍යාප්තවාදය" ඉදිරියේ දී තවත් ජයට සිදුවීමට ඉඩ ඇත. කොටි සංවිධානය දැනටමත් පසුබසින සිය සන්නද්ධ කල්ලි කොළඹ සහ මහනුවර ස්ථානගත කරමින් සිටින අතර තවත් "කොටි බංකර" පෙළක් නුවර, මීගමුව, වත්තල, මට්ටක්කුලිය, වැල්ලවත්ත, කිරුළපන හා දෙහිවල, ගල්කිස්ස ප්‍රදේශයේ ඉදිවෙමින් පවතින බව අප විසින් දැනගත යුතුය. කොටින්ගේ දෙවැනි සටන් පෙරමුණ කොළඹ විවෘත වීමට පෙර එය මර්ධනය කිරීම අවශ්‍යය. එහි අත්‍යවශ්‍ය සාධකය නම් කොළඹ හා නුවර සිදුවන දෙමළ ව්‍යාප්තවාදය නතර කිරීමය. විශේෂයෙන් 1987 සිට පැමිණි ව්‍යාප්තවාදී සංක්‍රමණිකයන් විසින් සම්ප්‍රදායික මිනිසුන්ගෙන් ලබාගෙන ඇති දේපොල ලබා ගැනීමය. මේ සම්බන්ධයෙන් දැඩි ලෙස ක්‍රියා නොකළ හොත් යාපනයේ අහිමි වූ යුද පෙරමුණ කොළඹ විවෘත වීම වැලැක්විය නොහැකි වනු ඇත.

වතුකරයේ දෙමළ ව්‍යාප්තවාදය හා කොටින්ගේ ක්‍රියාකාරීත්වය මීලඟ පරිච්ඡේදයේ දී සලකා බලන නිසා ඒ පිළිබඳ වැඩි විස්තර දැනට අවශ්‍ය නැත.

කොටි සංවිධානයේ පිරිස් බලය අත 1985 ට අනුව බලන කල ඇත්තේ ඉතා අඩු මට්ටමකය. එහෙත් 1985 ට වඩා ඔවුන්ගේ විනාශකාරී හැකියාව කිහිප ගුණයකින් වැඩිවී ඇත. මේ තත්ත්වය මොවුන් ලබාගෙන ඇත්තේ ඉතා නවීන අවිආයුධ ලබාගැනීමත් ඒවා පුහුණු වීමත්, එක දිගට අඛණ්ඩ ලෙස මුදල් හා සෙසු සැපයුම් මාර්ග පවත්වා ගැනීමට හැකිවීමත් නිසාය.

මේ සඳහා ඔවුන් විවිධ ජනකණ්ඩායම් හා සංවිධාන සූක්ෂම ලෙස යොදාගෙන ඇත.

ඔවුන්ගේ ප්‍රධානතම ඉලක්ක කණ්ඩායම වූ කලී විදේශගත ශ්‍රී ලාංකික දෙමළ ජනයාය. 1833 තරම් ඈත අතීතයක සිට දෙමළ ජනයා ඉංග්‍රීසීන් විසින් විදේශ සේවයට යවනු ලැබූ අතර 1977 න් පසු මේ තත්ත්වය වැඩිදියුණු විය. 1983 න් පසු තවත් පිරිසක් එනම් "දේශපාලන රැකවරණය පතන දෙමළ ජනයා" නම් ඊනියා පීඩිතයන් පිරිසක් ද මොවුන්ට එක්වූහ. මොවුන් බහුල වශයෙන් ලන්ඩන්, ටොරොන්ටෝ, සිංගප්පූරුව, ලොස්ඇන්ජලීස්, මෙල්බෝන්, ඔස්ලෝ, ට්‍රෝන්ඩියම්, ඉබදන් ආදී නගරවල කේන්ද්‍රගතවී සිටිති. මොවුන් ප්‍රමාණයෙන් හාරලක්‍ෂයක් පමණ වන අතර එයින් අඩක්ම පාහේ යාපන දෙමළ ජනයා වෙති. එමෙන්ම මොවුන් ගෙන් 95% ක්ම 77 න් පසු එහි ගියෝ වෙති.

1961 - 75 අතර කාලය තුළ මේ විදේශගත දෙමළ ජන කොටසින් ප්‍රයෝජනය ගත්තේ චෙල්වනායගම්ය. එහෙත් දේ.එ.වි පෙරමුණේ අමිර්තලිංගම් හා නවරත්නම් විසින් විදේශගත දෙමළ පිරිස් වලට කොටි සංවිධානය හඳුන්වා දෙන ලදි. ලන්ඩනයේ පදිංචිව සිටි එන්.එස්. ක්‍රිෂණන් මෙහිදී මූලික කාර්යභාරයක් ඉටකළ අතර 1983 න් පසු ලන්ඩනය පදනම් කරගෙන යුරෝපය පුරා කොටි ජාලය මෙහෙය වූ යූ.කේ. බාලසේකරන් විසිනි. එලියතම්බි රත්නසභාපති විසින් බිහිකරන ලද දෙමළ ඊළාම් ශිෂ්‍ය සම්මේලනයද (GUES) මෙහිදී මූලික කාර්යභාරයක් ඉටුකළේය. කොටින්ට පලස්තීන ත්‍රස්තවාදීන් සමඟ පුහුණුවීම් හා සබඳතා ඇති කර දුන්නේ රත්නසභාපති ය. මුලදී කොටි සංවිධානය මෙන්ම ප්ලොට් හා ඊරෝස් සංවිධානද යුරෝපා දෙමළ ප්‍රජාවෙන් මුදල් උපයාගත් ත්‍රස්ත කල්ලි වූහ. එයින් 1984 දී ප්ලොට් සංවිධානය "පලාවන්" නමින් නෞකාවක් මිලදී ගැනීමට පවා සමත් විය.

කෙසේ වෙතත් 1986 වන විට කොටි යාපනයේ සෙසු දෙමළ ත්‍රස්තවාදී සංවිධාන අහිබැවූ ආකාරයටම විදේශ වලදී ද එය සිදුකළහ. එහිදී ඔවුන්ගේ සංවිධානය ජාලයේ හදවත බවට පත්වූයේ ලන්ඩනයයි.

කොටි සංවිධානය මේ විදේශ ජාලය ක්‍රියාත්මක කරගැනීමේ දී ආදර්ශයට ගත්තේ යුදෙව් ජාතික ව්‍යාපාරයයි. ඔවුන් සහමුලින් ම පාහේ අනුගමනය කළේ යුදෙව් ව්‍යාපාරයය.

1858 දී ලිතුවේනියාවේ කුඩා නගරයක උපත ලද එලිසර බෙන් යෙහුඩා යුදෙව් සියෝන් වාදයේ පියා විය. එවකට මල බසක් වූ හිබෘ බස නගා සිටයුයේන් ලිතුවේනියාවේ, ජෝර්ජියාවේ විසූ යුදෙව්වන් සිය ගණනින් පලස්තීනයට රැගෙන ගියේත් ඔහුය. 1894 දී ප්‍රංශයේ ඇති වූ "ඩිරේෆ්ස්" සිදුවීම වාර්තා කිරීමට ගිය තියෝඩර් හර්ෂල් විසින් හෙයුඩාගේ ක්‍රියාවලිය යථාර්ථයක් කිරීමට ඉටාගත්තේය. 1897 දී පුද්ගලයින් සියගණනක් එක්කර සියොන්වාදී යුදෙව් ව්‍යාපාරය

ගොඩනැගුවේ ඔහුය. එහිදී ඔහු අනුගමනය කළ පතිපත්තිය වුයේ එවකට රටවල් 86ක වාසය කළ කෝටියකට මදක් වැඩි යුදෙව් ජනකාය එකම සංවිධානය ජාලයකට ගෙන ඒමය. එහිදී යුරෝපයේ දී ඉංග්‍රීසි හා යුරෝපීය විරෝධි වු ඔවුහු පලස්තීනයේ දී අරාබී විරෝධි වි ඉංග්‍රිසි ගැති වුහ. මේ නිසා ඉංග්‍රීසින්ගේ බලපෑමෙන් 1917 දී බැල්ෆර් ගිවිසුමෙන් ඔවුනට පලස්තීන කුඩා ප්‍රදේශයක ස්වයං පාලනයක් ලැබුණි. (මෙය හරියටම 1987 දී ඉන්දීය මැදිහත් වීමෙන් පළාත් සභා ලැබීම වැනිය) ඉන් පසු වේගයෙන් විදේශ අරමුදල් වලින් පලස්තීනය තුළ යුදෙව් ජනපද පිහිටුවමින් යුදෙව් ව්‍යාප්තවාදය ක්‍රියාත්මක කළහ. අරාබි ජාතික බෙදී වෙන්වී කාකොටා ගනිද්දී යුදෙව් ව්‍යාප්තවාදය අරාබි ඉඩකඩම් මිළදී ගනිමින් පලස්තීනය පුරාම පැතිර ගියේය. අරාබි තෙල් බලය බිඳලීම සඳහා යුදෙව්වන් යොදාගත හැකිබව සිතූ ඉංග්‍රීසීහු එයට හැම අනුබලයක් ම දුන්හ. දෙවන ලෝක සංග්‍රාමය නිසා යුදෙව්වෝ උතුරු ඇමරිකාවටත් රුසියාවටත් හා පලස්තීනයටත් සංක්‍රමණය වූහ. උතුරු ඇමරිකාවේ බලවත් කල්ලියත් වූ යුදෙව් ජනකාය එහි සිට මුදල් ආධාර හා දේශපාලන ආධාර සහිත "නොනවතින සැපයුම් ගඟක්" ඊශ්‍රායාලය දක්වා කැපූහ. ප්‍රතිඵලය වූයේ 1948 දී ඊශ්‍රායලය නමින් පලස්තීනයම දෙකඩ කර වෙනම රාජ්‍යයක් බිහිවීමය. නාසි ප්‍රහාර වල අනුකම්පාවට මුවාවෙන් 1948 දී ඊශ්‍රෑයලය නමින් පලස්තීනයම දෙකඩ කර වෙනම රාජ්‍යයක් බිහිවීමය. නාසි ප්‍රහාර වල අනුකම්පාවට මුවාවෙන් 1956 වන විට මුළු පලස්තීනයම සියතට ගන්නට ඔවුන් සමත් වූහ. 1956, 1967 හා 1973 යුද්ධ වලින් ඊජිප්තුව, සිරියාව, ලෙබනනය, ජෝර්දානය යන රටවල කොටස් ඈඳා මහා ඊශ්‍රායලයක් ගොඩනගා ගත්හ. සීතල යුද සමය පුරාම බටහිර ජාතීන්ගේ තොටුපළ වූයේ ඊශ්‍රායලයයි.

ලෝක ද්‍රවිඩ රාජ්‍යය ගොඩනගා ගැනීම සඳහා සියොන්වාදී අඩිපාරේ යෑමට ප්‍රභාකරන් තීරණය කළේ යුදෙව්වන්ගේ මේ ජයග්‍රාහී අත්දැකීම සමගය. මේ අනුව ලන්ඩනය පදනම් කරගෙන ලොව පුරා රටවල් 34 ක සිටින දෙමළ ජනයා අතර විවිධ පෙරමුණු සංවිධාන, ආවරණ සංවිධාන ඇති කිරීමට ඔවුන් සමත් වී ඇත. ලන්ඩනයේ දී කොටි සංවිධානය බොහෝ විට ක්‍රියාත්මක වන්නේ දෙමළ තොරතුරු මධ්‍යස්ථානය (Tic, Tamil House, romford Rd London) දෙමළ පුනරුත්ථාපන සංවිධානය (Tro-Walthamstow, London) ජාත්‍යන්තර දෙමළ පෙඩරේෂණය (Ift-Birchiew, Surrey) ආදී ආවරණ සංවිධාන හරහාය. දැනට පෙනීගෙස් ඇත්තේ වන්නියේ පිහිටා ඇති රාජ්‍ය නොවන සංවිධානයක මූලස්ථානය හා දෙමළ තොරතුරු මධ්‍යස්ථානය චන්ද්‍රිකා දුරකථන මගින් සම්බන්ධව පවතින අතර එමගින් කොටින්ගේ නිවේදන ලොව පුරා ප්‍රචාරය කරන බවය.

ඕස්ට්‍රේලියාව තුළද ඔවුන් ආවරණ සංවිධාන ගණනාවක් පුරා පැතිරී ඇත. සිඩ්නි නගරයේදී කෙලින්ම දෙමළ ඊළාම් සංගමය නමින් ද දකුණු

ඕස්ට්‍රේලියාවේ දී දෙමළ අනාථ සංගමය ලෙසද මෙල්බර්න් නගරයේ දී ලංකා දෙමළ සංගමය ලෙසද ක්‍රියා කරති. ෆීජි හා නවසීලන්තයේ ද මෙවැනි ආවරණ සංවිධාන ගොඩනගා ගෙන ඇත.

යුරෝපය තුළ නම් එක්සත් රාජධානිය, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, ඔස්ට්‍රියාව, තුර්කිය, සයිප්‍රසය, නෙදර්ලන්තය, නෝර්වේ, ඩෙන්මාර්කය ස්වීඩන හා ෆින්ලන්තය ආදී රටවල් තුළ මොවුන් කිසිදු නීතිමය බාධාවකින් තොරව විවෘතවත් ආවරණ සංවිධාන හරහාත් අරමුදල් එක් කිරීමත්, ව්‍යාපාර කිරීමත් සන්නිවේදන ජාලා පවත්වා ගැනීමත් හොර ජාවාරම් කිරීමත් කරගෙන යති.

අප්‍රිකාව තුළ නම් ලිබියාව, ඇල්ජීරියාව, සැම්බියාව, දකුණු අප්‍රිකාව, මුරුසිය හා සෞදි අරාබිය තුළ ඔවුහු ක්‍රියාකරති. දෙමළ රටක් වන මුරුසිය සිය රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙසම කොටි සංවිධානයට උපකාර කරන අතර අනාගත ද්‍රවිඩ ලෝක රාජ්‍යයේ කොටසක් ලෙස එය දැනටම නම් කර ඇත. දකුණු අප්‍රිකාවේ නතාල් ප්‍රාන්තයේ බහුතරය ඉන්දීය ජාතිකයන්වීම නිසාත් දකුණු අප්‍රිකාවේ ජාතික කොන්ග්‍රසය බොහෝවිට මෙහෙයවන්නේ ඉන්දීයයන් නිසාත් දකුණු අප්‍රිකාව තුළ රාජ්‍ය පිළිගැනීමක් කොටි සංවිධානයට ඇත. නයිජීරියාවේ ඉබදන් නගරයද දෙමළ ජාතිවාදී තෝතැන්නක් වන අතර මෑතක සිට අප්‍රිකාවේ ගෝත්‍රික හා යුද අධිපතීන් සමග කොටින්ගේ සබඳතා ගොඩනැගී ඇත්තේ ද ඉබදන් හා ඩර්බන් හරහාය.

උතුරු ඇමරිකාවේ නම් එක්සත් ජනපදය, කැනඩාව, පනමාව දක්වා කොටි ජාලයන් විසිරී ඇත. එංගලන්තය හැරුණු විට කොටින්ට වැඩිම ආදායමක් උපත ලබන්නේ උතුරු ඇමරිකාවෙනි.

යුරෝපය තුළත් උතුරු ඇමරිකාව තුළත් පෙර තරම් නිදහසක් නොලැබෙන විට කොටි දැන් සිය මධ්‍යස්ථාන ලෝකයේ නව ආර්ථික කේන්ද්‍රයක් වන ආසියාව කරා ගෙන අවුත් ඇත. ජපානය, පිලිපීනය, හොංකොං, සිංගප්පූරුව, මැලේසියාව, ඉන්දුනීසියාව, තායිලන්තය හා බුරුමයේ ඔවුන්ගේ කාර්යාල ඇත. මැලේසියාව, ඉන්දුනීසියාව, තායිලන්තය හා බුරුමයේ ඔවුන්ගේ කාර්ය ඇත. මැලේසියාව, ඉන්දුනීසියාව දෙරටම කොටි සංවිධානය තහනම් කර ඇති අතර සිංගප්පූරුව පොදුවේ දෙමළ ජාතිවාදය සම්බන්ධයෙන් දැඩි ප්‍රතිපත්ති අනුගමනය කරයි. පුදුමය නම් ලංකාවේ මෙන්ම ථෙරවාදී බෞද්ධ රාජ්‍යයන් තුනක් වූ බුරුමය, තායිලන්තය හා කාම්පූචියාව ශ්‍රී ලංකාවේ බෞද්ධ විරෝධී කොටි සංවිධානයට අවි හා සැපයුම් සපයන ප්‍රධාන රටවල් බවට පත්වී තිබීමය. (තායිලන්තයේ බැංකොක්හි වාසය කරන පුවත්පත් කලාවේදියෙකු වන රොබට් තාර්නොයිල් ප්‍රකාශ කරන අන්දමට 1994 නොවැම්බර් හා 1995 අප්‍රේල් අතර චන්ද්‍රිකා ප්‍රභාකරන් සාකච්ඡා පවත්වන විට අවිනැව් තුනක් ඉන්දු - චීන ප්‍රදේශවල සිට

ගෙනවිත් ඇත. මෙයින් එක් අවි නැවක කාම්පුචියාවෙන් මිළට ගත් ඒ-7 මිසයිල තිබී ඇත. මේවා කෝකෝන් නම් කාමුපුචියා ප්‍රදේශයේ සිට චුම්පොර්න් නම් තායිලන්තයේ ප්‍රදේශයට ගෙනවිත් ඇත. බුරුමයට අයත් ටීවෙන්ටො නම් කුඩා දිවයින 1996 වන තෙක්ම කොටි සංවිධානයේ ප්‍රධාන අවි තොටුපොල විය)

කොටින්ගේ ප්‍රධාන සැපයුම් මාර්ගය තවමත් ඉන්දියාවය. තවමත් ඔවුන් තමිල්නාඩුව සිය ත්‍රස්ත කටයුතු සඳහා යොදාගනී. ශ්‍රී ලංකා රජයට කොටි ත්‍රස්තවාදය මැඩලීමට මෙතරම් අසීරු වී ඇත්තේ තමිල්නාඩු ප්‍රාන්ත රජයේ දේශපාලන බලධාරින් හා රජයේ නිළධාරින් වක්‍රව හා සෘජුව කොටින්ට සිදුකරන උපකාරයක් නිසාය. රජිව්ගාන්ධි කොමිසද (ජායින්) මේ තත්ත්වය කදිමට හෙළිදරව් කර ඇත. භාරතීය ජනතා පක්ෂ ආණ්ඩුවේ ආරක්ෂක ඇමතිවරයා වු ජෝර්ජ් ෆර්නෑන්ඩස්ට එරෙහිව නැගුනු චෝදනා වලින් ද පෙනී ගියේ කොටි සංවිධානය කෙතරම් ඉන්දිය රාජ්‍ය යන්ත්‍රය විනිවිද ගොස් ඇති ද යන්නය. කොටි තමිල්නාඩු ප්‍රාන්තයේ ධර්ම පුරෙයි. කොයිම්බතෝර් සේලම් - පෙරියා, වේදරන්යම්, මදුරෙයි, නන්ජ්පුවුවර්, නාගපට්ටම්, ට්‍රිචු, මැඩ්රාස් (චෙන්නායි) ආදි ප්‍රදේශවල සිය සංවිධාන ජාලය පිහිටුවා ඇත. 1984 - 91 දක්වා මෙය විවෘත මුහුණු වරින් සිදුවු අතර 1991 න් පසු එය රහසිගතව සිදුවිය. තමිල්නාඩුවේ ප්‍රධාන පක්ෂ දෙකක් වන ජයලලිතාගේ අන්න දෙමළ මුන්නේත්‍රකසාගම් පක්ෂයද, කරුණානිධිගේ දෙමළ මුන්නේත්‍රකසාලම් පක්ෂයද තරඟයට මෙන් කොටින්ට උපකාර කරයි. මෙයට අමතරව කොටි සංවිධානය විසින් මෙහෙයවන පක්ෂද ඇත. රාම්දාස් ගේ දෙමළ නිර්ධන පක්ෂය, වීරමණිගේ ද්‍රවිඩ කසාගම් පක්ෂයද, නැදුමරන්ගේ කම්රාජ කොංග්‍රස්, පෙරින්චින්තනාරයන්ගේ ශුද්ධ දෙමළ ව්‍යාපාරය ආදීය ඒවාය.

ඇත්ත වශයෙන් තමිල්නාඩුව බලවත් දොළදුකක් පවතින සමාජයකී. ආර්ය ආධිපත්‍යය සහිත ඉන්දීයාවේ වසර 4000 ක සිට අනාර්යයින්ට ආර්යයන් යටතේ පාලනය වීමට සිදුව තිබේ. මේ නිසා 1930 ගණන් වලදී ඔවුන් ඉංග්‍රිසීන් ගෙන් ඉල්ලා සිටියේ නිදහස අවශ්‍ය නැති බවත් නිදහස දෙනවා නම් ද්‍රවිඩ රාජ්‍යයක් අන්ද්‍රා, කේරල, මදුරාසි හා කර්නාටක ප්‍රාන්ත එක්කර පිහිටු වියයුතු බවත්ය. ඉන්දියාවේ විසූ පැරණි අනාර්යයන් ද්‍රවිඩයන් ලෙස අර්ථකතනය කළ මොවුන් හින්දුස්ථානයට එරෙහිව ද්‍රවිඩස්ථානයේ හඬ ගොඩනැගූහ. පකිස්ථානය (ඉස්ලාම්) හා කලිස්තාන් (සීක) බෙදුම්වාදයන් පවා ඇති වූයේ ඉන් පසුවය. පකිස්ථානය පිහිටවීමෙන් ධෛර්යට පත් දෙමළ ජාතිවාදීන් නිදහස් ඉන්දියාව දෙකඩ කිරීමට ද්‍රවිඩස්ථාන් සටන්පාඨය වේගයෙන් ගයන්නට වූහ. නමුත් ගාන්ධිගේ නායකත්වය යටතේ සිටි දකුණු ඉන්දීය නායකයන් වූ පොත්සිරි රමිලු, වී.වී ගිරි ආචාර්ය පාතම්බි, සාතාරාමියා වැනි අය එකී බෙදුම්වාදය පරාජය කළහ. නිදහසින් පසු භාෂාව පදනම් කරගෙන ඊනියා ද්‍රවිඩ දේශය මදුරාසි (දෙමළ) කේරල

(තෙලිගු) අන්ද්‍රා (මලයාලම්) කර්නාටක (කණ්නඩ්) ලෙස භාෂා වලට බෙදන ලදී.

ද්‍රවිඩ දේශයකට එරෙහව පොත්සිරි රම්ලු මරණය දක්වා උපවාස කළ අතර ඔහුගේ මරණින් පසු ඇතිවූ දෙමළ විරෝධී කෝලාහල වලින් පසු මදුරාසි ජාතිවාදය පසු බැස්සේය. දූරදර්ශී ඉන්දීය නායකයෝ සිය ව්‍යවස්ථාව සංශෝධනය කළ ආරම්භයේ දීම බෙදුම්වාදය නීති විරෝධී කර එය දැඩිව ක්‍රියාත්මක කළහ. මෙලෙස ඉන්දියාවේ සෙසු ප්‍රාන්ත සමග එක්වීමට නොහැකි වූ විට මදුරාසියේ දෙමළ කසාගම් හා නාම්තම්ෂාර් වැනි පක්ෂ ශ්‍රී ලංකාවේ දෙමළ ජාතිවාදය හා එක්වී දෙමළ රාජ්‍යයක් පිළිඳව හඬ නැගීය. "අපි දෙමළ" ව්‍යාපාරය ලෙස එය නම් විය. එහෙත් 1962 මැතිවරණයෙන් කසාගම් පක්ෂය පැරදුණු විට නේරු දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කරමින් ඔවුන් මර්ධනය කළේය. නායික්කර්ගෙන් පසු දෙමළ කසාගම් පක්ෂයේ නායකයා වූයේ අන්නදොරෙයියි. අන්ත දෙමළ ජාතිවාදියෙකු වූ අන්නදොරෙයි යටතේ 1967 දී ඉන්දීය කොන්ග්‍රසය පරදවා මදුරාසි ප්‍රාන්තයේ ජය ලැබීමට දෙමළ කාසාගම් පක්ෂයන්ට හැකිවිය. එහෙත් ඔහුට කළ හැකි වූයේ මදුරාසි ප්‍රාන්තයේ නම තමිල්නාඩුව ලෙස වෙනස්කිරීම පමණකි. පසුව කසාගම් පක්ෂය දෙකඩ විය.

මෙයින් පෙනී යන්නේ ඉන්දියාවේ මුල් බෙදුම් වාදීන් මුස්ලිම් හෝ ග්‍රීකයන් නොව දෙමළ ජාතීන් වාදීන් බවය ඉන්දීය ප්‍රාන්තයක ප්‍රාන්ත පක්ෂයක් බලයට හසුවූයේ මුල්මවරට මදුරාසියේය. අදවන විට මුලු ඉන්දියාවේම ප්‍රාන්ත පක්ෂ ප්‍රාන්ත බලය අල්ලාගෙන ඇති අතර මධ්‍යම ආණ්ඩුව පවතින්නේද දැන් ප්‍රාන්ත පක්ෂ මතය. මේ අනුව තමිල්නාඩුව පමණක් නොව ඇසෑමය, පන්ජාබය, නාගලන්තය ආදී වෙනත් බෙදුම් වාදයන්ද දුර්වල ඉන්දීය මධ්‍යම රජය යටතේ ශක්තිමත් වන අතර ප්‍රභාකරන් ඔවුන්ගේ ආකර්ෂණයට ලක්වේ. ජායින් කොමිසමට අනුව අද ඉන්දියාවේ සියලු බෙදුම්වාදයන් සමඟ කොටි සංවිධානය තක්ෂණික හා වෙනත් පහසුකම් හුවමාරු කරගනිමින් ඇත. ඇත්තෙන්ම බටහිර ජාතීන්ටද අවශ්‍ය දකුණු ආසියාවේ මේ යෝධ රාජ්‍යය සෝවියට් සංගමය හෝ යුගොස්ලාවියාව මෙන් විසුරුවා හැරීමය. ඔවුන් ප්‍රභාකරන් රකින්නේ ඒ සඳහාය. ඔවුන් අමතක කරන සත්‍යය නම් දුර්වල ඉන්දියාවක් ඇතිවීමත් සමඟ ඇෆ්ගනිස්ථානය හරහා මුස්ලිම් මූලධර්ම වාද ඉන්දියාවට කඩා වැටීමට ඉඩ ඇති බවය.

එහෙත් උතුරු ඉන්දියානු දේශපාලන බලවේග තවමත් දෙමළ ජාතිවාදී අනතුරු තේරුම් ගෙන නැත. භාරතීය ජනතා පක්ෂය ''හින්දුත්ව'' සංකල්පය සොයා ගැනීමෙන් පසු දැන් ශ්‍රී ලංකාවේ දෙමල ජාතිවාදීන්ගේ උතුරු ඉන්දියානු සටන්පාඨය වී ඇත්තේ ''අපි හින්දු'' යන්නය. මෙලෙස තමිල්නාඩුවේදී ''අපි දෙමළ''

සටන් පාඨය ගයන ප්‍රභාකරන් දකුණු ඉන්දියාවේදී ''අපි ද්‍රවිඩ'' සටන් පාඨය ගයයි. උතුරු ඉන්දියාවේදී ''අපි හින්දු'' සටන්පාඨය වයන ඔහු පන්ජාබයේදී, ඇසෑමයේදී හා කාශ්මීරයේදී ''අපි ඉන්දීය විරෝධී'' සටන් පාඨය කියයි. මේ උපක්‍රමික හැසිරීමට පිලිතුරු දීමට හැකි සන්ධානයක් උතුරු ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ අර්යයන් ගොඩනගා ගන්නේ නැත්නම් ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ බෞද්ධයන් ගොඩනගා ගත්තේ නැත්නම් දකුණු ආසියාව ඇත්තේ මරණයේ කෙත උඩය.

මෙලෙස කොටි සංවිධානය දකුණු ආසියාවේ සහ නැගෙනහිර ආසියානු මෙන්ම නැගෙනහිර අප්‍රිකානු රටවල දෙමළ ජන කොටස් අතර ලෝක ද්‍රවිඩ රාජ්‍ය පිළිබඳ මනස රැගෙන යනු ලැබේ. ලෝක ඉතිහාසයේ ඉතා පැරණි යුගයක මේ කලාප තුළ පැවති මිනිස් ශිෂ්ටාචර (ශ්‍රී ලංකාවේ යක්ෂ, ඕස්ට්‍රේලියාවේ ඇබෝජින් ආදී) පවා ද්‍රවිඩ ශිෂ්ටචාර බවට දැන් දෙමළ ජාතිවාදීන් විසින් මතවාදයක් වපුරාගෙන යයි. මෙමගින් මෙම කලාපය තුළ ජීවත් වන දුඹුරු මිනිසුන්ගේ ''අර්ය නොවන'' යෝධ ශිෂ්ටාචාරය ද්‍රවිඩ බව පෙන්වා එය තම ලෝක ද්‍රවිඩ රාජ්‍යයේ ඓතිහාසික පදනම බවට පෙන්වීමටද උත්සුක වේ. සුදු මිනිසුන්ගේ ලෝකයෙන් බැටකන මේ ශිෂ්ටාචාර වලට පෙන්වා දිය යුත්තේ ආර්ය නොවන ශිෂ්ටාචාර සියල්ල දෙමළ නොවන බවත් අඩුම තරමින් ද්‍රවිඩ කියා ශිෂ්ටාචාරයක් වත් ඉතිහාසයේ නොමැති බවය. (ද්‍රවිඩ යනු භාෂ පවුලකට කියන නමකි. ආර්ය යනු භාෂා පවුලක් වන අතරම ශිෂ්ටාචාරයකි) අනික් අතර දෙමළ ජාතිවාදය ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ බිහිකළේ සුදුමිනිසුන් බව පෙන්වා දීමද මේ කලාපයේ සංස්කෘතික විද්වතුන්ගේ වගකීමය.

කොටි සංවිධානය ලොව පුරා සිය ජාලය ව්‍යාප්ත කරලීමේදී විවිධ සංවිධාන හා ව්‍යාපාර සමඟ උපක්‍රමික සබඳතා ගොඩනගා ගනී. ඒවා නම්.

1. විදේශ ඔත්තුසේවා අංශය
2. අවිජාවාරම් හා මත්ද්‍රව්‍ය ජාවාරම් කල්ලි
3. ආගමික මූලධර්ම වාදී සංකල්ප ලෙසය

ඉන්දියාවේ රජිව්ගාන්ධි, ඝාතන කොමිසම ප්‍රකාශ කරන පරිදි කොටි සංවිධානය එක්සත් ජනපද මාධ්‍ය ඔත්තු සේවය හා සම්බන්ධය. ඒ සඳහා ත්‍රිකුණාමල වරාය එක්සත් ජනපදයට ලබාදීමේ ගිවිසුමකට කොටි සංවිධානය බැඳී ඇත.

ජාතීන් කොමිසමේ ප්‍රකාශ කෙසේවෙතත් 1983-87 කාළය තුළ ඉන්දු ලංකා සබඳතා පිරිහීමට බොහෝ සෙයින් බලපෑවේ ත්‍රිකුණාමලය වරාය ඉන්දියාවේ

සතුරන්ට පත්වනු ඇති බව ඉන්දියාවට වූ සැකයයි. පිලිපීනයේ ක්ලාර්ක් දිවයිනේ වූ හමුදා සංකීර්ණය ත්‍රිකුණාමලයට ගෙන ඒමට ඇමරිකා එක්සත් ජනපදය උත්සහා කළ බවටද ඉන්දියාව චෝදනා කරයි. 1998 ජූලි වලදී ත්‍රිකුණාමල තෙල් ටැංකි සිංගප්පූරුවට බදු දීමේදී ද ඉන්දුනීසියාවේ විරෝධය එල්ල විය. එප්පාවල පෝස්පේට් නිදිය හා අනුරපුරයේ සැඟවී ඇතැයි කියන විකරණශිලී තෝරියම් නිධිය. පුල්මුඩේ හා මුලතිව්වල ඛණිජ වැලි හා රසායනික ද්‍රව්‍ය නිසා යළිත් වරක් ත්‍රිකුණාමලය කේන්ද්‍ර කරගනිමින් ඉන්දියාව හා ඇමරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාව තම සටන් බිම කරගෙන සිටි. ඉන්දියාව නැවත වතාවක් න්‍යෂ්ටික බෝම්බ පිපිරවීමකින් පසු (1998 මැයි) ඇමරිකා එක්සත් ජනපදය ඉන්දියාව,අස්ථාවර කිරීමට උත්සහා ගන්නා බව ඉන්දියානුවෝ චෝදනා නගති. කාශ්මීරය අරභයා ඉන්දියාව හා පකිස්ථානය අතර පවත්නා සම්ප්‍රදායික ගැටුමත් ආසියාවේ බලවතා ලෙස චීනය රඟපාන චරිතයක් නිසා මේ විදේශය සබඳතා අතිශය සංකීර්ණ වි ඇත. කොටි එයින් උපරිම ප්‍රයෝජන ලබති.

අනෙක් අතින් රජිව් ගාන්ධි ඝාතනය කළේ කොටි සංවිධානය බව හිරු මෙන් පැහැදිලිය. රජිව් ඝාතනය හුදු පුද්ගල ඝාතනයකට එහා ගිය දෙයකි. රජිව් ගාන්ධි මියගිය නිසා ඉන්දියානු කොන්ග්‍රස් පක්ෂයට එකට ලබාගත හැකි අවසන් නායකයාද අවසන්විය. ඉන්දියාව එක් කළ හැකි එකම පක්ෂය කොන්ග්‍රස් පක්ෂයවන අතර කොන්ග්‍රස් නොවෙන ඉන්දීය ආණ්ඩුව යනු ප්‍රාන්තවල බෙදුම්වාදි බලවේග දිල්ලිය අල්ලා ගැනීමක් පමණකි. ගාන්ධිගේ මරණින් පසු හින්දු අන්තවාදය මෙන්ම ප්‍රාන්තීය පක්ෂද පෙර නොවූවිරූ ලෙස දේශපාලනිකව බලවත් වී ඇත. ''ඉන්දියාව දැනටම දේශපාලනිකව ලෙස බෙදී ඇතැයි '' කියා විචාරකයින් කියන්නේ ඒ නිසාය. මේ අනුව රජිව්ගේ මරණය නිසා , ශ්‍රී ලංකාව බෙදීමට කොටින්ට ආධාර කළ රජිව් කොටි අතින්ම මිය යන්නේ ඉන්දියාව බෙදීමේ බරපතල කුඝද්ඝදය ගසමින් බව ඉතා පැහැදිලිය. මේ ඝාතනය කොටි සංවිධානය මෙන්ම බටහිර ලෝකයද අත්පොලසන් දෙන්නේ ඒ නිසාය. රජිව් ඝාතනය නිසා අස්ථාවර වූ ඉන්දියාව තවත් වසර ගණනාවක් යන තුරු එලෙසම අස්ථාවර වනු ඇත.

ඒ අනුව කොටි තහනම් කරමින් ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව කුමක් කීවත් කොටි සංවිධානය සහමුලින් අතුගා දැමීමට ඔවුන් ක්‍රියා කරනු ඇතැයි සිතිය නොහැක. ඊශ්‍රයල් ඔත්තුසේවා නිළධාරියෙකු මෙන්ම ඉන්දියාවේ සිටි කොටි හිතවාදියකු වන සුබ්‍රමනියම් ස්වාමි සී.අයි.ඒ. කොටි සබඳතා ගැන කියන විට ඒවා එක් වරම ඉවතලිය නොහැක්කේ ඒනිසාය. අනෙක් අතින් කොටි සංවිධානය සිය ත්‍රස්තවාදී තාක්ෂණය ''ගෝලීයකරණය'' කිරීම නිසා ලොවපුරා ශක්තිමත් ත්‍රස්තවාදී ජාලයක් ගොඩනැගීම එක්සත් ජනපදයේ ආරක්ෂාවට තර්ජනයක්ව පවති. එමෙන්ම බටහිර රටවල වෙසෙන දෙමළ

සරණාගතයින් එකී රටවල ආර්ථිකයට බරක් වන මොහොතේදී ශ්‍රී ලංකාවට මැදිහත් වීමට බටහිර රටවල් ක්‍රියා කළ හොත් හොත් පුදුමයට කරුණක් නොවේ.

මෙයට අමතරව කොටි සංවිධානය තවමත් ඉන්දීය ඔත්තු සේවා සමඟ සබඳතා පවත්වන බව ද රහසක් නොවේ. 1987 - 90 වකවානුවේ ශ්‍රී ලංකාවේදී ලත් බරපතල යුද දේශපාලන පරාජයෙන් ඉන්දීය ඔත්තුසේවා තවමත් පාඩම් ඉගෙනගෙන නැති බව පෙනේ.

මෙයට අමතරව කොටි සංවිධානය බ්‍රිතාන්‍ය ඔත්තුසේවාව සමඟ මෙන්ම පකිස්තාන ඔත්තුසේවා සමග ද ගනුදෙනු කරන බව වාර්තාවේ. කොටි හා ඊශ්‍රායල් ඔත්තුසේවාව අතර සමීප සුහදතාව හෙලිකළේ මොසඩ් ඔත්තු කරුවකු වන වික්ටර් ඔස්ත්‍රොවිස්කි විසින්මය.

කෙසේ වෙතත් 80 දශකයේ තිබූ දේශපාලන ගැටුම් වෙනුවට දැන් ලෝකය තුළත් නව ගැටුම් මතුවී ඇත. බලවත් යුදබලයක් හා ආර්ථිකයක් සහිත වීම හා හින්දු මූලධර්මවාදය නිසා ඉන්දියාව ගැන ප්‍රතිවිරෝධයක් බටහිර ලෝකයට ඇත. එමෙන්ම තමන් විසින්ම සෝවියට දේශයට එරෙහිව ගොඩනැගූ ඇෆ්ගනිස්ථානයේ මූජෙහිඩීන් හා තාලෙයිබාන් ඉස්ලාම් මූලධර්ම වාදී පකිස්තානය යටත් කිරීමටත් එතැනින් ඉන්දියාවට, ශ්‍රී ලංකාවට, මැලේසියාවට හා ඉන්දුනීසියාවට කඩාපැනීමට යන බවත් එක්සත් ජනපද තේරුම් ගනිමින් ඇත. අනික් අතින් අනාගත ලෝකයේ තම ආර්ථිකය, යුද, දේශපාලන සතුරා වන්නේ චීනය හා එයන් මතුවන සිනික්-කහ ව්‍යාප්තවාදය බවද එක්සත් ජනපදය දනී. චීනයට හා පකිස්ථානයට මුහුණ දීම සඳහා අනික් අතින් එක්සත් ජනපදයට ශක්තිමත් ඉන්දියාවක්ද අවශ්‍යය. මේ අනුව අනාගතයේදී බටහිර ලෝකය ඉන්දියාව සමඟ ක්‍රියාකරනු ඇත්තේ මේ පරස්පර අදහස් දෙක සමඟ උපක්‍රමික ලෙසය. අනෙක් අතින් ඉන්දියාවේ හින්දු මූලධර්ම වාදය බලවත් වුවහොත් එය නිසැකවම යලිත් ශ්‍රී ලංකාවට මැදිහත් වනු ඇත. ශ්‍රී ලංකාවට වැඩිම හානිය කළ හැක්කේ බටහිර ලෝකයට හෝ වෙනත් රටකට නොව ඉන්දියාවට බව තේරුම් ගත යුතුය. මේ අනුව ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තිය මේ පරස්පරයන්ත තුළ ඉතාම ශූර ලෙස නොහැසිරවුවහොත් අවසානයේ එයින් ප්‍රයෝජන අත්වන්නේ ප්‍රභාකරන් හා දෙමළ ජාතිවාදයටය.

කොටි සංවිධානය ඉතා බරපතල හා තීරක සබඳතාවක් ගොඩනගා ගෙන ඇත්තේ මත්ද්‍රව්‍ය හා අවිජාවාරම් කරුවන් සමඟය. එය එක් අතකින් කොලොම්බියාව සමඟද, ඇෆ්ගනිස්තානය සමඟද, තායිලන්තය සමග ද එකවිට මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදෙයි. කොටි සංවිධානය සිය ප්‍රථම නෞකාව 1984 දී මිලදී ගෙන ඇති අතර අද එය නැව් සමාගම් ගණනාවක් මෙහේයවයි. සිය නාවික

ගමන් වලදී 95% ක් ම වෙළඳ කටයුතු සඳහා යොදාගන්නා මොවුන් හිටි අඩියේ මත්ද්‍රව්‍ය හා අවි ජාවාරම් වල යෙදෙති. ආචාර්ය එච්. පී. ක්ලේපැක් ට අනුව අනුව මත්ද්‍රව්‍ය සමස්ථ ජාවාරම වාර්ෂිකව ඩොලර් බිලියන 2-4 අතර වේ. (රුපියල් කෝටි 14000-28000 ත් අතර) මෙයින් විශාල ප්‍රමාණයක් ඇෆගනිස්තානයෙන් හා තායිලන්තයේ රන් ත්‍රිකෝණයෙන් ලැබේ. කොටි සංවිධානය මේ ජාලයට එකතු වී ඇති අතර එමගින් වාර්ෂිකව රු කොටි 600 ක් පමණ ජනනය කරන බව වර්තා වේ. මෙය අති විශාල ධනයක් වන අතර ශ්‍රී ලංකාවේ පමණක් නොව ඉන්දියාවේද ඕනෑම දේශපාලනයක්, හමුදා නිලධාරියෙක්, රාජ්‍යසේවකයෙක්, රාජ්‍යනොවන සංවිධානයක් මාධ්‍ය ආයතනයක් මිලදී ගතහැකි තත්වයකි. දැන් යාපනයේ උපයන මුදල් ද සැලකිය යුතු ලෙස ඇණහිට ඇති තත්වය තුළදීත් ආණ්ඩුවල බාධා නිසා විදේශ මුදල් එකතුකිරීම් වලට බාධා පැමිණෙන විටදීත් කොටින්ගේ ප්‍රධාන ආදායම මෙය බවත් සැක නැත. මෙය වැලැක්විය නොහැකි නම් කොටි සංවිධානය පරාජය කිරීම යනු හීනයකි. තායිලන්තයේ කුන්සා, කොලොම්බියාවේ මැඩලින් කර්ටෙල්වරු මෙන් කොටි සදහටම තම ව්‍යාපාර කටයුතු කරගෙන සිටිනු ඇත. දේශප්‍රේමි විදේශ ඔත්තු සේවයක් ශක්තිමත් නාවික දැලක් හා ඉන්දියාව, බුරුමය හා තායිලන්තය සමඟ නාවික ආරක්‍ෂක බලයක් ගොඩනැගීම අත්‍යාවශ්‍ය වී ඇත්තේ ඒ නිසාය.

කොටි සංවිධානය ඉතා බලවත් සංවිධානයක් වන්නේ බටහිර ආගමික මූලධර්ම වාදී සංවිධාන හා රටවල් සමඟ ඔවුන් ගොඩනගාගෙන ඇති සම්බන්ධතාවයි. සීතල යුද්ධය අවසන් වී ඇති නිසා අනාගත ලෝකයේ සටන කතෝලික, ක්‍රිස්තියානි (32.5%) ඉස්ලාම් (19.5%) හින්දු (13.7%) බෞද්ධ (5.7%) වන බව සමහර විද්වතුන්ගේ මතයයි. යුරෝපය, ඇමරිකාව, අප්‍රිකාව, රුසියාව දැනටමත් මේ අරගලයෙන් තීර්ණය වී ඇති අතර සියලු ආගම් පැතිරීමට උත්සාහ කරන්නේ ලෝකජනගහනයෙන් 2/3 සිටින ආසියාව තුළය. මේ නිසා ආසියාවේ බිහිදොර පිහිටි ශ්‍රී ලංකාවද මේ ආගමික මූලධර්මවාදයට තදින් ගොදුරු වී තිබේ. විශේෂයෙන් ගැටුම් සහිත ප්‍රදේශ වල සාමය ස්ථාපිත කිරීම අනාථාධාර සුභසාධන, මාධ්‍ය නිදහස, මානව හිමිකම්, පරිසර සුරැකීම ජනතා සටන් ආදියේදී මේ මූලධර්ම වාදී ආයතන සිය සැඟවුනු හස්තය විවිධ රාජ්‍ය නොවන සංවිධාන හරහා ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලාංකික දෙමළ සමාජය දෙස බැලීමේදී එය ඉන්දියාවේ මෙන් හින්දු බ්‍රාහ්මණයන් විසින් පාලනය කරන සමාජයක් නොවන බව පෙනී යයි. ශ්‍රී ලංකාවේ හින්දු පූජකයා වනාහි අධිපති වෙල්ලාල කුලයේ සේවකයකු බව නාවලර්ගේ පුනර්ජීවනයේ සිට පැවතුනු සත්‍ය විය. කෙසේ වෙතත් 1996 න් පසු ඉන්දියාවේ ''හින්දුත්ව'' බලය නැගීමට සමාන්තරව සීග්‍ර හින්දු වර්ධනයක් දැන් ලංකාවේ

ඇති වෙමින් පවතී.

ශ්‍රී ලාංකික දෙමළ ප්‍රජාව තුළ කතෝලික හා ක්‍රිස්තියානි ප්‍රජාව සුළුතරයක් වුවත් (යාපනය රෝමානු කතෝලික පිරිස 11.5% කි මන්නාරමේ 41% කි මුලතිව් වල 15.2% කි) ක්‍රිස්තියානි ප්‍රජාව යාපනයේ 1.1% කි මන්නාරමේ 1% (1981) කි. සිංහල සමාජයට වඩා කතෝලික ක්‍රිස්තියානි ප්‍රජාව සංඛ්‍යාවෙන්ද සිවිල් බලයෙන් ද බලවත්ය. මෙයට බලවත් හා එකම හේතුව වූයේ යාපනයේ හා මන්නාරමේ පැවති ආගමික පාසල් වල බලයයි. ෆැන්සිස් සෙෂ්වියර්ගේ ජේසුයිට්වරු මුලින්ම ගොඩබටුවේ මන්නාරමට වන අතර දෙමළ යුද ආධිපත්‍යකු වූ සංකිලි විසින් කතෝලික සංහාරයක් කිරීම නිසා පෘතුගීසින් මුලින්ම යටත් කලේද මන්නාරම හා යාපනයයි. එතැන් සිට දෙමළ ක්‍රිස්තියානි වරු 1819 දී ඇමරිකානු මිෂනාරී බලපෑමට හසුවෙමින් අතිශය බලවත් ප්‍රභූ කල්ලියක් බවට පත්වූහ. නාවලර්ගේ පුනර්ජීවනය නිසා ආපසු ගිය ක්‍රිස්තියානීන් නැවත කරලියට ආවේ චෙල්වනායගම් නිසාය. පසුව පූජකවරු කිහිප දෙනෙක් කෙලින්ම ත්‍රස්ත ක්‍රියා සඳහා සම්බන්ධ වී අත්අඩංගුවට පවා පත්විය. (සිංහරායල් පියතුමා (කතෝලික), සින්නරාසා පියතුමා (කතෝලික), ජයතිලක රාජ පියතුමා (මෙතෝදිස්ත), ඩොනල්ඩ් කනගරත්නම් (එංගලන්තය සභාව) - 1982 - 1983 ජූලි කොලාහලයයෙන් පසු යැපන සභාව කොළඹින් වෙන්වී ඊළාම් සභාවක් ලෙස හැසිරෙමින් වෙනම පූජක පුහුණු ආයතනයක් ඇතිකරගත් අතර ඒ සඳහා එම්වානුවෙල් (දැන් ඕස්ට්‍රේලියාවේ කොටි ප්‍රකාශක), තෝමස් සෞන්දනායගම් (දැන් යාපනයේ රදගුරු) හා ජෝසප් රායප්පු (මන්නාරම රදගුරු) මුල් විය. කොටි සංවිධානය තුළ සිටි ඉහළපෙළේ නායකයන් රැසක් ද (බාලසංහම්, වික්ටර්, යෝගි) කරලියට ආවේ මේ ආගමික පසුබිම තුළය. මේ නිසා ම යුරෝපයතුල ජනප්‍රිය මතවාදය වී ඇතිතේ ශ්‍රී ලංකාවේ දෙමළ ක්‍රිස්තීයානීන් සිංහල බෞද්ධයන් විසින් සංහාරය කරවන බවය. එකදු කතෝලික පියනමක් හෝ මේ භයානක මුසාවාදය නිවැරදි කිරීමට ඉදිරිපත් වූයේ නැත. කෙසේ වෙතත් මේ තත්වය තවත් බරපතල වන්නේ කොටි ඉදිරියේ දෙමළ කතෝලික පූජක වරු නිර්භයව ක්‍රියාකොට ඝාතනය වීමත් නිසාය. (1997 දී සිංහල කොමිසම ඉදිරියේ සිංහලයන් වෙනුවෙන් සාක්ෂි දීමට පැමිණි ඔස්කා අබේරත්න පියනම හා සෙල්ටන් ප්‍රනාන්දු පියනමට සිය ප්‍රජාව වෙතින් ආ බරපතල ප්‍රහාරයකට මුහුණ දීමට සිදුවිය. 1960 ගණන්වල ඇතිවූ බෞද්ධ කතෝලික දේශපාලන ගැටුම් වල සිත්පෑරීම් තවමත් සුවනොවන බව එමගින් පෙනී ගියේය.) ක්‍රිස්තියානි සභාවල නම් කිසිවෙක් කිසිම විටක සංවිධානයට එරෙහිව කටයුතු නොකළහ.

එහෙත් සිංහල කතෝලික හා ක්‍රිස්තියානි විශාල පිරිසක් ආරක්ෂක හමුදා සාමාජිකයෝ වෙති. මෙයට අමතරව කැකුලාව දීවර ගම්මාන වලදී මරාදැමුනේ

අදද අනාථ වන්නේ සිංහල කතෝලික ධීවරයන්ය. මඩු පල්ලිය වන්දනාවක දශක දෙකක සිට සිංහල කතෝලිකයන්ට නිදහසක් ලැබී නැත. එහෙත් දෙමළ කතෝලි ක්‍රිස්තියානි ප්‍රජාව තුළ අන්තවවාදීන්ගේ ප්‍රහාර මැඩලීමට පොදුවේ ශ්‍රී ලංකාවේ කතෝලික - ක්‍රිස්තියානි ප්‍රජාවට නොහැකිව ඇත්තේය.

මේ අනුව දැන් ශ්‍රී ලංකාවේ කොටි සංවිධානය පමණක් නොව ආණ්ඩුව හා විපක්ෂයද විශේෂයෙන් වාමාංශික පක්ෂද නටවන බලවේගය බවට ආගමික මූලධර්මවාදීන් හා රාජ්‍ය නොවන සංවිධාන පත්ව තිබේ. විශේෂයෙන්ම නෝර්වේ ආධාර ලැබූ ඇලර්ට් සංවිධානය පිළිබඳ හෙලිදරව් වූ කරුණු අනුව එය ශ්‍රී ලංකාවේ ආණ්ඩු පක්ෂය, විපක්ෂය හා වාමාංශික පක්ෂ සියල්ලද සමහර හමුදා නිලධාරීන් හා රාජ්‍ය නිලධාරීන්ද සිය අල්ලට ගෙන තිබේ. එමතුද නොවේ. විදේශ රටවල මේ රට පිළිබඳ වැරදි ප්‍රචාර ගෙනයාමට රට පිළිබඳ ද්‍රෝහී පර්යේෂණ කිරීමට මත වාද හැසිරවීමට අතිවිශාල ධනයක් ආගම් මූලධර්මවාදීන් විසින් යොදවනු ලැබේ. චීනය හා ඉන්දියාවද බුරුමය හා තායිලන්තයද මෙන් මේ ආගමික මූලධර්ම වාදීන්ගේ ව්‍යාප්තිය දේශපාලනික ලෙස, මතාවාදී ලෙස, නීත්‍යානුකූල ලෙස මර්ධනය නොකලහොත් ශ්‍රී ලංකාවේ සැඟවුනු පාලකයන් බවට ඔවුන් පත්වීම අනිවාර්යය. **රාජ්‍යනොවන සංවිධාන ජාලය සහමුලින් පාලනය කිරීම කොටිත්‍රස්තවාදය මැඩලීමේ අත්‍යාවශ්‍ය පූර්ව කොන්දේසියක්ද වේ.**

# සෙන්කඩගලින් මලයානාඩුවේ පුල්ලි මතුවේ

නිල් අහස කුසට විහිදී ගිය කඳුයාය අවසන් වන්නේ එහිය. රාවනා රජසමයේ සිට මහනුවර රාජධානිය දක්වාවූ අඛණ්ඩ ශිෂ්ටාචාරයක සළකුණු හෑම සෑම පෙත් මගකම සෑම තුරුලතාවකම ගලා හැලෙන සෑම දියකදුරකම ලියැවී ඇත.

ඒ නුවර එළියයි

කුමාර විජේරත්න 1998 ජනවාරි 25 වැනිදා ගුවන් විදුලි ප්‍රවෘත්ති ප්‍රචාරය ඇසීමෙන් මුලින් විශ්මයට පත් විය. එයින් කියවුනේ මහනුවර ශ්‍රී දළදා මාලිගය කොටි ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්වූ බවය. වහා නුවර එළිය නගරයට ගිය ඔහු මේ පිළිබඳ සිය මිතුරෙකු වූ පතිරණට පැවසීය. ශෝකයට හා කෝපයට පත්ව සිටි ඔවුහු දෙදෙනා බැනරයක මෙසේ ලියූහ.

"දළදාවට පහර දුන් ත්‍රස්තවාදීන්ට අපේ විරෝධය."

එහෙත් ඔවුන්ට එය ප්‍රදර්ශනය කිරීමට ලැබුනේ නැත. පැජරෝ රියක පැමිණි ඔවුන් අසල නතර කළ අතර එයින් බැස ආවේ ප්‍රදේශයේ වතු කම්කරු කොන්ග්‍රසයේ බලවතා වූ සතාසිවම්ය. ඔහු බැනරය ඉරාදැමීමට තැත් කළේය. තම උපන් බිම තුළ භයානක ලෙස තමන් අසරණ වී ඇති බව හොඳන් ආත්මාරක්ෂක සටන් ක්‍රම ප්‍රගුණ කළ කුමාර් තේරුම් ගත්තේය.

සීතා එළියේ ධම්මානන්ද හිමියන් සීතාඑළිය ශ්‍රී ගංගාරාමයේ විහාරධිපතිනි වහන්සේය. සුන්දර දොල පහරකට උඩින් ආරාමට පිහිටා ඇති අතර මුළු සීතාඑළියම සහමුලින්ම පාහේ බෞද්ධයන්ය. (දෙමළ පවුල් ඇත්තේ 11 කි.) පන්සල පාමුල ගසක් යට "සීතා කෝවිල"නමින් කුඩා සිද්ධස්ථානයක් වසර ගණනකට පෙර මාර්ගයේ වැඩකළ දෙමළ කම්කරුවකු පිහිටවූ බව උන්වහන්සේට මතකය. හිටි හැටියේ දිනක එතනට පැමිණි පිරිසක් එය එළිපෙහෙළි කරන්නට විය. ඉන්පසු ඇමති වරුද තවත් බොහෝදෙනෙක් ද එහි ආගියහ. දැන් එහි "සිද්දෙයි අම්මාන්" නමින් කෝවිලක් ඉන්දීය ශිල්පීහු විසින් නිර්මාණය කරන්නට කරමින් සිටිති. ගඟට උඩින් වූ අක්කර 50 ක කැළයක් කපා රාම-සීතා පුරයක් ඉදිකිරීමට යයි. අපේ රජුවූ රාවණා වෙනුවට ආක්‍රමණික රාමගේ පුරයක් එහි ඉදිවන බව දැන් රහසක් නොවේ. එය නුවර එළිය පුරා ඉදිවෙමින් යන යෝධ කොවිල් සංකීර්ණවල තවත් එකක්

පමණි. දෙමළ ජාතිවාදයේ ඉතා ශූර ලෙස කන්ද උඩරට තමන්ගේ අගනුවරක් නිර්මාණය කරමින් සිටිති.

1999 අප්‍රේල් 29 වෙනිදා නුවරඑළියට සුවිශේෂි දිනයක් විය. දශක පහක් තිස්සේ ඒ සීත කඳුකරය අල්ලා ගැනීම සඳහා ලංකා වතු කම්කරු කොන්ග්‍රසයේ ජාතිවාදීන් ගෙනගිය සීතල යුද්ධය පුපුරා ගියේ එදා ය. ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරයේ බැනරයක් ඉවත් කිරීම සඳහා ස්වයංක්‍රීය ගිනි අවි රැගෙන නගරයට කඩිපනිනු ආරුමුගම් තොණ්ඩමන් ප්‍රමුඛ කල්ලිය විසින් ගෙන ගිය නිති විරෝධි ක්‍රියාවිලිය විසින් නුවර එළිය පමණක් නොව මුළු රටම අවධි කළේය.

මේ හා සමාගම නුවරඑළියේ දේශපාලන ඒකාධිකාරිය ඉන්දියානු සම්භවයක් සහිත දෙමළ දේශපාලනයට නතුවෙමින් පවත්නා බව පැහැදිලි කරමින් දුම්රිය මාර්ගයේ ප්‍රථම බිම්බෝම්බය පිපිරීගියේය. ප්‍රදේශයේ තෙල් ටැංකි. ට්‍රාන්ස්පෝමර්, හා දුරකථන පද්ධති පිපිරී යමින් ඇත. පාසැල් දරුවන් සිංහල විරෝධී පෙළපාලි වලට දක්කමින් සිටිති. එය ක්‍රමයෙන් සිංහල පමණක් නොව මුස්ලිම් විරෝධී ද වන බව බදුල්ලේ මුස්ලිම් ගුරුවරියන් පාසැල් වලින් පළවා හැරීමෙන් පෙනී ගියේය. 1970 ගණන්වල යාපනය, නුවරඑළියේ නිර්මාණය වෙමින් පවතී ද? ත්‍රස්තවාදය සිය දෙවන යුද පෙරමුණ කඳුකරයේ විවෘත කර ඇති ද?.

ශ්‍රී ලංකාවේ ජාතික දේශපාලනය කළ ප්‍රභූවරු සියළු දෙනාම පාහේ දූරදර්ශී නොවූ අවස්ථාවලදී බලලෝභීන් බව පෙන්වීමට හොඳම උදාහරණය පිපිරෙමින් ඇති කඳු කරයයි. උතුරු හා නැගෙනහිර සම්බන්ධයේන් ඔවුන්ට යම් සමාවක් දියහැකි වුවත් ගිනි ගැනීමට නියමිත කඳුරට පිළිබඳව නම් කිසිදු සමාවක් දිය නොහැකිය.

1833 දී මේ වැවිලි කර්මාන්තය ඇරඹුණු අතර මාර්ෂ හා යටිතල ව්‍යුහයන් ගොඩනැංවීම සිදුවිය. ඉංග්‍රීසින් හා මුහුණට මුහුණ දුන් සිංහල ජනයා මේ වැඩබිම්වල වැඩට නොගිය නිසා ඉන්දියාවේ විවිද ප්‍රාන්තවලින් තොග ගණනින් වහල් සේවය සඳහා කම්කරුවන් ගෙන එන ලදී. ඉන්දීය ජාතික කොංග්‍රසයේ බලපෑම නිසා 1982 සිට මෙලෙස ඉන්දියාවෙන් "ජනයා විකිණීම"නීති විරෝධී කළත් ජාවාරම් කරුවෝ සිය ජාවාරම දිගටම කරගෙන ගියහ.

මේ ජාවාරම යෙදීමට වැවෙන්ඩන් වතුයායේ කම්කරුවෙකු වූ කරුපයියා ඉටාගත්තේය. නීති විරෝධි ඉන්දියානු මිනිස් අසරණුන් විකිනීම අතිශය ලාභ උපයන් ව්‍යාපාරයක් විය. කරුපයියා මෙමගින් කෙතරම් ධනයක් උපයාගත්තාද යත් 1910 දී ඔහු තමා සේවය කළ වැවෙන්ඩන් වතුයාය මිළදීගත්තේය. 1924 දී ඔහු දකුණු ඉන්දීය මුනාපුඩර් ගම්මානයේ සිට තම බාල දරුවාවූ මතාවන් හෙවත්

වනා ඊනා කනා රූනා සෞම්‍යමූර්ති තොණ්ඩමන් මේ රටට ගෙන්වා ගත්තේය. මේ සියවස තුළ උඩරට සිංහල රාජධානියේ වෙනමම දෙමළ රාජධානියක් ගොඩනගා ගැනීම පිළිබඳව කථාව ඇරඹුණේ එතැන සිටය.

දිගින් දිගටම ඉන්දියානු කම්කරුවන් ගෙන්වීම අභියෝගය ලක් කිරීමට කිසිදු ජාතික නායකයකු ඉදිරිපත් වූයේ නැත. ඒ.ඊ. ගුණසිංහ මහතා පමණක් මේ අනතුර දැක එයට විරෝධය පෑවද ප්‍රභූවරු සිතුවේ තමන්ගේ වතුවල අඩුකුලියට වැඩකරන දෙමළ මිනිසුන් තවත් පැමිණියාවේ කියාය.

1928 දී ඩොනමෝර් කොමිසම මේ ජාතික නායකයින්ට හොඳ කණේපාරක් දුන්නේය. එනම් හයමසක් තරම් සුළු කාලයකට මේ රටට පැමිණ සිටි සියළු ඉන්දියානු සංක්‍රමණකයින්ට ඡන්ද අයිතිය ලබාදීමය. එමගින් සිංහල බලය පාලනය කිරීමට ඩොනමෝර් කොමිසම ඉටාගත්තේය. මෙලෙස තමන් උපන් රටේවත් නැති ඡන්ද අයිතියක් ශ්‍රී ලංකාවේ දි මේ ජනයාට ලැබුණි. 1931 රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඔවුහු නියෝජිතයන් දෙදෙනකු යැවූහ. 1947 දී එය 7 දක්වා ඉහළ ගියේය.

1939 ජූලි 25 දා ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රී නේරු පිළිගැනීම සඳහා ශ්‍රී ලංකාවේ වාසය කළ ඉන්දියානු ව්‍යාපාරික පිරිස වූ චෙට්ටින් විසින් උත්සවයක් පවත්වන ලදී. උත්සවය අවසන් වූයේ ලංකා ඉන්දියානු කොංග්‍රසය බිහිවීමෙනි. 1939 අගෝස්තු 13 වන දා ගම්පොළදී එහි ශාකාවක් විවෘත කරන ලද අතර සෞම්‍යමූර්ති තොණ්ඩමන් එහි සභාපතිවරයා විය. 1940 මැයි මස හපුතලේදී ලංකා ඉන්දියානු කොංග්‍රසයට අනුබද්ධ කම්කරු අංශයක් බිහිකරන ලද අතර නීති විරෝධී දෙමළ සංක්‍රමණිකයන් එයට බඳවාගන්නා ලදී. මෙහි විශේෂත්වය වන්නේ බොහෝ වතුවල අයිතිකරුවන් වූයේද චෙට්ටින්ම වීමයි. මේ අනුව කම්කරුවන්ගේ ස්වාමිවරුන්ම කම්කරුවන්ට වෘත්තීය සමිති තනාදෙන ලදී. ඔවුන්ට ලැබුණු එකම අයිතිය වූයේ ඡන්දයේ දී චෙට්ටින්ට ඡන්දය දීමයි. පසුව ඡන්ද බලය නිසා ලංකා ඉන්දියානු කොංග්‍රසයේ දියවී ලංකා කම්කරු කොංග්‍රසය බිහිවිය.

ලංකා ඉන්දියානු කොංග්‍රසය ශ්‍රී ලංකාවට නිදහස ලබාදීමට එරෙහිවිය. කොන්දේසි විරහිතව ඉංග්‍රීසියෙන් ආපසු යායුතු යැයි කිවේ අබ්දුල් අයිස් පමණි. ඔහු පසුව ප්‍රජාතන්ත්‍රවාදී කමකරු කොංග්‍රසය බිහිකළ අතර අසිස්ගේ මරණයෙන් පසු එය යළිත් තොණ්ඩමන් හා එක්විය.

ඩොමිනියන් නිදහස ලැබීමෙන් පසු නිදහස් රජය, ශ්‍රී ලංකාවේ පුරවැසියන් කවුරුන්දැයි තීරණය කිරීමට පුරවැසි පනත් දෙකක් ගෙන ආවේය. මේ මගින් විවාහකයන් නම් වසර 10 කින්ද මේ රටේ ස්ථිර පදිංචිය දැරූ අය නම් ඔවුන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස නම් කරන

ලදී. එහෙත් දෙමළ ජාතවාදීන් මෙන් පුරවැසි පනත නම්කර ඇත්තේ දෙමළ ජනයාගේ පුරවැසි අයිතින් නැසීමක් ලෙසය. ඇත්තෙන්ම එයින් සිදුවූයේ පුරවැසි අයිතිය ලබාදීමටය. 1939 සිට දෙවන ලෝක යුද තත්වය නිසා එතෙක් හයමසකට වරක් ඉන්දියාවට යමින් සිටි සංක්‍රමණික කම්කරුවන් ශ්‍රී ලංකාවේ නතර වූ අතර මේ නිසා නව පුරවැසි පණත යටතේ සැලකිය යුතු පිරිසක් පුරවැසියන් වීමට සුදුසුකම් ලැබූහ. නිදහස් ඉන්දියාවද තම රටේ පුරවැසියන් කවුරුන්දැයි තීරණය කිරීම සඳහා මේ ලෙසම වූ පුරවැසි පනතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමගම ගෙනා බව අමතක නොකළ යුතුය. එහෙත් මේ පුරවැසි පනත සහමුලින්ම ක්‍රියාත්මක නොවීය. තොණ්ඩමන් එයට නඩුදැමූ අතර දීර්ඝ වැඩවර්ජන සඳහා හා හර්තාල් සංවිධානය කළේය. 1953 දී නේරූ සේනානායක හා 1954 දී නේරූ කොතලාවල සාකච්ඡා හා එකඟතා ඇති වුවද ඉන්දියාව ඒවා ක්‍රියාත්මක නොකළ අතර ශ්‍රී ලංකාවද අලස ප්‍රතිචාරයක් දැක්වීය. තොණ්ඩමන් එජාපයේ හෝ ශ්‍රී.ල.නි.ප. පත්කල මන්ත්‍රීන් වෙමින් සිටියේය.

1964 ඔක්තෝබර් 30 වැනිදා වන විට ඉන්දීය නීතිවිරෝධි සංක්‍රමණිකයින්ගේ චිත්‍රය මෙලෙස විය.

පුරවැසි පනත යටතේ ලංකා පුරවැසි භාවය ලැබූ 1,40,185 යි. ඉන්දීය පුරවැසිකම ලැබූ 2,34,488 යි. තීන්දුවක් නැති පිණිස 9,71,073 ය.

එදින ඉන්දීය අගමැති ශාස්ත්‍රී හා ශ්‍රී ලංකා අගමැති සිරිමා බණ්ඩාරනායක ගිවිසුමට එළැඹිණි. එමගින් තීන්දුවක් නැති 9,71,073 ක පිරිසෙන් ලක්‍ෂ 3කට හා ඔවුන්ගෙන් පැවත එන්නට ශ්‍රී ලංකා පුරවැසිකම ලැබේ. ලක්‍ෂ 5.4 කට හා ඔවුන්ගෙන් පැවත එන්නට ඉන්දීය පුරවැසිකම ලැබේ. මෙය 1981 ඔක්තෝබර් මසට පෙර අවසන් කළ යුතුය. ඉතිරි ලක්‍ෂ 1.3 ගැන පසුව තීන්දුවක් ගනු ඇත.

1964 දී තොණ්ඩමන් සිරිමාවෝගේ ආණ්ඩුව පෙරළා දැමීමට හවුල් වූ අතර 1956-70 හත් හවුල් එ.ජා.ප. රජයට එක්වී සිරිමා - ශාස්ත්‍රී ගිවිසුම මුළුමනින්ම අඩාල කළේය. වසර 5කට බලයේ සිටම එජාපය මුළු රටේම අනාගතය උගසට තැබීය. මේ නිසා 1964-70 අතර ඉන්දියාවට ගිය පිරිස 13,733ක් වූ අතර ලංකා පුරවැසිකම ලැබුයේ 8,519 ක් පමණ ය.

1970 න් බසු පූර්‍ර් සැලැස්ම ක්‍රියාත්මක වූ අතර 1973 දී සිරිමා - ඉන්දිරා කථාවලින් 64 දී ඉතිරිවූ ලක්‍ෂ 1.3 (එය දැන් ලක්‍ෂ 1.5 කි) ලක්‍ෂ 0.75 බැගින් 1:1 අනුපාතයට බෙදා ගනු ලැබීය. එහෙත් මෙය ක්‍රියාත්මක වන්නේ 64 ගිවිසුම පූර්ණ ලෙස ක්‍රියාත්මක වීමෙන් පසුය ලෙස එකඟතාවයකට ද එනු ලැබීය.

1970-76 ඉන්දීය පුරවැසිභාවය ලැබූ පිරිස 2,14,732 ක් වූ අතර 99,059ක් ඉන්දියාවට ගිය පිරිස 1,79,663 ක් විය. මේ කාලය තුළ ශ්‍රී ලංකික පුරවැසිකම 1,01,992 ක් ලබාගත්තේය.

1977-81 අතර ඉන්දීය පුරවැසිභාවය 96,142 ක් ලැබූ අතර 99,059 ක් ඉන්දියාවට යවනු ලැබීය. මේ කාලය තුළ ශ්‍රී ලංකික පුරවැසිභාවය 55,744ක් ලැබූහ.

මේ අනුව 1964- 81 සම්පූර්ණ විය.

ඉන්දීය පුරවැසිභාවයට සුදුසු වූ ගණන 3,73,912 කි. ස්වාභාවික වැඩිවීමත් සමග එය 4,98,341කි. මෙයින් සත්‍යයෙන්ම ඉන්දියාවට ගියේ 2,84,300කි. ස්වාභාවික වැඩිවීමත් 3,75444කි. ශ්‍රී ලංකික පුරවැසිභාවය ලැබූ පිරිස 1,62,112කි. ස්වාභාවික වැඩිවීමත් සමග එය 2,10,660 කි. මේ අනුව ලක්ෂ 5.36 ක පිරිසකගේ ප්‍රශ්නය පමණි.

1986දී ඇතුළත්මුදලි - තොණ්ඩමන් - ඩික්සිත් කථා අනුව 1964 ගණක් අනුව ඉන්දියාව භාර ගැනීමට සූදානම් වූ ලක්ෂ 6.15 ක ගණන ලක්ෂ 5 දක්වා අඩු කරනු ලැබීය. ලංකාව සිය ලක්ෂ 3.75 ට අමතරව තවත් ලක්ෂ 0.94ක් භාරගෙන මුළු ගණන ලක්ෂ 4.69 දක්වා වැඩි කළේය. පසුව ඉන්දියාව පෙන්වා දුන්නේ තම ලක්ෂ 5න් ලක්ෂ 4.2 කට දැනට පුරවැසි භාවය ලබාදී ඇති නිසා තව ඇත්තේ 84,000 ක් පමණ බවය. ඉන්දියාවේ සිටින ලංකා අනාථයින් ගෙන්වා ගත් විට ඒ 84,000 භාරගන්නා බව ඩික්සිත් කිවේය. මේ නිසා 1984 න් පසු ඉන්දියානුවන් පිටවී ගියේ නැත. 1988 ජනාධිපතිවරණයට පෙර ඉන්දීය ඡන්ද කුට්ටිය කඩාගැනීමට උත්සහ කළ එ.ජා.ප.ය 1988 දී පුරවැසි පනතක් ගෙනවිත් 1964 දී 2,31,849 ක් හා ඔවුන්ගෙන් පැවත එන්නට එකවරම පුරවැසි අයිතිය ලබාදෙන ලදී. අවසාන වශයෙන් අද දක්වාම 1964 ගණන අනුව ඉන්දියාවට ගිය පිරිස ලක්ෂ 3.4 කි. මේ අනුව 1986 ශ්‍රී ලංකාවේ වාසය කරති. 1964 ගිවිසුම අනුව නම් මේ ගණන 2,78,000ක් හා ඔවුන්ගෙන් පැවත එන්නන් වේ.

ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන වේගය අනුව සිංහල 0.74%, ලංකා දෙමළ 1.7% වතු දෙමළ 3.0% මුස්ලිම් 4.5% වේ. මේ අනුව වතු දෙමළ ජනගහනය සෑම වසර 23 කටම වරක් දෙගුණවේ. මේ අනුව 1964 ගිවිසුම අනුව ශ්‍රී ලංකාවේ රැඳී සිටින ඉන්දීය පුරවැසියන් ගණන ලක්ෂ 9ක් වන අතර 1988 ද්‍රෝහිකම නිසා එය දැන් ලක්ෂ 6ක් පමණ වේ.

1994 ජන සංඛ්‍යා ලේඛන අනුව උතුරු හා නැගෙනහිර පළාත්වල හැරුණු විට සෙසු පළාත්වල වෙසෙන ඉන්දියානු දෙමළ ජනගහනය 5,43,794 කි. මෙයින්

3,91,749 ක් මධ්‍යම පළාතේද, 20,886 ක් බස්නාහිර පළාතේද 61 137ක් ඌව පළාතේද,56,735ක් සබරගමු පළාතේද වාසය කරති. නුවර එළිය දිස්ත්‍රිකයේ පමණක් මේ ගණන 3,42,326කි.

පොදු පෙරමුණ ආණ්ඩුවේ නව ව්‍යවස්ථා සංශෝධනයෙන් (1995) මේ මුළු පිරිසටම ශ්‍රී ලංකාවේ පුරවැසි අයිතිය දීමට යොජනා කර ඇත. ඒ අනුව බස්නාහිර පළාතේ ඉන්දියානු දෙමළ ප්‍රතිශතය 7%ක්ද, මධ්‍යම පලාතේ 24.8% දක්වාද (වත්මන් 7.9%) ඌව පළාතේ එය 17.5% ක් (වත්මන් 8.9%) හා සබරගමුව පළාතේ එය 8.9% ක් වත්මන් 5.57%) දක්වද ඉහළ යයි. නුවර එළිය දිස්ත්‍රික්කයේ එය 55.7% දක්වාද ඉහළ යයි.

මෙයින් පෙනීයන්නේ තොණ්ඩමන් ඉතා දක්ෂ ලෙස කඳුකරයේ දෙමළ ජනගහනයක් නිර්මාණය කර ඇති බවය. වසර 23 කට වරක් දෙගුණවත් වන එය ඊළඟ සියවස තුළ 16 ගුණයකින් ඉහළ යන බවය. මේ පිරිස අතර තරුණ ජනකාය 27%ක් තරම් අගයක් ගන්නා බවය. මොවුන් සඳහා දැනටමත් ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතියක් දියත් කර ඇත. වෙනම ග්‍රාම සේවා වසම් 101ක් පිහිටුවා ඇත. ප්‍රාදේශීය උපසභාපති කොට්ඨාශ 14ක් ලබාගැනීමට ද කටයුතු යෙදේ. ඊළඟට දෙමළ දිස්ත්‍රික්කය පිහිටුවන අතර අවසානයේ පළාත් හා නිජභූමිය බිහිවෙයි. නව ග්‍රාමසේවා වසම්, ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් මායිම් නිර්දේශ කිරීමේ කමිටුව විසින් නුවර එළියේ දැනට ඇති ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ ගණන අටක් හෝ ඊට වැඩි ගණනක් විය යුතු බවත් එයින් හතරක් දෙමළ බහුතරය සහිත විය යුතු බවත් යෝජනා කර ඇත. මේ අනුව අඹ ගමුව හා නුවරඑළිය කොට්ඨාශ එක්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 4ක් බිහිකර එයින් 3ක් දෙමළ බහුතර කොට්ඨාශ කිරීමටත්, වලපනේ, කොත්මලේ, හඟුරන්කෙත එක්කර නව කොට්ඨාශ 4ක් හෝ වැඩි ගණනක් බිහිකර එයින් අඩුතරමින් එකක් දෙමළ බහුතර කොට්ඨාශයක් කිරීමට යෝජනාකර ඇත. මෙය මහනුවර රත්නපුර හා බදුල්ල දිස්ත්‍රික් වලද සිදුකිරීමට නියමිතයි. එයින් ඉබේම තනි දෙමළ ග්‍රාම සේවා වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා අවසානයේ දිස්ත්‍රික්ය ලැබෙනු ඇත. සන්නද්ධ සටනකින් තොරවම තොණ්ඩමන් විසින් තනිදෙමළ නිජබිමක් බිහිකරමින් සිටි යන්නට මෙයට වැඩි අටුවා අවශ්‍ය නැත. දැනටමත් ජාතිවාදී දෙමළ පෙරමුණ ඉන්දීය පෙරමුණ ඉන්දීය වමුසීලී මක්කල් පේරනී ලෙස ගොඩනැගී ඇත. තොණ්ඩමන්ටත් වඩා ඉදිරියෙන් සිටිමින් චන්ද්‍රසේකරන් හා පුත්‍ර සීගාමනී වැන්නන් ප්‍රචණ්ඩත්වය ජාතිවාදය වපුරමින් ඇත. දෙමළ තරුණයන් කොළඹට මෙන්ම වන්නියේ යුද පුහුණුවටද යන අතර වගා පාළුවීමෙන් සිංහල ගැමියන් උඩරට ඉඩම් අත්හැර යෑමත්, ඉඩම් අහිමිකම නිසා වියලි කළාපයට තල්ලුවීමත් සිදුවෙමින් ඇත. මේ සඳහා ඉක්මන් දැඩි පාලනයක් නොකළ හොත් වතුකරයේ දෙවන දෙමළ ජාතිවාදී

සටන් පෙරමුණ විවෘතවනු නොවනු මානය. මේ ප්‍රශ්නය විසඳා ගැනීමට පෙර දැනටමත් බොහෝ දේ වැරදී ඇති බව පිළිගත යුතුය. 1947 පුරවැසි පනත ක්‍රියාත්මක නොවීම නිසා ශ්‍රී ලංකාවට අවාසිදායක ලෙස 1964 ගිවිසුම ඇති විය. බල ලෝභී දේශපාලනය එය ක්‍රියාත්මක නොකිරීම නිසා 1986 ගිවිසුම ඇති විය. දැන් ඊනියා දේශපාලන යෝජනා වලියෙන් සියළු ඉන්දියානු වැසියන්ට වහා පුරවැසිකම ලබාදීමට යයි. දැනටමත් නුවර එළියේ ජනවාර්ගික පවිත්‍ර කරණය ක්‍රියාවලිය ඇරඹී ඇති අතර පාරම්පරික සිංහල මිනිසුන්ට බිම් අඟලක් හෝ ලබා ගැනීමට අහෝසිවී ඇත. නුවර එළියේ කාර්මික විද්‍යාල හා පාසැල් තනි දෙමළ අධ්‍යාපනය ආයතන බවට පත් කෙරෙමින් ඇත. නුවර එළියේ ඇති කාර්මික විද්‍යාල හා පාසැල් තනි දෙමළ අධ්‍යාපන ආයතන බවට පත් කෙරෙමින් ඇත. නුවර එළියේ ඇති එකම ගුරු විද්‍යාලයට කිසිදු සිංහලයකු බඳවා ගනු නොලැබේ. යාපනය හා මඩකලපුව විශ්ව විද්‍යාල මෙන් සබරගමු විශ්ව විද්‍යාල ද තනි දෙමළ එකක් බවට පත්කිරීමට යොජනා කෙරී ඇත. රටේ නීතිය, පොලිස් ආරක්‍ෂාව සිංහලයකුට පීඩාකාරී ලෙසත් දෙමළ ජාතිවාදී සංවිධාන වලට වරදානයක් ලෙසත් ක්‍රියාත්මක වේ. මේ සියල්ල තුළින් මධ්‍යම පළාතේ පමණක් නොව මධ්‍යම ආණ්ඩුවේ ද බලය හැසිරවීම දෙමළ ජාතිවාදී ලෙස සිදුකිරීමට තොණ්ඩමන්ට හැකියාව ලැබී ඇත. ඔහු එක් අතකින් වතු දෙමළ ජනයාට රටේ සෙසු කොටස් සමග මුසුවීමට හෝ ඉන්දියාවට යෑමට ඉඩ නොදෙන අතර අනෙක් අතින් තම පවුලේ දේශපාලන ඒකාධිකාරයට ඔවුන් යටත් කොට ඇත. මෙහි අවසාන ප්‍රතිඵලය වනුයේ යාපනයේ ප්‍රභූ ආධිපත්‍ය මත දෙමළ ජාතිවාදය ඇති වී වැඩීගියා සේ කඳුරටද දෙමළ ජාතිවාදය ත්‍රස්තවාදය ඇතිවීමය.

ලංකාවේ මේ ද්‍රෝහි දේශපාලනය හඳුනාගත යුත්තේ ඉන්දීය කම්කරුවන් නීතිවිරෝධී ලෙස රැගෙන ගිය වෙනත් රටවල් දෙස බැලීමෙනි. බුරුමය, කෙන්යාව, උගන්ඩාව, පිජී රට මේ ප්‍රශ්නයට නිර්භීත ලෙස විසඳා ඇත. ඒ කෙසේද?

කෙන්යාවේ තේ වැවිල්ල සහිත රටකි. 1963 දී එරට නිදහස ලබාගත් අතර ජනාධිපති ජෝමෝ කෙන්යාටා විසින් "අප්‍රිකානුවාදය" හඳුන්වාදෙන ලදී. මේ අනුව කෙන්යානු භාෂාව ඉගෙනගෙන කෙන්යා අප්‍රිකානුවෙකු විය නොහාකි සියළු දෙනා රටින් පිටවිය යුතුයැයි නියෝග කෙරිණ. 1967 දී සංක්‍රමණික පනත ගෙන එන ලද අතර අප්‍රිකානුවාදය ප්‍රතික්ෂේප කරන සියල්ලන්ගේ වෙළෙඳ ව්‍යාපාර හා දේපළ අත්පත් කරගෙන ඔවුන් රටින් නෙරපන ලදී. ඒ නිසා කෙන්යාවේ තොණ්ඩමන් කෙනෙකු හෝ ප්‍රභාකරන් කෙනෙකු නැත.

උගන්ඩාව ද ඉන්දියානු සංක්‍රමණිකයින් බහුලව සිටි රටකි. 1969 දී එරට ජනාධිපති මිල්ටන් ඔබෝටේ විසින් සංක්‍රමණික නීති ගෙන ආ අතර ඉන්දියානුවන්

ඇතුළු ආසියාතිකයින් රටින් පිටුවහල් කලේය.

1948 දී බුරුමය නිදහස දිනාගත් අතර ඒ වන විට එහි ව්‍යාපාර හා පාලනය ඉන්දියානුවන් අතට පත්වී තිබිණි. 1953 දී ඉඩම් ජන සතුකළ අතර ඉන්දියානු චෙට්ටින්ගේ දේපොළ ජනසතු කෙරිණි. ඉන්පසු නෙවින්ගේ හමුදා රජයද බුරුම පුරවැසි නීති පිළිගත නොහැකි අය රටිං පිටමං කළේය. ඔහුගේ ප්‍රතිපත්තිය වූයේ බුරුමය එහි ජනයාට මිස අන් කිසි විදේශිකයෙකුට ණය නැති බවය. ඉන්දීය කම්කරුවන් මේ රට ගොඩනැගූ බවට මොරගාන වාමාංශිකයින්ට එය හොඳ පිළිතුරකි.

පිජි රටේ තත්වය ඊට වඩා බරපතලය. 1970දී පිජි රටේ ව්‍යාපාරය, කම්කරු ක්ෂෙත්‍රය හා ජනගහනය ඉන්දියානුවන් විසින් පාලනය කෙරිණි. ඉන්දීය ජනගහනය 55% ක් විය. 1970 ව්‍යවස්ථාවෙන් ඉන්දියානුවන්ට සමතැන්දුන් අතර ප්‍රතිඵලය වූයේ ඉන්දියානුවන්ගේ ජාතික සංගමය (NFF) ජය ලැබීමය. කෙසේ වෙතත් අගමැතිකම කම් ඔස්සේ මරා නම් පිජි නායකයකු සතුවූ නිසා පිජිවරු තවත් කරබා සිටියහ. 1987 දී මේ තත්වය වෙනස් විය. ඉන්දියානුවෙක් අගමැතිවන අතර පිජි දේශප්‍රේමියෙකු වන සිව්වෙනි රබුකා එහි හමුදා පාලනයක් පිහිටුවීය. 1990 දී නව ව්‍යවස්ථාවක් පිහිටුවනු ලැබූ අතර පාර්ලිමේන්තු ආසන 59 න් 37ක් පිජි ජාතිකයින් සඳහා 27ක් ඉන්දියානුවන් සඳහාද වෙයි. ඉහළ මන්ත්‍රණ සභාවේ බහුතරයද (ආසන 34කි) පිජිවරුය. මෙලෙස එරටේ සංඛ්‍යාත්මක බහුතරය වෙතින් ස්වදේශිකයන් රැකගැනීම සඳහා ව්‍යවස්ථාව ප්‍රයෝජනයට ගෙන ඇත. මෙවැනි නීති පද්ධතියක් මගින් මැලේසියාව, ඉන්දුනීසියාව, හා සිංගප්පූරුව ඉන්දියානු වසංගතයෙන් බේරී ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ දේශපාලනය කරන්නන් බවට පියවරින් පියවර ඉන්දියානු විදේශිකයින් පත්වී තිබේ. මේ සියවස් තුළ කොන්ද පණ ඇති දේශප්‍රේමී ජන නායකයෙකු බිහි නොවීම එයට හේතුවකි. එයට ඊළඟ සියවසේදී වගකීමට සිදුවී ඇත්තේ උඩරට ඓතිහාසික පදිංචිකරුවන්ටය.

චන්ද්‍රශේකරන් හා තොණ්ඩමන් දැනටමත් සිය ප්‍රතිපත්තිය ප්‍රකාශනය තුළ කන්ද උඩරට සෙංකඩගල ප්‍රදේශ වතුදෙමළ ඉන්දීය ජනයාගේ නිජ භූමිය ලෙස ප්‍රකාශකර ඇත. මුලින් ජනගහනය තනාගත් ඔවුන් ඊළඟට භූමිය දිනාගනිමින් යති. ඊළඟට මතවාදය හා ඉතිහාසය නිර්මාණය කරමින් යයි. අවසානයේ යුද්ධය හා වෙනම රාජ්‍යය පෙරට එනු ඇත.

වතු දෙමළ ජාතිවාදය පුපුරායෑමට පෙර වහා ක්‍රියාත්මකවිය යුත්තේ ඒ නිසාය.

# කොටි මදිවට ඔටු ත්‍රස්තවාදයක් !

1997 ජුලි 23 වන දින පැවැත්වූ මහා මැතිවරණ සමයේදී දෙමළ එක්සත් විමුක්ති පෙරමුණේ නායකයෝ උතුරු හා නැගෙනහිර පළාත්වල ස්වෛරී දෙමළ ඊලාම් රාජ්‍යයක් සඳහා ඡන්ද ව්‍යාපාරයක් ගෙන ගියහ. නැගෙනහිර පළාතේ "ඊලාම් වාදය" වැපිරූ එක් කටහඬක් අයත් වූයේ එම්.එච්.එම්. රශ්රෆ්නම් නීතිවේදියෙකුටය. අමිර්තලිංගම් ඊලාමය ලබාගන්නා බව අෂ්රොෆ් එහිදී දිවුරා පොරොන්දු වූයේය.

එහෙත් එකී මැතිවරණයෙන් ආගමික මූලධර්මවාදී සිංහල විරෝධී මුස්ලිම් එක්සත් පෙරමුණ අන්ත පරාජයට පත්විය. ඔවුන් පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක්වුවද අෂ්රොෆ් දිගටම දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ සමග ගියේය. 1982 න් පසු සැලකිය යුතු තරම් මුස්ලිම් තරුණ පිරිසක් සිංහලයින්ට එරෙහිව දෙමළ ත්‍රස්තවාදය සංවිධාන සමග එක්වී "පිහාද්"ශුද්ධ යුද්ධය දියත් කර තිබුණෝය. දෙ.එ.වි.පෙ. දියවී යෑමත් සමග සමග 1986 සිට අෂ්රොෆ් වැඩිවැඩිටයන් මුස්ලිම් ආගම් වාදය අවුස්වන්නට වූයේය. එහි අනසාන ප්‍රතිඵලය ලෙස දැන් ඔහු මුස්ලිම්වරුන් වෙනුවෙන් වෙනම රාජ්‍යයක් හෙවත් "කලිස්ථානයක්" ඉල්ලීමේ යෝජනාව කරා ගමන් කර ඇත්තේය. සිය දෙමළ ජාතිවාදය ගජමිතුරන් මෙන් ඔහු දැන් ඉතිහාසයෙන් පටන්ගෙන ඇත. එනම් ඉතිහාසය විකෘති කිරීමය. ඒ අනුව අම්පාර දිස්ත්‍රික්කයේ වසර දහස් ගණනක සිට පැවත එන අනන්‍ය මුස්ලිම් නිජභූමිය යැයි පෙන්වාදීම සඳහා ශ්‍රී ලංකා රජය අරමුදල් වලින්ම මුස්ලිම් ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් කෘති පෙළක් නිකුත්කර ඇත. ඒ අනුව ඊනියා අග්නිදිග මුස්ලිම් කලිස්ථානය ඔවුන් විසින් ඉදිරිපත් කර ඇත්තේ මෙසේය.

ශ්‍රී ලංකාවේ ජල හා ගොඩබිම් සම්පත් ඇතුළු ආර්ථික පහසුකම් ව්‍යාප්ත වූ බිම් පෙදෙසක් අයත් කරගෙන අග්නිදිග මුස්ලිම්වරු වාසය කරති. ඔවුන් එහි බහුතරය ජනතාව වන අතරම වෙනම අනන්‍යතාවයකින් ද යුක්තය. කුමන පරිසරයක කුමන තත්වයක වුව තමනගේ උරුමය නිජභූමිය අත්හැරීමට අකමැති **"භූමිපුත්‍රයන්"** ලෙස එහි වාසය කරති.

"අග්නිදිග අම්පාර දිස්ත්‍රික්තය දෙමළ හෝ සිංහල හෝ ජනතාව සමග ඇලීම එකට යාකිරීම කළ නොහැකිය."

නැගෙනහිර වෙරළ සමග අරාබිවරු ඇතිකරගත් සබඳතා "ටොලොමිගේ" සටහන් වල දැකිය හැක. පානම, තිරුක්කෝවිල්, කොමාරි, කරෙයිතිවු, කල්ලාරු, කල්මුණේ, මඩකලපුව ආදී වරාය ගැන අරාබිවරුන් විසින් "ටොලොමිට"දෙන ලද තොරතුරු වලින් ඒවා සටහන් විය. ඉතා පැරණි යුගයේ සිටම අරාබි මුතුන් මිත්තෝ නැගෙනහිර සමග සබඳතා පැවැත්වූහ.

7 වන ශතවර්ෂයේ මුලාරම්භයේ අරාබි රටේ ඉස්ලාම් ධර්මය බිහිවූ කාල පරිච්ඡේදයේ ලංකාවේද ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත වූ බවට සාධක ඇත.

මඩකලපුව හා අග්නිදිග වෙරළබඩ තීරය සහමුලින්ම පාලනය කළ බව කිවහැකිය. කිසිම සිංහල - දෙමළ රජෙක් සිටියේ නැත.

ක්‍රි.ව. 1160 දී පරාක්‍රමබාහු රජතුමා අග්නිදිග ප්‍රදේශය සම්පූර්ණයෙන් නොසලකා හැරී අතර සිංහලයෝ එය අත්හැර ගියහ. මෙලෙස අඳුරු වූ ප්‍රදේශය ජනාවාස කර ඒකාලෝක කළේ මුස්ලිම් වරුන්ය. කවරෙකු කුමක් කීවත් 13 වන ශතවර්ශයේදී මේ ප්‍රදේශ වල මුස්ලිම්වරු ගොවියන් ලෙස ජීවත් වූ බවට සාක්‍ෂ්‍ය ඇත්තේය.

මෙලෙස අග්නිදිග ප්‍රදේශය තම ඓතිහාසික නිජභූමිය යැයි පෙන්වාදීමට මුස්ලිම් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම්වරුන්ගේ ඓතිහාසික මෙහෙවර හා උරුමය (කතෘ එම්.එස්.එම්. අනිස්) නමින් කෘතියක් නිකුත්කර ඇත.

මෙමගින් ව්‍යාජ ඉතිහාසයක් නිර්මාණය වෙමින් ඇත. එමගින් වසර 1500කට එපිට සිට (ඒවන විට ලෝකයේ ඉස්ලාම් ආගම බිහිවී වත් නැත.) මුස්ලිම් වරු නැගෙනහිර ජීවත් වූ බවත් ඔවුන් එහි භූමි පුත්‍රයන් බවත් ප්‍රකාශ කර ඇත. අම්පාර දිස්ත්‍රික්කය සඳහා ඒ මුළු කෘතිය පුරාම 'මුස්ලිම් ප්‍රාන්තය' යන්න භාවිත කර ඇත. මෙය කෙලින්ම මොහිර් රහුමාන්ගේ මුස්ලිම් එක්සත් විමුක්ති පෙරමුණ 'කලිස්තනෙය' ලෙස නම් කර තිබේ. රජයේ අරමුදල් වලින්ම මෙලෙස අග්නිදිග මුස්ලිම් වෙනම රාජ්‍ය සඳහා ඉතිහාසය ගොඩනංවාගෙන යනු ලැබේ. (මේ කෘතියේ මුල් පිටපත ජනාධිපතිට පිළිගන්වනු ලැබීය)

මුස්ලිම් වරුන්ගේ සැබෑ ඉතිහාසය කුමක්ද ? අරාබින් සිංහල රට සමග ගනුදෙනු කළ නමුත් එවකට අරාබියෙන් සැලකිය යුතු ප්‍රදේශයක් බෞද්ධයන් විය. 7 වන සියවසේ සිට මහමද් බිහිවීමෙන් පසු ඉස්ලාමය ආක්‍රමණික ලෙස 12 වන සියවස දක්වා පැතිර ගියේය. උතුරු ඉන්දියාවේ ඔබ්බට එය පැතිර ගියේ නැත. එය උතුරු ඉන්දියාවේ හා අග්නිදිග ආසියාවේ පැතිර ගියේ බෞද්ධ රාජ්‍යයන් යටපත් කරලමිනි. ශ්‍රී ලංකාවට මුස්ලිම් වරුන් පැමිණියේ 14 වන හා 15 වන

සියවස් වල සංක්‍රමණික වෙළෙන්දන් ලෙසය. පෘතුගීසීන් විසින් 1526 දී මුස්ලිම් වෙළෙන්දන් වෙරළබඩින් පිටුවහල් කළ අතර 1626 දී කොන්ස්ටන්ටයින් ඩී සා විසින් මුස්ලිම් වරු සහමුලින්ම පාහේ පළවාහරින ලදී. එවිට මුස්ලිම් වරු කන්ද උඩරට සෙනරත් රජු හමුවූ අතර රජු ඔවුන්ට 1602 - 35 අතරදී අම්පාර ප්‍රදේශයේ පදිංචිකර වූයේය. එහිදී පරම්පරා දෙකක් තුළ සිංහලයන් වීමට පොරොන්දුවක් ද විය. තවත් මුස්ලිම් වරු පිරිසක් මාලදිවයිනට පලාගොස් එහි තිබූ සිංහල රාජ්‍යයන් අත්පත් කරගත් අතර කිසි කලෙක සිංහල රජුට වූ පොරොන්දුව ගරු නොකළහ.

මුස්ලිම් වරුන්ගේ සැබෑ ස්වරූපය පෙනුණේ 1817 සිංහලයින් නැගෙනහිර හා රුහුණු ප්‍රදේශය පුරා ඉංග්‍රීසි විරෝධී දේශප්‍රේමී කැරැල්ලක් ඇති කළ විටය. බ්‍රිතාන්‍යයන් කැරැල්ල මර්ධනය සඳහා හාජි නෙයින මරික්කාර් යොදා ගත් අතර සිංහලයින් සමූහ ඝාතනයෙන් පසු මුස්ලිම් වරුන්ව නැගෙනහිර සිට කන්ද උඩරට දක්වා පදිංචි කරන ලදී. ඉංග්‍රීසින්ගේ බෙදා වෙන්කර පාලනය යටතේ දෙමළ අසලට වරප්‍රසාද ලැබුණේ මුස්ලිම් වරුන්ටය.

ඊජිප්තුවෙන් පිටුවහල් කරන ලද අරාබියකු වූ සිද්ධි ලෙබ්බේ විසින් වහාබි ඉස්ලාම් ව්‍යාපාරයට සමාන්තරව මුස්ලිම් පිබිදීමක් ඇති කළේය. එයින් සිදුවූයේ මුස්ලිම් ප්‍රභූවරු පාරිස දෙශපාලන ලෙස ශක්තිමත් විමත් මුස්ලිම් වරු වෙනම සිතන්නට හුරු වීමත් පමණය.

1880 ගණන්වල සිට තමන්ට වෙනම නියෝජනයක් අවශ්‍ය බව මුස්ලිම් ප්‍රභූවරු හඬ නගන්නට වූ අතර 1889 දී ඒ සඳහා මර්හුම් අබ්දුල් රහුමාන් පත්විය. රහුමාන් ඉන්දියානුවෙකු වන අතර පසුව ඒ සඳහා කුප්පිය තම්බි මහමුද් පත්කරන ලදී. ඉන්පසු මුස්ලිම් වරු අතර මැලේ - මුවර් භේදය ආරම්භ වූ අතර සුළුතරය වූ මැලේ වරුන්ට වැඩි වරප්‍රසාදය ලැබෙතැයි මුවර්වරු චෝදනා කළහ. මෙය මාකර් හා ටී.බී. ජයා මුලදී දැඩි බෞද්ධ විරෝධියෙකු විය.

ප්‍රථම මුස්ලිම් ජාතිවාදී සංවිධාන 1927 දී පිහිටුවනු ලැබූ අතර 1931 මැතිවරණයේදී මාකන් මාකර් මඩකලපුවේන් ජය ලබා මණ්ත්‍රණ සභාවට ඇතුළු විය.

ශ්‍රී ලංකා රාජ්‍ය අත්පත් කර ගැනීම තමන්ගේ කුමන්ත්‍රණයට මුස්ලිම් වරු ඈඳා ගැනීමට දෙමළ ප්‍රභූවරුන් ගත් උත්සහය ව්‍යර්ථ වූයේ මාකන් මාකර් මහතා මෙසේ ප්‍රකාශ කළ හෙයිනි.

සුළු ජාතින් වන අපි සම නියෝජනයක් නොඉල්ලුමු. අපට අවශ්‍ය නිසි නියෝජනයකි. මේ රට සිංහලයන් පාලනය කරනවාට අපගේ අකැමැත්තක් නැත.

( ETHNIC POLITICS IN COLONIAL SRI LANKA - N.Wickamasingha - 1995) මාකන් මහතා නොසිටින්නට බෙදුම්වාදය ආරම්භ වීමට නියමිත වූයේ 30 දශකය තුළදීමය.

පසුව එම්.එස්. හමීඩ් විසින් වෙල්වනායගම්ගේ බෙදුම් වාදය නැගෙනහිර බෙදුම් වාදය නැගෙනහිර මුස්ලිම් ජනයාට කාවැද්දීමට උත්සහ කළ නමුත් (1956 න් පසු) සාර්ථක නොවීය. පසුව වෙල්වනාගම්ගේ ගෝලයකු වූ එම්.එස්. කාරියප්පර් ද 1960 දී සමස්ත ලංකා ඉස්ලාමීය එක්සත් පෙරමුණ බිහිකළේය. පසුව බදුරුද්දීන් මහමුද් විසින් "පිහාද්" නම් පෙරමුණක්ද ආරම්භ කළේය. අවසානයේදී 1976 දී දෙමළ එක්සත් විමුක්ති පෙරමුණට සමාන්තරව මුස්ලිම් එක්සත් විමුක්ති පෙරමුණ ෆලීල් ඒ. මජීඩ් හා ඒ.එම්. ෂම්සුදීන් විසින් බිහිකළෝය. හය දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ හා 1977 දී එක්වූ අතර අෂ්රොෆ් එහි ප්‍රමුක නායකයෙකු විය. 1986 දී ඔහු මුස්ලිම් කොංග්‍රසය පිහිටුවිය. එතැන් පටන් එම්.එච්.එම්. අෂ්රොෆ් ඉතා ශූර ලෙස එජාපයත්-ශ්‍රීලනිපයත්-කොටි සංවිධානයත්, දෙමළ එක්සත් විමුක්ති පෙරමුණත්, ඉන්දියාවත්, අරාබියත් අතර සිය "ඉස්ලාම්"ගනුදෙනුව සිදු කරගෙන ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස එ.ජා.ප. යට හා ශ්‍රී.නි.ප. යත් තිබූ මුස්ලිම් ජනයා අන්තවාදයකට කොටුකර ගනිමින් සිටී. ඔහුගේ ඊළඟ ඉලක්කය අග්නිදිග මුස්ලිම් ප්‍රාන්තයයි.

මේ අනුව මාකන්මාකර්, ටී.බී. ජයා, රසික් ෆරීඩ්, කාරියප්පර් හෝ ෂමුසුදීන්ට කළ නොහැකි වූ හෝ ඔවුන් කිරීමට අකමැති වූ මුස්ලිම් බෝම්බයේ සේව නූලට අෂ්රෝෆ් ගිනි තබා ඇත. අමිර්තලිංගම් මෙන්ම ඔහුද එහි අවසානය කුමක් දැයි නොදන්නා බව පෙනේ. කෙසේ වෙතත් දැනටමත් මුස්ලිම් ජාතිවාදී මතවාදයක් හා දේශපාලනයක් ගොඩනැගී ඇති තත්වය තුළ එයට යුධ පෙරමුණක් ද බොහෝවිට එක්වීම විය හැකක්කි. මෝහීර් රහුමාන්ගේ මුස්ලිම් එක්සත් විමුක්ති පෙරමුණ එවැන්නක කළලයයි. එවැනි දෙයක් සිදුවුවහොත් හේතු ගණනක් නිසා එය ශ්‍රී ලංකාව අනතුරේ හෙළීමට තරම් බලවේගයක් බවට පත්වනු ඇත.

පළමුවැන්න නම් ජාතිකයන්ගේ සාමූහික බැඳීම ආගමික ස්වරූපයක් ගැනීමය. ( ඒ නිසාම එය ජාතිකත්වයක් ලෙස හැඳින්විය හැකි ද යන ප්‍රශ්නය ඇත.) එම ආගමික ඉස්ලාමීය, යුදෙව්, ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගම් තුනේම පදනම එකක් වුවත් ඉස්ලාමීය ආගමික නායකත්වය හා ගිහිනායකත්වය දෙකක් නොව එකක් වේ. එමෙන්ම ඉස්ලාම් දහමට අනුව අල්ලාහ් නොහඳුන ඕනෑම කපිරයෙකුට එරෙහිව ශුද්ධ යුද්ධයක් හෙවත් පිහාද් ප්‍රකාශ කිරීමට ඉස්ලාමීය ෂරියාහ් නීතිය අනුව හැකියාව ඇත.

අෂ්රොෆ්පවා තම මුස්ලිම් කොංග්‍රස් ව්‍යවස්ථාවට තමන් අල්ලාගේ බලයත් ආගමික නායකයා යන්න ඇතුල් කරගෙන ඇති අතර "පිහාද්"සංකල්පයද විටින් විට ඔහු පසුපස සිට හොල්මන් කරන බව ද පෙනීයයි.

දෙවන වැදගත් හේතුව නම් ශ්‍රී ලංකාවේ වැඩිම වේගයකින් වැඩෙන ජන කොටස මුස්ලිම් වරු වීමය. ශ්‍රී ලංකාවේ සමස්ථ ජනගහණ වර්ධන වේගය 1 -1.1% අතර පවතිද්දී මුස්ලිම් වරු අතර එය 4- 4.5% ක් තරම් ඉහළ අගයක් ගන්නා බව නියදි පරීක්ෂා පෙන්වාදෙයි. ලබාල වියෙන් විවාහ වෙන නිසාත්, උපත් පාලනය, ඉස්ලාම් නීතියට පටහැනි නිසාත් වැඩිම සඵලතාවයක් ඇත්තේද මුස්ලිම් කාන්තාවන් අතරය. විශේෂයෙන් 1981 න් පසු මේ ප්‍රවණතාවය වේගවත් වී තිබේ. ඒ අනුව සෑම වසර 15-18 ක් කාලයකදී මුස්ලිම් ජනගහනය දෙගුණ වන අතර ඊළඟ සියවස තුළ එය 32-64 ගුණයකින් පමණ ඉහළ යයි. ( එය මේ සියවසේ දී 8 ගුණයකින් ඉහළ ගොස් ඇත.) මේ අනුව ඊළඟ සියවසේදී චිත්‍රය මෙසේය. එනම් 1994 දී 13 ලක්ෂයක් පමණ වූ මේ ජනගහනය වසර සියයකින් ලක්ෂ 400-600 අතර සංඛ්‍යාවකට හෙවත් ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 55% විමේ තතවයක් ඇත. වයස 16-24 අතර තරුණ ප්‍රතිශතයද 24% ක මට්ටමක ඇති නිසා පුපුරායන තරම් ජනගහණ වර්ධනයක් එය තුළ ඇත. 1980 න් පසු මුස්ලිම් වරු ශ්‍රී ලංකාවේ ජන සංයුතිය බරපතල ලෙස විකෘතිකර ඇති අතර ජනගහනය හා සීමිත ඉඩම් හා සම්පත් පිළිබඳව ගැටළුව නිසා අෂ්රොෆ් ගේ භූමි පුත්‍ර නිජභූමි සංකල්පය ඉදිරියේ දී වඩාත් වේගයෙන් ඉදිරිපත් වීමට ඉඩ ඇත. මුළු මුස්ලිම් ජනගහනයෙන් 30% ක් (15%) බැගින් ජිවත්වන අම්පාර හා කොළඹ දිස්ත්‍රීක්වල ද තවද 10% ක් පමණවාසය කරන මහනුවර දිස්ත්‍රික්කය තුළ ද මෙය පිපිරීමක් වනු ඇත. (1994 නියැදි පරීක්ෂාවට අනුව කොළඹ දිස්ත්‍රික්කයේ ඉස්ලාම් ජනගහනය 2,22,614 ක් වේ. මහනුවර 1,60,196 ක් වේ.)

තෙවැනි වැදගත් කරුන නම් ලොව පුරා සිදුවන ඉස්ලාම් ව්‍යාප්තවාදයට අනුව පෙනීයන්නේ 1900 දී 12.4% ක් වූ ඉස්ලාම් ඇදහිල්ල 19.2% ක් ලෙස වසර 2000 දී සනිටුවහන් වන බවය. (බෞද්ධ ආගම 7.8% සිට 5.7% දක්වා ඇද වැටී ඇත. ඒ පමණක් නොව ආර්ථික බලයෙන්ද එය වැඩෙන බවය. චෙච්නියාවේදී හා බොස්නියාවේදී රුසියානුවන් හා සර්බිවරුන් ලත් යුද පරාජයන් පිටුපස ඇෆ්ගන්ස්ථානයෙන් හා ලොව පුරා රටවල් ගිය ඉස්ලාම් ස්වේච්ඡා සටන් කළාකරුවන් බලපා ඇති බව දැන් හෙළිදරවූ වී තිබේ. ලෝක තෙල් වෙළදාම පමණක් නොව ආසියාවේ මත්ද්‍රව්‍ය හා අවි ජාවාරම් ද කරන්නෝ බවට ඉස්ලාමීය මූලධර්ම වාදීහු පත්ව

සිටිති. මේ අනුව ශ්‍රී ලංකාවේ ගැටුමටද මුදල්, අවි හා මිනිසුන්ද එවීමට ඉස්ලාමීය සහෝදර වරුන් ඉදිරිපත්වුවහොත් එය පුදුමයක් නොවේ. කලක් මුස්ලිම් කොංග්‍රසයේ නායකයින් ලෙස සිටි සේගු ඉසදීන්, ඔස්මාන් අබ්දුල් රසූල් ආදීන් විසින් කර ඇති හෙළිදරව් වලට අනුව සෞදි අරාබිය, ලිබියාව, ඉරානය, ඉරාකය, ඇෆ්ගනිස්ථානය හා පකිස්ථානයද එහි ඔත්තු සේවාව වන අයි.එස්.අයි. ද මුස්ලිම් කොංග්‍රසයට මුදල්, අවි හා ජාත්‍යන්තර සබඳතා ලබාදී තිබේ. ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රාන්තයක් වුවහොත් ඉක්මණින්ම එය ආදර්ශමත් මුස්ලිම් රාජ්‍යයක් කිරීමට ආයෝජනය සිදුවන බව පැහැදිලිය. එය ඉන්දියාවේ පමණක් නොව චීනයේ ස්පාඤද්ඤයේ හා එක්සත් ජනපදයේ ද වෙනම මුස්ලිම් ප්‍රාන්ත පිහිටුවීම සඳහා වන උද්ඝෝෂණයට සේවනූල වනු ඇත.

සිව්වැනි හේතුව නම් ශ්‍රී ලංකාවේ තුච්ඡ දේශපාලනයයි. එජාපය හා ශ්‍රීලනිපය වරින් වර බලය සඳහා මුස්ලිම් ජාතිවාදය යොදාගනිමින් සිටිති. අෂ්රොෆ් වෙනුවෙන් එජාපය තම ජ්‍යේෂ්ඨ මුස්ලිම් නායකයන්ව (මොහොමඩ්, මන්සූර්, හමීඩ්) පවාදෙන අතර ශ්‍රීපනිපය ද තම මුස්ලිම් ජාතිවාදීන්ට සිත්සේ ආගමික ස්ථාන සිය උම්මත්තක දේශපාලන කටයුතු වලට යොදාගැනීමට ඉඩදී ඇත. නැගෙනහිර මුස්ලිම් ජනයා පල්ලිවල වෙඩි තබා ඝතනය කළේ දෙමළ කොටි ත්‍රස්තවාදීන් වුවත් ඔවුන් සියළු දෙනා සටන් වදින්නේ සිංහල ජනවර්ගයාට එරෙහිවය.1999 ජුනි 18 දා කොළඹදී පැවැත්වීමට නියමිත තිබූ දෙමළ ජාතිවාදී සංවිධානය විසින් කැඳවූ සිංහල විරෝධී හර්තාලයට මුස්ලිම් මූලධර්මවාදීන් එක්ව සිටි බව පැහැදිලිය. මුස්ලිම් ජනයා තුළ සිටින ජාතිවාදීන් හා මූලධර්මවාදී අන්තවාදීන් දැන්ම පරාජය නොකළහොත්, සහනශිලී ලෙස ජීවත් වීමට කැමති මුස්ලිම් ජනයාගේ නායකයන් ස්ථාවර නොකළහොත්, සහනශිලී ලෙස ජීවත් වීමට කැමති මුස්ලිම් ජනයාගේ නායකයන් ස්ථාවර නොකළහොත් ශ්‍රී ලංකාවට ද තලේබාන් ඔටු ත්‍රස්තවාදයට අනාගතයේදී මුහුණදීමට සිදුවනු ඇත.

# මඩපාට කොටි

දෙමළ ජනතාවගේ ආදරණීය දරුවන් දකුණු ආණ්ඩුව විසින් චෝදනා විරහිතව රඳවාගෙන වද බන්දන දෙමින් සිටිති. කොටි පැටවුන් ලෙස අසාධාරණ ලෙස සිරකරගෙන සිටින දෙමල ජනයාගේ දරුවන් ඇත්තෙන්ම අහිංසක මුවපොවුවන්ය. දිවි පරදුවට තබා තම නිර්දෝශීභාවය වෙනුවෙන් මැරෙනතෙක් උපවාසය කිරීමට තීන්දුකර ඇති ඒ අහිංසකයින් ගලවාගැනීම අපේ පරම යුතුකමය. ඒ සඳහා මම කැපවෙන්නෙමි.

මෙලෙස ප්‍රකාශ කළේ අන් කිසිවකු නොව යාපනය දිස්ත්‍රික්කයේ "වැඩිම පාර්ලිමේන්තු ආසන"ගණනක් හිමිව සිටින ඊ.පී.ඩී.පී. නායක ඩග්ලස් දේවානන්දය. මේ ප්‍රකාශයෙන් දින කිහිපයකට පසු උපවාසය කරන අහිංසක දෙමළ මුවපොවුවන් බැලීමට විශාල මාධ්‍ය ප්‍රසිද්ධියක් සහිතව කළුතර බන්දනාගාරයට ගිය දෙමළ ජනතා නියෝජිත ඩග්ලස් දේවානන්දව "මුවපොවුවන් ගේ" දත් පහරින් ලත් තුවාල සමග පොරබදද්දී ඔහුගේ කිට්ටුවරයෙකු වූ රමේෂ් විසින් පළකරන "තිනමුරසු"පුවත්පත් දේවානන්දට පහරදීම පිළිබඳව සිංහල ආණ්ඩුවට දෝෂාරෝපනය කළේය.

වව්නියාවේ සිය අණසක පතුරුවාගෙන සිටින ප්ලොට් සංවිධානයේ යුදනායක මනික්කදසන් යාපනය නගරසභා මැතිවරණයේදී නගරාධිපති තනතුර සඳහා තරඟකළේය. ඉන්පසු ඔහු දෙමළ ජනයාගේ මානව හිමිකම් ගැන ඉහළින් කථාකරන්නට විය. "වෙම්මනි"හි ඇතැයි කියන සමූහ මිනිවලවල් ගොඩගැනීමට දෙමළ ජනයාගේ උතුම් මිනිස් නිදහසේ නාමයෙන් තමා කටයුතු කරනබව මණික්කදසන් යාපනයේදී මාධ්‍යවලට ප්‍රකාශ කළේය. දින කිහිපයකට පසු වාර්තාවූයේ මණික්කදසන්ට අයිති වදකාගාරයක අපාදුක් විදිමින් සිටි දෙමළ තරුණයකු සිය ජීවත් වීමේ අයිතිය ඉල්ලා වව්නියාවේ කතොලික පියනමක් ලඟදනින් වැටීම පිළිබද' ශෝක ජනක පුවතය. ප්ලොට් සාමාජිකයින් විසින් පල්ලිය වටකරණු ලැබූ අතර තරුණයා කියා සිටියේ ප්ලොට් මිනීමරුවන්ට බාරදීමට වඩා තමන් ශ්‍රී ලංකා ආරක්ෂක අංශ වෙතට බාරදෙන ලෙසය. පසුව වව්නියාවේ පවත්වාගෙන යන ප්ලොට් වධකාගාර 14ක් පිළිබඳව ජත්‍යන්තර මෙන්ම දේශිය මානව හිමිකම් සංවිධාන කථාකරන්නට වූ විට හෙළිරවූ වූයේ ප්ලොට් නායකයා

ලෙස පෙනී සිටින සිද්ධාර්ථයන් පවා තමන්ගේ ජීවිතයට "දසන්" ගෙන් එල්ලවන තර්ජන වලටබියේන් ජීවත් වන බවය. 1999 පෙබරවාරි 25 ද යාපනය නගර මධ්‍යයේ තිබී කඳ නැති මිනිස් හිසක් හමු වූ අතරඑහි කඳ කොටස් බසුව ප්ලොට් සංවිධානයට අයත් කාර්‍යාලයක වැසිකිලි වලේ තිබී හමුවීය. කෝපයට පත් දෙමළ ජනයා ප්ලොට් කාර්යාලය ගිනි තබා විනාශ කළේය.

දෙමළ ජනයාගේ ප්‍රශ්න වලට වහා විසඳුමක් ගෙස සටන්විරාමයක් හා කොටි සංවිධානය සමග කොන්දේසි විරහිත සාකච්ඡාවක් අවශ්‍ය බව ඊ.පී.ආර්.එල්.එෆ්.නායක සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් ප්‍රකාශකළේ වරක් දෙවරක් නොවේ. ඔහුගේ තර්ජනාංගුලියට විටින් විට ශ්‍රී ලංකා ආණ්ඩුවත් ආරක්ෂක හමුදාත් ලක්වෙයි. එහෙත් ඔවුන්ගේ සංවිධානය ට අනුයුක්ත කල්ලි වන "මොහාන් කල්ලිය"හා "රසික් කල්ලිය" වැලි ඇටයේ සිට අම්පාර හා මඩකළපු ජනතාවගෙන් කප්පම් ගන්නා බවත් ඒ ප්‍රදේශවල දෙමළ ජනජීවිතය බෙහෙවින් දුෂකර වී ඇත්තේ ඊ.පී.ආර්.එල්.එෆ්. කප්පම් කල්ලිනිසා බවත් ප්‍රේමචන්ද්‍රන් ලොවට නොකියයි. වඩාත් වැදගත් කරුණානම් මහා සිංහල ආණ්ඩු විරෝධියකු ලෙස දහස් ගණනින් වැටුප් ලබන්නෙකු වන බවය. රසික් කල්ලි නායකයා මරා දමනු ලැබූ විට හෙළිදරවු වූයේ එකී සියළු සන්නද්ධ කල්ලිවලට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් වැටුප් ගෙවූ බවය.

දෙමළ එක්සත් විමුක්ති පෙරමුණේ දෙබඩි ජීවිතයට ඔවුන් බොහෝ සේ වන්දි ගෙවුවද ඔවුන්ගේ වංචනික දේශපාලනය බිඳකුදු අඩුවී නැත. දෙ.එ.වි.පෙ. නායක අප්පාපිල්ලේ අමිර්තලිංගම් හා තම සැමියා වූ වෙට්ටිවේලු යෝගේස්වරන් යන දෙදනාවම ඔවුන් සමග සුහද කථාවක නියැලී සිටි කොටි සාමාජිකයකු වන "විෂූ" විසින් 1989.07.13 දින මරාදමනු සරෝජනී යොගේස්වරන් ඇස් පනාපිට දුටුවාය. එහෙක් ඇය යාපන පුරපතිනිය වූ විට දිගටම "තම්බි" (ප්‍රභාකරන්) ගේ ගණ ගියනා කිරීමටද පසුබට නොවූවාය. ඇය පරිහරණය කරමින් යාපනයේ සිවිල් පාලනය කොටි සංවිධානය අතට පත්වෙමින් තිබෙන බව පවා එක් අවස්ථාවකදී පෙනී ගියේය. එහෙත් ඇය මරා දැමීම සඳහා වූ කොටි තීන්දුව වෙනස් කිරීමට ඒ කිසිවක් සමත් නොවීය.අවසානයේ ඇයට සාමදනයේ සැතපීමට,ඇය දශක තුනක් සටන් කළ ඊනියා දෙමළ නිජ භූමියේ රියන් හරක් වත් ඉතුරු නොවීය. ඇය මිහිදන් වූයේ කොළඹය.මිය යෑමට දිනකට පෙර පොන්නයියා සිවපාලන් යාපනය නලරාධිපතිවරයා කීවේ ද කොටින්ගෙන් තමන්ට තර්ජනයක් නැති බවත් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදවලින් දෙමළ ජනයාට හිරිහැරයක් සිදුවන බවත්ය. අන්තිමේදී ජාත්‍යන්තර මට්ටමේ චරිතයක් වූ නීලන් තිරුවෙල්වම්ව ඝාතනය කළ අතර කොටින් වචනයක්වත් විවේචනය නොකිරීමට ඔහු බොහෝ

වෙහෙස ගත් අයෙකි. යෝගේෂ්වරන්, සිවපාලන් හෝ ත්‍රිකුණාමල දිස්ත්‍රික් මන්ත්‍රී තංගදෙරෙයි. දෙමළ සංවිධානයක් අඩු තරමින් දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ පවා වචනයක්වත් ඒ පිළිබඳ ප්‍රකාශ නොකළේය. ජෝසප් පරරාජසිංහම් වැනි දෙ.එ.වි.පෙ. සමහර නායකයෝ කෙලින්ම කොටි සංවිධානයේ ප්‍රකාශයන් වන තරම් දුරදිග ගොස් ඇත්තේ මේ සියල්ල තුලය. 1999 ජුලි මස සිට කොටි යළිත් වරක් මේ සියළු සංවිධාන තහනම් කළේය. ඒ ගැන කථාකළ මානව සංවිධානයන්ද නොවීය.

හිටපු ඊනියා සටන් කාමී සංවිධාන වන ප්ලොට් , ඊ.පී.ආර්.එල්.එෆ්., ඊ.පී.ඩී.පී., ටෙලෝ ආදී සංවිධානද දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ පිළිබඳවද යථාර්ථය දැන්වත් ශ්‍රී ලංකික සමාජය තේරුම් ගත යුතුය. මොවුන් පිළිබඳව, මොවුන් හා සෙසු දෙමළ ජාතිවාදී වපුරා ඇති මායාවන් තේරුම් ගත යුතුය. කොටි ත්‍රස්තවාදයේ ඌනපුරකයක් ලෙස ක්‍රියාකරන මේ මඩපාට කොටි රැළ මර්ධනය කිරීමට සාමකාමී ශ්‍රී ලංකාවක අත්‍යවශ්‍ය කොන්දේසියක් වෙයි.

මොවුන් පිළිබඳ මායාවන් එකින් එක හදුනා ගත යුතු වෙයි. පළමු මායාව නම් "දෙමළ ජනතාව" හා "කොටි ත්‍රස්තවාදය" කියා දෙයක් ඇති බවත් එමෙන්ම කොටි ත්‍රස්තවාදය දෙමළ ජනයා දෙන සහයෝගය නතර කිරීමට නම් දෙමළ දුක්ගැන්විලි හෝ දෙමළ ජනයා දෙන අභිලිෂයන් ඉටුකළ යුතු බවත්ය. එහිදී කොටි ත්‍රස්තවාදීන් නොවන ඉහත කී මඩපාට කොටිරැළගේ දේශපාලනය අභිලාෂයන් ඉටුකළ යුතු බවද් තර්කයෙන් කියැවේ.

කොටි සංවිධනය හා දෙමළ ජනතාව අතර සම්බන්දය මාළුවා හා ජලය අතර සම්බන්ධය මෙන් යැයි ප්‍රකාශ කරන්නෝද වෙති. එහෙත් සත්‍යනම් මුලතිව් වල ජීවත් වන දෙමළ ජනයා විසින් ආහාර හා සැපයම් ලබාදීම නිසා කොටි සංවිධානය පවතිනවා නොව එකී ජනයා ජීවත් වන්නේද කොටි අරමුදල් වලින් බවය. කොටි හා සාමාන්‍ය දෙමළ ජනයා වෙන් වී බොහෝ කල් ගතවී ඇති අතර කොටින්ට ඊනියා දෙමළ ජන සහය නැතිව සිය ත්‍රස්තවාදය තව බොහෝ කල් ගෙනයා හැකි මුදල් උපයන, අවි සපයන, ප්‍රචාරය ලබාදෙන තමන්ගේම වූ ජාලයක් තිබේ. සාමාන්‍ය දෙමළ ජනයාට ආහාර, වාසස්ථාන, රැකියා හා සාමකාමී ජීවිතයකට වඩා වැඩි ඊනියා දෙමළ දුක්ගැන්විලි හෝ දෙමළ අභිලාෂයන් නැත. ඒ දුෂ්ඨ විනාශ කාරී මතවාද සියල්ල දෙමළ ජනයා මත බලයෙන් පැටවුයේ දෙමළ ප්‍රභූ පන්තිය විසිනි. ඊනියා හිටපු සටන් කාමී කල්ලි විසිනි. එහෙත් "දෙමළ ජනතාව" නම් වචනයකට මුවාවී තමන්ගේ දේශපාලන අභිලාෂය මුදුන්පත් කරගැනීමට දඟලන මේ දුෂ්ඨ බලවේග නොපැකිල මර්ධනය කළ යුතු වේ. කොටින් ගෙන් මුද ගත්

ජනතාව මඩපාට කොටින්ට භාරදීමෙන් ත්‍රස්තවාදය හා ව්‍යසන නතර නොවන බව 1986 දී පිහිටුවන ඊ.පී.ආර්.එල්.එෆ්. , පළාත් සභාවද, 1997 දී පිහිටුවන ලද යාපනයේ ප්‍රාදේශීය හා නගරසභාද ලේ වලින් ඔප්පු කර ඇත.

දෙවැනි ව්‍යාජ්‍ය නම් ප්ලොට්, ඊ.පී.ආර්.එල්.එෆ්, ටෙලෝ ආදී හිටපු ත්‍රස්ත කල්ලි ප්‍රජාතන්ත්‍රවාදයට ආවේ පළාත් සභා නම් දේශපාලන විසඳුම නිසා බවට වූ මතයයි. විසඳුමක් නොලැබුනහොත් තමන් යළිත් කැළෑවට යන බව මේ සංවිධාන වල නායකයෝ ඉඳහිට මාධ්‍ය හරහා තර්ජනාංගුලි නිකුත් කරති. මෙහි සත්‍ය කුමක්ද?

ටෙලෝ සංවිධානයේ හිටපු නායකයන් වන කුට්ටමනී හා ජේගන් ඔවුන් වැලිකඩ සිරගෙදරදී (1983 ජුලි 25) ඝාතනය කරන විට පවා ශ්‍රී ලංකා ආණ්ඩුව සමග එකඟතා ගණනාවක් ඇතිකරගෙන තිබුණි. ඔවුන්ගේ මරණවලින් පසු ශ්‍රී සභාරත්නම් විසින් ටෙලෝ සංවිධානය තනිකරම ඉන්දීය ඔත්තුසේවයේ කිහිලි කරුවක් කරනු ලැබූ අතර 1986 මැයි 07 වනද ඔහු ඇතුළු ටෙලෝ සිමාජිකයින් 350 ක් පමණ කොටි සාමාජිකයින් ශ්‍රී ලංකා ආරක්ෂක හමුද කඳවුරුවලට රැකවරණය පතා පැමිණි අතර ඉන්පසු අද දක්වා ඔවුන් ජිවිත් වන්නේ එහිය.

ප්ලොට් සංවිධානය එක් අතකින් එක් අතකින් ඉන්දීය ආණ්ඩුව සමග මෙන්ම අනෙක් අතින් ශ්‍රී ලංකා ආණ්ඩුව සමග දිගටම ගනු දෙනු කළේය. ප්ලොට් සංවිධානයට ශ්‍රී ලංකා ආණ්ඩුව පඩිගෙවන්නට පටන්ගෙන ඇත්තේ 1984 තරම් දුර කාලයක සිටය 1986 දෙසැම්බර් මස ප්ලොට් සංවිධානය කොටි විසින් තහනම් කරනු ලැබූ අතර ඉන්පසු ඔවුන් සහමුලින්ම පාහේ යැපුනේ ශ්‍රී ලංකා ආණ්ඩුවෙනි.

ඊ.පී.ආර්.එල්.එෆ් සංවිධානය තනිකරම පාහේ ඉන්දීය ඔත්තුසේවා වල නිර්මාණයකි. 1986 දෙසැම්බර් 14 ද ඊ.පී.ආර්.එල්.එෆ් සංවිධානය කොටි විසින් තහනම් කර ඔවුන් ශ්‍රී ලංකා ගිවිසුමෙන් විසු ඔවුන් ඉන්දීය හමුද වලට මාරු වී ගියහ. වර්ධරාජා පෙරුමාල් ඊලාම් ප්‍රකාශ කිරීමෙන් පසු ඔවුන් ඉන්දියාවට ගොස් සිටි අතර 1994 අගෝස්තු මස පොදුපෙරමුණ බලයට පැමිණීමෙන් ඔවුන් ඔවුන්ගේ වාමාංශික මිතුරන්ගේ ආධාරයෙන් ආණ්ඩුවේ තනතුරු ගණනාවක් හිමිකරගෙන ඇත. සමහරුන් මාධ්‍යවේදීන් හා බුද්ධිමතුන් ලෙස සාර්ථක ලෙස වෙස්වලා ගෙන ඇත. යෝගරාජා යෝගචන්ද්‍රන් හෙවත් එස්තමනොරංජන්, රාම් මානික්කලිංගම්, ජෝ සෙනවිරත්න ආදීන් එහිදී කැපීපෙනේ. ආණ්ඩුවේ සාම තවලම වල ප්‍රධාන සාම ප්‍රකාශයන් වී ඇත්තේ රට බෙදීම සඳහා ඇතිවන තුරු ලේ වැගිරූ මෙවැනි "මහත්වරු" පිරිසකි. ඔවුන්ගේ සමහර පිරිස් නැගෙනහිරදී කෙලන්ම ආරක්ෂක හමුද සමග සිටිති. කොළඹදී ආරක්ෂක හමුදවලින් කඩවන දෙමළ ජනයාගේ

මානව හිමිකම් ගැන කථාකරති.

ඊ.ඩී.පී. සංවිධානය තනිකරම පාහේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ නිර්මාණයකි. ඩග්ලස් දේවානන්දට කුලී හේවායකුගේ සිට සම්භාව්‍ය මහජන නියොජිතයකු දක්වා වූ වෙස්මාරුව සිදුකර දුන්නේ ශ්‍රී ලංකා ආණ්ඩුවයි. අදද ඔහුට ශ්‍රී ලංකා ජනතාවගේ අරමුදල් වලින් පඩිගෙවනු ලැබේ.

මේ අනුව පෙනී යන්නේ මේ ඊනියා හිටපු සටන්කාමී සංවිධාන සියල්ලම පාහේ "ප්‍රජාතන්ත්‍රවාදයට" පැමිණ ඇත්තේ කොටි ඔවුන්ව විනාශ කරලීමෙන් පසු මිස නොව "හිතහොඳකම" නිසා නොවන බවය. එමෙන්ම ඔවුන් අද දින පවතින්නේ දෙමළ ජන සහායක් නිසා නොව ශ්‍රී ලංකා ආණ්ඩුවේ මූල්‍ය, අවි ආයුධ හා දේශපාලන රැකවරණය නිසා බවද පැහැදිලිය. අද අවි දරා මිනී මරණ, කප්පම් ගන්නා, බියවැද්දීම කරනා මොවුන් කිසිදිනක සාමකාමී ප්‍රජාතන්ත්‍රවාදය නොපිවිසි බවද එමෙන්ම පැහැදිලිය. මොවුන් තවදුරටත් ජනතාවගේ අරමුදල් වලින් නඩත්තු කිරීමක් සිදුවන්නේ,

1. කිසිකලෙක දෙමළ ජනයා උතුම් ජාතිවාදයෙන් මිදීම වැලකීයෑමය.
2. කොටි විරෝධී සාබෑ සාමය අගයන දෙමළ ජන කණ්ඩායම් වලට ඉදිරියට ඒමට නොහැකි වීමය.
3 මොවුන්ගේ කප්පම්, වධක ක්‍රියා, බලහත්කාරය නිසා දෙමළ ජන ජීවිතය තවතවත් අවුල් වී ඒ මිනිසුන්ගේ කලකිරීම වැඩිවීමය.
4 කිසිම දෙමළ ජනපදනමක් නැති මේ චෞර කුලී මිනීමරු කල්ලි ආරක්ෂක හමුද මෙහෙයුම් වලට ගවා ගැනීමෙන් යුද රහස් මිලට ගැනීමට කොටින්ට හැකියාව ලැබීමය. කොටින්ට යුද රහස්, ඉන්ධන හා තොරතුරු මොවුන් ලබාදෙන බවට සාධාරණ සැකයක් දැන් මතුවී ඇත. 1999 ජූලි වලදී කොටින්ගේ නියෝගයට අනුව මේ සංවිධානවලට අයත් 79 දෙනකු හමුද කඳවුරු වලින් කොටි කඳවුරු වලට මැරුවී ගියහ. මේ සමග කඳවරුවල යුධරහස් ද කොටින් අතට පත්වීය.
5 මොවුන්ගේ රැකවලා ලෙස ආරක්ෂක හමුද දෙමළ ජනයා ඉදිරියේ පෙනී සිටීමෙන් සිදුවන්නේ ශ්‍රී ලංකා හමුදවග කිර්තිනාමය තවතවත් විනාශවීමය.

ඊනියා මධ්‍යස්ථවාදින් ලෙස ක්‍රියා කරන දෙ.ඒ.වි.පෙ. "නඩත්තු" කිරීමෙන් හා ඔවුන්ගේ දේශපාලන අභිලාෂයන් එකින් එක ඉටුකිරීමෙන් සිදුවන්නේද දෙමළ ජාතිවාදය ශක්තිමත් වීම හා ශ්‍රී ලංකාවේ සාමය තවතවත් කල්යෑමය. දෙ.එ.වි.පෙ. අද තමතමන්ගේම වූ දේශපාලනයක් නැති අතර එය කොටි සංවිධානයේ

දේශපාලන හා උද්ඝෝෂණ පෙරමුණේ අංගයක් බවට වැඩි වැඩියෙන් පත්වී සිටී.

මොවුන් පතුරවන මිථ්‍යා මතවාදයක් නම් කොටි සංවිධානය යුදමය ලෙස විනාශ වුවුද දෙමළ ප්‍රශ්නයක් තිබෙන නිසා කවද හෝ යලිත් කොටි සංවිධානය වැනි යුද බලවේගයක් ගොඩනැගෙන බවය. මෙහි සත්‍ය නම් "දෙමළ ප්‍රශ්නය" දෙමළ ජාතිවාදීන්ගේ මැවීමක් නිසා එය විනාශ කළ විට යළිත් ගොඩනැගෙන බවය. විජයබාහු රජු චෝල අධිරාජ්‍ය පරාජය කළවිට එය යළිත් බිහිනොවීය. එළෙසම ප්‍රභාකරන් ඇතුළු කොටි වනසා දැමූ විට දෙමළ ජාතිවාදය යළිත් බිහිවන්නේ නැත.

මොවුන් පිළිබඳ ඊලඟ මිථ්‍යා මතය නම් මොවුන්ට පහරදුන් විට මොවුන් වැඩිවැඩියෙන් කොටින්ට තුරුළු වන බවය. ඒ නිසා ඔවුන් අනුවයන දෙමළ ජනයා ද කොටින්ට තවතවත් හේත්තු වන බවය. එමගින් කොටි ශක්තිමත් වන බවය.

පළමුව කිවයුත්තේ මොවුන්ගෙන් සමහරුන් එනම් චන්ද්‍රහසන් ,පරරාජසිංහම්, කුමාර්පොන්නම්බලම් වැන්නවූවන් දැනටම සෘජුව කොටින්ට හේත්තු වී ඇතිබවය. අනෙක් අයට කොටින්ට හේත්තු වීමට වුවමනාවක් තිබුණද එසේ කිරීමට සාධාරණ මරණ බියක් ද ඇති බව දේවානන්ද , යොගේෂ්වරන්, සිවපාලන්, තිරුචේල්වම් සිද්ධි පෙන්වා දෙයි. අනෙක් අතින් මොවුන් පිටුපස පෙළගැසී සිටින දෙමළ ජනතාවද සීමාකාරීය. මේ දේශපාලනය මරාදමා බොහෝ කල්ය. මොවුන්ට වඩා හොඳින් සාමාන්‍ය දෙමළ ජනයා පෙළගැස්වීමට අවශ්‍ය නම් ශ්‍රී ලංකා ආරක්ෂක අංශ වලට හැකිය. ඒ සඳහා අවශ්‍ය සාමාන්‍ය දෙමළ ජනයා කවදකවත් නොයිල්ලූ පෙඩරල් ව්‍යවස්ථා සංශෝධනය නොවේ. ආහාර, වස්ත්‍ර, රැකවරණය, ප්‍රජාතන්ත්‍රවාදය හා ස්වයං දේශපාලන අභිමානය , බියෙන් මිරිකී කුලවාදයෙන් ඔද්දල් වී සිටින පසුගාමී දෙමළ සමාජයට ලබාදීමය. දිනාගැනීමට දෙමළ ජනතාවක් නැත. එහෙත් මුල සිට ප්‍රජාතන්ත්‍රවාදී, ජාතිවාදී නොවන දෙමළ සමාජයක් ගොඩනැගීම අත්‍යවශ්‍යවේ. ඒ සඳහා කොටි පෙන්වමින්, දෙමළ ජනයාට මුවාවී තමන්ගේ පටිටු දේශපාලනය අභිලාෂය ඉටුකර ගැනීමට මාන බලන දේවානන්ද, මානික්කදසන්, ප්‍රේමචන්ද්‍රන්, සිවසිත්තම්පරම් පරරාජසිංහම් වැනි මඩපාට කොටි සහමුලින්ම මර්ධනය කරලීම අත්‍යවශ්‍යවේ.

දෙමළ ජාතිවාදයේ හා ත්‍රස්තවාදයේ කිහිලිකරු ලෙස ක්‍රියා කරන තවත් මඩපාටකොටි රංචු කිහිපයක් දකුණේ වාසය කරති. මොවුන්ගෙන් ප්‍රමුඛ කල්ලිය වන්නේ දකුණේ මාක්ස්වාදී පක්ෂයන්ය. ලංකා සමසමාජ පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, නව සමසමාජ පක්ෂය ආදී සියළු

පක්ෂ දෙමළ ජනයාගේ ඊනියා ස්වයං තීරණ අයිතිය එක් අයුරකින් හෝ තවත් අයුරකින් පිළිගනිති. එනම් ශ්‍රී ලංකා රජයෙන් වෙන්වී වෙනම රාජ්‍යයක් බිහිකරලීමට දෙමළ ජනයාට අයිතියත් ඇති බව ප්‍රතිපත්තිය ලෙස පිළිතනිති. ල.ස.ස.ප.,ජ.වි.පෙ., ශ්‍රී ල.කො.ප. හා න.ස.ස.ප. යන පක්ෂ තනිකරම පවතින යුද ගැටුම් දෙමළ ජන ඝාතක යුද්ධය ලෙස නම් කරති. යුද්ධය නවතා වහාම කොටි සමග සාකච්ඡා කරන ලෙස ඉල්ලා සිටිති. මේ පක්ෂ වල සමහර විදේශගත කල්ලි විදේශ වලදී කොටි සමග එක්වී ශ්‍රී ලංකා රජයට එරෙහිව පවා ප්‍රචාරය කරති. එක්ව පෙළ පාලි යති. කොටි මේ සිංහල නම් ඇති ද්‍රෝහි රැල්ලෙන් සමහරුන්ට විදේශ චාරිකා ලබාදී සිංහල කටවල් වලින්ම "දෙමළ ප්‍රශ්නය" ලොවට ප්‍රකාශ කරති. එමගින් තමන්ගේ ලේ තැවුරුණු ත්‍රස්තවාදයට සුදුපිරුවට පොරවා ගනිති. මේ පක්ෂ සියල්ලම පසුගිය දශක දෙක තුළ ශ්‍රී ලංකාවේ ලේ වැගිරීම් වලට සෘජුවම සම්බන්ධය. සමහරුන්ගේ පක්ෂවලින් ඇමතිකම් දී ඇත්තේ ශ්‍රී ලංකා රජය දෙකඩ කිරීමට දෙමළ ජාතිවාදීන් හා කුමන්ත්‍රණය කිරීමට සම්බන්ධව රාජ්‍යද්‍රෝහී චෝදනා යටතේ නඩු පවරා වැදකරුවන් වූ අයටය. සමහර පක්ෂ වල මහලේකම් වරු ශ්‍රී ලංකා ආරක්ෂක හමුද කඳවුරුවලට පහර දීමට සම්බන්ධ අයය. මෙලෙස ඉස්මුරුත්තාව සෑදෙන තෙක් මලමිනී ගිලදමා ඇති මේ ඇවිදින නර රකුසන් රැළ කථාකරන්නේ සාමය ගැනය. සමානාත්මතාව ගැනය. දෙමළ අසාධාරණත්වය ගැනය. ජාතික ගැටලුව ගැනය. කොටි ත්‍රස්තවාදය මර්ධනය කරන අතරම මේ රටේ දී හා විදේශවලදී ඔවුන්ගෙන් කිහිළිකරුවක් ලෙස ක්‍රියා කරන මේ මාක්ස්වාදී ල.ස.ස.ප., ජ.වි.පෙ., ශ්‍රී.ලං.කො.ප., හා න.ස.ස.ප. ජාතිද්‍රෝහී රැළ පරාජය කිරීටද අද අවශ්‍ය වී තිබේ.

මඩපාට කොටි රැලේ ඊළඟ කල්ලිය නම් මේ රටේ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන ජාලයයි. ඇලර්ට් සංවිධානය, මර්ජ් සංවිධානය, සාම මන්ත්‍රණ සභාව, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා මේ වාට අනුයුක්ත තවත් දේශපාලන එන්.පී.ඕ. දෙසීයකට අධික ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වෙති. මේ සියල්ලටම පාහේ පොදු ලක්ෂණය නම් මේවාට මූල්‍ය ආධාර ලැබෙන්නේ බටහිර ආගමික මුලධර්ම වාදී රටවලින් වීමත් එකම් පාරිසක් විවිධ නම් වලින් යුත් මේ සංවිධානමෙහෙය වීමත්ය. මෙයින් අතිශය සුළු පිරිසක් ඉහළ තලයේ සිට එන්ජීඕ මාෆියාවක් ලෙස ක්‍රියාකරන අතර සෙසු පිරිස ඔවුන්ගේ ප්‍රවේණි දසයන් වෙති. මොවුන්ගේ අවසාන අරමුණ ඊළම පිහිටුවීම හෝ ද්‍රවිඩස්ථානයක් පිහිටුවීමද නොවේ. එය හඳුනා ගත යුත්තේ ලොවම සිය යුදමය, මතවාදමය, දේශපාලනමය, ආර්ථිකමය ආධිපත්‍යයට යටත් කර ගැනීම සඳහා බටහිර ලොකයේ 15වැනි සියවසේ සිට ගෙනගිය සංග්‍රාමයේ අංගයක් ලෙසය. කොටි ත්‍රස්තවාදය ඔවුන් යොදගන්නේ දකුණු ආසියාව යටත් කර ගැනීම පිණිසය. මුස්ලිම් වරුන්ගේ

අරාබි ලෝකය නැටවීමට ඊශ්‍රාලය යොදා ගන්නාක් මෙන් දකුණු ආසියාව එනම් ශ්‍රී ලංකාව හා මහා භාරතය නැටවීමට ද්‍රවිඩස්ථානය යොදාගැනීමට මෙවුන් කටයුතු කරති.

මොවුන්ගේ සමහර ආයතන කෙලින්ම යුද අවි ජාවාරමට සම්බන්ධය. උදාහරණයක් ලෙස බ්‍රිතාන්‍ය රතුකුරුසය අවි පැක්ටේරි පවත්වාගෙන යන බව හෙළිදරව්‍ව කළේ බී.බී.සී. සේවමය. මොවුන්ගෙන් තවත් ආයතන කෙලින්ම ආගම් ව්‍යාප්ත කරති. අනාථ වූ දුක්ඛිත මිනිසුන් අතරේ අරමුදල් වැපිරීමෙන් අප්‍රිකාවේ ආගම් වැනසූ ආකාරයෙන් දැන් ශ්‍රී ලංකාවේ ද වන්නියේ හා නැගෙනහිර ද, කොළඹද,මේ බලවේග සිය ව්‍යාප්තිය දියත් කරමින් සිටිති. තවත් අය සුභසාධන වල නියැලෙති. ආහාර සහනාධාර ලබාදෙති. මානව අයිතීන් ගැන කථාකරති. නඩුහබ වලට උදවු කරති. එමගින් එහි සාමාන්‍ය ජනයා අතර වැදගත් නමක් හිමිකර ගනිති. සෝමාලියාවට හා රුවන්ඩාවට විදේශ මැදිහත් වීමක් ඉල්ලා සිටියේ කෙයාර් හා ඔක්ස්පෑම් යන සුභසාධන ආයතන දෙක බව සිහිකර ගැනීම මෙහිදී වටී. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව ජාත්‍යන්තරයට ගෙනයන්නේ "මර්ජ්"ආයතනය හා එයට අනුබද්ධ අය විසින් බව ද එමෙන්ම සිහිකළ යුතුය. මොවුන්ගෙන් තව අය මාධ්‍ය වලට අරක්ගෙන මාධ්‍යවේදින් කුලියට ගෙන තමන්ගේ මතවාද හීන් සීරුවේ ජනතාවට දමති. ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය හා පුවත්පත් දෙස බලන විට මොවුන් කෙතරම් ඒකාධිකාරියක් උසුළයි ද යන්න පැහැදිලිය.

ආණ්ඩුවේ මාධ්‍ය මෙන්ම ආණ්ඩුවට එරෙහි මාධ්‍ය ද, ඇතම් මාධ්‍යවේදින් ද සිටින්නේ මොවුන්ගේ මුදල්, විදේශ චාරිකා, මත්පැන් හා ලිංගික දෙළපිදේනි විසින් අත්අඩංගුවට ගැනීමෙනි. මොවුන් කෙතරම් නින්දිත ලෙස ශ්‍රී ලංකාවේ මාධ්‍ය සදාචාරය විදේශ වලට විකුණන්නේද යන්න ලූෂන් රාජකරුණානායකට නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට එල්ල කළ මුදල් වංචා චෝදනා වලින් ම පෙනී යයි. ලූෂන් රාජකරුණානායකට ප්‍රතිචාර ලෙස මර්ජ් ආයතනය විසින් සැකකටයුතු ලෙස මැතිවර්ණ නිරීක්ෂණයට ලබාගත් අරමුදල් පිළිබඳව හෙළිදරව්වක් කළේය. ඒ දසවසරකට පෙර සොරාකා එක්දහස් එක්වැනි වර විරසක විමේ ප්‍රතිඵලයයි. 1987 - 89 භීෂණ සමයේ ජීවිත 1200 ක් විනාශ කිරීමට වගකිවයුතු "ප්‍රා" නම් මිනී මරු සංවිධානයේ ක්‍රියාකරුවකු වන සරත් සිල්වා නැමැත්තා කර ඇති ප්‍රසිද්ධ ප්‍රකාශයට අනුව එකී මිනීමරුම් වලට මර්ජ් සංවිධානයද දේවසරණය ද සම්බන්ධය. ජාත්‍යන්තර විහිලුව වනුයේ එකී සංවිධාන වලට සම්බන්ධ වූ ශ්‍රී ලංකාවේ කිසිදු ජනපදනමක් නැති එක්තරා "ප්‍රභූ ස්ත්‍රියකට" ජාත්‍යන්තර සාම ත්‍යාගයක් හිමිවීමය. ඝාතන චෝදනා එල්ලවී ඇති තවත් අය බුදුවරුමෙන් දැන් සාම ධර්මය දේශනා කරමින් සිටිති. ශ්‍රී ලංකාවේ කිසිදුංනපදනමක් නැතිව

අරමුදල් වල බලයෙන් වැංඹෙන මේ ජාත්‍යන්තර චෞරයන් රැල වැලැක්වීමට හෙළිදරවූ කිරීමට දැන්වත් ශ්‍රී ලංකික සමාජය ඉදිරිපත් විය යුතුය.

මොවුන්ගෙන් තවත් අය පර්යේසණ මට්ටමේ වැඩිකරගෙන යති. දෙවැනි ලෝක සංග්‍රාමයේ යුද අපරාධ කරුවන් විසින් පවත්වාගෙන යන පින්ලන්තයේ වයිඩර් ආයතනය වැනි ආයතන හරහා ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රජාව සිය ධනය ඉදිරියේ අල්ලේ නැටවීමත් එමගින් ඉතිහාසය මෙන්ම සදචාරයද තමන්ට අවශ්‍ය ලෙස විකෘති කර ගැනීමටත් මොවුන ක්‍රියා කරති. මෙය ශ්‍රී ලංකාවේ දී අතිශය සාර්ථක වී තිබේ. අද බටහිර මූලධර්මවාදින්ගේ දර්ශනික ප්‍රකාශයන් වී සිටින්නේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල වල (විශේෂයෙන් කොළඹ හා පේරාදෙනිය ) ආචාර්ය, මහාචාර්ය වරුය. මොවුන්ගෙන් තවත් සමහරෙක් කළාකරුවන් බිලීබාගැනීමට යෙදෙති. තමන්ට අවශ්‍ය ගෙස කළාකරුවන්ද යොදගනිති. කළා විචාරය කරති.

මොවුන්ගෙන් සමහරෙක් කෙලින්ම දේශපාලන පක්ෂ විනිවිද යති. ඒවා තුළ තමන්ගේම වූ "ට්‍රෝජන්" අශ්වයන් නිර්මාණය කර ගනිති. හොඳම උදරරණය නම් "ඇලර්ට්" සංවිධානය විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා විදේශ වලදී පවත්වන්නට යෙදුනු දේශපාලන පන්තිය. මේවාට එජාපයෙන් මහින්ද සමරසිංහ, සරත් අමුණුගම කරුණාසේන කොඩිතුවක්කු වැනි අයද ශ්‍රීලනිපයෙන් ඩලස් අලහප්පෙරුම , ඩිලාන් පෙරේරා වැනි අයද ජ.වි.පෙන් නිහාල් ගලප්පත්ති ද සහභාගිවිය. ඇලර්ට් සංවිධානයේ හිටපු සංවිධායක කුමාර් රූපසිංහට සිරලියෝන් රජය පෙරලා දැමීමට කුමන්ත්‍රණය කළ බවට චෝදනා එල්ල වූ අතර නොර්වේ රට කොටි සංවිධානයට සිදුකරන දේශපාලන උපකාර හෙළිදරව් කිරීම නිසා පෙඩ්රිකා ජෑන්ස්ව එම සංවිධානයෙන් නෙරපන ලදී. අද ආණ්ඩුවේ මෙන්ම විපක්ෂයේද උපදේශකත්වයන් වී සිටින්නේ මේ රාජ්‍ය නොවන සංවිධාන වල බළල් අඬුය. දැන් ඔවුන් ව්‍යාපාරික ප්‍රජාව නියෝජනය කරන වාණිජ මණ්ඩලය වැනි ආයතනද, රාජ්‍ය නිලධාරීන්ද, ශ්‍රී ලංකා යුදහමුදවේ සමහර නිලධාරීන්ද තම "කොටි අඬු" බවට පත් කරගෙන සිටිති. නිත්‍යානුකූල ලෙසත්, දේශපාලනික ලෙසත්, ආයතනික ලෙසත් එන්ජීඕ මාෆියාවේ ක්‍රියාකාරීත්වය මර්ධනය නොකළහොත් ඉදිරි දශකයේ දී මේ ද්‍රෝහි රැළ ශ්‍රී ලංකාව කොටි සංවිධානයට බිලිදෙනවා නියතය. එන්ජීඕ මාෆියාව මර්ධනය කිරීමට ගත හැකි නීතිමය පියවර බොහෝය. පළමුව මොවුන්ට ලැබෙන අරමුදල් පිළිබඳව පාර්ලිමේන්තුවට වගකියන ක්‍රමයක් ඇතිකළ යුතුයි. දෙවනුව මූල්‍ය වංචා සිදුකරන අයට දඬුවම් ලබාදිය යුතුය. රාජ්‍ය ආරක්ෂක කටයුතු විදේශ ප්‍රතිපත්තිය, රාජ්‍ය උපදේශක කටයුතු ආදී කිසිවකට එන්ජීඕ මාෆියාවට අයත් පුද්ගලයින් සම්බන්ධ වීම නීති

විරෝධි කළ යුතුය. විෂේශයෙන් විශ්ව විද්‍යාල ප්‍රජාව සිය ප්‍රචාරක කටයුතු සඳහා යොදගැනීමට එන්ජීඕ මාෆියාවට ඉඩදිය යුතු නැත.

සියළුම දේශපාලන පක්ෂ ද තම පක්ෂ තුළ සිටිනා එන්ජීඕ මාෆියාවේ ක්‍රියාකාරීන් හඳුනාගෙන ඔවුන් බවත් කිරීමට කටයුතු කළ යුතුය. ඒ සඳහා ජනතාව පක්ෂ වලට බල කළ යුතුය.

සුබසාධන ව්‍යාපාර සඳහා බටහිර මූලධර්මවාදී ආයතන වලින් සිදුකරන මැදිහත් වීම් පාලනය කිරීමට රජය මැදිහත් විය යුතුය. එමෙන්ම විදේශාධාර ලබන සෘජු ආගමික ප්‍රචාරක කල්ලි සහමුලින්ම නීති විරෝධී කළ යුතුය.

මේ ලෙස රජය හා සාමාන්‍ය ජනතාව මැදිහත් වී රාජ්‍ය නොවන සංවිධානවල දේශපාලන කාර්යභාරය උදුරා නොගතහොත් වැඩිකල් නොගොස් මේ රටේ පාලකයින් බවට පත්වනු ඇත්තේ එන්ජීඕ මාෆියාව බව සිහිකට යුතුය. මොවුන් මර්ධනය කිරීම සඳහා හොඳම ආදර්ශයක් ආසියාතික රටවල් වන ඉන්දියානුවන් චීනයේන් හා මැලේසියාවෙන් ලබාගත හැක.







කළුගල බාලදක්ෂයා බාල
ශිෂ්‍යයෙකු වූ සිංහල දරුවෙක් නිදි
පැළඳුම ඝාතකයන් දෙමළ
දෙවන ත්‍රස්ත ඝාතක මිනිමරුවන්
සමරන් පත් කළේය



කොළඹ සිංහල සංහාරය



යාපනය බලා ආපසු......
රිවිරැස මෙහෙයුම අවස්ථාවේදී වන්නියට පළවාහරිනු
ලැබූ යාපනවාසීන් යළි දහස් ගණනින් යාපනයට පැමිණියේ
දෙමළ ජාතිවාදයේ අසත්‍ය ප්‍රචාර විනාශ කරමින්



උන්ගේ
දරුවන්ට
සැලවිලි ගී
හා
අපේ දරුවන්ට
මරං ගී

දෙමළ ජාතිවාදයේ
ළමා අයිතිවාසිකම්
විකෘතිය



ප්‍රභාකරන්ගේ මිනීමරු ළමා හමුදාව විසින් ඝාතනය කළ සිංහල දරුවන්
දෙදෙනෙක් මිහිදන් වීමට මොහොතකට පෙර




දෙමළ ත්‍රස්තවාදය කොළඹ ගිලගැනීම. කොටින්ගේ
තුන්වෙනි යුධ පෙරමුණ දැන් කොළඹ විවෘත වී ඇත.



වැලපීම හැර වෙන් මගක් පාතියට නැද්ද?



දෙමළ නිජබිම සඳහා උතුරේ හා නැගෙනහිර සිංහල සමූල ඝාතනය.




කොටුවේ හින්දු කෝවිල විරාටමානව
කොළඹයින් හින්දුන් වනයන බවට වූ දෙමළ ජාතිවාදයේ උලුප්ම
“හින්දූන්ට” බොරුව කොළඹ කෝවිල් සංකීර්ණ වලින් ඔප්පුවේ.




( 1987-89 – උතුරට පවතාන් භාණ්ඩ යුධ කිරීමට ගොස් දකුණ ගිනිගැනීමට දකුණ අමතක කර තිබිදු භාණ්ඩයක් දැකගෙන ගොනාව



ඌරැල්ල තඹලගමුව මූතූර් ත්‍රිකුණාමලයේ සිංහල ගම් සංහාරය සිදුවීමෙන් පසු



බෝධි මණ්ඩලයෙන් වෙඩි
ශුද්ධස්ථානය ද ලෙයින් නෑව




අරන්තලාවේදී සාමණේරයන්ගේ මිය ගිය සිරුරු පසු



කොටි වලිගය අල්ලාගත් රජිව් ඔවුන් විසින්ම ඝාතනයෙන් පසු
රජිව්ගාන්ධි. රණසිංහ ප්‍රේමදාස. ගාමිණි දිසානායක
ආදි දේශපාලකයින් මියගියේ ඔවුන් කොටි සමග
සාකච්ඡා කරමින් සිටින අතරතුරේදීමය.


මතක තබාගමු
සමාව නොම දෙමු කිසිද





යුධ සෙබළුන් ද මිනිසුන් බව දෙමළ ෆාසිවාදීන් තගත යුතුය
ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා සහ කොටි සංවිධානය අවිගත් දෙපිරිසක් ලෙස සමාන කළ නොහැක.
එකක් නීත්‍යානුකූල රජයකට වගකියන ප්‍රජාතන්ත්‍රවාදීව පාලනය කළහැකි හමුදාවකි. අනෙක
තමන්ටත් වගනොකියන උමතු ත්‍රස්තවාදී කල්ලියකි

# කොටි වැනසීම හැර අන් මගක් නැත

අපි දැන් දෙමළ ජාතිවාදී කොටි ත්‍රස්තවාදය කුමක්දැයි මදක් විපරම් කර දැනගනිමු. උදෑසන සුදෝසුදින් හැඳ බුදුරැස් දකින්නට ශ්‍රී මහා බොධියට, ශ්‍රී දළදවට ගිය උවැසි උවැසියන් කෑලි ඉරාදමනු අපි දුටුවෙමු. පිරිත් පැන් ඉසමින් ලොවට ශාන්තිය දෙසූ මහ සඝ ගණ හිස් දෙබෑකර කීතු කීතු කරනු දුටුවෙමු. දෙසීය හැටක් ආසන්න උතුරු හා නැගෙනහිර පළාත් වල තිබූ පෞරාණික බෞද්ධ සිද්ධස්ථාන වනසනු, බෞද්ධ ප්‍රතිමා රෙදි අපුල්ලන ගල් බවට පත් කරනු, චෛත්‍ය බිඳ ඒවායින් වැසිකිළි තනනු අපි දුටුවෙමු. එහෙත් අපි බෞද්ධයින් මේ මහා බෞද්ධ සංහාරයට එරෙහිව කළේ කුමක් දැයි අපේ බෞද්ධ හදවතින් දැන්වත් අසාබැලිය යුතුය. දෙමළ සාමාජයේත්, ඉන්දියාවේත්, ලොව පුරාත් බෞද්ධයින් කෝටි 40කගේ අධ්‍යාත්මය කොටි මිනීමරුවන්ට එරෙහිව ධර්ම යුද්ධයකට අවධිකරලීම බෞද්ධ අපේ යුතුකම විය යුතුව තිබුණි. එහෙත් අපි එය මෙතෙක් මගහැරියෙමු. ඉතින් හෙට අපි එය නොකළහොත් එළාරට, කාලිංගමාඝට, අසවේදුට හෝ බුවන්රිග්ට කළ නොහැකි වූ බෞද්ධ රාජ්‍ය අවසන් කිරීම ප්‍රභාකරන් විසින් සිදුකරනු ඇත. ලෝකයේම බෞද්ධ රාජ්‍යය වීමට සියළු අතින් තීන්දු වී ඇති මේ පින්බිම වැනසීමට අපි ඉඩ දෙමු ද යන්න අපි අපේ හදවත් වලින් විමසා බැලිය යුත්තෙමු.

මේ රටේ ඉතිහාසය ගොඩනැගූයේ සිංහලයින් විසිනි. එය රාවනාගේ සිට විජයටත්, දේවානම් පියතිස්සගේ සිට දුටුගැමුණු ටත්, විජයබාහුගේ සිට පරාක්‍රමබාහු ටත්, කැප්පෙට්ටිපොළගේ සිට ධර්මපාලටත් වෙන්කළ නොහැකි ඉතිහාසයකි. එය ගලින්. රනින්, පන්හිඳෙන්, කටහඬින්, ලෙයින් සනිටුහන් කළ ඉතිහාසයකි. එය අනුන්ගේ දේශයක බිම් අඟලක්වත් ආක්‍රමණය නොකළද තමන්ගේ දේශයේ වැලිකැටයක් පවා අනුන්ට පවාදීමට එරෙහිවූ ආනුභාව සම්පන්න වීරයින්ගේ ඉතිහාසයකි. එහෙත් දෙමළ සමාජය තුළත්, මුළු ලොව පුරාමත් මේ ඉතිහාසය කීතු කීතු කර දමත්දී සිංහල අපි නිහඬව බලා සිටියෙමු. විකෘති ඉතිහාසයෙන් මත්වී දෙමළ ජාතිවාදී උම්මත්තකයෝ උතුර හා නැගෙනහිර පළාත්වල සිංහලයින් සංහාරය කර ඒවා ජනවාර්ගික පවිත්‍රකරණය කරත්දී අපි නිහඬව බලාසිටියෙමු. යාපනයේ අවසන් සිංහලයා ජීවත් වූයේ 1987 ඔක්තෝබර් 6 දා බව අමතක කළ අපි දේශපාලනයට වරද අපේ පිටම පටවාලන්නට ඉඩදුන්නේමු. කළු ජූලිය හා ඇසළ කළුවර ගැන අපි වාද විවාද කරමින් සිටින විට දෙමළ ජාතිවාදය උතුර හා නැගෙනහිර වැට පැන කොළඹ

හා මහනුවර තමන්ගේ කරගත්තේය. අපි නගර ගම් අත්හරිමින් වඩවඩා කොටුවෙමින් අපේ ඉතිහාසයත් සාරධර්මවලටත් නිගාදෙමින්, සියවස් තුනකට පෙර විදේශවලින් මෙරටට පැමිණි සිංහල විරෝධී පෙළපත් වලින් පැවත එන දේශපාලකයින්ට පක්ෂ ලෙස බෙදී අප වනසන්නට ඉඩ දෙමින් බලා සිටියෙමු. මිලේච්ඡත්වයේ දෑතට හසුව අප යටත් වන්නට යන බව අපට නොහැගෙන්නේ ඇයි? අකුරු කරන්නට පාසලට ගිය අපේ දරුවෝ ඔවුන් සිංහල වූ නිසාම මහපාර මැද ඉරාදමද්දී අපි නිසලව සිටියේ ඇයි? තම දරුවන්ගේ කුස පිරවීම සඳහා අඩකුසින්ම වැඩපොළට, කාර්යාලයට ගිය අපේ දෙමාපියන් බස්රියේදී, දුම්රියේදී හා කාර්යාලයේදී පුපුරවා හරින විට අපේ දෑස් විවෘත නොවූයේ ඇයි? රට බේරාගැනීමට සටන් බිමට පිවිසි අපේ දරුවන් උතුරේ බංකර තුළ මියැදී එහිම පොළවට පස්වෙද්දී ඔවුන්ගේ නෑසියන්ගේ අඳෝනා අපට නෑසුනේ ඇයි? අපි අපේ ජාතික අධ්‍යාත්මය අද අවධි නොකළ හොත් හෙට එය සහමුලින්ම මරාදමන බව අපි දැන්වත් අමතක නොකළ යුතුය.

1984 නොවැම්බර් මස කැකුලාව කලපුවේදී සිංහලයින් කතෝලිකයන් මරා ඔවුන්ගේ දුගී පල්ලිය ගිනිතබද්දී කතෝලික අපි නිහඬව ඒවා විඳරා ගත්තේ ඇයි? මඩකළපුවේදී චන්ද්‍රාප්‍රනාන්දු පියනම (1988.06.06) මරාදමද්දී පාසල් විවෘත කිරීමේ වරදට කතෝලික පූජක සොයුරන් ඝාතනයකරද්දී අපේ කතෝලික හදවත් සසල නොවූයේ ඇයි? 1985 දෙසැම්බර් 20 ද මඩුපල්ලියේ වන්දනාමාන වලට ගිය සිංහල කතෝලිකයන් හයදෙනකු මරා දමද්දී මඩුපල්ලිය වැනි අපේ පූජනීය වන්දනාස්ථාන කොටි සතුරාට බිලිදී අපි බලාසිටින්නේ ඇයි? මඩුපල්ලියේ දෙමළ අනාථයින් ගැන වැලපෙන අය කාලතුවක්කු ප්‍රහාර වලින් කැකුලාවේ සිංහල කතෝලිකයින් එළවා දමද්දී නිහඬව බලා සිටියේ ඇයි? අසරණ සිංහල දෙමළ කතෝලිකයන් අපි දුක් විඳිත්දී වන්නියේ ඉනිදියානු දෙමළ හින්දු ජනයා යුද ජනපද වල පදිංචි කිරීමට පල්ලිය සිය අරමුදල් කෝටි ගණන්වැය කළේ කෙසේ දැයි කතෝලික ප්‍රජාව අසා දැන ගත යුතුය. සියල්ලට පළමුව කතෝලික ක්‍රිස්තියාන් ප්‍රජාවතුළ එහි නිළ ආයතනය තුළ නොනිළ ආයතන තුඝ, අල්තිරයමත පවා බහුතර සිංහල විරෝධී , බෞද්ධ විරෝධී, දෙමළ ජාතිවාදී ගැති උතුම් කථා අපි පරාජය නොකරන්නේ ඇයි? කතෝලික- ක්‍රිස්තියානි ප්‍රජාව දෙමළ මිලේච්ඡත්වය පිළිබඳ අවධිකරලීම අපේ පරම දේව යුතුකම විය යුතුය. මේ රට, දකුණු ආසියානු කළාපය, අනාගත ලේ සයුර කරා දක්කාගෙන යන බටහිර ක්‍රිස්තියානී මූලධර්ම වාදීන් ගේ සැබෑ කුමන්ත්‍රණය නිරවුල් ලොවට හඬගා කීමට දේශප්‍රේමී මානව වාදී ක්‍රිස්තියානීන්ට දැන් කාලය එළඹී ඇත.

ඉස්ලාම් අදහන ජනතාවට කොටි ත්‍රස්තවාදියා කළ විනාශය අපට අමතක ද? කාත්තන්කුඩි ඝාතනය පමණක් ඉස්ලාමයට එරෙහිව සමූහ ඝාතනයක් නොවිනි

ද? අනෙක් අතින් මේ රටේ ඉස්ලාම්වරු වාසය කරන්නේ පැරණි සිංහල බෞද්ධ රජවරුන්ගේ කරුණාව අරාබි මුතුන්මිත්තන්ට ලැබුන නිසා නොවේද? එහෙයින් ඉස්ලාම් භක්තිකයන් දෙමළ කථාකළ පමණින් ඔවුන් දෙමළ ජාතිවාදයට ඇදගෙන යන්නට, සිංහල විරෝධි කරන්නට, කොටින්ගේ ගැත්තන් කරන්නට, ද්‍රෝහි මුස්ලිම් දේශපාලකයින්ට ඉඩදිය යුතුද? උතුම් ආගමික මත ප්‍රචාරය කරමින් සැමට පෙනෙන, ඇසෙන, දැනෙනලෙස ව්‍යාප්තවාදී වෙමින් මුස්ලිම් ප්‍රජාව විනාශය කරා දක්කාගෙන යෑමට තලෙයිබාන් වර්ගයේ මූලධර්ම වාදීන් අතලොස්සකට ඉඩදිය යුතුද? ඇෆ්ගනිස්ථානය හෝ පළස්තීනය ශ්‍රී ලංකාවට එරෙහි යුද්ධයට යොදාගැනීමට මුස්ලිම් ජනතාව ඉඩදිය යුතු නැත. කොටි විරෝධී ශුද්ධ යුද්ධයේ වැදගත් වැඩකොටසක් මුස්ලිම් වරුන්ට ද ඉටුකිරීමට ඇත.

ශ්‍රී ලංකිය දෙමළ සමාජයද දැන් හැරී බැලීම අගනේය. මේ රට උරුම දෙමළ මිනිසාටය.... යන දෙමළ ප්‍රභූ දෙඩවිල්ල රණාඝෝෂාවක් බවට පත්වෙමින් දෙමළ සමාජයට අත්පත් වූ සුගතිය කුමක්ද? සිංහල රාජ්‍යය අදහෙට කඩා වැටෙන බවට වූ වහසි බස් දශක හතරක් තිස්සේ අසා සිටියා නේද? තවත් දශක පහක් මේ රණාහඬ නැගුවද එයින් දෙමළ සමාජයට ලැබුනේ මොනවාද? යුද්ධය පෙන්වා විදේශගතවූවන්ට, යුද්ධය නිසා ඉහලින් වැජඹෙන කොටි නායකයන්ට, යුද්ධය පෙන්නා කොළඹ දේශපාලන සූදු කෙළින දෙමළ ප්‍රභූ කල්ලි වලට නොව හානිය සිදුව ඇත්තේ සාමාන්‍ය දෙමළ සමාජයට බව ඔවුන් අවබෝධ කරගත යුතුය. ප්‍රභාකරන්ගේ බිරිඳ මන්දිවාදීනී, පුතා චාල්ස් ඇන්තනී, දුව දේව්රා ස්විස්ටර්ලන්තයේ සුරසැප විඳිමින් කුමාර ජීවිත ගෙවන විට අහිංසක දෙමළ දැරියන් ප්‍රභාකරන්ගේ උමතු අණින් අනුනුත් මරා තමනුත් වැනසෙනවා නොවේද? වෙට්ටිවේලු යොගේස්වරන්, අප්පාපිල්ලේ අමිර්තලිංගම්, මුරුගේසු සිවසිත්තම්පලම් 1977 දී මාස තුනෙන් ලබාදෙන බවට පොරොන්දු වූ ඊළම වෙනුවට ලැබී ඇත්තේ ලේ හා කඳුළු පමණක් නොවේද යන්න දෙමළ සමාජය තම හෘද සාක්ෂියෙන් විමසා ගත යුතුය. ශ්‍රී ලංකාව සමග පමණක් නොව ඉන්දියාව සමගත් යුදවැදීම අරමුණු කරගත් ලෝක ද්‍රවිඩස්ථානය නම් සිහිනය වෙනුවෙන් තවත් කොපමණ වන්දියක් දෙමළ ජනයා ගෙවන්නට ද? කෲරලෙස ඉන්දියාව, බටහිර රටවල් හා ද්‍රෝහී දේශපාලනයන් දෙමළ මිනිසුන් සිය බල අරගලයේ ඉත්තන් ලෙස යොදාගැනීම ඔවුන් තේරුම් ගන්නේ කවදාද? වේගයෙන් පැතිර යන හින්දු මූලධර්ම වාදෙයෙන් සිදුවන්නේ දෙමළ වණය තවත් ඔද්දල්වීම පමණකි. ප්‍රභූවරුන්ට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීමට දෙමළ සමාජයට නොහැකි වූ පසුගාමීත්වය නිසා පොන්නම්බලම්ට, චෙල්වනායගම්ට හා ප්‍රභාකරන්ට යටත්වීමට එයට සිහි විය. දෙමළ-හින්දු ආගමික භූමි, ආගමික අදහස් හා ඇදහිලි ලෙයින් කිළිටි කරන්නට සිදුවිය. ලේ සාගරයේ ගිලියන්නට ප්‍රථම තම සමාජය ගිලගෙන ඇති ම්ලේච්ඡත්වය

පරාජය නොකළ හොත් දෙමළ සමාජයද එහිම මියයෑමට නියමිතව ඇත. හිට්ලර් හා පොල්පොට් පරාජය කිරීමට ජර්මන් හා ඛෙමර් ජනතාවට වගකීමක් තිබුණාසේ ප්‍රභාකරන්, පොට්ටුඅම්මාන්, කපිල් අම්මාන්, බල්රාජ්, කරුණා හා සොරනාම් ගේ විනාශය ලබාදීමට දෙමළ සමාජය දැන්වත් නිර්භීතව ඉදිරිපත් විය යුතුය. මෝහයෙන් අන්ධකර ඇති, අසත්‍යයෙන් වසා ඇති දෙමළ ඇස් හා හදවත් සත්‍යයට හා සම්‍යක්දෘෂ්ටියට විවෘත කරදීම සෑම ශ්‍රී ලාංකිකයෙකුගේම ප්‍රමුඛ වගකීමය. මළ දෙමළ සමාජයට යළිත් ජීවආත්මයන් ලබාදිය හැක්කේ කොටි පැරදවීමෙන් පමණක් බව සියළුදෙනා වටහාගත යුතු සත්‍යයයි.

ඉතින් තවදුරටත් දාර්ශනික සංවාද, දේශපාලන විවාද, ඇනකොටාගැනීම් වලට කාලය ඉතිරිව නැත. දෙමළ ජාතිවාදී ම්ලේච්ඡ ත්‍රස්තවාදයෙන් ලක්ෂ 180ක ජනතාවගේ ජීවිත, දේපොළ හා ආත්ම අභිමනෙය බේරාගත යුතුය. සෑම ජිවිතයක්ම එකහා සමාන ලෙස වටී. සෑම මරණයක්ම වේදනාබර ඛේදවාචයකි. එහෙත් විටෙක සාතිශය බහුතරයේ ජීවිත වෙනුවෙන්, සාතිශය බහුතරයකගේ මිනිස් අදහස්, ආත්ම අභිමානය හා ඉතිහාසයේ සත්‍ය වෙනුවෙන් මියයන්නට ඇතමෙකුට සිදුවේ. ඉතිහාසයේ දේශපාලකයින්ගේ කාලකන්නිකම් වලට දැන් අපටත් අලේ දරුවන්ටත් වන්දිගෙවීමට සිදුව තිබේ. දේපාළ හා ආත්ම අභිමානය විනාශවී යෑමට ඉඩදීමට සිදුව තිබේ.

වැදගත් වන්නේ ජිවිත විනාශය හෝ දේපොළ වැනසීම නොවේ. වැදගත් වන්නේ ඒ වන්දියෙන් ම්ලේච්ඡත්වය හා ජාතිවාදය පරාජය වි ඊනියා දෙමළ දුක්ගැන්විලි හා පසුව දෙමල අභිලාෂයන් සැපරීම සඳහා දිස්ත්‍රික් සභා, පළාත් සභා, කළාප සභා ආදී දේශපාලන දොලපාදේනි හා සාම සාකච්ඡා, සටන් විරාම ජාතිවාදී ම්ලේච්ඡයින්ට ලබාදීමය. එමගින් ජීවිත හා දේපොළ වැනසීම දෙගුණ තෙගුණ කරගැනීමය. අද අවශ්‍ය ජීවිත වැනසීම වැලැක්වීම සඳහා අඛන්ඩ යුද හා දේශපාලනික වැඩ පිළිවෙලකි. ඒ වෙනුවෙන් වන ජාතික කැපවීමකි.

දෙමළ ජාතිවාදී ඉතිහාස කරුවන් හා ප්‍රභූ දේශපාලකයින් මේ රටේ ඉතිහාසය පිළිබඳ කියා ඇත්තේ ගල් පැලෙන බොරු බව ඔප්පුවීඇත. ඉඩම්, රැකියා, අධ්‍යාපනය, ආරක්ෂාව හා ප්‍රමාණවත් දේශපාලන නියෝජනය පිළිබඳ ගැටළු වලදී දෙමළ ජනයාට අසාධාරණයක් නොව සිදුව ඇත්තේ වරදාන හා වරප්‍රසාදිත තත්වයක් ලැබීමට බව ඔප්පුවී හමාරය. ශ්‍රී ලංකා රාජ්‍යයන් කිසිවෙක්දෙමළ ජනයා පිටමං නොකළ අතර එසේ ස්වයංවම පිටමංවී ගියේ දෙමළ දේශපාලකයෝය. ඊළඟට ඔවුහු දෙමළ ජනයාව බලහත්කාරයෙන් තම මගට ඇද ගත්හ. ශ්‍රී ලංකා ආරක්ෂක අංශවල දෙමළ නියෝජනය අවම කළේ එහි

සේවය කළ දෙමළ නිලධාරීන් මරාදමමින් බියවද්දමින්. ද්‍රෝහී ඔත්තුකරුවන් ලෙස හංවඩු ගසමින් දෙමළ ජාතිවාදීන් ගෙනගිය ක්‍රියාමාර්ගයය. දෙමළ ඉතිහාසය හා දෙමළ දුක්ගැන්විලි පිළිබඳ මතය දැන් මේ රටේදී බිඳවැටී ඇත. (එහෙත් විදේශවල මෙය බිඳදැමිය යුතුව ඇත. ) ඒ නිසා දැන් ඔවුන් "දෙමළ අභිලාෂයන්" නම් අලුත් වදනක් සොයාගෙන ඇත. සියල්ලන්ට අභිලාෂයන් ඇත. මිනීමස් කැමට පවා අභිලාෂයන් තිබිය හැකිය. තනි පුද්ගලයකුට හෝ සමාජයකට තමන්ට උවමනා ලෙස අභිලාෂයන් සිතා ගත හැකි වුවත් ක්‍රියාත්මක කළ නොහැක. මන්ද පුතුන්ගේ මගේ ලෝකවලට මහපොළවේ ඉඩක් නැත. මේ නිසා එවැනි හිතුවක්කාර අභිලාෂවල අවසාන ප්‍රතිඵලය යුද්ධයයි. යුද ගැටුමෙන් දෙමළ ත්‍රස්තවාදය කවදා හෝ ජයගනිතියැයි සිතයි නම් එය උමතුවකි. ශ්‍රී ලංකා යුද හමුදාව පරාජය වීම හෝ පසුබැසීම යනු යුද්ධය ආරක්ෂක අංශ වෙතින් ගිලිහී උතුරා යෑමය. පාළනය කළ නොහැකි අපරාජික තත්වයකට ඇදවැටීමය. සියල්ලන් සියල්ලට එරෙහි "නියම ජනවාර්ගික යුද්ධයකට" යෑමය. මේ නිසා ශ්‍රී ලංකා යුද හමුදාව පරාජය වීම හෝ පසුබැසීම යනු දෙමළ මිනිසුන්ගේ පරාජයයි. පසුබැසීමයි. විනාශයයි. විශේෂයෙන් එවන් ව්‍යසනයකවී උතුරු පළාතේන් පිට වෙසන 70% කට අධික දෙමළ මිනිසුන්ගේ ඉරණම ඛේදවාචකයක් වන බව දෙමළ සමාජය හා දෙමළ අභිලාෂය ගැන කථාකරන්නටත් දැනගත යුතුය.

ශ්‍රී ලංකා ආරක්ෂක අංශ හා කොටි ත්‍රස්තවාදය අතර යුද ගැටුම තමන්ට අයිති නැති දෙයක් ලෙස දේශපාලකයෝත් ඒ නිසා ජනතාවත් සිතීමට පටන්ගෙන ඇත. රට පාලනය කරන ඇත්තන්ගේ දුවාදරුවන් විදේශ සරසවි වලට ඇතුළත්වෙද්දී, රාත්‍රී කැසිනෝ සමාජවල විනෝද ක්‍රීඩා කරද්දී රටේ විපක්ෂනායකයින් කැබ්රේ නැටුම් බලමින්, කම්සුව විඳිත්දී ජාතික රූපවාහිනියෙන් ගලායන පොප් සංගීතයෙන් නැලවෙද්දී සෙබළු රණබිමේදී දිවිදෙති. ඇස්, ඉස්, මස්, ලේ පුදති. ඔවුන්ගේ නිර්ණාත්මක පරාජය යනු කොටි හමුදා කොළඹ නගරය කරාම පැමිණීමත්, එයට ප්‍රථම දැවැන්ත ජනවාර්ගික මිනිස් ඝාතනයක් සිදුවීම බවත් සියල්ලන් දත යුතුය. ඊනියා විවාද, සැණකෙළි හා දේශපාලන ගැටීම් නතර කර දැන්වත් මේ යුද ගැටුමට ජාතික අරමුණක් කවා සියළු දෙනාගේ ජීවිතයේ වෙන්කළ නොහැකි ජීව අංගයක් ලෙස එය සලකා අවසන් ජයග්‍රහණය ලබාගත යුතුය. වැනසෙන ජීවිත වලට, දේපොළවලට වටිනාකමක් ලැබෙන්නේ එවිටය. ඉතිහාසය පුරා අපේ මුතුන්මිත්තන් ලෙයින් කඳුළින් රැකගත් ජාතියේ අභිමාණය රැකෙන්නේ එමගින් පමණකි. දුටුගැමුණු රජු අක්‍රමණික එළාරව අනුරපුරයේදී පරාජය කළේ නම්, විජයබාහු රජු රාජරාජ-රාජේන්ද්‍රගේ යෝධ චෝල අධිරාජ්‍යය පොළොන්නරුවේදී දණ ගැස්සුවේ නම්, අඹතැන්න මහ සටනින්

ඉංග්‍රීසි අධිරාජ්‍ය පසුබැස්සවූයේ නම් මුලතිවු වනයේදී ප්‍රභාකරන් පරාජය කිරීම අපට කළ හැකිම දෙයකි. අවශ්‍ය ඉතිහාසය අනුව පියවර තැබීම පමණි. නැත්නම් 1997 දී ඉතියෝපියානු එරිත්‍රියා බෙදුම්වාදීන් ඉතියෝපියාවම අල්ලාගත්තාසේ කොටි ම්ලේච්ඡයා ශ්‍රී ලංකාව අල්ලාගන්නවා ඇත. හිට්ලර් පටන්ගත්තේ ජර්මනියේ මුල්ලක තිබූ බැවේරියාවෙනි. ඔහු පරාජය කිරීමට ජර්මන් ජනතාවටත්, ලෝකයාටත් මහා වන්දියක් ගෙවීමට සිදුවූයේ ඔහු බැවේරියාවේදීම සාපේක්ෂ වශයෙන් සුළු වන්දියක් ගෙවා පරාජය නොකිරීම නිසාය. ඉතින් ප්‍රභාකරන්ව අපි වන්නියේදී පරාජය නොකළහොත් ශ්‍රී ලංකාවටත්, ඉන්දියාවටත්, තවත් ජීවිත කෝටිගණනක වන්දියක් ගෙවීමට සිදුවනු ඇත.

මේ නිසා කවර වන්දියක් ගෙවා හෝ දෙමළ ජාතිවාදී කොටි ත්‍රස්තවාදය අද අදම තීරණාත්මක ලෙස පරාජය කළ යුතුය. ඒ සඳහා මතවාදී ලෙස, ප්‍රචාරක ලෙස, උද්ඝෝෂණික ලෙස, ආර්ථිකමය ලෙස, යුදමය ලෙස කොටින්ට එරෙහිව සෑම දොරකඩම, සෑම බිම් අඟලකම, සෑම රටකම සටන් වැදිය යුතුය. අපේ රටේ කාලකන්නි කොළ-නිල්-රතු දේශපාලකයින් කිසිකළෙක මේ සත්‍යය තේරුම් ගන්නේ නැත. කොටින්ට ශ්‍රී ලංකාවේ ගොඩබිමත් මුහුදත් (සමහර විටෙක හෙටදිනයේ දී ) අහසත් පවාදුනනේ මේ දේශපාලකයන් විසිනි. එහෙත් ඔවුන්ට ශාප කිරීමෙන් පමණක් කොටින්ට පරාජය වන්නේ නැත. අපි අපේ දුවාදරුවන්ගේ ජීවිත වෙනුවෙන්, අපේ ජාතියේ ඓතිහාසික අභිමානය වෙනුවෙන්, මිනිසත්බව වෙනුවෙන් අද අදම සංවිධානය විය යුතු වෙමු. කුණුවනු දේශපාලකයින් වෙනුවට ඓන්ද්‍රිය ජාතික ව්‍යාපාරයක් ගොඩනැගිය යුතුවෙමු. ඒ සඳහා දැනටමත් ගොඩනැගී ඇති සංවිධාන ශක්තිමත් කළ යුතුය. මුළු ලෝකය පුරාම අපේ ජාතික අදිටන ව්‍යාප්ත කළ යුතුය. කොටි විරෝධී සටන "ගෝලීකරණය" කළ යුතුය.

අපි මව්කුසින් බිහිවන විටම ජාතියේ කුසින් ද බිහිවෙමු. අපේ සිරුරු අපේ මාතෘභූමියේ ගහකොල, සතා සිව්පා, දිය කඳුරු හා වාතලයෙන් පෝෂණය වී ගොඩනැගෙන්නා සේම අපේ ජාතික කළලය මවගෙන්, පියාගෙන් සමාජයෙන්, ගොඩනැගෙන්නා සේම අපේ ජාතික කළලය ගබ්සා කිරීමට, විෂපොවා විකෘති කිරීමට, හීන දීන කිරීමට ආක්‍රමණිකයෝ සැදී පැහැදී සිටිති. අපි අපේ මස් මාංශ වල, ලේ නාලිකා තුළ, සම විද ඇටමිදුලු තුළ ඒ ජාතික බිජුව සොයාගත යුතු වෙයි. මහා නුග රුකක් කුඩා බිජුවකින් ජනිතව පැතිරයන්නා සේ අප තුළ සැඟව ඇති ඒ ජාතික බිජුවට අප සොයාගෙන, රෝපණය කර, යෝධ ජාතික වෘක්ෂයක් ලෙස හදාවඩා ගතයුතුවෙයි. එහි උපන් බිමත්, වැදූ මවත් රැකගන්නා, ඔවුන්ට සෙවන සදනා යෝධ වෘක්ෂයක් බවට පත්කළ යුතුවෙයි. ගසක මුල්, කඳ, අතු, ඉති, මල්, ඵල සේම ජාතික වෘක්ෂයේත් විවිධ මිනිසුන් සිටිති.

එහි බුද්ධමතුන්, සෙබළුන්, හිමිවරුන්, ව්‍යාපාරිකයන්, කම්කරුවන්, ගැහැණුන, පිරිමින, වැඩිමහල්ලන් සේම දරුවන් ද සිටිති. අපට අවශ්‍ය එවැනි යෝධ ඓන්ද්‍රිය ජාතික වෘක්ෂයක් නිර්මණය කිරීමයි. කොටි දත්, නිය, හා පුල්ලි වලට ඔරොත්තුදෙන විවිධත්වයෙන් යුතු යෝධ ජාතික වෘක්ෂයක් නිර්මාණයයි.

ඉතින් අපි සිහිනයක් දකිමු. බෝම්බ නොපිපිරෙන, අපේ දරුවන්ගේ මාංශ ඉරානොදැමෙන, රුධිරය ගලා නොයන, වේදනා ඉකි ගැසීම අඳෝනා විරහිත, ම්ලේච්ඡ උමතු ජාතිවාදී මිනිසුන් නැති, සුන්දර සාමකාමී, එලබර අභිමානවත් හෙටදවසක් ගැන අපි සිහිනයක් දකින්නෙමු.

ඒ සිහිනය සැබෑ කරන්නට අපි අපේ ජාතියට ආමන්ත්‍රණය කරමු.

පුදබිමේ හිමිවරුණේ,
රණබිමේ සෙබලුනේ,
වැඩබිමේ මිනිසුනේ,
සිප්බිමේ දරුවනේ,

ඉරාදැමෙන්නේ ඔබේ මාංශයයි.
ගලායන්නේ ඔබේ රුහිරයයි.
වැලපෙන්නේ ඔබේ කඳුළුයි.

ජාතිය වෙනුවෙන් ඔබ පුදන ජීවිතයට අරුතක් දෙන්නට ඔබ හෙළන රුහිරු වලට වටිනාකමක් දෙන්නට ඔබේ කඳුළු ම්ලේච්ඡයන් දවනා ගිනිදැල් කරන්නට ඔබේ දුක් වේදනා අඳෝනා රණ ගීයක් බවට පත්කරන්නට මේ ඔබට කාලයයි.

දත්ත අංක 1

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිශ්පාදනය රුපියල් කෝටි වලින්

| වසර | 1993 | 1994 | 1995 | 1996 | 1997 |
|---|---|---|---|---|---|
| පවත්නා මිල | 50,000 | 57,000 | 66,800 | 76,800 | 89,000 |
| උද්ධමන විරහිත වටිනාකම් | 8291 | 9415 | 10437 | 11130 | 12136 |

1998 මෙය පවත්නා මිළ ගණන් අනුව රුපියල් කෝටි ලක්‍ෂයකුත් පන්දහසක් විය. 1999 දී එය රුපියල් කෝටි ලක්‍ෂයකුත් විසිදහසක් වනු ඇති බවට විශ්වාස කෙරේ.

උද්ධමන විරහිත මිළ ගණන් ගණනය කර ඇත්තේ ඇමරිකානු ඩොලරයකට සාපේක්‍ෂවය.

දත්ත අංක 2

ශ්‍රී ලංකාවේ ආරක්‍ෂක වියදම රුපියල් කෝටි වලින්

| වසර | 1993 | 1994 | 1995 | 1996 | 1997 | 1998 |
|---|---|---|---|---|---|---|
| ආරක්‍ෂක කටයුතු (වර්තන) | 1541.3 | 1941.5 | 3518.6 | 3811.7 | 3358 | 3645.7 |
| පොදුනීතිය, ආරක්‍ෂාව | 536.8 | 702.9 | 795.4 | 681.8 | 799.7 | 719.4 |
| පවත්නාමිල අන්ව සමස්ථ වියදම | 2078.1 | 2644.4 | 4314 | 4493.5 | 4152.7 | 4371 |
| උද්ධමන විරහිත සැබෑ වටිනාකම | 225.5 | 315.7 | 549.8 | 552.4 | 456.1 | 455.6 |
| දල දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස % | 4.16 | 4.57 | 6.45 | 5.85 | 4.67 | 4.2 |

1998 සැප්තැම්බර් මාසයේදී එක්වූ තවත් පිරිවැයක් නිසා 1998 මුළු ආරක්‍ෂක වියදම රුපියල් කෝටි 5600 දක්වා ඉහළ ගියේය. එය දළ දේශීය නිශ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ආසන්නයෙන් 5.6% ක් වේ. 1999 දී ආරක්‍ෂක වියදම දළ දේශීය නිශ්පාදනයෙන් 4.5 කි. එය රුපියල් කෝටි 4760 වෙතැයි විශ්වාස කෙරේ.

**දත්ත අංක 3**

ආරක්ෂක බද්ද හරහා ජනතාව ආරක්ෂක කටයුතු වලට සෘජුව ගෙවන මුදල රුපියල් කෝටි වලින්

| වසර | 1993 | 1994 | 1995 | 1996 | 1997 | 1998 |
|---|---|---|---|---|---|---|
| වටිනාකම | 658.9 | 969.3 | 1440.8 | 1644.1 | 1842.6 | 2050.0 |

1998 මැදදී මුළු පරිභෝජනයෙන් තවත් 1% ක් එක්විය. ඒ අනුව 1998 සඳහා ආසන්නයේ රුපියල් කෝටි 3200ක්ද 1999 සඳහා ආසන්නයෙන් රුපියල් කෝටි 3700ක්ද ආරක්ෂක බද්දෙන් ලැබේ.

**දත්ත අංක 3**

ඊනියා දේශපාලන විසඳුම වූ පළාත් සභා වලට සෘජුව වැයවන මුදල

| වසර | 1995 | 1996 | 1997 |
|---|---|---|---|
| පළාත් සභා වියදම | 2085.2 | 2212.8 | 2341.5 |
| පළාත් සභා ආදායම | 444.2 | 488.4 | 539.5 |
| රජය ගෙවූ මුදල | 1641.2 | 1724.4 | 1806 |

1998 දී පළාත් සභාවල මුළු වියදම (මැතිවරණ සමඟින්ද) රුපියල් කෝටි 2800 ඉක්මවූ අතර එයින් රුපියල් කෝටි 2200ක් වියදම් කළේ මධ්‍යම රජයයි. 1999 දී පළාත් සභා වියදම රුපියල් කෝටි 3000කට ආසන්න වන බව වාර්ථා වේ. පළාත් සභාව විසින් ඇතිකර ඇති නිලධාරී ව්‍යුහය නිසා අධ්‍යාපන සෞඛ්‍ය හා වෙනත් සංවර්ධන කටයුතුවලට වාර්ෂිකව සිදුවන පාඩුව කිසිවකු විසින් ගණනන් බලා නැත. මෙයට පළාත් සභා මැතිවරණ සමයේ රජය සහ අපේක්ෂකයන් විනාශ කරන ධනය ද එක් කළ විට සමස්ත ආරක්ෂක වියදම ඉක්මවන බව පෙන්වයි.

දත්ත අංක 5

කොටි මිලේච්ඡත්වයේ මුල් පහර - ආරක්ෂක අංශ සමාජිකයින්

| නම | දිනය | ස්ථානය | තනතුර |
|---|---|---|---|
| කරුණානිදි | 1977-02-14 | කන්කසන්තුරේ | පොලිස් කොස්තාපල් |
| ෂන්මුගනාදන් | 1977-05-18 | කන්කසන්තුරේ | පොලිස් කොස්තාපල් |
| වි. ෂන්මුගනාදන් | 1997-05-18 | කන්කසන්තුරේ | පොලිස් කොස්තාපල් |
| බැස්ටියන් පිල්ලේ | 1978-04-07 | මන්නාරම | පොල්ස් පරීක්ෂක |
| පොන්නම්බලම් | 1978-04-07 | මන්නාරම | උප පොල්ස් පරීක්ෂක |
| බාලසිංහම් | 1978-04-07 | මන්නාරම | පොල්ස් පරීක්ෂක |
| සිරිවර්ධන | 1978-04-07 | මන්නාරම | රියදුරු |
| පද්මනාදන් | 1978-04-07 | යාපනය | පොල්ස් පරීක්ෂක |
| කුමාරස්වාමි | 1978-06-09 | වැල්වැටිතුරේ | පොල්ස් පරීක්ෂක |
| පෙරේරා | 1978-12-05 | යාපනය | පොල්ස් කොස්තාපල් |
| සත්‍යානන්ද | 1978-12-05 | යාපනය | පොල්ස් කොස්තාපල් |
| ඥානසම්තෙදු | 1979-02-01 | යාපනය | පොල්ස් කොස්තාපල් |
| සිවනේසම් | 1979-03-31 | වෙල්වැටිතුරේ | පොල්ස් කොස්තාපල් |
| ගුරුස්වාමි | 1979-07-01 | යාපනය | පොල්ස් පරීක්ෂක |
| මුතුබණ්ඩා | 1981-03-25 | යාපනය | පොල්ස් කොස්තාපල් |
| අබේරත්න | 1981-03-25 | යාපනය | පොල්ස් කොස්තාපල් |
| පුංචි බණ්ඩා | 1981-05-31 | යාපනය | පොල්ස් කොස්තාපල් |
| කනගසුන්දරම් | 1981-05-31 | යාපනය | පොල්ස් කොස්තාපල් |
| ජයරත්න බණ්ඩා | 1981-07-02 | ආනකෝට්ටේ | පොල්ස් කොස්තාපල් |
| විවී | 1982-07-02 | පේදුරුතුඩුව | පොල්ස් කොස්තාපල් |
| ආරියරත්න | 1982-07-02 | පේදුරුතුඩුව | පොල්ස් කොස්තාපල් |
| කන්දයියා | 1982-10-27 | චාවකච්චේරිය | පොල්ස් කොස්තාපල් |
| කරනානන්දන් | 1982-10-27 | චාවකච්චේරියරෑ | පොල්ස් කොස්තාපල් |
| තිලකරත්න | 1982-10-27 | චාවකච්චේරිය | පොල්ස් කොස්තාපල් |
| විජේවර්ධන | 1983-02-18 | පේදුරුතුඩුව | පොල්ස් පරීක්ෂක |
| වීරසිංහ | 1983-02-18 | පේදුරුතුඩුව | පොල්ස් කොස්තාපල් |
| ජයවර්ධන | 1983-05-18 | යාපනය | පොල්ස් කොස්තාපල් |
| එල්.එම්. පෙරේරා | 1983-06-01 | වවුනියාව | ගුවන් භට |

# කොටි ත්‍රස්තවාදීන්ගේ සමූහ ඝතන පෙළ

| | දිනය | ස්ථානය | මියගිය ගණන | තුවාල ලත් ගණන |
|---|---|---|---|---|
| 01 | 84-11-30 | ඩොලර්ෆාම්. මුලතිව් | 33 | 21 |
| 02 | 84-11-30 | කෙන්ට්ෆාම්. මුලතිව් | 29 | 14 |
| 03 | 84-12-01 | කැකුලාව. මුලතිව් | 11 | 12 |
| 04 | 85-05-14 | ශ්‍රී මහා බෝධිය, අනුරාධපුර | 129 | 285 |
| 05 | 85-05-14 | විල්පත්තු | 21 | 31 |
| 06 | 85-05-30 | මිහිදුපුර, මුතූර් | 15 | 08 |
| 07 | 85-06-11 | දෙහිවත්ත, මුතූර් | 13 | 11 |
| 08 | 85-08-02 | සෝමාවතී, පොළොන්නරුව | 11 ● | 06 |
| 09 | 85-08-14 | අරන්තලාව, වව්නියාව | 13 | 07 |
| 10 | 85-08-18 | නාමල්වත්ත, ත්‍රිකුණාමලේ | 08 | 13 |
| 11 | 85-11-07 | නාමල්වත්ත, ත්‍රිකුණාමලේ | 14 | 16 |
| 12 | 85-12-20 | මඩු, මන්නාරම | 09 ● | 06 |
| 13 | 86-05-25 | මහ දිවුල්වැව, ත්‍රිකුණාමලේ | 21 | 20 |
| 14 | 86-06-04 | ආනන්ද වැව. ත්‍රිකුණාමලේ | 17 | 23 |
| 15 | 86-06-11 | ත්‍රිකුණාමලේ (නගරය) | 27 | 75 |
| 16 | 86-06-25 | කන්තලේ, ත්‍රිකුණාමලේ | 19 | 31 |
| 17 | 86-07-08 | මන්කිබ්‍රිජ්, ත්‍රිකුණාමලේ | 17 | 03 |
| 18 | 86-07-13 | පාවන්කුලම, වව්නියාව | 19 | 13 |
| 19 | 86-07-17 | සීනි කම්හල, කන්තලේ | 12 | 03 |
| 20 | 86-07-19 | වඩිගෙවැව, පොළොන්නරුව | 14 | 03 |
| 21 | 86-07-22 | මාමඩුව, වව්නියාව | 36 | 20 |
| 22 | 86-07-24 | ඉසෙන්බැස්සගල, මැදවච්චිය | 19 | 40 |
| 23 | 87-02-07 | අරන්තලාව, අම්පාර | 31 | 08 |
| 24 | 87-03-07 | අරන්තලාව, වව්නියාව | 11 | 03 |
| 25 | 87-03-22 | සෙරුනුවර, හොරොවච්පකතාන | 29 | 13 |

● මියගිය අයගෙන් තිදෙනෙක් බෞද්ධ භික්ෂූන් වහන්සේලාය

● මියගිය අයගෙන් හයදෙනෙක් කතෝලික වන්දනා කරුවන්ය.

| | දිනය | ස්ථානය | මියගිය ගණන | තුවාල ලත් ගණන |
|---|---|---|---|---|
| 26 | 87-04-17 | හබරණ. ත්‍රිකුණාමලේ | 127 | 31 |
| 27 | 87-04-20 | ජයන්තිපුර, ත්‍රිකුණාමලේ | 19 | 08 |
| 28 | 87-04-21 | මධ්‍යම බස් නැවතුම, කොළඹ | 114 | 398 |
| 29 | 87-05-02 | කඩුවැල්මදුව, පොළොන්නරුව | 11 | 07 |
| 30 | 87-06-02 | අරන්තලාව, අම්පාර | 34 ●● | 04 |
| 31 | 8706-11 | වෙප්පන්කුළම | 17 | 08 |
| 32 | 87-06-12 | ගොඩපාත, මැදිරිගිරිය | 12 | 06 |
| 33 | 87-10-06 | මඩකලපුව | 21 | 08 |
| 34 | 87-10-06 | ලවාය, එරාවුර් | 34 | 03 |
| 35 | 87-10-07 | පොතුවිල, අම්පාර | 29 | 04 |
| 36 | 87-10-10 | ගන්තලාව, කන්තලේ | 19 | 03 |
| 37 | 87-10-15 | කන්තලේ, ත්‍රිකුණාමලේ | 17 | 08 |
| 38 | 87-10-16 | පල්ලිමොදායි, ත්‍රිකුණාමලේ | 11 | |
| 39 | 87-11-09 | මරදාන, කොළඹ | 29 | 106 |
| 40 | 87-11-12 | වෙට්ටිකුළම, වව්නියාව | 31 | 06 |
| 41 | 87-12-15 | සෝමාවතිය, පොළොන්නරුව | 14 | 03 |
| 42 | 87-12-31 | මහදිවුල්වැව, ත්‍රිකුණාමලේ | 19 | 03 |
| 43 | 88-03-02 | මොර වැව, ත්‍රිකුණාමලේ | 17 | 08 |
| 44 | 88-03-05 | සිත්තාරු, කන්තලේ | 19 ● | 03 |
| 45 | 88-03-11 | සුහදගම, හොරොවුපතාන | 23 | 09 |
| 46 | 88-03-14 | කන්තලේ, ත්‍රිකුණාමලේ | 18 | 03 |
| 47 | 88-03-15 | කිවුල්කඩේ, ත්‍රිකුණාමලේ | 11 | 07 |
| 48 | 88-03-17 | දීඝවාපි, අම්පාර | 17 | 03 |
| 49 | 88-03-22 | පුදුකුලම, වව්නියාව | 11 | 03 |
| 50 | 88-03-22 | මැදවච්චිය | 12 | 03 |
| 51 | 88-03-29 | වේවැල්කැටිය, අනුරාධපුර | 11 | 14 |

●● මියගිය අය හා තුවාල ලැබූ අය බෞද්ධ භික්ෂූන් වහන්සේලාය

● මියගිය අය මුස්ලිම් ජාතිකයන්ය

| | දිනය | ස්ථානය | මියගිය ගණන | තුවාල ලත් ගණන |
|---|---|---|---|---|
| 52 | 88-03-31 | සයින්තිමරුදු, කල්මුනේ | 19 ● | 07 |
| 53 | 88-04-08 | හොරෙව්පතාන, අනුරාධපුරය | 19 | 05 |
| 54 | 88-05-01 | සිත්තාරු, කත්තලේ | 24 ● | 06 |
| 55 | 88-07-28 | ඇතාවැටුණු වැව, වැලිඔය | 19 | |
| 56 | 88-08-25 | මාරවිල, පොළොන්නරුව | 1 | |
| 57 | 88-09-10 | දාසය කොළනිය, මධ්‍යම කඳවුර | 11 | |
| 58 | 88-10-09 | මහකන්ගස්කඩ, මැදවච්චිය | 49 | 16 |
| 59 | 88-11-14 | පන්නිකෙටියාය, ගොමරන්කඩවල | 28 | 60 |
| 60 | 89-02-02 | බෝගමුයාය, මහඔය | 14 | |
| 61 | 89-02-11 | දුටු වැව, හොරව්පතාන | 34 | |
| 62 | 89-02-22 | සිංහපුර, වැලිඔය | 09 | 07 |
| 63 | 89-02-27 | බොරවැව, පොළොන්නරුව | 42 | |
| 64 | 89-08-17 | නොච්චිකුලම, වව්නියාව | 11 | 04 |
| 65 | 90-07-23 | වීරචෝලෙයි, මඩකලපුව | 11 | |
| 66 | 90-07-24 | අරංගවිල, පොළොන්නරුව | 12 | 18 |
| 67 | 90-07-25 | වාං ඇල, ත්‍රිකුණාමලය | 11 | 03 |
| 68 | 90-07-26 | තම්මැන්නාව, මැදවච්චිය | 23 | |
| 69 | 90-07-30 | අක්කරෙයිපත්තුව, මඩකලපුව | 14 ● | |
| 70 | 90-07-31 | පෙඩංකඩ, ත්‍රිකුණාමලය | 13 ● | |
| 71 | 90-08-03 | කාත්තන්කුඩි, මඩකලපුව | 103 ● | 70 |
| 72 | 90-08-05 | පුලියංකඩුව, අම්පාර | 19 ● | 73 |
| 73 | 90-08-06 | අම්පාර | 39 | |
| 74 | 90-08-07 | බණ්ඩාරදූව, උහණ, අම්පාර | 34 | |
| 75 | 90-08-08 | මීගස්වැව, අනුරාධපුරය | 29 | 07 |
| 76 | 90-07-11 | කොට්ඨාශ 3-6 එරාවූර් | 121 ● | 20 |
| 77 | 90-08-13 | පුල්මුඩේ, වැලිඔය | 17 | 11 |
| 78 | 90-09-13 | අරන්තලාව, වව්නියාව | 12 | |
| 79 | 90-09-19 | වැල්ලමණ්ඩලය, පුත්තලම | 27 | 07 |

● මියගිය අය ඉස්ලාම් බැතිමතුන්ය

| | දිනය | ස්ථානය | මියගිය ගණන | තුවාල ලත් ගණන |
|---|---|---|---|---|
| 80 | 90-09-19 | උහන අම්පාර | 09 | 02 |
| 81 | 90-09-21 | පුඩිකුඩිරිප්පු, අම්පාර | 15 | 11 |
| 82 | 90-09-24 | ගජබාපුර, වැලිඔය | 09 | |
| 83 | 90-09-30 | පේරවැල්තලාව | 09 | 84 |
| 84 | 90-10-02 | වාහල්කඩ, පදවිය | 09 | |
| 85 | 90-10-11 | ආරුගම්බේ, අම්පාර | 09 ● | |
| 86 | 90-10-23 | තන්තිරිමලේ, අනුරාධපුරය | 14 | 06 |
| 87 | 90-10-27 | තන්තිරිමලේ, අනුරාධපුරය | 09 | |
| 88 | 90-11-23 | සිංහපුර, වැලිඔය | 10 | |
| 89 | 91-01-23 | බෝගමුයාය, අම්පාර | 29 | 13 |
| 90 | 91-04-03 | කෙවිලිය, පෝල්පොයින්ට්, ත්‍රි.මෙල් | 26 | 11 |
| 91 | 91-04-14 | එතිමලේ, මොනරාගල | 19 | |
| 92 | 91-04-20 | නිගදෑල | 27 | 03 |
| 93 | 91-04-24 | මාලු වෙළඳපොළ, අක්කරෙයිපත්තුව | 09 | 32 |
| 94 | 91-05-20 | මල්වත්ත, අම්පාර | 09 | 02 |
| 95 | 91-06-12 | කොක්කඩිදෝලෙ, මඩකලපුව | 11 | |
| 96 | 91-06-27 | ලාහුගල, අම්පාර | 19 | 08 |
| 97 | 91-07-06 | මනම්පිටිය, පොළොන්නරුව | 09 | 03 |
| 98 | 91-07-06 | පුදූර්, පොළොන්නරුව | 18 | 03 |
| 99 | 91-09-19 | පල්ලියගොඩැල්ල, පොළොන්නරුව | 13 | 06 |
| 100 | 92-01-26 | බොරපොළ, අම්පාර | 14 | 17 |
| 101 | 92-04-10 | මහරගම | 09 | 23 |
| 102 | 92-04-29 | අලින්චිපොත්ත, පොළොන්නරුව | 61 | 15 |
| 103 | 92-06-02 | 209 සැතපුද් කණුව, අම්පාර | 17 | 02 |
| 104 | 92-07-06 | පරයන්කුළම, මඩකලපුව | 10 | |
| 105 | 92-07-15 | හිරියන් කුළම, මඩකලපුව | 19 | 07 |
| 106 | 92-07-21 | පරංගියමඩු, මඩකලපුව | 07 | |
| 107 | 92-08-30 | ත්‍රිකුණාමලේ නගරය | 15 | 34 |
| 108 | 92-09-01 | සයින්ද්මරුති, කල්මුණේ | 24 | 67 |

| | දිනය | ස්ථානය | මියගිය ගණන | තුවාල ලත් ගණන |
|---|---|---|---|---|
| 109 | 92-10-01 | කොං වැව, වැලිඔය | 17 | 09 |
| 110 | 92-10-24 | අම්පාර නගරය | 25 | 33 |
| 111 | 94-03-16 | කුඩිරමලේ, පුත්තලම | 19 | 03 |
| 112 | 95-05-25 | කල්ලරාව, ත්‍රිකුණාමලය | 44 | |
| 113 | 95-08-07 | නිදහස්චතුරශ්‍රය, කොළඹ | 21 | 44 |
| 114 | 95-10-20 | කොළොන්නාව තෙල්පිරිපහදුව | 14 | 20 |
| 115 | 95-10-21 | මංගලගම, අම්පාර | 16 | 05 |
| 116 | 95-10-21 | මොනර තැන්න, බෝවත්ත | 39 | 12 |
| 117 | 95-10-21 | ගල්තලාව, පදවිය | 21 | |
| 118 | 95-10-23 | ඇතුමලේ, කොටියාගල | 19 | |
| 119 | 95-10-25 | පානම, අම්පාර | 14 | |
| 120 | 95-10-26 | තම්මැන්නාව, තල්ගහවෙල | 26 | 27 |
| 121 | 95-11-02 | මලකළුගොල්ල | 07 | |
| 122 | 95-11-11 | කොම්පඤ්ඤ වීදිය | 17 | |
| 123 | 96-01-31 | මහ බැංකුව කොළඹ | 98 | 1338 |
| 124 | 96-07-24 | දෙහිවල දුම්රිය ස්ථානය | 63 | 418 |
| 125 | | ලෝක වෙළෙඳ ම. කොළඹ | 13 | 125 |
| 126 | 98-01-25 | දළදා මාලිගාව මහනුවර | 11 | 22 |
| 127 | 98-03-05 | මරදාන | 42 | 196 |
| 128 | 99-05-31 | කිරිඉබ්බන් වැව, පදවිය | 11 | 06 |
| 129 | 99-07-06 | ඉගිනියාගල, අම්පාර | 07 | 34 |





පිදුම...

සුලෝචනා

ඉරේකා

දූවේ නුඹලාව

එදා උන්

කිහිරඟුරුවන්ව

දැවෙන තාර පොළොව මත

ඉරා දැමීමෝය.

නුඹලා හෙළූ අවසන්

සුසුම් එතැන් පටන්

අපේ ආත්ම අදිටන විය.

මේ පොත නුඹලා වෙනුවෙනි.

ISBN-955-8239-00-3 ආධාරය රු. 150/-